නම්වූ පද්‍යසාධන ටීකාව, නාමාවලිය, කව්‍යශෙඛරය, සැළලිහිණි සන්දෙශය, පරෙවි සන්දෙශය, ගුත්තිලකාව්‍යය, හංස සන්දෙශය, කොකිල සන්දෙශය, රුවන්මල සහ පියුම්මල, සිංහබාඅස්න සහ කුවේනි අස්න යනාදි ග්‍රන්ථයෝ සිංහල ජාතියේ නොනස්නා කීර්තිශ්‍රිය එළවමින් අද දක්වාත් පවතිත්.

මේ සන්දෙශ කාව්‍යය සන්න සහිතව දෙවරයක් මුද්‍රා ඞ්කණයට පත්කරවා තිබේ. ඒ කාලයෙහි ආධුනිකයන්ට මෙයින් විපුල ප්‍රයොජනයක් අත්පත් වෙන්ට ඇතැයි සිතමු. එතකුදුවූවත් තමමත් අව්‍යක්ත ලෙඛක දොෂයන්ගෙන් සඤ්ජාතව මේ කාව්‍යය පවත්නා හෙයින් වර්තමාන සිංහලාධුනික ජනයාගේ දිවුණුව පරමාර්ථකොට පැරණි පොත් රාශියක් ලක් දිව නානා ස්ථානවලින් සපයා සංශොධනය කිරිමෙන් දුරව බොධවූ ස්ථානයන් නිදර්ශන සමග යුක්තකොට මිට වර්ෂ හත රකට පමණ පෙර අපගේ ව්‍යාඛ්‍යානය දෙවෙනි වරට ලියා ප්‍රසිද්ධ කරවිමු.

මුද්‍රිත පොතේ නොමැත්තාවූ ප්‍රශස්ත කවි සයක් මිටම ඇතුළත් කරනලදී. ඒ කාව්‍ය ෂට්කය මෙසේයි:-

[illegible] ද නා දනනෙත් පැහැලඹු ලා සි ට
අ ද නා මෙන් [illegible]ම තම වෙත දෙනෙ ර ට
පි හි නා යන [illegible]ගනාත් දිය පි ට
[illegible] වැනි [illegible] තොප යතු ර ට

[illegible] 138

[illegible] ඉ සුදෙහි සෙ ද වා
අවනත නොවූ පෙර ස [illegible]දුන් ලුහු බ ද වා
ආරිය සක්විති [illegible] ඔද සි ද වා
නොමඳබළසෙන්යවාසුදයට [illegible] බෑ මලුන් බ ද වා

167 ඉඳුනිල් කොළතුරා රැඳි මු [illegible] රා යා
විලිකුන් අඹ ඉරා තුඩ ගිනි [illegible]රා යා
එන රස උර උරා ලොබ නො[illegible] [illegible]
නරඹ නඳනා ගිරා පෙළ ඉදු [illegible]

196 පළොල් සිහින් ගෙඳිය එරහැ
දූසමන් සව් ගෙඳය පූල් ගෙ
නිලු'පුල් අඹ ගෙඳය තුරුනො
සුවඳ දසන ගෙඳිය තුරුනො

232 අවට ඉදිනා පඬිවරු නමද අඩ දූ ගී
සිනට සතුටුවනලෙද පද'රුන් සෙහෙ ගී
රුවට කියන පෙර ඇදුරන් ලෙස නිති ගී
බහුට දසට විදුනැන් විසසිය පවෙ ගී

තවද මෙම ගිරාසන්දෙශය ආධාර ලබන පාඨශාලා වල තුන්වෙනි පෙල පාඩම් විභාගයට සහ ආණ්ඩුවේ තුන්වෙනි පෙල පාඩම් විභාගයටත් සූදානම්වන ශිෂ්‍යයන්ගේ ඥනාභිවෘධිය සඳහා නියම කර තිබෙන බැව් අධ්‍යාපන මණ්ඩලයේ අධ්‍යක්ෂ තුමාණන්ගේ ප්‍රකාශයකින් පෙනේ. එම හෙතුව කරණ කොට ගෙන පළමු ශුද්ධියට වඩා විශෙෂ කරුණු ඇතුලත් කිරීමෙන් පරිශුද්ධ අක්ෂර වින්‍යාශයෙන් යුක්ත කොට අත්‍යර්ථයෙන් සාර්ථක වන ලෙස මෙය සකස් කළ බවත් නැවත මුද්‍රණය කිරීමේ බලය අප වෙතම තබාගත් බවත් සියලුදෙනා විසින් කරුණාවෙන් සැලකිය යුතුයි.

කවියක් පාසා අලඞකාර සහ ඡන්දස් විභාගය සහිත විස්තර වණ්නාව හතරවෙනි වාරයේ මුද්‍රණය කරවා අධුනිකයන් වෙත පමුණුවන්නෙමු.

## ආචාර්‍ය ගුණානුස්මරණය.

---

අවුරුදු විස්සක පමණ කාලයක් තුළ සිංහලය, පාළිය, සංස්කෘතය යන ත්‍රිවිධ භාෂාවන් පිළිබඳ ගම්භීර සත්‍යායන් විස්තර කරදී ලිපුම්වලින් ඉගැන්වීමෙන් ආධාර කළ සවගී සථවි වදාළ දෙඩන්දූවේ ශෛලබිම්බාරාම විහාරාධිපති සරසවි මණ්ඩප පිරිවන්හිම් දෙශ දෙශාන්තරයන්හි විස්තෘත කීර්ති කදම්බාප්‍රවලිත පණ්ඩිත ශෙඛරායමාන ශ්‍රී බෞද්ධ සිද්ධාන්තාචාර්‍ය ධර්මරක්ෂිත වන්‍යකීර්ති සී. ඒ. ශ්‍රී සීලක්ඛන්ධාභිධාන නායක ස්ථවිර පාදයාණන් වහන්සේ වෙත අපගේ ගෞරව යනුතිය පුදකරම්හ.

අති ගෞරවාර්හ මේ නායක මහාස්ථවිරයන් වහන්සේ වර්ෂ 1923 ක්වූ පෙබරවාරි මස තුන්වෙනිදා සන්ධ්‍යා කාලයේ ස්වර්ගස්ථ විය. ඒ පිළිබඳව අප විසින් රචනා කරනලද ශොක ප්‍රකාශය පිළිබඳ මුද්‍රණයට පමුණුවා විසුරුවායැව් කාව්‍ය පඞක්තියද මධ්‍යස්ථ ලොකයාගේ දැන ගැනීම ..
ගුණ සැලකීම් වශයෙන් මෙහි බහාලන්නෙමු

1 සකාවසින් එක් දහස් අටසිය එපන්සාළිස සැප මි ණි
විදිලෙසින් අවශොලෙස් වසා ලත් දුරුතු මස
සොඳ මන මෙ ගි
දින විසින් රවිදිනේ සැන්ද රිවිගෙ හෝරා ලබමි ගි
තිරලෙසින් සිරි එසිල් සඳ නම් හිමිතුමා සුර පුර ව ගි

2 සිහල සකුමගද වියරණ ඈ නොමි න
පුවල නෙක සාලා දනුමෙන් නිති දිලු ණ
තුමුල මහ පඬින් මන බැබලි සිළුමි ණ
පතල මිණි පහන අද නිවුණි සසො බ න

3 ලකගන ගෙල පැලඳි මහ මිණි රුවන් වැ ල
අගනින මහරු මිණ ලෙස ලොව නඳන ක ල
ගුණසෙන සිල් කඳින් රජුසෙවි සා කම ල
අදරින වඳිමු සිරි සිල්කඳ හිමි උදු ල

4 පෙල වියරණ දනුමෙන් මහ බඹු සෙ වි ය
ස කු වියරණ පාණිනි රුසිට සම වි ය
එ ළු වියරණ සුරගුරු මෙන් පසිඳු වි ය
ගුණ බරණින සිල්කඳ ඇදුරු තුමි වි ය

5 සිරිලක බුදු සසුන් තුබ කුස තරිඳු ලෙ සේ
නොව සැක තද තෙදින් බැබළුන නිති දව සේ
ලොව එක මඟුල් හල ලෙස කළ තමා බ සේ
අද එක අඳුරු විය හිමි ඔබ නැති මෙනද සේ

6 සුගත් සසුන වෙත නිතරම සුප ස න් න
සුගත් දම් ලෙසින් දවසරිමින් ඉ න් න
සුගත් පල් නැමැති සිසුවර බැති සෙ න් න
උගත් ලෙස ගෙති මේ කාව් සිහි වෙ න් න

බලාපොරොත්තු නොවූ ලෙස ගිරාසන්දේශ සන්නයේ පොත් සියල්ලම විකිණී ගියෙන් ඉක්මනින් මුද්‍රණය කිරීමට පටන් ගැනීම සිදුවිය. ඒ හෙයින් අවසාන ශොධන පත්‍රය බලා යවන්ට ඇතැම් ප්‍රස්තාවයන්හි අවකාශයක් නොමැත් තෙන් වර්ණ යොජකයන්ගේ අතින් ඇතිවී තිබෙන සුළු ප්‍රමාද දොෂයන් ගැණ ශුද්ධි පත්‍රයක් යොදන්ට සිද්ධ විය. හ්‍රස්වවිය තන්හි දීර්ඝවද දීර්ඝවිය යුතු තන්හි හ්‍රස්වද අක්ෂරයෝ දක්නා ලැබෙත්. ඒවා ශොධන පත්‍රයට අප විසින් ඇතුලත් නොකරන ලදී.

මේ වගට – ශාසනාභිවෘද්ධිකාමී,

T. Sugatapala.

ශ්‍රී බුද්ධවර්ෂ 2471 ක්වූ කිණර මස
පූරපසලොස්වක ලත් ඉරුදින
අළුත්ගමදීය.

**පදවිග්‍රහය**:-සැරද-සැර යන නිපාත පදය පූර්වකොට ඇති පණ්ඩිතයෙහිවූ "දිව්" යන ධාතුයෙකෙරෙන් පරව ආශීර්වාද ගම්‍ය නොව ඇති විධි ක්‍රියා ප්‍රත්‍යයවූ 'අ' ප්‍රත්‍යය යොද, ධාත්වන්තය ලොප් කොට සෑදූ ආශීර්වාද ගම්‍යවිධි ක්‍රියායි. කිරන්වරද=කිරරද නො නොත්කිරන්ගේරද=කිරරද, තත්වූවන් ඇති යේ=තත්වන්, රුවන් මූවරු=රුවන්රු, අකුරු සහවූයේ=සහකුරු, මියුරුවූතෙපුල=මියුරු තෙපුල, සහකුරුවූ මියුරුතෙපුල=සහකුරු මියුරුතෙපුල, සව්වූ ලෙව්=සව්ලෙව්, සව්ලෙව්හුගේසතැන්=සව්ලෙව් සතැන්, යනු මෙහි පදවිග්‍රහයි.

**විශේෂණ විශේෂ්‍ය සම්බන්ධය.** තත්වන් යනුද, රුවන් රුවන් යනද. අදනා යනුද කිරරද සඳ යන්නට විශේෂණවූ ආලපන විභක්ති එකවචනාන්ත නාමපදයි. කිර ද සඳ යනු තද් විශේෂ්‍යවූ ආලපන විභක්ති එකවචනාන්ත නාමපදයි. සව්ලෙව් සතැන් යනු අදනා යන්නෙහි කර්මවූ හෙයින් කර්ම විභක්ති බහුවචනාන්ත පදයි. සහකුරු මියුරු තෙපුලෙන් යනු අදනා යන්නට භින්නාධිකරණ විශේෂණ කරණ විභක්ති බහුවචනාන්ත පදයි. මෙසේ පදවිභාග දතයුත්තාහ

මේ වෘත්තයතෙම ඡන්දෝ විෂයෙහි නිර්දිෂ්ට යහයිනම්වෘත්තයවේ. එහි ලක්ෂණ:-

**නවෙකොළොස් පසමෑ-එකොළොස් බැවින් සෙමෙහි**
**ලුහුවහලින් බඳනුයේ-යහයිය මේ නිදසුන්.**

මෙහි පළමුවන පාදයෙහි මාත්‍රා නවයක් හා දෙවන තුන්වන හතරවන පාදවල මාත්‍රා එකොළොස බැගින් යුක්තවන්නේ යහයි වෘත්තය බැව් සැකෙවින් දතයුතුයි.

කිරපක්ෂීන්ද්‍රයාගේ සම්ජනසමහාවිහාචය වාබ්මාධූර්යසීන කාලිදාස මහාකවිහු විසිනුදු වර්ණිතයි. ශේ මෙසේයි.

"ශුබී ලලිතු ශිශුසනාංශු හසිත ලබ්ධජන වාදියු
ශුක සඤ්ජර බඩ්ඩසෙත මධුරාණං ගිරාං ඵලම්"යි

අහෝ කීරපක්ෂි රාජය! සෞවර්ණපරයේ ගැසිරෙන්නාවූ සියලු පක්ෂීන් අතුරෙන් තොපට මැදිරිවල බැඳීමවන්නේය. ඒ මධුර වචනයන්ගේ ඵලය නිසා වෙයි යනු මෙහි අදහසයි.

---

*සතත් හදතා

මෙසේ කිර පක්ෂීහුගේ මනොහාරී රූප සෞන්දර්‍ය්‍යාතිශය සහිත මධුරාලාපිත්වය වර්ණනා කොට, තදනන්තරව විශෙෂ වර්ණනාවක්ද ප්‍රකාශකිරීමෙන් පක්ෂිරාජයා පරමාහ්ලාදයට පමුණුවනු කැමැත්තේ ඉඳුදුනු යනාදි උපජාති දසපද සැහැල්ල කියා

2 ඉඳුදුනු පැහැදිනූ-තුනුසිරි නුදුල මිතුර

ලඳ සොඳ අදරවැනි නංග තෙල තුඩ දවු ව
ලොබ බැඳ අදර නොකරති කවුරු සතුටු ව

වන වන පති තුරෙහි-පුර පුර පතින් මැඳුරෙහි

නදව නිතොර ලැබ පිය පිය සර පහ ස
ර ඳ ව ප ව ර කෙළි කෙළ කෙළ හැම දව ස
දි සි දි ය කු ස හැම සියොතුන් ගෙන් *සු රූ ව
නිසි ය ස රු ස කියවන නුවණින් ‡ ස රූ ව
ඉ සි වර ලෙ ස නිති පණි වා යෙන් දු රූ ව
රි සි ප ල ර ස. විඳ සතොසින් දව ස රූ ව

2 ඉඳුදුනුපැහැ, ඉන්ද්‍රචාපය පිළිබඳ කාන්තිය; දිනූ, පැරදවූ; තුනුසිරින්, දෙහශ්‍රීයෙන්; උදුල, සමුජ්ජ්වලිතවූ; මිතුර, මාගේ (ප්‍රිය) මිත්‍රය! ලඳ, කාන්තාවන්ගේ; සොඳ, සුන්දරවූ; අදරවැනි, අධරසදෘශවූ; නංග, යුෂ්මත්හුගේ; තෙලතුඩ, මේ චඤ්චුවෙහි; දවුව, දශ්නයකළහොත්; කවුරු, කවරනම් කෙනෙක්; ලොබ බැඳ, ලොභබන්ධනය කොට; සතුටුව, සන්තුෂ්ටව; අදරනොකරති, ආදර නොකෙරෙද්ද? (සියල්ලෝම කෙරෙත්මැයි) වන, අරණ්‍යයන්හි; වනපති තුරෙහි, වනස්පති වෘක්ෂයන්හිද; පුර, නගරයන්හි; පුරපතින් මැඳුරෙහි, නගරාධිපතින්ගේ භවනයන්හිද; නදව, ආනන්දිතව; පිය, ප්‍රියාවන්ගේ; පියසරපහස, ප්‍රියජනක ස්පර්ශය; නොහොත් පිය, ප්‍රියවූ; සරපහස, හස්තස්පර්ශය; නිතොර, අනවරතයෙන්; ලැබ, ලබාව; පවර, අතිශ්‍රෙෂ්ඨවූ; කෙළි, ක්‍රීඩාවන්; කෙළකෙළ, කොටකොට; හැම්දවස, සමස්තදිනයන්හි; රඳව, රඤ්ජමානවෙව හෙවත් සිත්සේ වාසයකළ මැනව; දියකුස, ලොක කුහරයෙහි; දිසි, දෘශ්‍යමානවූ; හැමසියොතුන් ගෙන්, සකල පක්ෂීන් අතුරෙන්; සුරූව, සුරයෙක්ව; නිසියසරුස, යොග්‍යවූ යශඃ සඳම්බය; කියවන, (...වැස්සාලවා) ප්‍රකාශ කරවන්නාවූ; නුවණින්, ප්‍රඥාවෙන්; සරූව, සාරවත්ව; (සම්ර බුද්ධිමතෙක්වයයිසේයි) නිති, නිත්‍යයෙන්; පණිවායෙන්, ප්‍රාණවධයෙන්; දුරූව, දූරීභූතව; ඉසිවරලෙස, සෘෂිවරයෙක්මෙන්;

* ශූරූව. † සුරූව.

පිහිපලරස, අභිලාෂ ඵලරසයන්; විඳ, විඳිනයකොට; හෙවත් අනුභවකොට; සතොෂින්, සන්තුෂ්ටියෙන් යුක්තව; දවස්අරෑව, දිවසාතික්‍රමණයකල මැනව.

කීරපක්ෂිරාජයාගේ ජන්මසම්භාවිතත්වයද පූර්වීය කිසියම් කවිවරයකු විසිනුදු වර්ණිතමැයි කෙසේද?

"වාසඃ කාඤ්චනපඤ්ජරෙ නෘපකරාම්භොජෛස්තනූමාර්ජනං
භක්ෂ්‍යඃ ස්වාදුරසාල දාඩිම ඵලං පෙයං සුධාභංපයඃ
පාඨඃ සංසදි රාමනාම සතතං ධීරස්‍ය කීරස්‍යමෙ
හාහා හන්ත! තථාපි ජන්මවිටපි ක්‍රොඩං මානොධාවති"

වාසඃ, විසුම; කාඤ්චනපඤ්ජරෙ, රන්මැදිරියෙහිය; තනූමාර්ජනම්, ඇඟමිරිකීම; නෘපකරම්භොජෛඃ, රජුන්ගේ හස්තපද්මයෙනි, භක්ෂ්‍යඃ, ආහාරය; ස්වාදුරසාල දාඩිමඵලම්, මිහිරි වූ අඹහා දෙළුම්ගෙඩිය, පෙයම්, පැන්; සුධාභංපයඃ, අමාවැනි කිරිය; පාඨඃ, කිම; සංසදි, සභාමෙහි; රාමනාම, රාමදෙවයාගේ නාමයයි; හා, අහෝ; හා හන්ත, අහෝ අහෝ; තථාපි, එසේවුවත්, ධීරස්‍ය, ධීරවූ; කීරස්‍ය, කීරපක්ෂිවූ; මෙ, මගේ; මනඃ, සිත; සතතම්, නිතොර; ජන්මවිටපික්‍රොඩම්, ජන්ම වෘක්ෂයාගේ කැදැල්ලවෙත; ධාවති, දුවයි.

3 ලද යම් කෙනෙක් සරසවි බැලුමක් ති සි
සොඳ රම් වුවද් මුළුලොව කෙරෙති අනවැ සි
එක රම් සසිඳු සරසවි දෙවිය අනෑව සි
මන රම් කෙනෙක් නොපිමය † පරසිඳු සුබැ සි

3 සරසවි, වාග්වනිතාවගේ; තිසි, යොග්‍යතරවූ හෙවත් අවශ්‍යතාවූ; බැලුමක්, තිරිශ්‍යණ මාත්‍රයක්; ලද, ප්‍රතිලබ්ධවූ; යම් කෙනෙක්, යම්කිසිවෙක්තුමූ; සොඳුරම්වුවත්, කතිප්‍රමාණවූයේ නමුදු; මුළුලොව, සමස්තලොකය; අනවැසිකෙරෙත්, අන්තෙවාසිකකෙරෙත් හෙවත් වසඟවූවක්කෙරෙත්; එකරම්, තාදෘශවූ; සසිඳු, ජගද්ව්‍යාප්තවූ; සරසවිදෙවිය, වාග්වනිතාවගේ; (සරස්වතී දෙවියාගේ) අනෑමැසි, කරසත්වූ හෙවත් හස්තයෙහි වාසයකරන්නාවූ; මනරම්, මනොරම්‍යවූ; කෙනෙක්, අයෙක්; පරසිඳු, ප්‍රසිද්ධවූ; සුබැසි, මනා තෙපුල් ඇත්තාවූ; නොපිමය, සුෂමත්හු මැයි

†පිරිසිඳු.

"සරසවිදෙවිය අනාවැසි"

කිරපක්ෂිතුයා සරසවතී දෙවියගේ හස්තයෙහි විසිමද කවි සමයාගතයි. ඒහෙයින්ම මොහුගේ වාක් පාටවය හා ප්‍රාඥ භාව යද ශිෂ්ටාමමතවියයි සැලකියයුතු. සරසවතී දෙවියගේ මනො විනොදයට හෙතුවත්තේ කිරපක්ෂියාගේ තත්ප්‍රකාර වාසනයිද ව්‍යවහෘතයි. සරසවතී දෙවිය මහාබ්‍රහ්මයාගේ මුඛයෙහි වාසය කරන බැව් හැගේ. මේ දේවිතොමෝ මහාබ්‍රහ්මයාහට භාය්‍යාවූ වාය. වචනයට අධිපතිවූ මේ දෙවිතොමෝ සමස්ත විද්‍යාවන්ට කත්‍රීභූතවූවා සංස්කෘත භාෂාව සහිත දෙවනාගර වර්ණමාලාවද ප්‍රතිපාදනය කොට භරතසෘෂිවරයාහට ඉගැන්වීම් කළායයිද කියති

තවද හවභූයි කවිහු විසිනුදු මේ නිර්දිෂ්ටය.

**ශුක! තව ජන්ම සදැඳුනු-මිහවාමෙසා යනසරසවතිහමසන**
**යනපවන පාඨවංශය-යමනා තරුකොටඇර ජන්ම"**

ශුක!, එම්බා කිරපක්ෂිය!; **ඉහ**, මේ ලොකයෙහි; **තව**, තාගේ; **ජන්ම**, උප්පත්තිය; **සද**, සැම්කල්හි; **අදභුතම්**, ආශ්චය්‍යයි; **යත්**, යම්හෙයකින්; **සරසවතිහමසන**, සරසවියගේ අතෙහි; **වාසඃ**, විසුම; **යත්**, යම්හෙයකින්; **තව**, තාගේ; **පඨනපාටවම්**, කියමෙහි දක්‍ෂබවද; **යත්**, යම්හෙයකින්; **තරුකොටරම්**, රුක්බෙනෙයිද; **තව**, තාගේ; **ජන්ම**, උත්පත්තිය; එසේහෙයිනි.

4 මෙවන් ගුණෙන් යුතු තොපගේ පියතෙපුල
සවන් පුරා පැමිණෙනා මිතුර මනකල
ලෙවන් තොසතොස ලෙසනිවන් සැප විපුල
නිවන් දකිනතෙක් සැපතම් එමැයි බල

4 **මනකල**, මනඃ කල්‍යාවූ; **මිතුර!**, මිත්‍රය!; **මෙවන්ගුණෙන් යුතු**, උක්තප්‍රකාර ගුණාඞ්ග සඞ්ගතවූ; **තොපගේ**, නුඹතන්හුගේ **පියතෙපුල**, පියවූවචනය; **සවන්පුරා**, කර්ණපූරණයකොට; **පැමිණෙන**, ප්‍රාප්තවන කල්හි; නෙවත් ලැබෙනහොත්; **ලෙවන්**, ලොකවාසීජනයා විසින්; **තොසතොසලෙස**, නානාවිධයෙන්, **විපුල**, උදාරවූ; **සැප**, සම්පත්තිය; **නිවන්**, සාමිය නමුත්; **නිවන්දකින**, **තෙක්**, නිර්වාණ දශ්නය සිම්කොට; **බල**, උදාරවූ, **සැපතම්**, සම්පත්තියනම්; **එමැයි**, ඒ ප්‍රිය තෙපුල් ශ්‍රවණයමැයි.

ලොකයා නානාවිධ සැප ප්‍රකාශකරණ නමුත් තොපගේ මධුර රසාන්විත නාද ශ්‍රවණ මාත්‍රයම සියලු සම්පත්තීන්ට වැඩිවූ උදාරසැපමෙවයි. යනු භාවයි.

5 දි රා වැමෙනතුරු තුර නොහැර ඉඳ නො සේ
පු රා තනෙහි පරසිඳු මුළු *මෙදිය කු සේ
ගි රා කුල උපන් සකි නොපෙනෙ සිත් ලෙ සේ
පු රා මිතුරු දම් අමුතුව †කියනු කො සේ

5 පුරාතනෙහි, පූර්වකාලයෙහි; තුර, (තමන් චිරකාලයක්ම සැප පිණිස ඇසුරුකළ) ඉඹුල්වෘක්ෂය; දිරාවැමෙනතුරු, ජීර්ණව පතිතවනතාක්; නොහැර, ප්‍රතික්ෂේප නොකොට; නොසේ, සන්තුෂ්ටියෙන් සුඛිතව; ඉඳ, වාසයකොට හෙවත් වාසය කිරීමෙන්; මුළුමෙදිනිකුසේ, මේ සමස්තලෝක කුහරයෙහි; පරසිඳු, ප්‍රසිද්ධවූ; ගිරාකුල, කීරවංශයෙහි; උපන්, උත්පන්නවූ; සකි! මිත්‍රය! නොපෙනෙසිත්ලෙසේ, යුෂ්මත්හුගේ චිත්තානුකූල පරිද්දෙන්; මිතුරුදම්, මිත්‍රධර්මය; පුරා, සම්පූර්ණකළ මැනව; අමුතුකියනු, අමුතු ප්‍රකාරයෙන් කථනය කිරීම; කොසේ, කොයිලෙසින් වන්නේද?

"දිරාවැමෙන තුරු තුර නොහැර ඉඳ නො සේ

පුරණලද පාරමිධර්මයන් ඇති අප්‍රමාණ බෝසත්තෙම කීපර වශව ගිරාකුලයෙහි ඉපිද කීරපක්ෂි සමූහයකට නායකව හිමාලය වන පෙදෙසෙක්හි ඉඹුල්වෘක්ෂයක් ඇසුරුකොට එහි ඵල මල් ආදිය කමින් වාසය කෙළේය. ඒ වනයෙහි ඵල ආදිය නැති කාලවල අන්‍ය පක්ෂීහු වෙන පෙදෙස් සොයාගොස් වෘක්ෂයන් බලබලා ඵල මල් අනුභව කිරීමෙන් ජීවිකාවෘත්තිය කරන්නාහ. මහසත් වනාහි තමා සිටි වෘක්ෂයහැර නොගොස් එහිම තිබෙනා-දේ අනුභව කෙරෙමින් වෙසෙයි. මෙසේ සුපරිශුද්ධ වෘත්තියෙන් දිවසාතික්‍රමණයකරන කීරපක්ෂියා ගැන පරීක්ෂාකරනුවස් සක්දෙව් රජ අවුත් එම රුකෙහි කොළ මල් ඵල අතුරුදන්කොට අතුපතරද වනසා ගස පමණක් ශේෂවෙන්ට හිතුවේය. එසේවූ විටද කිරපක්ෂියා වෙන රුක් ඇසුරු කිරීමට නොගොස් එහිම රඳන බැව් මනාව දත් ශක්‍රයා මම වනයෙහි බොහෝ ඵල මල් ආදියෙන් උපලක්ෂිත වෘක්ෂයන් තිබියදී තොප මේ දිරාගිය ගසේම කුඩු අනුභව කරමින් සිටීමට කාරණා කිම්දැයි ඇසීය. තමාවිසින් ආශ්‍රයකරනලද උපකාර සවාමියාවැනි වෘක්ෂයට විපත් සම්ප්‍රාප්තකලැ අත්නොහැර සිටීම සත්පුරුෂයන්ගේ විශිෂ්ට ගුණ ධර්මයක් බැව් තමාදන්නා හෙයින් බොහෝ කාලයක් හිත පිණිස පැවති වෘක්ෂය දිරාගිය නමුත් එය අත්හැර

*කෙදියකුසේ. †කියමි.

අන්‍ය වෘක්ෂයක් කරා ගොස් දිවි රැකගැනීම තමාවැන්නවුන්ට ප්‍රමාණ නොවන බවත් කීයේය. බෝධිසත්ත්වයන්ගේ උත්කෘෂ්ට ප්‍රතිපත්තියට තුටුපහටුවූ සක්දෙව් රජ තෙමේ ස්වකීයානුභාවයෙන් වෘක්ෂයෙහි ඵල මල් ආදිය ඇති කරවා ශක්‍රභවනයට ගියේය.

6 පෙ මා වඩන ඉමුසකි සඳිනි! දසදෙ ස
යොමා නුවණ් බැලුවත් මුළු මෙලෝකු ස
මෙ මා සිතන කටයුතු සිදුකරන ලෙ ස
ප මා නොවන මිතුරෙක් නැත මෙතොප මි ස

6 පෙමාවඩන, ප්‍රේමවර්ධනය කරන්නාවූ; ඉමුසකිසඳිනි! ප්‍රිය මිත්‍රයාණෙනි! දසදෙස, දසදිගුන්හි; නුවන්යොමා, නෙත්‍රයන් මෙහෙයා; මුළුමෙලෝකුස, සියලු මේ ලෝකකුහරයෙහි; බැලුවත්, නිරීක්ෂණයකළත්; මෙමාසිතන, මේ අසමත්හු චින්තනය කරන්නාවූ; කටයුතු, කෘත්‍යයන්; සිදුකරනලෙස, සිඬ කරන පරිද්දෙන්; පමානොවන මිතුරෙක්, ප්‍රමත්ත නොවන මිත්‍රයෙක්; මෙතොපමිස නැත, මේ යුෂ්මත්හු විනා අනිකෙක් නැත්තේය.

(1) විශිෂ්ට පත්‍ර පවිත්‍ර චාරිත්‍ර ඇති මිත්‍රෝත්තමය! පක්ෂීන් අතුරෙන් තොපම දූත ක්‍රියාවෙහි යොදනු පූර්වචාරිත්‍රයක් මැනෝ?

(1) විචිත්‍ර පක්ෂපත්‍රයෙන් අලඞ්කෘත ශරීරයක් හා පිරිසුදු චාරිත්‍රයක් ඇති මිත්‍රෝත්තමය සියලු පක්ෂිවර්ගයා අතුරෙන් යුෂ්මත්හුම දූතභාවයෙහි යෙදීම පූර්වකාලයෙහි පටන් පැවති සිරිතක් නොවේද?

7 හිම සෙල් අතර කෙලලක් රක්සස් *විසි නි
රැක වල් කල කුවෙර අබතුර අඹතුරෙ නි
ලොහොදල් තුළට වැද මීඅඹ ගෙනදෙම් නී
පෙර කල් †රජකු තුටුකළෙ ගිරවෙක කවැ නී

7 හිමසෙල්අතුර, හිමාලය පර්වතාභ්‍යන්තරයෙහි; කෙල ලක්රක්සස්විසිනි, කොටිලක්ෂගණන් රාක්ෂසයන් විසින්; රැක වල්කල, රක්ෂාවරණ කරන ලද්දාවූ; කුවෙර, වෛශ්‍රවණ දිව්‍ය රාජයාගේ; අබතුර අඹතුරෙනි, අභ්‍යන්තර නම් ආම්‍රවෘක්ෂ යෙන්; ලොහොදල්තුළට වැද, ලෝහජාලාභ්‍යන්තරයට පැමිණ; මීඅඹ, මධුරාම්‍රඵලයක්; ගෙනදෙම්නි, ගෙනවුත්

*රකුසන්. †රජෙකු.

දෙමින්; **පෙරසාල්,** පූර්වාඞ්ගයෙහි; රජකූ, තරෙඤ්ඤයකු; තුඹු **කලෙ,** ප්‍රසාදයට පැමිණියේ; නවැති, යුගමත්නු සදෘශවූ; ගිර **වෙන,** කිරපක්ෂියෙක්මය.

බරණැස්නුවර බ්‍රහ්මදත්තනාම් රජ්ජුරුවන්ගේ අග්‍රමහෙසි හට අභ්‍යන්තරනම් අඹතුරෙහි ඵලයක් අනුභවකිරීමට හටගත් දොළදුක සන්සිඳුවනු පිණිස රජ්ජුරුවන් විසින්ම මී වුසු විලඳ කවා සනප්වා යවනලද කිරපක්ෂිතෙම හිමාලය පර්වතාභ්‍යන්තරයෙහි රාක්ෂසයන් විසින් ලොහොදලින්වසා සෑඩිමත් තාපසය කුටවත් ගෙනයාහැකි නොවනයේ ආරක්ෂා කරනු ලබන අභ්‍යන්තරනම් වෛශ්‍රවණයාගේ ආම්‍රවෘක්ෂය සොයා හොසින් රාත්‍රි කාලයෙහි මුරකරුවන් නිදන වේලෙහි සෙමින් සෙමින් ගසට නැංගේය. දැලෙහි බඳිනලද මිණි කිකිණි හඬ ඇසීමෙන් ප්‍රබුද්ධවූ රාක්ෂසයන් ගිරවා අල්වාගෙන මූ මරමුයයිද මූ පලහාකමුයයිද මූ හැරපියමුයයිද නානාවිධියෙන් කරන්නාවූ කථාවන් අසා ගිරාතෙම කියනුයේ තමන් ඇතුරුකරන ස්වාමිහට කාර්‍ය්‍ය පිණිස යෙදුන දූතයා ස්වාමිනු පිණිස මළේවිනම්දු ස්වර්ගයෙහි උපදනේය. මටද ස්වර්ග සුඛය ලැබෙන හෙයින් දූත් මරණයට කැමැත්තේ වෙමියිකිය රාක්ෂසයෝද කරුණු විචාරා පැහැදී එම තුරෙන් තෙලාගන්නා ලද අඹුඵලයක් ගෙනයන්ට සැලැස්වූහ.

8 බඹදත් *රද රදුන්හට විස යෙදූ ස ඳ
එපවත් අසා සෙද සෙබළුන් සමගින ද
මහසත් ගුණෙන් සිරි මහබඹු සඳිස ද
දියසෙන් කෙළේ එක් †කිරිදෙකු !සඳහව ද

8 බඹදත්රද, බ්‍රහ්මදත්ත රාජයා; රදුන්හට, (ඒ සියයක්) මණ්ඩලයන් තසනු පිණිස; විසයෙදූගෙද, (ජයපානයකාරවූයම් වලහා මරන්නට පිණිස) සුරාවෙහි විෂයෙදූ කල්හි; එපවත්, තත් ප්‍රවෘත්තිය; අසා, ශ්‍රවනයකොට; සෙද, සුනසුළුව; සෙදසෙබළුන්, එකිනරානෙවාහනවයන්; සමඟ, [illegible] කරවා; ගුණෙන්, 'දයා දාක්ෂිණ්‍යාදිවූ) ගුණසාදෘශ්‍යයෙන්; සිරි, පරිපූර්ණවූ; මහසත්, මහා බෝධිසත්ත්වවූ; මහබඹුසඳිස, මහාබ්‍රහ්මයා [illegible] තෙම; දියසෙන් කෙළේ, ජනත්සාකතියන් කෙළේ; (තෙවත් විෂ යෙදූ සුරාපැණිබිඳදමා ඔවුන් බියගැන්වීමෙන් යනපතක් සැලැස් වූයේ;) එක්කිරිදෙකුසඳහවෙද, අන්‍යතර කිරපක්ෂියකු නියාවේ.

*රජ රදුන්හට. †කිරිදෙකු.

බ්‍රහ්මදත්තනරේන්ද්‍රයා විසින් කේවට්ට නම් බ්‍රාහ්මණයාගේ බස්ගෙන දඹදිව ඒ සියයක් රජුන් ජීවග්‍රාහයෙන් අල්ලාගෙන මැරීම පිණිස විෂපානයක් යෙදූවිට මහොෂධ පණ්ඩිතයන් විසින් යවනලද ගිරාපොතකයකුගේ මාර්ගයෙන් ඒ බැව් දැනගත් හෙයින් එම දුෂ්ටවූ උපක්‍රමය නැතිකර දමනලදී.

9 එබව සි තා දැන්වන ලෝවැඩ පිණි ස
තරව ප තා නොවමින් මඳකුත් අල ස
ගිරව! මෙ තා සිතවයමින් පිය දන ස
අසව! ඉ තා සනොසින් මකියන මෙබ ස

9 ගිරව! කීරපක්ෂිය! එබව, උක්තප්‍රකාර වෘත්තාන්තය; සිතා, අනුස්මරණයකොට; දැන්වන, මේ වර්තමානකාලයෙහි වන්නාවූ; (වියයුතුවූ) ලෝවැඩ පිණිස, ලොකාභිවෘද්ධියක් සඳහා; තරව, සථිරව; පතා, ප්‍රාර්ථනාකොට; (දැඩිතරව සිතේ තබාගෙන) මඳකුත්, ස්වල්පවශයෙන්වත්; අලස නොවමින්, ආලස්‍යයුක්තවූවෙක් නොවමින්; මෙතා සිත, මේ පුෂ්මත්හුගේ චිත්තයෙහි; පියදනස, ප්‍රියාධ්‍යාසය; වයමින්, වර්ධනය කෙරෙමින්; මකියන, අසමත්හු විසින් ප්‍රකාශකරනු ලබන්නාවූ; මෙබස, මේ වචනයන්; ඉතා සනොසින්, අතිසන්තුෂ්ටියෙන්; අසව! ශ්‍රවණය කරව!

10 හරගිර රසිතු'දුල—දිනිසුරු අලකාපුරයු රු
ප සි ඳු ත රි ඳු මෙන් මුළුලොව නන් බැබ ළි
සානි ඳු සි නි ඳු තුගු කැල්මෙන් වතෝ'ස තෙහෙ ළි
පෙරසිට ඉමුණොපමු—නොවගමු වෙහෙර විසිතු රු
සිර සර *ගැඹුරු ගුණ පිරිසිදු පිළිවෙති න
මනහර මහරු සඟගණ සමග වැජඹෙ න
තෙව ලා රුවනකර උඩුසවි කැරූ රුව ට
අ ල ලා ගැඹුරු පද'රුත් මිණි'ඳෙන ලොව ට
තෙල ලා වදන්සුරු විජසබ නෙරිඳුහ ට
නොවලා හොඹින මෙහසුන් සැලසුරව †තු ට

10 හරගිර: සින්, කෛලාසපර්වත කාන්තියෙන්; උදුල, උදී ප්‍රතවූ; දිනිසුරු, ධනෙශ්වරයාගේ; අලකාපුරපුර, ආලකමන්දානම් රාජධානියමෙන්; බැබළි, භ්‍රාජිතවූද; තරිඳුමෙන්, චන්ද්‍රයාගේ; නිති, අනවරතයෙන්; මුළුලොව, සමස්තලොකයෙහි; පසිඳු, ප්‍රසිද්ධවූ; තරිඳු, තාරෙන්ද්‍රයාගේ; ස [illegible] කැල්මෙන්, ස්නිග්ධවූ ශරීර කාන්තියෙන්; [illegible], එකාලොකවත්කාවූද;

*පැහැසර ඇම. †සිට ඇතම.

**පෙරසිට,** පූර්වකාලයෙහි පටන්; **පෙම්,** ප්‍රියවන්තාවූද; **විසිතුරු,** විචිත්‍රවූද; **පොළොවු,** විශාලවූද; **තොටමුවදොර,** තිවිග්‍රාම විහාරයෙහි; නිරසර, සවිරසාරවූ; **ගැඹුරුගුණ,** ගම්භීරගුණයෙන් හා; **පිරිසිදු පිළිවෙතින,** පරිශුද්ධ ප්‍රතිපත්තියෙන්; **මනහර,** සිත් කලුවූද; **මහරු සඟගණ සමග,** මහාර්ඝ සඞ්ඝ සමූහයා සමගින්; **වැජඹෙන,** විජෘම්භමාණවන්නාවූද; **තෙවළා,** ත්‍රිපිටක ධර්ම නැමැති; **රුවනකර,** රත්නාකරයාගේ; **උඩු,** ඌර්ධ්වස්ථානය; **සවිකර,** අධඃස්ථානස්ථකොට; **රුවට,** ශොභාවත් පරිද්දෙන්; **අලලා,** ආලෝලනයකොට; **ගැඹුරු පදරුණ්,** ගම්භීරපදවූ නැමැති; **මිණ්,** මාණික්‍යයන්; **ලොවට,** ලොකයාට; **දෙන,** ප්‍රදානය කරන්නාවූ; **තෙවළාවදනිසුරු,** ත්‍රිපිටකවාගීශ්වරවූ; **විජ‍බාහුපිරුහට,** විජයබාහු පරිවෙණාධිපති) සර්විරොහතාචාර්යයාණන් වහන්සේට; **තෙවළා,** තෙවළක්වා; **ගොසින්,** ගමනය කොට; **තුට,** සන්තුෂ්ටියෙන්; **මෙහසුන්,** මේ සන්දේශය; **පැළ කරව,** ප්‍රකාශකරන්.

11 එ හ සු න් මතු කියමි බබ ගියසඳ සබ ඳ!
කොපමෙනන් පිළිවිසිත දන විස්මවන ලෙ ද
වෙ සෙ සින් මෙපුර සිරිවණනා මෙබස් සො ඳ
ස නො ඕ න් මිණ් කොඬොල් ලෙස නා ගවන් ස ද

11 **සබඳ!** මිත්‍රය! **එහසුන්,** ඒ සන්දේශය; **මතුකියමි,** මත්තෙහි ප්‍රකාශකරන්නෙමි; **බබගියසඳ,** එහි ගියකල්හි; **කොපමෙනන්,** පුණ්‍යමත්හුගෙන්; **පිළිවිසිත,** විචාරන්නාවූ; **දන,** ජනයා; **විස්මවනලෙස,** විස්මයට පත්වන පරිද්දෙන්; **මෙපුරසිරි,** මේ නගරශ්‍රිය; **වෙසෙසින්,** විශෙෂයෙන්; **වණනා,** වර්ණනාකරන්නාවූ; **සොඳ,** සුන්දරවූ; **මෙබස්,** මේ වක්ෂ්‍යමාන වචනයන්; **මිණ්කොඬොල්ලෙස,** මාණික්‍ය කුණ්ඩලාභරණයන් මෙන්; **තාසවන්,** තාගේ කර්ණයන්හි; **සඳ,** සජ්ජිතකරව.

12 ජ ය ව ද් දන දනුමැති මැතියුන් පව ර
රු පු ම ද් දන *ගජගණසෙන පිරි නිරතු ර
තො ව රද් දන සහමොක් බුති දහම කා ර
ජ ය ව ද් දන සුරවර මෙය දනු ඔතු ර!

12 **ජයවද්දන,** විජයශ්‍රීවර්ධනය කිරීමෙහිලා; **දනුමැති,** ප්‍රඥාවන්තවූ; **පවර,** ශ්‍රෙෂ්ඨවූ; **මැතියුන්,** මන්ත්‍රීන්ගෙන් ගහනවූද; **රුපුමද්දන,** ශත්‍රු මර්දනය කරන්නාවූ; **ගජගණසෙන්,** හස්ත්‍යශ්වසෙනාවන්ගෙන්; **නිරතුර,** නොපරතොව; **පිරි,** පරිපූර්ණවූද; **සග**

*ගජබලසෙන්.

මොක්, ස්වර්ගමොක්ෂවය; **නොවරද්දන**, නොවළකන්නාවූ;(ස්වර්ග මොක්ෂ සම්පත්ති ප්‍රතිලාභය කරන්නාවූ යනු භාවයි) **මුනිඳහම්**, සර්වඥයන්වහන්සේගේ ධර්මයට; **අකර**, ආකරයමාණවූද; **ජය වද්දනපුරවර**, ජයවර්ධන නම් පුරප්‍රවරයතෙම; **මෙය**, මේයයි; මිතුර! මිත්‍රය! දනු ජානනයකර.

“නොවරද්දන සගමොක් මුනිඳහම ක ර”

අකර යනු ආකරයට හෙවත් උත්පත්තිස්ථානයට නමකි. යමක් බහුල වශයෙන් පවති නම් එම ස්ථානයට ආකර-අකර යන වචන ව්‍යවහෘතයි.

ස්වර්ගමොක්ෂ සම්පත් ප්‍රතිලාභයට හෙතු භූත සම්බුද්ධ ධර්මයට ආකරයවැනිවූ යන්නෙන් මේ නගරවරයෙහි බුද්ධභක්ති පරම්වූ ජනයන්ගේ ගහනත්වය නිර්දිෂ්ටයි. මෙහි ජනයෝ බුද්ධ ධර්මය ඉගෙන එහි ප්‍රකාශිත පරිදි සුචරිතයෙහි පිළිපැද්දූහ යනු සූචිතයි.

13 බ ඹා පළමුවෙන් ලොව පමණ නොදැන මා
අ ඹා තුඹු සක්වළ ගිරිසෙස මෙතනා මා
ප ඹා විහිදී පවුරට නත දරණ යො මා
නොබා කියමි නොසඳ සතනමක් න මා

13 **බඹා**, මහාබ්‍රහ්මයා විසින්; **පළමුවෙන්**, ප්‍රථමයෙන් හෙවත් ලොකනිර්මාණය කාරණ සමයෙහි; **ලොව**, ලොකය පිළිබඳවූ; **පමණ**, ප්‍රමාණය; **නොදැනමා**, ජානනයනොකොටම; **මෙතනමා**, මේ ස්ථානයෙහි හෙවත් මේ ජයවර්ධන පුරප්‍රවරයෙහිම; **අඹාතුඹු**, නිර්මාණයකොට ස්ථාපිතවූ; සක්වළගිරිසෙ, චක්‍රවාට පර්වතය සදෘශවූද; **විහිදීසබා**, විස්තීර්ණප්‍රභා ඇත්තාවූද; **පවුරට**, ප්‍රාකාරයට; **නත**, අනන්තනම් නාගරාජයාගේ; **දරණ**, භොගාවලිය; **යොමා**, යොමුකොට හෙවත් අභිමුඛයෙහි ස්ථාපිත කොට; **සන්නමක්**, ස්වල්පයක්; **නොසඳිද**, සදෘශනොවේදැයි; **නමා**, නමන්; **නොබා**, නිර්භීතව; **කියම**, ප්‍රකාශකෙරෙමි.

බඹා පළමුවෙන් ලොව පමණ නොදැන මා
අඹා තුඹු සක්වළ ගිරිසෙස මෙතනා මා

ලොකනිර්මාණ කාලයෙහි බ්‍රහ්මයා ලොක ප්‍රමාණය නොදැන මේ ජයවර්ධන පුරයෙහි මවාතුබූ චක්‍රවාට පර්වතය බඳුවූ ප්‍රාකාර යයි කීමෙන් චක්‍රවාට පර්වතයසේ ප්‍රාකාරයාගේ විසම්ත උත්තුඞ්ග සවිස්තාර භාවය සූචිතය. ලො ප්‍රමාණය නොදැන මවනලදයයි කීමෙන් පෘථිවි අන්තභාගයෙහි මැවිය යුතු චක්‍රවාට පර්වතය මේ ස්ථානයෙහි මැවූයේ යානදූහ.

14 එන සඳ පෙර මෙපුර කිරිසිඳු දුව තු මූව
සිඳු රද විසින් ඈ රැකවරණට කැ මූව
සිරි සිඳ එවු සිඳ කඩ කොව නොව ප මූව
ඇම සඳ සිරුණු දිය'ගල ලොබවෙසි දු මූව

14 පෙර, පසියෙහි; කිරිසිඳුදුව, ශ්‍රීකාන්තාව; මෙපුර, මේ නගරයට; එනසඳ, ආගමනයකරනකල්හි; තමූව, සන්තුෂ්ටියට පැමිණ; සිඳුරද වසින්, සමුද්‍රලක්‍ෂණ රාජයා විසින්; ඈය, ඒ ශ්‍රීකාන්තාවගේ; රැකවරණව, රක්‍ෂාවරණය පිණිස; සිරිසිඳ, පරිච්ඡේදකොට; (වෙන්කොට) කැමූවඑව, සමග එවනලද්දාවූ; සිඳු කඩකොව, සමුද්‍ර ඛණ්ඩයක්ය හෙවත් සමුද්‍රයාගේ එක්භාගයක් මෙන්; පමූව නොව, ඌනනොව හෙවත් අතිවිශාලව; ඇමසඳ, සැමදිනයන්හි; සිරුණු, පරිපූර්ණවූ; දිය අගල, ජලපරිඛාව; දු මූව, දශීතයකලහොත්; ලොබවෙසි, ලොභයවේ.

කිරිසිඳුදුවයනු ශ්‍රීකාන්තාවට නමකි. විෂ්ණු දිව්‍යරාජයා ක්‍ෂීර සාගරය අලළනකල්හි ශ්‍රීකාන්තාව ආදී වස්තු තෙළෙසක් පහළ විය හෙවත් ප්‍රාදුර්භූතවිය යනු පුරාණොක්තියි. ශිවමහා පුරාණ යෙහි:-

ක්‍ෂීරාබ්ධෞ මථ්‍යමානෙතු - ශ්‍රීඃ සර්වලෝක මහෙශ්වරී
සමුද්භූතා සමුද්‍රාච්ච - භාගුපුත්‍රීහරිප්‍රියා

ධන්වන්තරීඃ ශශාඞ්කශ්ච - පාරිජාතො මහාද්‍රුමඃ
උච්චෛශ්ශ්‍රවාශ්චතුරගො - ගජඓරාවණඃ තථා

සුරාහරිධනුශ්ශංඛො - ගාවඃ කාමදුඝාතතඃ
ශොඩශතුභාරථ්‍යාමීෂිශෙශ්වච - තථාපිශූක්‍ෂමෙවච

පුනශ්චමථ්‍යමානෙතු - කාලකූටං මහාවිෂං
ප්‍රභූතානාලසඤ්ජාතං - සුරාසුරභයාවහං. යනුයි.

ක්‍ෂීරාබ්ධෞ, කිරිමුහුද; මථ්‍යමානෙතු, අලළනකල්හි; සර්ව ලෝකමහෙශ්වරී, දෙව්ලෝමහෙශ්වරීවූ; භාගුපුත්‍රී, භෘගුහුගේ පුත්‍රිය; හරිප්‍රියා, විෂ්ණුහුගේ භාර්යාවූ; ශ්‍රීඃ, ශ්‍රී විතොමෝ; සමුද්‍රාත්, මහදින්; සමුද්භූතා, පහළවිය; ධන්වන්තරීඃ, ධන්වන්තරී නම් සාමිතෙමේද; ශශාඞ්කශ්ච, චන්ද්‍රතෙමේද; පාරිජාතඃ, පාරිජාත නම්; මහාද්‍රුමඃ, මහාකල්පවෘක්‍ෂයද; උච්චෛශ්ශ්‍රවාඃ, උච්චෛශ්ශ්‍රවස් නම්; තුරඟශ්ච, අසුද; තථා, එසේම; ඓරාවණඃ ගජඃ, ඓරාවණ නම් ඇත්තෙමේද; සුරා, සුරානම් දිව්‍යාඞ්ගනාවද; හරිධනුඃ;

දෙවි දුන්නද; ශම්භුහු, ඊශ්වරයාගේ; භාවූ, ගොනුද; නනා, එයින් මතු; කාමදුඝා, සුරභිධේනුවද; කෞස්තුභාඛ්‍යා, කොතඹු නම්; මණිශ්ච එව, මිණද; තථා, එසේම; පියූෂඑවච, අමාද පහ ලවිය; පුනශ්ච, නැවතත්; මථ්‍යමානෙතු, අලලනකල්හි; යුග න්තානලහම්, ප්‍රලයකාලයෙහි වන් ගිය වැනි; සුරාසුරභයාවහම්, දෙවසුරයන්ට භයඑලවන්නාවූ; කාලකූටම්, හලාහලනම්; මහා විෂං, මහාවිෂය; ජාතම්, වීය.

මෙහිදී අගල සමුද්‍ර ඛණ්ඩයක් මෙතැයි කීමෙන් දිය අගල පිළිබඳ විශාලත්වය නිර්දිෂ්ටයි

15 සු වි ස ල් අගල දියතුල පෙණෙනා *මනහ ර
ර ළ වු ල් සසල දිවිසඳ මඬල †පැහැස ර
තුඟු තු ල් පවුර හිස පැනසනු බැරිව හැ ර
ර ස ත ල් පිවිස හැමවර යනු වැනි මිතු ර

15 සුවිසල්, අතිවිශාලවූ; මනහර, මනොඥවූ; අගලදියතුල, පරිඛාජලාභ්‍යන්තරයෙහි; පෙණෙනා, දෘශ්‍යමානවන්නාවූද; රළ වුල්, තරඞ්ගපඞ්ක්තියෙන් ආකුලිතවූ; සසල, චලිතවන්නාවූද; පැහැසර, ප්‍රභාසාරවූද; දිවිසඳමඬල, චන්ද්‍රසූර්‍ය්‍යමණ්ඩලවය;(කො යේද?) තුඟු, උත්තුඞ්ගවූ; තුල්, විශාලවූ; පවුර, ප්‍රාකාරයාගේ; හිස, ශීර්ෂය; පැනසනුබැරුව උල්ලඞ්ඝනයකොට යනු නොහැ කිව; හැර, (ස්වාභිෂ්ටආකාශප්‍රයාණය) හැරපියා; රසතල්, රසාත ලයට හෙවත් නාගභවනයට; පිවිස, ප්‍රවිෂ්ටව; හැමවර, නිරන්තර යෙන්; මමිතුර! මාගේ මිත්‍රය! යනු වැනි ප්‍රයාණයකරයි හඟිමි.

අතිවිශාල ප්‍රාකාරයාගේ ශීර්ෂය පැනයනු නොහැකිව චන්ද්‍ර සූර්‍ය්‍ය දෙදෙනා රසාතලයෙන් යන්නාක් වැනියයි කීමෙන් ප්‍රාකා රයාගේ අති උත්තුඞ්ග භාවය හඟවත්.

ප්‍රාකාරයාගේ අත්‍යන්තයෙන් උත්තුඞ්ග භාවය හෙවත් විශේෂ වශයෙන් උසස්බව හා පරිඛා ගම්භීරත්වය යන ලක්ෂණ වය මෙහි නිර්දිෂ්ටයි මෙසේවන ප්‍රාකාර හා පරිඛා කවිසමයෙහි අතිශයින් වර්ණිතයහයි දතයුතුයි.

16 ස ද දිවිනමන් රහුමුව පත්වූ සඳ සි
කි ද ගන අඳර එළි පරකුව රැ දෙමව සි
පෑ ද සිඛ කිරණ පටගිය වැනි†† පන දෙමහ සි
සො ද රන්දිදී දද බාලනා** පුරවරෙ සි

---

*පැහැසර. †හැමවර. ††සිරාමෙණ්. **බබලති.

16 පුරවරෙහි, (එම ජයවර්ධන) පුරප්‍රවරයෙහි; බබළන, භ්‍රාජමානවන්නාවූද; මනොද, මනඃකල්‍යවූද; රන්රිදීදද, සවර්ණ රජත ධවජ; (කෙසේද? සඳහිරු, චන්ද්‍රසූර්‍ය්‍යී දෙදෙනා; රහුමුව, රාහුග්‍රහයාගේ මුඛයට; පත්වූසෙයදෙයි, ප්‍රවිෂ්ටවූකල්හි; ගනඳුර, ඝනාන්ධකාරය; බිඳ, භග්නකොටලා; රෑදවෙහි, රාත්‍රියෙහි හා දිවාලයෙහි; එළිකරනුව, ආලොක පතුරුවන සඳහා; හිසකිරණ පෙම, සවකීය රශ්මි ලක්ෂණ වස්ත්‍රය; පහළගෙහි, ප්‍රාසාදග්‍රයෙහි; බැඳ, බන්ධනයකොට තබා; ගියවැනි, ප්‍රයාණය කළයි හඟිමි.

ජයවර්ධන පුරයෙහි භ්‍රාජමානවූ මනොඥ සවර්ණ රජත ධවජ පඞ්ක්තිය; චන්ද්‍රසූර්‍ය්‍යී දෙදෙනාගේ රශ්මිකදම්බය සෙයින් ඝනාන්ධකාර විධ්වංශනකොට බැබළිබැව් ප්‍රකාශිතයි.

17 හ ය කු ර ග සි න් නැගි රෙණුසින් ගිවි අඹ ර
ග ජ ස න් ත ලි න් එන පවනින් යුත් මෙපු ර
කෙළිසන් තොසින් රැඳි සකලදුන්හට නිතො ර
සැ ඩ ක ර ර සි න් සැඩගිමගින් දුක් කව ර

17 හය, සෙන්ධවයන්ගේ; කුරගසින්, ඛුරසම්ඝණය හෙතු කොටගෙන; ගිවි අඹර, උස්වූ ආකාශයට; නැගී, උද්ගතවූ; රෙණුසින්, රජො රාශියෙන්ද; ගජ, හස්ති රාජයන්ගේ; සන් තලින්, කණ්තාලය හෙතුකොටගෙන; එන, හමන්නාවූ; පවනින්, මාරුතයෙන්ද; යුත්, යුක්තවූ; මෙපුර, මේ ජයවර්ධන පුරප්‍රවර යෙහි; නිතොර, නිරන්තරයෙන්; කෙළිසන්තොසින්, ක්‍රීඩා සම්භව තුෂ්ටියෙන්; රැඳි, රඤ්ජිතවූ; සකලදුන්හට, සකලජන යන්ට; සැඩකර, චණ්ඩ රශ්මිහුගේ; සූර්‍ය්‍යයාගේ; රසින්, රශ්මිය කාරණකොටගෙනද; සැඩ, චණ්ඩවූ; ගිමනින්, ග්‍රීෂ්මයකාරණ කොටගෙනද; කවර, කිනම් ප්‍රකාරවූ; දුක්, දුඃඛයෙ වේද, (නොවේමැයි.)

අශ්වයන්ගේ ඛුරසම්ඝණයෙන් උද්ගත දූවිල්ල අහසට නැගී මෙන් හිරුරැස් වැසිය. හස්තීන්ගේ කන්තලින් පවන්ගැසීමෙන් ග්‍රීෂ්මය නැසෙයි. ඒ හෙයින් මේ නගරවරයෙහි කිසිවෙකුටත් හිරු රැසින් හා ග්‍රීෂ්මයෙන් පීඩාවක් නොවීය යනු භාවයි.

18 අ ගි ල් කපුරු දුම්කඳ පැතිරී සිහිනු ළු
ව පු ල් [illegible] ළු
ල ක ල් [illegible] ළු
සි ස ල් [illegible] ළු

18 අගිල්කපුරුදුම්නඳ- අගිල්, අගරුය; කපුරු, කර්පූරය යන මොවුන්ගේ; දුම්නඳ, ධූමස්කන්ධය; පැතිරි, විස්තීර්ණව; පිහිකුළු, වැසුම්ලද්දාවූ; විපුල්, මහත්වූ; මෙපුර, මේ පුරප්‍රවරයෙහි; රන්දෙදෙන්, ස්වර්ණධ්වජයන්ගෙන් උදුල, උජ්ජ්වලවූ; පහකුළු, ප්‍රාසාදකූට පඞ්ක්තිය (කොත්දූ) ලකල්, මනොඥවූ; සුරඅඹසිදුලිය, සුරාඞ්ගනාවන් හා සිද්ධාඞ්ගනාවන් විසින් කෙළි, ක්‍රීඩාකරන ලද්දාවූ; කුළුසිරස, කූටශිඛී ඇති; සියල්හිමව් ගිරිකුළු, නිරවශේෂ හිමාලය පර්වත කූටය පිළිබඳවූ; ලකුළු, විචිත්‍රවූ; සිරි, ශෝභාවිලාසය; පැයි, ප්‍රකාශකළා

අගිල්කපුරුදුම් පැතිර මෙන් ස්වර්ණධ්වජ පඞ්ක්තියෙන් බබලන ප්‍රාසාදකූටයෝ සුරසිද්ධාඞ්ගනාවන් ක්‍රීඩාකරන හිමාලය පර්වතය වැනියයි කීමෙන් ස්වර්ණධ්වජයෝ සුරසිද්ධාඞ්ගනාවන්ටද ප්‍රාසාද හිමාලය පර්වතයටද උපමිතයහ.

19 මෙපුර පහණ දිලි රන්කැරලි වසමි නි
පැතිර උලැඟි අරාන්පටහණ කුරගසි නි
අඹර ඇඹිරි දදතින් පිසසනු සෙවැ නි
නිතොර සොඳුරු ගුරුපිළියම් කරනවැ නි

19 මෙපුර, මේ ජයවර්ධන පුරප්‍රවරයෙහි; (විද්‍යමානවූ) පහණ, ප්‍රාසාද ශිඛීයන්හි; දිලි, භ්‍රාජමානවන්නාවූ; රන්කැරලි, සෞවර්ණාඞ්ගනන්; වසමිනි, ප්‍රතිවර්ජනා කෙරෙමින්; හස, අශ්වයන්ගේ; කුරගසිනි, ඛුරඝට්ටණයෙන්; පැතිර, ප්‍රස්තරිතව; උලැඟි, උල්ලඞ්ඝිතවූ හෙවත් අහසට නංගාවූ; අරාන්පට, රජස් පටලය; අඹර, ආකාශයෙහි; ඇඹිරි, ආවෘතව හෙවත් සාරසෑවෙන්නාවූද; දදතින්, ධ්වජ නැමැති හස්තයෙන්; පිසසනු, පරිමාර්ජනය කිරීම, සෙවැනි, සෙබඳුද? නිතොර, නිරන්තරයෙන්; ගුරුපිළියම් කරනවැනි, ගෞරික පරිකර්ම කිරීමක් වැන්නේය.

ප්‍රාසාද මස්තකයෙහිවූ ස්වර්ණ ශෘඞ්ගයෝ දූවිලියෙන් වැසුනාහු වර්ණය නොදක්වති. එහිම බඳනාලද ධ්වජයන් ශෘඞ්ගයන්හි වැදීමෙන් දූවිල්ල පිසහාමෙන් පෙරටැවති වර්ණය පැනේ. එහි ධ්වජයන්කරන ගෞරික කර්මයක් වැනියයි උත්ප්‍රේක්ෂාකළහ.

20 සොබන කොබෙයක් පැසැළිණි බිඟිනි මහන ර
සෙනෙන උදය දිව්‍යසුරු ඔබල පැහැස ර
රදන මෙසුරඳර කුලඟන මුවනඹ ර
බලන වැන්න වැද වැද සිව මැඳුරු තු ර

20 **සොබන**, ශොභනවූ; **නොයෙක්පැහැ**, නානාප්‍රභායෙන්; **මනහර**, (දුටුවන්ගේ) සිත් පැහැරගන්නාවූ; **මිණිබිතිනි**, මාණික්‍යමය භිත්තියෙහි; **පෙනෙණ**, දෘශ්‍යමානවූ; **පැහැසර** ප්‍රභාසාරවූ; **උදය දිවසුර මඩල**, උදීයතසූර්‍ය්‍යමණ්ඩලයනෙව; (කෙසේද?) **මැඳරකුරු**, මන්දිරාභ්‍යන්තරයෙහි; **වැදවැද** ඩිව, ප්‍රවිෂ්ටවෙමින් සිටිනව; **පෙසරවර**, මේ පුරප්‍රවරයෙහි; **රඳන**, රඤ්ජමානවන්නාවූ; **කුලඟනා**, කුලාඞ්ගනාවන්ගේ; **මුවනඹර**, මුඛලක්ෂණ නාම්රසයන්ද;බලනවැන්න, සිරිපැණනකරයි හගිමි.

**සොබන නොයෙක් පැහැමිණි බිතින් මනහ ර**
**පෙනෙන උදය දිවසුරු මඩල පැහැය . ර**

මේ නගරවරයෙහි සාදනලද ගෘහයන්ගේ භිත්තීහු මාණික්‍යමය වෙති. ඒ හෙයින්ම සූර්‍ය්‍යබිම්බය ඒ ඒ භිත්තිවල සැම දවස් හිඳදෘශ්‍යමානවන්නේය එමතින් ප්‍රකාශවන්නේ මෙපුරවරයෙහි සම්පත්තීන්ගේ මහත්බවයි;

**21 සි ස ල් සිරින් පිරිමෙහි පහ කැරලි අ ග**
**තු මු ල් සුනිල් මිණි පැහැ පැතිර සුරම ග**
**අ ස ල් වෙමින් පිවිසඳුහට පලඟ ර . ග**
**සෙවෙල් ලෙසින් †දිසිවිය ගොස් අහස් ග ග**

21 **සිසල්සිරින්**, සමස්ත ශ්‍රීකාරයෙන්; **පිරි**, පරිපූර්ණවූ; **මෙහි**, මේ ජයවර්ධන පුරප්‍රවරයෙහි; (භ්‍රජමානවූ) **පහ**, ප්‍රාසාදයන්ගේ; **කැරලිඅග**, ශාඛාග්‍රයන්හි; **තුමුල්**. මහත්වූ; **සුනිල්මිණි**. අති නීල මැණික්‍යයන්ගේ; **පැහැ**, කාන්තිස්කන්ධය; **සුරමග**, ආකාශ යෙහි; **පැතිර**, ප්‍රසාරිතව; **පිවිසඳුහට**, චන්ද්‍රසූර්‍ය්‍ය දෙදෙනාට; **අසල්**, ආසන්නයෙහි; **පලගරගමෙමින්**, රාහුග්‍රහයා හා සදෘශ වෙමින් නොහොත් **අසල්වෙමින්**, ආසන්නවෙමින්; **පලඟරග**, රාහුග්‍රහයා සදෘශව; **අහස්ගඟ**, ආකාශනදියකරා; **ගොස්**, ප්‍රයාණයකොට; **සෙවෙල්ලෙසින්**, ශෛවාලවිලාසයෙන්, **දිසිවිය**, දෘශ්‍යමානවිය.

ප්‍රාසාද ශාඛාග්‍රයන්හි බඳනාලද මහත්වූ නීලමාණික්‍යයාගේ කාන්තිය අහස්කුස පැතිර චන්ද්‍රසූර්‍ය්‍ය දෙදෙනාට ලංව රාහු ග්‍රහයාගේ අහස් ගඟෙහි ශෛවාල විලාසය දැක්විය යනු භාවයි. මාණික්‍ය කාන්තියෙන් චන්ද්‍රසූර්‍ය්‍ය දෙදෙනා මුවනගළු බව හා, ආකාශ ගංගා ජලය මතුයෙහි පැතිරයිය වත් ප්‍රකාශකිරීමෙන් ප්‍රාසාදයන් සඳ හිරු දෙදෙනාට ලංවන ප්‍රමාණය ශේ උස්ව ආකාශ ගංගාවටත් ඉහලින් (උස්ව) පැවසි බැව් කියැයි යකි.

---

†දිස්නෙය. සමහර

22 *කනා පබලු මුතුමිණි අබරණ පැළ ද
පිනා සඳලු වල සිටි පුරගණෝ ල ද
මනා ලපලු පත්මල් පලගෙන නොම ද
කනා ලියන් වැනි රැඳි රන්ගිරි බෙස ද

22. කනාපබලු මුතුමිණි අබරණ-කනා, කනකය; පබලු, ප්‍රවාලය; මුතු, මුක්තය; මිණි, මාණික්‍යය; යන මෙතෙක් දෙයින් කරන ලද්දාවූ; අබරණ, ආභරණයන්; පැළඳ, පිළඬනයකොට; පිනා, පිහිතව හෙවත් ප්‍රීතියෙන් යුක්තව; සඳලුවල, චන්ද්‍රිකාශාලාවන්හි; සිටි, සිටිතවූ; ලඳපුරගනෝ, තරුණපුරස්ත්‍රීහු; මනා, යහපත්වූ; ලපලු, බාලපල්ලවයන්ද; පත්, පත්‍රයන්ද; මල්, පුෂ්පයන්ද; ඵල, ඵලයන්ද; ගෙන, ග්‍රහණයකොට; රන්ගිරිබෙයද, ස්වර්ණපර්වතයාගේ නිම්නස්ථානයෙහි; රැඳි, රඤ්ජිතවූ; නොමද, අමන්දවූ; කනාලියන්වැනි, කනකලතාවන් වන්නෝය.

කනක, ප්‍රවාල, මුක්තා, මාණික්‍යාභරණ පිළඬනය කළාවූ පුරාඞ්ගනාවෝ ලපලු, පත්, මල්, පල යන මොවුන් ගත්තාවූ කනකලතාවන් වැන්නාහයි ක්‍රමෙන් කනකාභරණ බාල පල්ලවයන්ටද, ප්‍රවාලාභරණ පත්‍රයන්ටද; මුක්තාභරණ පුෂ්පයන්ටද, මාණික්‍යාභරණ ඵලයන්ටද; උපමිතකොට පුරාඞ්ගනාවෝ කනකලතාවන්ට උපමිත කරනලදහ.

23 පිය කරු තෙනෙන් පැරදි පිවිසි වන වි ල
පිවි තුරු හසුන් එනලෙස යලි ගෙදිගු වි ල
විසි තුරු මෙපුරවර අඟනෝ වෙමින් ලො ල
පිය යුරු පටින් බැද † වසතී සිතේ බ ල

23 පියකරු, මනඃකාන්තවූ; තෙනෙන්, පයොධරයන් හේතුකොටගෙන; පැරදි, පරාජිතව; වනවිල, වනතටාකයට; පිවිසි, ලජ්ජායෙන් ප්‍රවිෂ්ටවූ; පිවිතුරු, පවිත්‍රවූ; හසුන්, හංසයන්, යලි, නැවත; ගෙදිගුවිල, ගෘහදීර්ඝිකාතටාගයන්ට; එනලෙස, ආගමනය කරන පරිද්දෙන්; විසිතුරු, විචිත්‍රවූ හෙවත් රූපසෞන්දර්‍ය්‍යශ්‍රීයෙන් භ්‍රාජමානවූ; මෙපුරවර අඟනෝ, මේ පුරප්‍රවරයෙහිවූ කාන්තාවෝ; ලොලවෙමින්, ලෞල්‍යයුක්තවෙමින් හෙවත් ඇලුම් වඩමින්; පියයුරු, පයොධරයන්; පටින්, පයොධරපට්ටයෙන්; බැද නොපෙණෙන ලෙස හා නොසැලෙන ලෙස) බන්ධනය කොට; වසතී, වසන්නාහයි; සිතේ, හැගේ; බල, (මේ කාරණය) බැලුව මැන.

---

* කනා=හැම. † වසතැයි.

පයෝධරයන්ට හංසයන් සමාන කිරීම කවිසමයාගත සම්මතයකි. හංසයෝ පරිපූර්ණ ශරීර ඇත්තෝය. හෙවත් ආරෝහ පරිණාහනාදි ලක්ෂණයෙන් සම්පූර්ණයහ. එසේවූ හංසයන්ට අධිකකොට පයෝධරයෝ මෙහිදී උපමිත කරනු ලැබෙති. එම පයෝධරයන්ට පැරදී වනතටාකයන්ට ගිය හංසයන් නැවත ගෙදිගුවිල්කරාම එනලෙස පයෝධරයන් පයෝධරපට්ටයෙන් බඳින්නැයි කීමෙන් හංසයන්ගේ පැරදීමට හෙතුභූත ගුණවත් පයෝධරයන් නොපෙණී නොසැලී සිටීමට වස්ත්‍රයෙන් බැඳ තැබීම හෙතුකොටගෙන තමන්ගේ සතුරන්ට ඉදිරියට නොඑන සේ වසාතිබීමෙන් සතුටුවූ හංසයෝ නැවත තිහීයව නුවරතුල ගෘහාභ්‍යන්තරයෙහිවූ විල්කරා පැමිණ සතුටින් ස්ත්‍රීන්ගේ අභිමුඛයෙහිම ක්‍රීඩාකෙරෙති යනු ප්‍රතීය මානයි.

24 කලා සපිරි සිසිවන මන කලා වන්
නිලා තිබෙන බැම ඉඳුදුනු පිලා වන්
දුලා තනන තන රණහස පිලා වන්
බලා පියැද යනු බැරි පුර කලා වන්

24. කලාසපිරි, (ෂොඩශ) කාලපරිපූර්ණවූ; සිසි, චන්ද්‍රයාට බඳුවූ; වන, වක්ත්‍රයෙන්; මනකලාවන්, මනඃ කාන්තවන්නාවූද; පිලාවන්, උත්පලාවිතවන්නාවූ හෙවත් නැම් මතුවී දිලෙන්නාවූ; ඉඳුදුනු, ඉන්ද්‍රචාප සදෘශවූ; නිලාතිබෙනබැම, නීලායමානව පවත්නා භ්‍රෑයුග්ම ඇත්තාවූද; රණහස, ස්වර්ණ හංසයන් සෙයින්; පිලාවන්, උද්ගතවන්නාවූ හෙවත් උන්නතවූ; තනන, තිතියෙන් නාවූ; (කම්පිතවන්නාවූ) තන, පයෝධරයෙන්; දුලා, ජ්වලිතවූද; (ශොභාවෙන් යුක්තවූද) පුරකලාවන්, පුරප්‍රවරයෙහිවූ අඞ්ගනාවන්; බලා, නිරීක්ෂණයකොට; පියැද, පාදනික්ෂේපණයකොට; යනු, ප්‍රයාණය කිරීම; බැරි, භාරයි.

“කලා සපිරි සිසිවන මන කලා වන්”

දහසය කලාවකින් සම්පූර්ණවූවිට චන්ද්‍රයා ශොභාසම්පන්නව ගගනතලයේ බබලයි. අමාවක දිනයෙහි පටන් පුරපසළොස්වක පොහෝදින දක්වා අතර පැවති පසළොස් දින අවසන්වී දහසය වෙනි දිනට කලා දහසයෙන්යුක්තව නිර්මල චන්ද්‍රමණ්ඩලය සම්පූර්ණවේ. අමාවක හෙවත් මාසේ පෝය පසුවූදිනට පුරපෑලවිය, දියවක, තියවක, ජලවක, විසේනිය, සටවක, සතවක, අටවක, නවවක, දසවක, එකොළොස්වක, දෙළොස්වක, තෙළෙස්වක, තුදුස්වක, පසළොස්වක, කියා තිථි පඞ්ක්තිය ජ්‍යෝතිශ්ශාස්ත්‍රානු

කුලව යෙදෙත්. මේ පුණුරුසි පොහෝදින සොළොස්කලා පරිපූර්ණව සහස්‍රරශ්මි පතුරුවමින් නිර්මල චන්‍ද්‍රයා ගගන තලයේ උදවනවිට දකින ජනයෝ අතිප්‍රශන්නභාවයට පැමිණෙති. ප්‍රියකරුකාන්තාවන්ගේ මුහුණුද එම චන්‍ද්‍රමණ්ඩලයට උපමාකිරීම කවි සමයාගත ධර්මතායි,

පුරපසළොස්වක පොහෝදින පටන් අමාවක පොහෝදින දක්වා අතර ව්‍යවහාරවන යථොක්ත තිථි පඞ්ක්තියට අවපෑලවිය දියවක, තියවක, ජලවක, විසේතිය සටවක, සතවක, අටවක, නවවක, දසවක, එකොළොස්වක, දොළොස්වක, තෙළොස්වක, තුදුස්වක, අමාවක කියා පිළිවෙළින් ව්‍යවහාරවෙත්.

25 රොදක් කන අලක මුතුපට ගොතා බැ ඳ
සඳක් බඳු වුවන මදහස යොදා න ඳ
මදක් මතු මහල සිටි එළිපෙනී සෙ* ඳ
උදක් සුර'ගනන් වැනි පුරඟනෝ ළ ඳ

25 අලකරොද, අලකාවලිය හෙවත් කියඹුවැල; මුතුපට, මුක්තාවලිය සමගින්; ගොතා, ග්‍රන්ථනයකොට; කනඅක් කර්ණාන්තයෙහි; බැඳ, බන්ධනයකොට; සඳක්බඳු, චන්ද්‍රයා හා එක්වැනිවූ; වුවන, වක්ත්‍රය; මඳහස, මන්දහාස්‍යය හා; නඳ, සන්තොෂයෙන්; යොදා, යුක්තකොට; (සිනාමුසු මුහුණින් යුක්තව යනු භාවයි) මතුමහල, ප්‍රාසාද පෘෂ්ඨයෙහි; මඳක්, අඹියක්; සෙද, ශීඝ්‍රව; එළි, බාහිරයට; පෙනිසිටි, දෘශ්‍යමානව සිටිතවූ; ළඳ, තරුණවූ; පුරඟ නෝ, පුරාඞ්ගනාවෝ; උදක්, අත්‍යර්ථයෙන්; සුරඟනන්වැනි, සුරාඞ්ගනාවන් වැන්නෝය. -

අලකරොද හෙවත් අලකාවලිය යනු කියඹුවැලට නමකි. කියඹුවැල නම් ස්ත්‍රීන්ගේ තුප්පයයි හෙවත් බඳිනු ලබන කෙස රචනායයි දතයුතුයි.

26 වෙරළ ඉගිල තුළ රළ වැළ ලෙස'උපෙල ළ
නෑබළ පටල පෙළ† ලෙල වමිනි කෙළ කෙ ළ
සැරළ සොරළ මොළ බල දළ දප පහ ළ
පුවළ ¶සිහළ බළ මුළු බල නිති ඔස ළ

6. වෙරළ, සමුද්‍රසීමාව; ඉගිල, උල්ලඞ්ඝනයකොට; හෙවත් පැනගෙන; උතුළ, ඉතිරී ගියාවූ; රළවැළලෙස, තරඞ්ගාවලිය සෙයින්; උලෙළ, චඤ්චලවූද; නෑබළ, මගන්වූද; පටලපෙළ,එ ගම්

* සොඳ-ඇතැම්. † මබලපෙල ¶සිහලබලමුළුබල-වැඩියක්.

ආවධ පඩක්තින්; හෙවත් සරවාරණ පළිහයන්; ලෙලවමිනි, ලලිතකොරමින්; කෙළෙකළ, ක්‍රීඩනයකොට කොට; මොළ, වණ්ඩවූ; කරළුකොරළු, කාරලුහෙවරලුයොධයන්ගේ, දළදප, දෑස්වූ දපිය; පහළු, පහනකළාවූද; පුවළු, පෞඪවූද; හෙවත් විස්තීර්ණවූද; නිනිඹසල, නිරන්තරයෙන් රාශිභූතවූද; සිහළබළමුළු, සෛංහලීය හට සමූහයා; බල, නිරීක්ෂණයකරව.

“පටල” යනු සරවාරණ පලිහයට නමකි. එනම් ඊවලක්වන ලොහෝමය ද්‍රව්‍යයකි.

**27 මහ සෙන් විකුම්සර – මහසෙන් නිතොර රඳනා**
**වෙසෙසින් සියල් ඉසුරෙන් – පිරි සක්පුරෙව මෙපුරේ.**

27. මහසෙන්, මහාසෙන දිව්‍යපුත්‍රයාට බඳුවූ; විකුම්සර, වික්‍රමයෙන් සාරවූ; මහසෙන්, මහත්වූ සේනාව; නිතොර, නිරන්තරයෙන්; රඳනා, රඤ්ජමානවන්නාවූද; වෙසෙසින්, විශෙෂයෙන්; සියල්ඉසුරෙන්, සකලෛශ්වර්‍ය්‍යයෙන්; පිරි, පරිපූර්ණවූද; සක්පුරෙව්, ශක්‍රපුරය බඳුවූද; මෙපුරේ, මේ ජයවර්ධිත පුරප්‍රවර වෙයා:—

“ මහසෙන් විකුම්සර ”

මහාසෙන දිව්‍යපුත්‍රයානම් ස්කන්ධදෙවියා හෙවත් කතරගම දෙවියාවේ. ඔහුට මහත්වූ දිව්‍යසේනාවක් පරිවාරවශයෙන් යෙදී සිටින හෙයින් මහසෙන්යයි කියනු ලැබේ.

**28 පවර ඉසුරු පරසිඳු දම්බා — විරිඳු**
**විරිඳු නිරිඳු මතගජ කුම්බා — මිගිඳු**
**සතත සුසිරි නය නොකලම්බා — පුරුදු**
**වැජඹී සොඳුරු සිරි පැරකුම්බා — නිරිඳු**

28. දම්බාවිරුදු, ජම්භශත්‍රුහට සදෘශවූ හෙවත් ජම්භභෙදීවූ ශක්‍රයාට සම්වූ; පවරඉසුරු, ප්‍රවරෛශ්වර්‍ය්‍යසාරයෙන්, පරසිඳු, ප්‍රසිද්ධවූද; (කීර්තිමත්වූද) මිරිදුනිරිදු, ශත්‍රුරාජයන් නැමැති, මතගජ, මත්තගජේන්ද්‍රයන්ගේ; කුම්බා, කුම්භයන් (විදාරණයට;) මිගිඳු, මෘගරාජයකු හා සදෘශවූද; සතත, නිරන්තරයෙන්; සුසිරිනය, සුචරිතපථය හා රාජනීතික්‍රමය; නොකලම්බා, ක්ෂොභ නොකොට හෙවත් භෙදනොකොට; පුරුදු, පරිචිතවූද; සොඳුරු, සුන්දරවූද; සිරිපැරකුම්බා නිරිඳු, ශ්‍රී පරාක්‍රමබාහු නරෙන්ද්‍රතෙම වැජඹී, ජෘම්භමාණවේ.

"දම්බාවිරිදු යනු" ශක්‍රයාට නමකි. ජම්භනම් අසුරයාට ශත්‍රුවූ හෙයිනි ජම්භනම් අසුරයාවනාහි අධිකබලසම්පන්නව ශක්‍රයා සහිත දෙවපිරිස නසනු සඳහා යුද්දයට සැරසීවන්විට ශක්‍රයාවිසින් ඔහුගේ සිරුර කැබලිකොට නසනලද බැව් පුරාණෝක්තියි. "ජම්භභෙදී හරිහයඃ" යනු අමරකොෂයි. සංස්කෘත "ජම්භ" ශබ්දයෙන් "දම්බ" යයි ශුද්ධසිංහලට තද්භවවිය. සම්බන්ධ විභක්ති ප්‍රත්‍යයවූ "ආ" යන්න හා යෙදුනුවිට "දම්බා" යි සිඩයි.

වැජඹියනු කිරිය පෙරළියි. වර්තමානාර්ථය ගියයුතු හෙයිනි.

2. තවද මේ නිජභුජ බලපරාක්‍රමාක්‍රාන්ත පරරාජචක්‍ර වික්‍රම ප්‍රශස්ත භූචක්‍ර චක්‍රවර්ත්ති ශ්‍රී පරාක්‍රමබාහු මහාරාජෝත්තමයාගේ සඞ්ක්‍රම වික්‍රමාතික්‍රම ප්‍රතාප ප්‍රදාන කීර්ත්‍යාදි ගුණෛක දෙශයක් ශ්‍රවණයකර.

2. යලිත් ස්වකීය බාහුබල වික්‍රමයෙන් යටපත් කරනලද ශත්‍රු රාජසමූහයාගේ වික්‍රම ඇත්තාවූද ප්‍රශස්ත පෘථිවිමණ්ඩලයට චක්‍රවර්තිවූද මෙම ශ්‍රී පරාක්‍රමබාහු මහිපාලයන්ගේ සඞ්ක්‍රම ප්‍රයාණයද වික්‍රමයද දුස්තර ප්‍රතාපයද දාක්ෂිණ්‍යයද කීර්ත්තිආදිවූද ගුණමහිමයන්ගේ මදවර්ණතාවක් (මිත්‍රය!) ඇසුව මැනවි.

29 මෙරද ගුණෙන් සවනත සිත් සැනැහැ විය
නිබඳ දෙනෙන් සිතුමිණකැයි * ඇදූහැ විය
නොමඳ බෙලෙන් පැලොව බල දෙවිහ විය
දුහද රදුන් කගදල දරිති නැහැ විය

29. මෙරද, මේ ශ්‍රීපරාක්‍රමබාහු නරවීරතෙම; ගුණෙන්, දයා දාක්ෂිණ්‍යාදි ස්වාමිගුණය හෙතුකොට ගෙන; සවනත, සකලසත්ත්වයන්ගේ; සිත්, චිත්තයන්; සැනැහැවිය, සන්සිඳුවීය; නිබඳ, නිරන්තරවූ; දෙනෙන්, දානමහිමය හෙතුකොටගෙන; සිතුමිණ කැයි, චින්තාමාණික්‍යයක්යයි; ඇදූහැවිය, සම්භාවිත කරවිය, නොමඳබෙලෙන්, අමන්දශක්තිය හෙතුකොටගෙන; ලොව, ලොකයෙහි; බලදෙවිහවිය, බලභද්‍රයාගේ ආකාරය; පෑ ප්‍රකාශකොට, දුහද රදුන් වෛරි රාජයන්, කග, ඛඩ්ගලක්ෂණවූ; දල දරිති, මෙඝයෙන්; නැහැවිය, සනාතය කරවිය.

"දුහද රදුන් කගදල දරිති නැහැවිය"

වෛරී රාජයන් ඛඩ්ගලක්ෂණ මෙඝයෙන් සනාතයකරවීය. යත්නෙන් තමා හා විරුඩව සටන් පිණිස පැමිණි මිහිපලුන් කඩුවෙන් කැබලිකොට ලෙයෙහි ගැල්විය යනු හැඟවූහ.

* ඇඟහැවිය.

30 සත සිත රැඳි නිමල් ගුණ පසිඳු විකුමැ ති
සිරි කත සිරි කමල් වැනි මෙනිරිඳුගෙ නි ති
*මෙදියත දිව සියල් තද තෙදග නොනැව ති
රුපුකත නෙතසිලිල් සිඳුතෙර වැද තැවැ ති

30. සත, සජ්ජනයන්ගේ; සිත, චිත්තාභ්‍යන්තරයෙහි; රැඳි, රඤ්ජිතවූ; නිමල්ගුණ, නිර්මල ගුණයෙන් හා; පසිඳුවිකුමැතී, ප්‍රසිද්ධ වික්‍රමයෙන් යුක්තවූද; නිති නිරන්තරයෙන්; සිරිකත, ශ්‍රීකාන්තාව (ශ්‍රීවාසය)ට; සිරිකමල්වැනි, ශොභාන්විත පද්මයක් බඳුවූද; මෙනිරිඳුගෙ, මේ පරාක්‍රමබාහු නරේන්ද්‍රයාගේ; තද, දෘඪතරවූ; තෙදග, තෙජො ලක්ෂණවත්නිය තෙම; සියල් මෙදියත, සකලමේ ලොකකුහරයෙහි; දිව, ධාවනයකොට; නොනැවතී, නිවෘත්තනොවී හෙවත් නොරඳා; රුපුකත, ශත්‍රුවනිතාවන්ගේ; නෙතසිලිල්, නෙත්‍රජලලක්ෂණවූ; සිඳුතෙර, සමුද්‍රතීරයෙහි; වැද, සට්ටිතව; තැවැති. නිවෘත්තවී හෙවත් රැඳුණේය.

මේ නරවීරයාගේ මුළුලොකයෙහි ජ්වලිතව පැවැත්තාවූ තෙජොලක්ෂණ වත්නියතෙම අන්කිසි තැනෙක නොරඳා ශත්‍රුවනිතාවන්ගේ නෙත්‍රජලලක්ෂණ සමුද්‍රතීරයෙහි හැපී නැවතුණේයයි කිමෙන් මේ රජහු තමාගේ ශත්‍රුරාජයන් නැසූවිට තද්වනිතාවන්ගේ රොදනය සහගත දුඃඛාවස්ථාව දුටුවිට අභයදානයදී ඇලා සුවපත් කළබව මෙයින් හඟවයි.

81 මෙරද රුපුන් කර පා වැජඹි මෙදිය ත
සගුණ මහල් සිවුපා සිවු බිතිනි යු ත
දසරද දම් මිණි පා තෙදණ මැඳුර ත
සතත සතන් යත පා කෙරෙය සුබසෙ ත

31 රුපුන්, ශත්‍රුරාජයන්; පාකර, පහකොට හෙවත් නෂ්ටකොට; මෙදියත, මේලෝකකුහරයෙහි; වැජඹි, විජෘම්භිතවූ; මෙරද, මේ පරාක්‍රමබාහු නරශ්‍රෙෂ්ඨතෙම; සගුණ, සන්ධිවිග්‍රහාදී ෂඩ්විධගුණලක්ෂණවූ; මහල්, මාලයෙන් හා; සිවුපා, (සාමාදි) චතුර්විධ උපාය ලක්ෂණවූ; සිවුබිතිනි, චතුර්භිත්තියෙන්; යුතු, සංන්විතවූද; දසරද දම්, (දානශීලාදී) දශරාජ ධර්මලක්ෂණවූ; මිණිපා, මණිමය ස්තම්භයන්ගෙන් යුක්තවූද; තෙදණ, තෙජස් ආඥා ලක්ෂණවූ; මැඳුරත, මන්දිරොදරයෙහි; සතත, අනවරතයෙන්; සතන්, සත්ත්වයන්; සතපා, සන්තර්පිතකරවා; සුබසෙත, ශුභශාන්තියක්; කෙරෙය, කරන්නේය.

* තෙදයක.   † තෙදයත.

සගුණ, ෂඩ්ගුණය නම්:- සන්ධි, විග්‍රහ, යාන, ආසන; සංශ්‍රය, ද්වෛධීභාව, යනුයි. "සන්ධි" නම් සතුරා සමග මිතුරුවීමය; "විග්‍රහ නම්" සතුරා සමග සටන් කිරීමය. 'යාන" නම් බලසෙන්ගෙන තමන් මඩනට එන සතුරා වැළක්වීම පිණිස පෙරමුණට යාමය. "ආසන" නම් ජයගනු කැමතිව කල්බලමින් දුර්ගස්ථානාදී වසීනයෙහි නියුක්තවීමය. "සංශ්‍රය" නම් බලවත් සතුරා යුදට පැමිණි විට ප්‍රබල මිතුරෙකු ඇසුරුකිරීමය."ද්වෛධීභාව" නම් සංශයෙන් සිටීමයි.

"සිව්පා" චතුර්විධ උපායනම්:- සාම, දාන, භෙද, දණ්ඩ, යනුයි. "සාම" නම් වෛරීන්ගේ වෛරාපගමයට යොග්‍යවූ ශාන්තවාක් ප්‍රකාශය. දානනම් ධනාදියදීමෙන් වෛරීන් යටත් කර ගැනීමය. "භෙද" නම් සතුරන් තමා වශහත්වයට ගැනීම පිණිස ඔවුනොවුන් බිඳුවීමය. "දණ්ඩ" නම් බලත්කාරයෙන් සතුරන් යටත්කරගැනීමය "දසරදදම්" දශරාජධර්ම නම් දාන, ශීල, පරිත්‍යාග, ඍජුභාව, මෘදුභාව, තපස්, අක්‍රොධතා, අවිහිංසතා, ක්ෂාන්ති, අවිරොධිතා, යන දශයයි.

32 ප සි ඳු මොහුගෙ දුල දන්දල දර පබ ද
දි ළි ඳු සිතෙහි කලිමල් දෙවියේ මතු ද
කි වි ඳු වදන් බිම් බැබළුම් කළ නිබ ද
සි නි ඳු යසස් ලිය සුහුඹුල් කෙළෙ නොම ද

32. පසිඳු, ප්‍රසිද්ධවූ; මොහුගෙ, මේ පරාක්‍රමබාහු නරවීරයාගේ; දුල, සමුජ්ජ්වලිතවූ; දන්, දාන ලක්ෂණවූ; දලදර, ජලධරය විසින් හෙවත් මෙඝය විසින්; පබද, දෘඪතරවූ; දිළිඳුපිනෙහි, කෘපණ ජනයන්ගේ සිත්හිවූ; කලිමල්,(දරිද්‍රසඞ්ඛ්‍යාත)දුඃඛමලය;දෙවියේ මතුද, සෝදාහරන ලද්දේ පමණක්ද? (සෝදාහැරීම පමණක් නොව අනිකක්ද කරන ලදුයිසේයි. ඒ කුමක්ද) කිවිඳු, කවීන්ද්‍රයන්ගේ; වදන්, වචන නැමැති; බිම, මාණික්‍යලක්ෂණවූ භූමියෙහි; නිබද, නිරන්තරයෙන්; බැබළුම්කළ, භ්‍රාජමානත්වයකළාවූ, සිනිඳු, ස්නිග්ධ හෙවත් දර්ශනීයවූ; යසස්ලිය, කීර්තිලක්ෂණලතාව; නොමඳ, අතිශසින්; සුහුඹුල්කෙළේ; පුෂ්පිමත්වූවක් කෙළේය.

නරේන්ද්‍රයාගේ දාන ලක්ෂණ ජලධරය විසින් කෘපණයන්ගේ කාර්පණ්‍යලක්ෂණ ක්ලිෂ්ටභාවය දුරලීමද කවීන්ද්‍රයන්ගේ වාග්භූමියෙහි භ්‍රාජිතකීර්තිලතාව සුහුඹුල්කිරීමද යැගවීමෙන් දුගීන්ගේ මනොරථය පුරාදුන් බව හා රජුගේ දානාධ්‍යාශය වර්ණතාව උත්කෘෂ්ටතරව ලොවතුළ පැවති බැව් ප්‍රකාශිතයි.

33 ස ක ත අසුරු පැරකුම් නිරිඳුගෙ පව ර
ස ම ත විපුල් බල සිවුරඟ සෙන් ලත ර
දි ග ත පැමිණි කොද නොපහළ රුපු නුව ර
යු ග ත සයුර රළ නොපහළ තැන් කව ර

33. සකත අසුරු, ශ්‍රී විෂ්ණු දෙවයා සදෘශවූ; පවර, ශ්‍රේෂ්ඨවූ; පැරකුම් නිරිඳුගෙ; (මේ) පරාක්‍රමබාහු නරේන්ද්‍රයාගේ; විපුල්, මහත්වූ; සමතබල, අනූනශක්තිසම්පන්නවූ; ලතර, ඉතාමහත්වූ; සිවුරඟසෙන්, චතුරඞ්ගසමන්වාගත සේනාව; දිගත, දිශාන්තයට; පැමිණි, ප්‍රාප්තව; නොපහළ, නොපෙළෙනලද්දවූ රුපුනුවර, ශත්‍රු නගරයෙක්තෙම; කොද,? කුමක්ද;? (ඒ එසේමැයි) යුගත, යුගාන්තයෙහි; සයුර, සාගරයාගේ; රළ, තරඞ්ගයන් විසින්; නොපහළතැන්, ප්‍රහාරදානය නොකළ ස්ථානයක් තෙම; කවර? කිනම්ද?

රජහුගේ චතුරඞ්ග සේනාව සියලුදිසාවට පැමිණ ශත්‍රූන් පරාජයකළ බව හා එය කිසිවකු විසිනුත් නොවැළැක්විය හැකිවූ බවද ප්‍රකාශිතයි. කල්පාන්තසමුද්‍රයාගේද මුළුලොව සැමතැනම ඉතිරී පැතිරයාම නොවැළැක්විය හැකිවන්නාක්මෙනි.

34 ඝෝ ර ක ම් කර රැගෙන වෙන වෙන වෙස් රුදු රු
*සු රු ක ම් කළ පොරණ දිය බිඳහු නරතු රු
පැ ර කු ම් පෑ නොයෙක් එක වෙස සිට සොඳු රු
පැ ර කු ම් රජුට සරියසි පවසති කවු රු

34. රුදුරු, රෞද්‍රවූ හෙවත් බියකරුවූ; වෙනවෙන, වෙනස් වෙනස්වූ; (නානාවිධවූ) වෙස්, මත්ස්‍යකූර්මාදී දශවිධ අවතාර සඞ්ඛ්‍යාත) විලාසයෙන්; ඝෝරකම්කර රැගෙන, වෛරකර්මයෙන් ග්‍රහණයකොට; නූප්තවසිට නානාවිධ වෙස් පෙරළමින්තැයිසේයි) පොරණ, පුරාතනයෙහි; නරතුරු, නිරන්තරයෙන්; සුරුකම්කළ, (ජගද්ව්‍යාපිත්වයෙන් පූජ්‍යතර) ශූරභාවයක් කළාවූ; දියබඳහු, ශ්‍රීවිෂ්ණු දිව්‍යරාජයා; සොඳුරු, සිත්කලුවූ; එකවෙසසිට, (නරරූප සඞ්ඛ්‍යාත) එකම විලාසයෙහි සිටිනියකොට; නොයෙක් පැරකුම්පෑ, නානාවිධ පරාක්‍රමයන් ප්‍රකාශකළාවූ; පැරකුම්රජුට, පරාක්‍රමබාහු රාජයාහට; සරියසි,සදෘශවන්නේයයි;කවුරු, කවර නම් කෙනෙක්; පවසති, ප්‍රකාශ කෙරෙද්ද?.

විෂ්ණුතෙම පුරාණයෙහි දසවාරයෙක මත්ස්‍යාදී දශවිධාවතාරයක් රැගෙන වික්‍රම දැක්විය යනු පුරාණෝක්තියි. මේද කියනලදී.

* සුරකම්-සමහර.

“මත්ස්‍යාලිඞ්ගනශල්කසිච්ඡලධිඃ පෘෂ්ඨෙ ජගන්මණ්ඩලං
දංෂ්ට්‍රාග්‍රං ධරණී නඛෙ දිතිසුතාධීශඃ පදේ රෝදසී
ක්‍රෝධෙ ක්ෂත්‍රගණඃ ශරේ දශමුඛඃ පාණෞ ප්‍රලම්බාසුරඃ
ධ්‍යානෙ විශ්වමසාවධාර්මිකකුලං කස්මෛචිදස්මෛ නමඃ”

යන්නෙන් නිර්දිෂ්ට හෙයින් මත්ස්‍යය-2 කූර්මය-3 වරාහය 4 නෘසිංහය-5 වාමනය-6 භාගීවරාමය-7 රාමරාමය-8 බලරාමය 9 බෞඩ්ය-10 කල්කීය න දශාවතාරයවේ. 1 එක්කලෙක මත්ස්‍යාවතාරයදරා තමන්ගේ ශල්කයෙහි සාගරය රඳවාගත්තේය. 2 තවත් කලෙක්හි කූර්මාවතාරයදරා පෘෂ්ඨයෙහි භූමණ්ඩලයදරා ගත්තේය. 3 තවත් කාලයෙක්හි වරාහාවතාරය ගෙන දංෂ්ට්‍රායෙහි පෘථිවිය රඳවාගත්තේය. 4 අන්‍යකාලයෙක්හි නෘසිංහාවතාරයගෙන නියපහරින් හිරණ්‍යක ශිපුනම් අසුරයාමරා ලොවට සෙතක් කෙළේය. 5 තවත් කාලයෙක්හි වාමනාවතාරය රූගෙන ආකාශය හා පෘථිවිය දුරීය. 6 එක්කලෙක්හි භාගීව රාමාවතාරය ගෙන වෛරීරාජයන් නෂ්ටකොට ශුභයක් කෙළේය. 7 තවත් කාලයෙක්හි රාමාවතාරයගෙන රාවණා මරා ශාන්තියක් කෙළේය. 8 අන්‍ය කාලයෙක්හි බලරාමාවතාරය ග්‍රහණයකොට ප්‍රලම්බනම් අසුරයා මරා ශාන්තියක් කෙළේය. 9 එක්කලෙක බෞඩාවතාරයදරා සර්වඥත්වය ලැබ ලොවට ශාන්තියක් කෙළේය 10 තවත් කලෙක කල්කී අවතාරය දරා අධාර්මිකවූ ම්ලේච්ඡයන් නසා ශාන්තියක් කෙළේය.

මේ ප්‍රකාරයෙන් විෂ්ණුහු ලොකයාට වික්‍රමය ප්‍රකාශකෙළේ දශවාරයෙක දශවිධවූ අවතාරයක් දරාගෙනය. මේ පරාක්‍රමබාහු රාජයා වික්‍රමකරන්නේ අනවරතයෙන් එකම ස්වරූපයෙන් සිටගෙනමය. එහෙයින් විපරීත ගතිඇති විෂ්ණුදෙවයා වනාහි අවිපරීත ගති ඇති මේ පරාක්‍රමබාහු රාජයාට සමකල නොහැකිය යනු එලිතාර්ථයි.

35 දෙසින් දෙසම දිසි යසසට මෙනරනි ඳු
† අ සි න් අසක් වත් සපිරෙව නම් නරි ඳු
ඇසින් ඇස පෙනෙන කැලලක් ගෙන මෙබ ඳු
ම සි න් මසට කුමකට අඩුවෙද එලි ඳු

35. මෙනරනිඳු, මේ පරාක්‍රමබාහු නරෙන්ද්‍රයාගේ; දෙසින් දෙසම, දෙශයෙන් දෙශයෙහිම හෙවත් සියලු තන්හිම; දිසි,

†ඇසින් ඇස පෙනෙන ලොව හැමට එකබ ඳු

4

දෘශ්‍යමානවූ; යනසට, කිඤ්චියට; අසින් අසස්වත්, අංගුලයෙන් අංගුලිකාටවත් නොවන් ස්වල්පමාත්‍රයකටවත්; නරිඳු, චන්ද්‍රතෙම; පරිවේනම්, සදෘශවන්නේ නම්; ඇසින් ඇස, ලොකවාසීන්ගේ) අක්ෂියෙන් අක්ෂියට; පෙනෙන, දෘශ්‍යමානවූ; කැලලක්ගෙන, ශශලාඤ්ඡනයක් (නිමිත්තකොට ගෙන; මෙබඳු උලිඳු, එතන් ප්‍රකාරවූ (මේ) චන්ද්‍රතෙම; මසින් මසට, මාසයෙන් මාසයෙහිම; කුමනට, කවර කරුණකින්; අඩුවෙද, (කලායෙන්) ඌනවේද.?

එකාකාර අකලඞ්කවූ රජුගේ ජගද්ව්‍යාපීවූ කීර්තියට අල්ප මාත්‍රයකින්වත් චන්ද්‍රයා සදෘශනොවේ. කැලලකින් යුක්තහෙයිනි. එපමණක්ද නොවේ. චන්ද්‍රතෙම මසින් මස අඩුවෙමින් නොපෙනිමටද යන්නේය

36 ලඳුන් සිනිඳු කොමල'ත වැලඳි සිහිල සේ
නඳුන් මෙහිමි සොඳ බඳ රඳන ගුණ රැසේ
නුඳුන් අතුරු උරගුන් දරණි කළ තොසේ
සඳුන් තුරෙක සරියයි කියමෝද කෙසේ

36 සිනිඳු, ස්නිග්ධවූ නොහොත් මාර්දවගුණ යුක්තවූ; ලඳුන්, කාන්තාවන්ගේ; සිහිලසේ, ශීතස්පර්ශ ඇති; කොමළ අත, කොමල හස්තයෙන්; වැලඳී, වැළඳගන්නාලද්දවූ; නඳුන්, නන්දනීයවූ; මෙහිමි, මේ පරාක්‍රමබාහු නරේන්ද්‍රයාගේ; සොඳ, සුන්දරවූ; ගුණරැසේ රඳන, (කොමලස්පර්ශාදී) ගුණකදම්බයෙහි යුක්තවූ; බඳ, දෙහයතෙම; අතුරු නුදුන්, අතර නොපැනෙනසේ; උරගුන්, සර්පයන් විසින්; තොසේ, සන්තොෂයෙන්; දරණිකළ, දරණා වලින් වෙසීතවූ; සඳුන්තුරෙක, චන්දනවෘක්ෂයකට; සරියයි, සදෘශයයි; කෙසේකියමෝද, කෙලෙසින් ප්‍රකාශකරමුද?

37 සුරතුරු අසුරු අතු අත රැඳි කතාලිය
නරතුරු සිටින රුසිරි සර මතාලිය
පියකරු මෙරද රුසිරෙන් මද දිනාලිය
සුරගුරු අවද ඉන් නොමහැකි වනාලිය

37 නරතුරු, අනවරතයෙන්; අතසිටින, සමීපයෙහි සිටිනය කරන්නාවූ; රූසිරිසර, රූපශ්‍රීන් සාරවූ; මතාලිය, මතස්කාන්තාවූ අඞ්ගනාවන් කරණකොටගෙන; අතු,ශාඛාවන්හි; රැඳි,රඤ්ජිතවූ; කතාලිය, කනකලතාවන් ඇති; සුරතුරු අසුරු, කල්පවෘක්ෂයක් සදෘශවූ; පියකරු, ප්‍රියඞ්කරවූ; මෙරද, මේ පරාක්‍රමබාහු රජතෙම; රුසිරෙන්, රූපශ්‍රීන්; මද, කන්දර්පයා; දිනාලිය, (පරදවා) ජය

ගන්නේය; සුරගුරු අවද, බෘහස්පති ආගමනය කෙළේද; ඉන්, (එයින්) හේපවා; වනාලිය නොම හැකි, වර්ණනාකොට ලියනොහැක්කේමැයි.

38 මෙනිරිඳු මෙවන් ගුණ-මිණි රුස් අද නදන්හි
කොරෙමින් නදන් සි අක්†-නොවිහිද අදර අදසින්

38 මෙතිරිඳු, මේ නරේන්ද්‍රයාගේ; මෙවන්ගුණ, උක්තප්‍රකාර ගුණ ලක්ෂණවූ; මිණිරුස්, මාණික්‍ය රාශීන්; අද, හෘදය ලක්ෂණවූ; නදන්හී, නිධානයෙහි; අක්, මදකුදු; නොවිහිද, බැහැරනොකොට; සි, සමෘතිසම්පන්නව; අදර අදසින්, ආදරාධ්‍යාශයෙන් යුක්තව; නදන්කෙරෙමින්, නිධානගත කෙරෙමින්:-

39 සුරංගඟ තරඟ වැල-මැදවන් සුපුන් සඳ රග
බඳ සෙල් වියන් යට'වට මුතු ලැලින් යෙ දු
මත කල් නිමල් දළපුබු සේසතින් ‡සැ දු
ඇමකල් දිලි විමල්-හරසෙල් සදිසි සිහසුන
ස රා උදය *ඊවිඹිඹු විලස නුබගැ බේ
ස රා 'බරණ කිරණින් එකලු කැරු ස බේ
ර ස් මිණි වලලු නදදෙන කොමල'තින් ල ද
දු ස් සුදු සිනිඳු වල්විදුනා පවන් වි ද
නයන් සුර සෙනහ මැදවන් සුරනිඳුසෙ න ද
ළ ස් සඳ පවර සිරි පැරකුම් නිරිඳු ස ✕ ද

39 සුරගඟ, ආකාශ ගඞ්ගායෙහිවූ; තරඟවැලමැද, තරඞ්ගාවලිමධ්‍යයට; වන්, ප්‍රවිෂ්ටවූ;සුපුන්සඳරඟ.පූර්ණ චන්ද්‍රවිලාසයුක්තව; බඳ, බඳනාලද්දවූ; සෙල්වියන්, ශ්වෙත විතානයන්ගේ; යට, අධඃප්‍රදෙශයෙහි; අවට, හාත්පසින්; යෙදූ, යුක්තකලාවූ; මුතුලැලින්, මුක්තාලතිකාවන් කාරණකොටගෙන; මතකල්, (දුටුවන්ගේ) මනඃකාන්තවූ; (සිත්අදනාවූ) නිමල්, නිර්මලවූ; දළපුබුසේසතින්, දන්තබවිත ශ්වෙතච්ඡත්‍රයෙන්; සැදූ, සජ්ජිතවූද; ඇමකල්, සෑම වේලෙහිම; දිලි, ජ්වලිතවූ; විමල්, නිර්මලවූ; හරසෙල් සදිසි, කෛලාස පර්වතය බඳුවූද; සිහසුන, සිංහාසනයෙහි; නුබගැබේ, නභොගර්භයෙහි; සරාඋදයරිවිඹිඹුවිලස, ශරත්කාලීන උද්ගත සූර්‍ය්‍යාසෙයින්; සරා, ෂඩ්විධවර්ණවත්වූ; අබරණ, ආභරණයන්ගේ; කිරනින්, රශ්මිස්කන්ධයෙන්; සබේ, රාජසභාව; එකලුකැරු, එකා'

†සිඅස්. ‡රුදු. *දිවයුරු.

ලෝක කොට; නදදෙන, නාදදනය කරන්නාවූ; රන්මිණිවළලු, ස්වර්ණමණිමය වලයයන් ඇති; කොමළතින්, කොමලහස්තයෙන්; ළද, තරුණාඞ්ගනාවන් විසින්; දුන්, ප්‍රදානය කරනලද්දාවූ; සුදු, ධවලවර්ණවූ, සිනිඳු, ස්නිග්ධවූ; වල්විදුනා, වාලවීජනීන්ගේ; පවන් විද, මාරුතස්පර්ශයලැබ; නන්සුරසෙනග මැද, නානාවිධ දිව්‍ය සේනා මධ්‍යයෙහි; වන්, ප්‍රවිෂ්ටවූ; නද, සනාථවූ; සුරනිඳුසෙ, සුරේන්ද්‍රයා පරිද්දෙන්; පවර, ප්‍රවරවූ; සිරිපැරකුම් නිරිඳු සඳ, ශ්‍රීපරාක්‍රම බාහුනරේන්ද්‍රයා; උන්සඳ, වැඩඋන් කල්හි:-

මෙහි දක්වූ ආකාශ ගඞ්ගා තරඞ්ගමධ්‍යගත පූර්ණචන්ද්‍රවිලාසය තෙම ශ්වේත වස්ත්‍ර විතානයාගේ අධොභාගයෙහි එල්වනලද මුක්තාලතිකාවෙන් ශොභාන්විතවූ දළපුඩුසේසතට උපමිතයයි සලකනු.

"හරසෙල් සදිසි සිහසුන"

හරසෙල්, කෛලාශ පර්වතය වනාහි හිමාලය වනයෙහි පිහිටි මහවිල් සතෙන් එකක්වන අනවතප්තවිල සීමාකොට පවතින සුදර්ශනකූට චිත්‍රකූටය කාලකූටය ගන්ධමාදනකූටය කෛලාස කූටයයි යන පර්වත පසකින් එකකි.

"සරාළඳෙහ රිවිබිඹු විලස නුබගැබේ"

ශරත් කාලය නම් වප් ඉල් දෙමාසයයි. මේ ශරත් ඍතුව තුළ නිර්මල සූර්යයා ගගනතලයේ ශොභමානව බබළයි. වලාකුල්, හිම, ධූලි. දුම්, අන්ධකාර යන පඤ්චොපක්ලේශයෙන් අහස විනිර්මුක්තාවී තිබීම අතිශයින් ප්‍රියජනකමය. මෙසමයෙහි සූර්යමණ්ඩලයෙහි දීප්තිමත්වූ සම්පූර්ණ තෙජොගුණය පෙනෙන්ට තිබේ. මහාකවි කාලිදාස භාරවීන් ආදී පණ්ඩිවරයන් විසින් මෙසේම ශරත් ඍතුව චමත්කාර ජනකලෙස වර්ණනාකරනලදහ.

40 සුරඹ ලෙසින් දනමන නෙත් ඇද වෙත ට
සලඹ ගොසින් රණහස රැව් නිසරු කො ට
තලඹ තොසින් දෙන රැගුම්ට පලඹු කො ට
මෙනුඹ ගොසින් වැද එනිඳු සබ මැද ට

40 සුරඹ ලෙසින්, සුරාඞ්ගනාවන් සේ; දනමන නෙත්, ජන සන්නේ චිත්තනේත්‍රයන්; වෙතට, (තමන්ගේ) සමීපයට; ඇද, ආකෘෂ්ට කොට; සලඹ ගොසින්, නූපුරයන්ගේ නාදය කාරණ කොටගෙන; රණහස, ස්වර්ණහංසයන්ගේ; රැව්, රාවය; නිසරු කොට, නිඃසාරවූවක් කොට; තලඹ, නාටිකාඞ්ගනාවන් විසින්

තොසින්, සන්තොෂයෙන්; දෙන, ප්‍රදානයකරනු ලබන්නාවූ; රැඟුමට පළමුකොට, නෘත්‍යයට ප්‍රථමකොට; මෙනුඹ, මේ පුෂමන් තෙම; නොසින්, ප්‍රයාණයකොට; එතිරිඳු සබමැදට, ඒ නරේන්ද්‍රයාගේ සභාමධ්‍යයට; වැද. ප්‍රවිෂ්ටව.

41 සු බ ඳ සියල් සිව්වෙ දන පිවි තුරුව
පැ ල ද කසුන් හු අබරණ වි සි තුරුව
තොමඳ පෙරෙවි බමුණන සිටු තිර තුරුව
එ ස ද කියන ජයතුනි නද අන තුරුව

41 සියල්සුබඳ, සකල ඉෂ්ටබන්ධනයන් හා; සිව්වේ, චතුර්වේදය, පිවිතුරුව, පවිත්‍රකොට; දුන, ජානනයකොට; කසුන්හු; සවර්ණසූත්‍රයන් හා හෙවත් වේදමන්ත්‍රයෙන් ජල්පිත රන්හු සහිත, අබරණ, ආභරණයන්; විසිතුරුව, විචිත්‍රකොට; පැලඳ, පිලන්ධනයකොට; තොමඳ, අමන්දවූ; පෙරෙවිබමුණන්, පුරොහිත බ්‍රාහ්මණයන්; තිරතුරුවසිට, අතර නොදක්වා සපිතියකොට; එසඳ, තත් කාලයෙහි; කියන, කථනයකරන්නාවූ; ජයතුනි නද, ජය සතුති නාදයට; අනතුරුව, අනන්තරව.

42 ඉ ගෙ න අදිකරණ දන රදනිය නොයෙ ක
නි ති න පෙම්න මුළුසත්වග රකින ල ක
එ දි න පැමිණි කටයුතු දන්වා නිසැ ක
සි ටි න දෙපස හැම මහ මැතිවරන් දු ක

42 නොයෙක රදනිය, අනෙකවිධරාජනීතිය; දන, ජානනයකොට; අදිකරණ, විනිශ්චය; ඉගෙන, උද්ග්‍රහණයකොට; නිතින, නිත්‍යයෙන්; ලක, ශ්‍රී ලඞ්කාවෙහි; මුළුසත්වග, සැමසත්ව වර්ගයා; පෙමින්, ප්‍රේමයෙන්; රකින, සංරක්ෂණය කරන්නාවූද; එදින, තද්දිනයෙහි; පැමිණිකටයුතු, සම්ප්‍රාප්ත කර්තව්‍යයන්; නිසැක, නිඃශඞ්කිතව; දන්වා, සැලකර; දෙපස සිටින, උභය පාර්ශ්වයෙහි සිටිනවූ; හැමමහමැතිවරන්, සමස්ත මහාමන්ත්‍රි ශ්‍රෙෂ්ඨයන්; දුක, අවලොකනයකොට.

43 මුදලි දු බෙයද මුල සැඩ තෙලෙනි ඇමක ලා
වැදවැද උලැහිවන සිදුනරග සිරිසු ලා
රද ස ද කඹුරු කිරුල‘ගමිණ් රසින් ග ලා
වැදවැද නැගෙන පිරිවර නරනිඳුන් බ ලා

43 සැඩතෙලෙනි, චණ්ඩවාරුණය තරණකොටගෙන; ඇම කලා, සැමවේලෙහි; මුදලිදුබෙයද්මුල, මහාමෙරුපර්වත මූලයෙහි;

වැද වැද, ඝට්ටනය වෙමින්; උලැගිවන, උල්ලඞ්ඝනය වන්නාවූ; සිඳුතරඟ, සමුද්‍රතරඞ්ගයන්ගේ; සිරි, ශ්‍රීවිලාසය; උසුලා, උද්වහනයකොට; රද, පරාක්‍රමබාහු නරේන්ද්‍රයාගේ; පදනඹුරු, පාද ලක්ෂණ නාම රසයන්; කිරුළුඅග මිණිරැසින්, කිරීටාග්‍රමාණික්‍ය කාන්තියෙන්; ගලා, ආලිප්තකොට; වැඳවැඳ, අභිවාදනයකොට කොට; නැගෙන, උද්ගතවන්නාවූ; පිරිවර නරනිඳුන්, පරිවාර නරේන්ද්‍රයන්; බලා, නිරීක්ෂණයකොට.

චණ්ඩමාරුතවේගයෙන් මහාමේරු පර්වත මූලයෙහි ඝට්ටනය වෙමින් නැගෙන සමුද්‍රතරඞ්ගයන්ගේ ශ්‍රී විලාසය උසුලමින් පරාක්‍රමබාහු රාජයාගේ පාද පද්මයන් කිරීට මාණික්‍ය රශ්මියෙන් ගල්වා වැඳවැඳ නැගෙන පරිවාර නරේන්ද්‍රයන්යයිකිමෙන් සුවර්ණ මහාමේරු පර්වතමූලයට රාජයාගේ පාද්වයද පර්වතයෙහි වැදෙමින් නැගෙන තරඞ්ගයන්ට ධවලවූ පට්ටවස්ත්‍ර හැන්දවූ රජවරුන්ගේ ඔටුණුමිණිරැස්ද උපමිතයහ. මෙහි තරඞ්ගයන්ගේ වැදීමට චණ්ඩමාරුතය කාරණ ස්ථානයක් කොට නිර්දිෂ්ට ලෙසින්ම රජුගේ වැදීමටද රාජයාගේ තේජෝමහිමය කාරණ ස්ථානවී යයි ප්‍රතීයමානයි.

44 දෙසතුරු ඉසුරු නිරිඳුන් පිසෙදූ ලකු එ
විසි තු රු මහ රු මිණිමුතු පට රන්පබ එ
පිවි තු රු කපු රු කස්තුරු තිසි කසි ය එ
පිය කරු පඹු රු නරනිඳුහට පැ පැසු එ

44 දෙසතුරු, දේශාන්තරයන්හිවූ හෙවත් අන්‍යරාෂ්ට්‍ර විෂයෙහි; ඉසුරු, අධිපතිවූ; නිරිඳුන්, නරේන්ද්‍රයන් විසින්; ලකුළු, අලඞ්කෘතකොට; පිසෙදූ, (ප්‍රාසාදවර්ධනය සඳහා) ප්‍රේරිතවූ; විසිතුරු, විචිත්‍රවූ; මහරු, මහාර්ඝවූ; මිණි, මාණික්‍යය; මුතු, මුක්තාය; පට, වස්ත්‍රය; රන්, සුවර්ණය; පබළු, ප්‍රවාලය; පිවිතුරු, පවිත්‍රවූ; කපුරු, කර්පූරය; කස්තුරු, මෘගමදය; තිසිකසිසළු, යෝග්‍යවූ කාශික සාටකයන්ද යන; පියකරු, ප්‍රියඞ්කරවූ; පඹුරු, ප්‍රාභෘතයන්; නරනිඳුහට, (ඒ පරාක්‍රමබාහු) නරේන්ද්‍රයාට; පැපසු, දක්වීමට අනතුරුව.

45 පරසිඳු කිවිඳු ගෙපුලෙන් බැඳි දසමර ට
මෙනිඳු විඳිදු නම් තොහැරම තොසිය සැ ට
ලෙලවිඳු රතන් රැඳි වැඳිගණ *සඳපස ගි ට
දල නිඳු ගොසෙව් තුති ගොස කැරැ නැවති වි ට

*දෙපිට.

45 දසවරට අෂ්ටාදශ රාජ්‍යවිෂයෙහි; පරසිදු, ජගද්ව්‍යාපීවූ; කිවිඳුතෙපුලෙන්, කවිවරයන්ගේ භාෂායෙන්; මෙතිරිදු නම් නොහැරමබැඳි, මේ රාජයාගේ නාමය පහනොකොටම බඳනා ලද්දාවූ හෙවත් රජහුගේ නාමය ඇතුළත්කොට ප්‍රබන්ධකළාවූ; තෙසියසැට විරිදු, ෂෂ්ට්‍යාධික ත්‍රිශත ප්‍රමාණවූ හෙවත් තුන්සිය සැටක් පමණවූ; විරිදු, විරුදාවලින් යුක්තකොට; ලෙළ, ලලිතවූ; විදු, විදුලිබඳුවූ; රතන්, රත්නාභරණයන්ගෙන්; රැඳි, රඤ්ජිතවූ; වැදිගණ, වන්දිභට්ට සමූහයා හෙවත් ස්තුතිපාඨකජනයා; දෙපස සිට, උභයපාර්ශ්වයෙහි සිටිනව; දලතිදුගොසෙව්, සමුද්‍රධ්වනිය සෙයින්; ස්තුතිඝොෂ, ස්තුතිඝෝෂය; කැරැ, පවත්වා; නැවතිවිට, නැවතුණුකල්හි.

46 ලි ය න  කි ය න  ලියගී රස විඳ නොහැ  ර
වි ය න  රද න  මිණි කිරණින් උන් පව  ර
න ය න  නද න  පැරකුම් රදු† දුන මිතු  ර
න ය න  ගම න  සැලකර රැගෙන අවස  ර

46 ලියන, කාන්තාවන් විසින්; කියන, ප්‍රකාශකරනු ලබන්නාවූ; ලියගීරස, ලයාන්විත ගීතිකාවන්ගේ රසය; නොහැර, පසු නොකොට; විඳ, විඳිනයකොට හෙවත් අසා; වියන, විතාන යෙහි; රදන, රඤ්ජමානවූ; මිණිකිරණින්, මාණික්‍යයන්ගේ කාන්තියෙන්යුක්තව; උන්, සිටියාවූ; නයන, (දුටුවන්ගේ නෙත්‍රයන්; නදන, සන්තුෂ්ටියට පමුණුවන්නාවූ; පැරකුම්රදු, පරාක්‍රමබාහු රාජයා; දුන, සඤ්ජානනයකොට හෙවත් ඇදිනගෙන; මිතුර!, මිත්‍රයාණෙනි!, නයනගමන, නොපයන්නාවූ ගමනය; සැලකර, ප්‍රකාශකොට; අවසර රැගෙන, සමුගෙන.

47 ලකල් මිණි බිම් බිතු-කැල්මේ ගැලී නොපෙනි
ලියගී ලොබින් නොවසිට-එසෙබෙන් අවුත් මදනැස්.

47 ලකල්, මනොඥවූ; මිණි, මාණික්‍යමයවූ; බිම්බිතු, භූමින් හා භිත්තීන් පිළිබඳවූ; කැල්මේ, කාන්තියෙහි; ගැලී, නිමග්නව; නොපෙනී, අදෘශ්‍යමානව; හෙවත් කාන්තාවෝ අල්වා ගනිත්යයි භීතියෙන් මාණික්‍ය කාන්තිය තුළටවී සැඟවීම්කොට; ලිය, කාන්තාවන්ගේ; ගී ලොබින්, ගීතිකාවන් කෙරෙහි අභිලාෂයෙන්; නොවසිට, සිටිය නොකොට; එසෙබෙන්, ඒ රාජසභායෙන් නික්මී; මදහැන්, අදූරස්ථානයකට; අවුත්, ආගමනයකොට.

---

†රජ මුද්‍රිත.

මාණික්‍යමය භූමිහා බිත්තිය පිළිබඳ කාන්තියෙහි ගැල් කාන්තාවෝ තමන් අල්වා ගණිත්ය යන භීතියෙන් සැඟවීගත සත්‍රින්ගේ ගිනිකා ඇසීමෙහි අභිලාසයෙන් නොරඳ එයින් පිටත්ව නුදුරු තැනකට ගමනයකොට යන අවියි.

48 පෙරළුවිඳ ගෙන ගි රි ඳ කිරිසයු ර
කලඹන ද නැගි තොමද ඝොස අසු ර
තුරුසමුද න ද ඈ ම ද දෙන නොහැ ර
වැද දළද ගෙට දළ ද වඳු මිතු ර

48 පෙර, පූර්වකාලයෙහි; උවිඳ, උපෙන්ද්‍රයා විසින් හෙවත් ශ්‍රී විෂ්ණුදෙවරාජයා විසින්; ගිරිඳගෙන, මන්දර පර්වතය ග්‍රහණය කොට; කිරිසයුර, ක්ෂීරාර්ණවය; කලඹනද, ආලෝලනය කරන දවස්හි; නැගි, (එසේ) උද්ගතවූ; තොමද, අමන්දවූ හෙවත් මහත්වූ; ඝොසඅසුර, ඝොෂාකාරයෙන්; තුරුසමුදනද, පඤ්චතූර්‍ය්‍යනාදය; ඇමද, සෑම දවස්හි; නොහැර, නොනවත්වා හෙවත් කඩනොකොට; දෙන, ප්‍රදානය කරනු ලබන්නාවූ; දළදගෙට දංෂ්ට්‍රාධාතු මන්දිරයට; වැද, ප්‍රවිෂ්ටව; දළද, දන්තධාතුන්වහන්සේ; මිතුර!, (මාගේ) මිත්‍රය; වඳු, නමස්කාරකරව.

පූර්වකාලයෙහි ශ්‍රීකාන්තාව සෙවීම සඳහා සොද්‍යෝගවූ විෂ්ණු දෙවයා විසින් මන්දර පර්වතය රැගෙන ක්ෂීරසාගරය කලඹනලද බැව් පුරාණොක්තියි.

49 දළද පුදට දිවසෙන් එන ගුවන් ම ග
ඈමද දිලෙන දනමන කර නුවන් ද ග
විහිද කිරණ බබලන රන් කැරලි අ ග
සුසද මදක් ඉඳබද අග මිණික් ර ග

49 දළද පුදට, දළදාධාතුන් වහන්සේ පුදනු පිණිස; දිවසෙන්, දෙවසමූහයා; එන, ආගමනය කරන්නාවූ; ගුවන්මඟ, නභෝමාර්ගයෙහි; දන, ජනයන්ගේ; මනනුවන්, චිත්තනේත්‍රයන්; දනකර, බඳකොට හෙවත් වශීකොට; ඇමද, සෑමවේලෙහිම; දිලෙන, ජාජ්වල්‍යමානවන්නාවූද; රන්කැරලිඅග, සෞවර්ණ ශෘඞ්ගාග්‍රයෙහි; කිරණවිහිද, රශ්මිව්‍යාප්තකොට; බබලන, භ්‍රාජමානවූ; සුසදබඳ, මනාසේ සජ්ජිතකොට බඳනා ලද්දාවූ; අගමිණික්රග, ශ්‍රේෂ්ඨ මාණික්‍යයක් සෙයින්; මදක්, සවල්ප වේලාවක්; ඉඳා, ස්ථිතියකොට.

50 තෙල රතු බබ තුඩගින් මැද — පියා සර
සල සිත් නොවී සතොසින් කොට — පියා සර
නිලු'පුල් කලඹ විලසින් යන — පියා සර
නිල'ඹර අරා කෙරෙමින් සෙද — පියා සර

50. බබ, ශුෂ්මත්හුගේ; තෙලරතුතුඩගින්, මේ රක්තවර්ණ තුණ්ඩාග්‍රයෙන්; පියාසර, පක්ෂපත්‍රයන්; මැද, පරිමාර්ජනය කොට; සලසිත්නොවී, චඤ්චල චිත්තයෙන් යුක්තනොව; සතොසින්, සන්තුෂ්ටියෙන්; පියා, පක්ෂපත්‍රයන්; සරකොට, ස්ථිරකොට; (බියනොවී සතොසින් පියාපත් තරලෙස සජ්ජිතව තබාගෙන යන අර්ථයි.) සරපියා, තබාගය හැරදමා; යන, ප්‍රයාණය කරන්නාවූ; නිල්උපුල්කලඹ විලසින්, නිලොත්පලකලාපයක් සෙයින්; නිල්අඹරඅරා, නීලාම්බරයට නැගී; සෙද, ශීඝ්‍රව; පියාසර කෙරෙමින්, පක්ෂ ප්‍රසාරණය කරමින්:-

51 සරිව තිදිව පුරසුරකුම රුවන් මිලි
සුරුව දුරුව ඉඳ නොව නුව රුවන් මැලි
තරව ලොලව තබ මිනි රන් රුවන් කිලි
ගිරව! බලව කෙළිනාසොඳ රුවන් කෙලි

51 තිදිවපුර, ත්‍රිදශපුරයෙන් (අවුත්); මිලී, රාශිභූතවූ; සුරකුමරුවන් සරිව, දෙවකුමාරයන්ට සදෘශව; නුවරුවන්, නාගරික ජනයන්; සුරුව, සුරව ; දුරුව, දුරස්ථව හෙවත් ලං නොවී මැලීනොවඉඳ, මලානත්වයට නොපැමිණ ඉඳගෙන; කිලී, භාජයන්හි; රන් රුවන් තබමින්, සුවර්ණසහිත රත්නයන් බහමින්; තරවලොලව, දෘඪතරලෞල්‍යයෙන් යුක්තව; කෙළිනා, ක්‍රීඩනය කරනු ලබන්නාවූ; සොඳරුවන්කෙලී, යහපත් රත්න ක්‍රීඩාවින්; ගිරව!, කීරපක්ෂිය!; බලව, නිරීක්ෂණය කරව.

52 නිතොර ගිගිරි දෙන මිණි සලඹ — ලා ගෙන
අදර* සරණ අතුලෙන් සඳව — ලා ගෙන
පැකිර ඝනන මනහර සුර'ඹ — †ලා ගෙන
පවර පුර'ඹ රඟව මඟ බ — ලා ගෙන

52 නිතොර, නිරන්තරයෙන්; ගිගිරිදෙන, ගිරිගිරියන නාදය පවත්වන්නාවූ; මිණිසලඹ, මණිමය නූපුරවලාවන්; ලාගෙන, ප්‍රක්ෂේපකොටගෙන හෙවත් බහාගෙන; අදර-සරණ-අතුලෙන්- අදර, අධරය; සරණ, පාදය; අතුලෙන්, හස්තතල යන මෙයින්; සඳවලා, සන්ධ්‍යාවලාහකයන්; ගෙන, ග්‍රහණයකොට හෙවත් ජය

* අඹර.  † ලාවන.

හැන්වකොට; මනහර, මනොහරවූ; සුරඅඹලාගෙන, සුරාම්බිකාවන්ගේ ආකාරයෙන්; පැතිරයනෙන, ව්‍යාප්තවප්‍රයාණය කරන්නාවූ; පවර, ප්‍රවරවූ; පුරඅඹ, පුරාම්බිකාවන්ගේ; රහ, ආකාරය; වේවිහ, වීථිමාර්ගයේදී; බලාගෙන, නිරීක්ෂණයකොටගෙන: –

“ අදර සරණ අගුලෙන් සඳවලා ගෙන ”

අධර-චරණ-හස්තතල යන මෙයින් සන්ධ්‍යාවලාහකයන්ගේ ආකාරය ග්‍රහණයකොට යයි කීමෙන් තොල් සහ අත්පාවල රක්තවර්ණය දැක්වූහ.

මනස්කාන්තවූ ස්ත්‍රීන්ගේ තොල්ද, පාදයන්හි යටිපතුල්ද, හස්තයන්ගේ අත්තලයන්ද රක්තවර්ණවීම ස්වභාවධර්මයකි. රාත්‍රිකාලයේ අහසේ පෙණෙන වළාකුල්ද රක්තවර්ණයි. සන්ධ්‍යාවලාහකයන්ගේ ස්වභාව යථොක්ත වස්තූන්ට උපමිතවිය.

“සුරඹලාගෙන” යනතන්හි “ලාගෙන” යනු උපමාද්‍යොතක “වාගේ” යන පදයාගේ “ව” කාරයට “ල” කාරාදේශව සිද්ධයයි සැලකියයුතු මෙය අකාර යන මාතෘකාවචනයෙන් තද්භවවූ “ඇග්” යන්නෙහි “ඇ” කාරයට වකාරාගමහා පිළිපෙරළිකොට වාගේයයි සිද්ධයි. මෙයම ඇතැම්විටම “වාලේ” යයිද ව්‍යවහාරයෙහි පෙනේ. ගුත්තිලකාව්‍යයෙහි: —

“ දකිනු රඟක සුරඟන රඟලාගේ ”

53 දිමුත් සඳලුවල කෙලනා ළඳ අද ර
සුරත් බැබළි බිඹු පලයයි කර අද ර
පුවත් නොදැන ගොස් අඹු නොව යෙද මිතු ර!
අමුත් යලි සොඳුරු විසිතුරු වෙහෙර තු ර

53 දිමුත් දීප්තිමත්වූ; සඳලුවල, චන්ද්‍රිකාශාලාවන්හි; කෙළනා, ක්‍රීඩාකරන්නාවූ; ළඳ, කාන්තාවන්ගේ; අදර, අධරයෝ; සුරත්, අති රක්තව; බැබළි, භ්‍රාජිතවූ; බිඹුපලයයි, බිම්බඵලයවෙති කියා; අදරකර, ඇලුම් උපදවා; පුවත් නොදැනගොස්, තත්ව විමංසනයනොකොට ගමනයකොට; අඹුනොව, (ඒ) කාන්තාවන්ට අඹුනොවී; මිතුර!, මිත්‍රය!; සොඳුරු, සුන්දරවූ; විසිතුරු, විචිත්‍රවූ; වෙහෙරතුර, විහාරාන්තරයට; යලි, නැවත; සෙද, සිසුව; අමුත්, ආගමනයකොට: —

54 සැදි මුනිසඳ සසුන්-නැවි සසුන් කුම් අයුරු
සිව සිසි සුදු සිල් සිවරග සෙනෙග ගෙ න
පව් බල රුදුමල් සැවි දල දපහර න

විනයනය දත නැණ-පහතින ගිවන යනමෙන*
දහම් විදුරු පාරි නදින පිළි ඇදු රැ
දහම් ඇදුරු මාගිම්සඳ සහ සොඳ රැ

සහ පත් සිල් සුවඳ විලවුන් ගෙන නිබ ද
†පිරිවෙන් නැණ කුලුණු ගුණ අබරණ පැල ද
දිය යෙන් කරරදන කෙලෙසුන් සිඳ පසි ද
පිළිවෙත් සරු මහරු මහසඟගණ නැම ද

51 මුනිසඳ, සම්බුද්ධරාජයාගේ; සසුන්, ශාසන නැමැති; නැව්, නෞකාවෙහි; සැදී, සජ්ජිතවූ හෙවත් සුසජ්ජිතවූ: කසුන් කම් අසුරු, කාංචනකුම්භ සදෘශවූ හෙවත් රන්වූවා කුඹක් බඳුවද; සිව් පිරිසුදුසිල්, චතුපාරිශුද්ධිසීල නැමැති: සිව්රඟ සෙනඟ, චතුරංගසේනාවන්; ගෙන, ග්‍රහණයකොට; පව්බල, පාපනැමැතිහට යන් ඇත්තාවූ; රුදු, රෞද්‍රවූ; මල්සැව්, පුෂ්පායුධයාගේ සෙවන් අනඞ්ගයාගේ; දළදප, දෘප්තතර දර්පය; හරන, පහකරන්නාවූ; නැණපහතින, ප්‍රඥනැමැති ප්‍රදීපය ධාරණකොටගෙන; නිවන යන මෙන, නිර්වාණයට පැමිණෙන පරිද්දෙන්; විනයනය, විනය ක්‍රමයන්; දත, ජානනයකොට; දහම්, ශ්‍රී සද්ධර්ම නැමැති; විදුරු පාරිත, වජ්‍රායුධ ප්‍රහාරයෙන්; පිළිඇදුරු, වෛරී ආචාර්යයන්; අරිත, පහකරන්නාවූ; සොඳුරු, සුන්දරවූ; දහම් ඇදුරු මාගිම් සඳ සහ, ධර්මාචාර්ය මහාස්වාමීන්ද්‍රයාණන් වහන්සේ සහිතවූ; යස පත්, මනොඥවූ; සිල්, ශීලනැමැති; සුවඳ විලවුන්, සුගන්ධාලේපය; නිබඳගෙන, නිරන්තරයෙන් ආලිප්තකොටගෙන; පිරි, පූර්ණවූ; මෙත්, මෛත්‍රිය; නැණ, ප්‍රඥාය; කුලුණු, කාරුණ්‍යය; ගුණ, (ක්ෂාන්ත්‍යාදි විශිෂ්ට)ගුණයන මොවුන් නැමැති; අබරණ, ආභරණයන්; පැලද, පිලන්ධනය; කෙලෙසුන්, ක්ලේශයන්; සිඳ පසිද, අතිශයින් නෂ්ටකොට; දිය, ලෝකයාට; සෙත් කරරදන, ශාන්තිකොට වැජඹෙන්නාවූද; පිළිවෙත්සරු, ප්‍රතිපත්තිසාරවූද; මහරු, මහාර්ඝවූද හෙවත් ශ්‍රේෂ්ඨතරවූද; මහසඟ ගණ, මහාසඞ්ඝසමූහයා; නැමද, ප්‍රණාමයකොට:—

මෙහි "කසුන්කුම්" යන තැන "කුම්" යනු "කුම්භ" යන මාගධ හෝ සංස්කෘත ශබ්දයෙන් භින්නයයි සැලකියයුතු. "කලාප" "කලශ" "කපල" "කිඹුල්" යනාදිය මෙනි.

"අමල පදරබන්ධං සුධෝතොදරකුම්භං" යනු දාඨාවංසයි.

අමලපදරබන්ධං, සපිරවූ පුවරු බැඳීම් ඇති, සුධෝතොදර කුම්භං, මනාකොට පිසිපි මහත් කුඹක් ඇති යනුයි.

* විනයනය සෙද දත යනුව නිවණට නැණපහතින ඇතැම්.
† පිළිවෙන්.

ගැන්මකොට; මනහර, මනොහරවූ; සුරඹලාගෙන, සුරාම්බිකා වන්ගේ ආකාරයෙන්; පැතිරයනෙන, ව්‍යාප්තවප්‍රයාණය කරන් නාවූ; පවර, ප්‍රවරවූ; පුරඹ, පුරාම්බිකාවන්ගේ; රඟ, ආකාරය; වෙමඟ, වීථිමාර්ගයේදී; බලාගෙන, නිරීක්ෂණයකොටගෙන: –

“ අදර සරණ අතුලෙන් සඳවලා ගෙන ”

අධර–චරණ–හස්තතල යන මෙයින් සන්ධ්‍යාවලාහකයන්ගේ ආකාරය ග්‍රහණයකොට යයි කීමෙන් තොල් සහ අත්පාවල රක්තවර්ණය දක්වූහ.

මනස්කාන්තවූ ස්ත්‍රීන්ගේ තොල්ද, පාදයන්හි යටිපතුල්ද, හස්තයන්ගේ අත්තලයන්ද රක්තවර්ණවීම ස්වභාවධර්මයකි. රාත්‍රී කාලයේ අහසේ පෙණෙන වළාකුල්ද රක්තවර්ණයි. සන්ධ්‍යාවලාහකයන්ගේ ස්වභාව යථොක්ත වස්තූන්ට උපමිතවිය.

“සුරඹලාගෙන” යනතන්හි “ලාගෙන” යනු උපමාද්‍යොතක “වාගේ” යන පදයාගේ “ව” කාරයට “ල” කාරාදේශව සිද්ධයයි සැලකියයුතු. මෙය අසාර යන මාතෘකාවචනයෙන් තද්භවවූ “ඇශ්” යන්නෙහි “ඇ” කාරයට වකාරාගමහා පිළිපෙරළිකොට වාගේයයි සිද්ධයි. මෙයම ඇතැම්විටම “වාලේ” යයිද ව්‍යවහාර යෙහි පෙණේ. ගුත්තිලකාව්‍යයෙහි:—

“ දකිනු රඟන සුරඟන රඟලාගේ ”

53 දිමුත් සඳලුවල කෙළනා ළඳ අද ර
සුරත් බැබළි බිඹු ඵලයසි සාර අද ර
පුවත් නොදැන ගොස් අසුපොව සෙද මිතු ර!
අවුත් යළි සොඳුරැ විසිතුරැ වෙහෙර තු ර

53 දිමුත් දීප්තිමත්වූ; සඳලුතල, චන්ද්‍රිකාශාලාවන්හි; කෙළනා, ක්‍රීඩාකරන්නාවූ; ළඳ, කාන්තාවන්ගේ; අදර, අධරයෝ; සුරත්, අති රක්තව; බැබළි, භ්‍රාජිතවූ; බිඹුපලයසි, බිම්බඵලයවැනි කියා; අදරසාර, ඇලුම් උපදවා; පුවත් නොදැනගොස්, තත්ව විමංසනයනොකොට ගමනයකොට; අසූනොව, (ඒ) කාන්තා වන්ට අසුනොවී; මිතුර!, මිත්‍රය!; සොඳුරැ, සුන්දරවූ; විසිතුරැ, විචිත්‍රවූ; වෙහෙරතුර, විහාරාන්තරයට; යළි, නැවත; සෙද, ශීඝ්‍රව; අවුත්, ආගමනයකොට:—

54 සැදි මුනිසඳ සසුන්-නැව් සසුන් කුම් අයුරැ
සිව පිරි සුදු පිල් සිවුරඟ සෙසනඟ සෙ න
පව් බල රුදුමල් සැව් දල දපහර න

විනයනය දන නැණ-පහනින තිවන යනමෙන*
දහම් විදුරැ පාරින් අරින පිලි ඇදු රැ
දහම් ඇදුරැ මාහිමිසඳ සහ සොඳු රැ

යහ පත් සිල් සුවඳ විලවුන් ගෙන නිබ ඳ
†පිරිමෙත් නැණ කුලුණු ගුණ අබරණ පැල ඳ
දිය සෙත් කරැරදන කෙලෙසුන් සිඳ පසි ඳ
පිලි වෙත් සරැ මහරැ මහසඟගණ නැම ඳ

51 මුනිසඳ, සම්බුද්ධරාජයාණන්ගේ; සසුන්, ශාසන නැමැති; නැව්, නෞකාවෙහි; සැදී, සජ්ජිතවූ හෙවත් සුසජ්ජිතවූ; කසුන් කුම් අසුරැ, කාඤ්චනකූප සදෘශවූ හෙවත් රන්වලා කුඹක් බඳුවූද; සිව් පිරිසුදු සිල්, චතුපාරිශුද්ධිශීල නැමැති; සිව්රඟ සෙනඟ, චතුරඞ්ගසෙනාවන්; ගෙන, ග්‍රහණයකොට; පව්බල, පාපනැමැති භටයන් ඇක්සාවූ; රුදු, රෞද්‍රවූ; මල් සැව්, පුෂ්පායුධයාගේ හෙවත් අනඞ්ගයාගේ; දළදප, දුස්තර දර්පය; හරන, පහකරන්නාවූ; නැණපහනින, ප්‍රඥා නැමැති ප්‍රදීපය ධාරණකොටගෙන; තිවන යන මෙන, නිර්වාණයට පැමිණෙන පරිද්දෙන්; විනයනය, විනය ක්‍රමයෙන්; දන, ජානනය කොට; දහම්, ශ්‍රී සද්ධර්ම නැමැති; විදුරැ පාරින, වජ්‍රායුධ ප්‍රහාරයෙන්; පිලිඇදුරැ, වෛරී ආචාර්යයන්; අරින, පහකරන්නාවූ; සොඳුරැ, සුන්දරවූ; දහම් ඇදුරැ මාහිමි සඳ සහ, ධර්මාචාර්ය මහාස්වාමීන්ද්‍රයාණන් වහන්සේ සහිතවූ; යහ පත්, මනොඥවූ; සිල්, ශීලනැමැති; සුවඳවිලවුන්, සුගන්ධාලෙපය; නිබඳගෙන, නිරන්තරයෙන් ආලිප්තකොටගෙන; පිරි, පූර්ණවූ; මෙත්, මෛත්‍රිය; නැණ, ප්‍රඥාය; කුලුණු, කාරුණ්‍යය; ගුණ, (සත්‍යාදි විශිෂ්ට)ගුණයන මොවුන් නැමැති; අබරණ, ආභරණයන්; පැලඳ, පලඳිනා; කෙලෙසුන්, කෙලශයන්; සිඳ පසිඳ, අතිශයින් නෂ්ටකොට; දිය, ලෝකයාට; සෙත් කරැරදන, ශාන්තිකොට වැජඹෙන්නාවූද; පිලිවෙත්සරැ, ප්‍රතිපත්තිසාරවූද; මහරැ, මහාර්ඝවූද හෙවත් ශ්‍රේෂ්ඨතරවූද; මහසඟගණ, මහාසඞ්ඝසමූහයා; නැමඳ, ප්‍රණාමයකොට:—

මෙහි "කසුන්කුම්" යන තැන "කුම්" යනු "කූප" යන මාගධ හෝ සංස්කෘත ශබ්දයෙන් නිපන්නයයි සැලකියයුතු. "කලාප" "කලඹ" "කපිල" "කිඹුල්" යනාදිය මෙනි.

"අචල පදරබද්ධං සුධම්මතොදරකූපං" යනු දාඨාවංසයි.

අචලපදරබද්ධං, ස්ථිරවූ පුවරු බැඳීම් ඇති, සුධම්මතොදරකූපං, මනාකොට පිහිටි මහත් කුඹක් ඇති යනුයි.

---

* විනයනය සෙද දන යනුව තිවණට නැණපහනින ඇතැම්.
† පිලිවෙත්.

55 පොරණ රු සින් කී තොප යතුරට පව ර
ලද නි දො සි න් රිවිදින නැකත දිනක ර
කුමරි රා සි න් කිවි සුරගුරු සිටි තොහැ ර
මිතුර තො සි න්! වඩු සිහිකර මෙත් සුතු ර

55 තොප යතුරට යුෂ්මත්හුගේ යාත්‍රාකරණයට; පවර, ශ්‍රෙෂ්ඨවූ හෙවත් යොග්‍යතරවූද; පොරණ, පුරාණයෙහි; රුසින්, ඍෂින්විසින්; කී, ප්‍රකාශිතදවූ; රිවිදින, සූර්‍ය්‍යදිනයෙහි; නිදො සින්, (අවයොගාදි) දොෂවිරහිතභාවයෙන්; ලද, ලබ්ධවූ; දිනකර නැකත, දිවාකරනක්ෂත්‍රයයි කියනලද හතේ නැකතෙහි; කිවි, සිකුරු හා; සුරගුරු, වෘහස්පති යන මේ ග්‍රහයන්; සිටි, සිටියාවූ; කුමරිරාසින්, කන්‍යාරාශියෙන්; මිතුර!, මිත්‍රය!; මෙත්සුතුර, මෛත්‍රසූත්‍රය; තොහැරසිහිකර, අත්නොහැර ස්මරණයකොට; වඩු, ප්‍රයාණයකර.

ඉරුදිනයෙහි අවයොග, කානයොග, මරයොගාදියෙන් විනිර්මුක්තව හතේනැකතෙහි අමෘතයොගය යෙදුනකල කන්‍යා ලග්නයේ කිවි සුරගුරු සිටිවිට පිටත්වෙවයි නියමකිරීමෙන් මේ යොගය ගමනට යහපත් බැව් ශාස්ත්‍රනසින් ගැහවීය.

56 වි ල ද රු දු ණු මී මී අඹ පල රසැ ති
සොඳව පැ සු ණු දෙළුමුදු දිගු ඉගු කැම ති
ගෙනෙන තුරුණු කොමලඟ ලඟලඟ පැවැ ති
න ය න ද කු ණු දිග *බල මහ පෙර නිමි ති

56 මීරුදුණු, මීයෙන් අනනලද්දවූ; විලද, ලාජය; රසැතී, රසවත්වූ; මී අඹ පල, මධුරාම්‍රඵලයන්; සොඳව, යහපත්සේ; පැසුණු පරිණතභාවයට ගියාවූ; දෙළුමුදු, දාඩිමය; කැමැති; අභිලාෂය වඩිනාය කරන්නාවූ; දිගුඉගු, දීර්ඝඉක්ෂුය යන මෙතෙක්දූ; ගෙන, ග්‍රහණයකොට ලඟලඟපැවති, ළංළංව ප්‍රවෘත්තවූ; එන, ආගමනය කරන්නාවූ; තුරුණු කොමලඟ, තරුණාඞ්ගනාවන්; නයන, නා ප්‍රයාණය කරන්නාවූ දකුණුදිග, දක්ෂිණදිශායෙහිවූ; පෙරමග, පර්පථයෙහි; නිමිති, ශුභනිමිති වශයෙන්; බල, නිරීක්ෂණයකර.

57 නොමඳ නෙඳගි සිරි සැරකුම් නර පා ය
සා හා ද සගන ගෙන සිමි බැඳ† දල පා ය
නි බ ද පොහොනස කරවන ඇලෙස නාල පා ය
ස බ ද වඩින දනා‡ ගෙනවසින සන පා ය

* මහ. † ගල. ‡ දූත සමහර.

57 නොමඳ තෙදැති, අමන්ද තෙජස්ගුණයෙන් යුක්තවූ; සිරි පැරකුම් නරපාය, ශ්‍රී පරාක්‍රමබාහු නරවීරයා විසින්; පැහැද, ප්‍රසන්නභාවයට පැමිණ; සගන ගෙන, සඞ්ඝයා පමුණුවා; දළපාය, දුස්තර ප්‍රයාසයෙන්; හිමි, ශීමාව; බැඳ, බන්ධනයකොට; නිබඳ, අනවරතයෙන්; පොහොය කරවනලෙස, පෞෂථකර්මය කරවන අදහසින්; කළ, කරවන ලද්දවූ; පාය, පෞෂථාගාරය; දැක, අවලොකනයකොට; නෙතසිත, චිත්තනෙත්‍රයන්; සතපාය, සන්තර්පණයකොට; සබඳ! (මාගේ) ප්‍රියමිත්‍රය!; වඩිත, ප්‍රයාණය කරන්.

58 වටින නොයෙක් බඩු ඇරගෙන ඇම ද ම
වටිනා මිලට නොවිකොට කොට වෙළ ද ම
සිටින ලියන් දැක සිහිකැරැ බණ ද ම
වඩින සෝන් ගස සෙවනේ නොර ද ම

58 වටින, ආසක්තකටයුතුවූ; නොයෙක්බඩු, නානාවිධභාණ්ඩයන්; ඇරගෙන, ග්‍රහණයකොට අවුත්; ඇමදම; සැමදවස්හිම; වටින මිලට, යොග්‍යවූ මුදලට; නොවිකොට, වික්‍රයනොකොට; වෙළඳමකොට සිටින, වණික් කර්මයකොට ස්ථිතියකරන්නාවූ; ලියන්, කාන්තාවන් දැක දර්ශනයකොට; බණදම, සම්බුද්ධධර්මය; සිහිකැරැ, අනුස්මරණය කොට; (අධර්මවෙළඳාමෙන් ලැබෙන අනිෂ්ටවිපාකය සිහිකොටයයිසේයි) සෝන්ගස සෙවනේ, එනම් ස්ථානයෙහි; හොරඳම, නොනැවතීව; වඩින, ප්‍රයාණයකර.

59 ගවසා සුනිල් වරලස කුසුම් පටි යෙන
වෙසෙසා * තනන නතරන්† තිසර පටි යෙන
සරසා‡ දීවෙන ලියදැක නගන අටි යෙන
තොලසා මිතුර යාගන් තොසිට යටි යෙන

59 සුනිල්, අතිනීලවර්ණවූ; වරලස, ධම්මිල්ලය; කුසුම්පටියෙන, පුෂ්පදාමයෙන්; ගවසා වෙඨනයකොට; වෙසෙසා, විශෙෂයෙන්; නතන, නිතියෙන්නාවූ හෙවත් ලෙලදෙන්නාවූ; තන, පයොධරයන් නැමැති; රන්තිසර, සුවර්ණහංසයන්; පටියෙන, වස්ත්‍රඛණ්ඩයෙන්; සරසා, සජ්ජිතකොටගෙන, යන, ප්‍රයාණයකරන්නාවූ; නා, යුෂ්මත්හුකෙරෙහි; අටියෙන, අභිලාෂයෙන් හෙවත් නා අල්වාගැනීමෙහි ආශායෙන්; දිවෙන, ධාවනයකොට එන්නාවූ; ලිය, කාන්තාවන්; දැක, අවලොකනයකොට; යටියෙන; යටියෙන නම් ග්‍රාමයෙහි; නොසිට, ස්ථිතියනොකොට; තොලසා, අනලස්ව; මිතුර!, මිත්‍රය!; යාගන්, ප්‍රයාණය කරන්.

---

* වෙහෙසා. † නතයන්. ‡ සගසා.

60 රිවි තුඹ ගැබින් බැස - හෙළසිඳු බැබළි යාගේ
සකි තුඹ ගැබින් ගොස් වැද - වෙහෙරට පැළිළි යාගේ

60 රිවි, සූර්යයා; තුඹගැබින්, නභෝගර්භයෙන්: බැස, අව තීර්ණව; සිඳු, සමුද්‍රයෙහි; බැබළියාගේ, භ්‍රාජමානව, හෙත, පතිත වනකල්හි; සකි, සගය; (ශුෂමන්තෙම) තුඹගැබින්, ආකාශගර්භ යෙන්; ගොස්, ගමනයකොට; පැළිළියාගේ, පැළිළියාත නම් ග්‍රාමයෙහිවූ; වෙහෙරට, විහාරයට; වැද, ප්‍රවිෂ්ටව:—

61 පුන් සඳ කිරණ එන තුඹ ගඟ වතුරැ ලෙස
නන්කොඳ කුමුදු සමඟව දිලෙන තුරැ රැස
දුන් සඳ මුනිඳු පුදයට පසඟ තුරැ ගොස
මන් බැඳ ලගින් පවුරස මි අඹ තුරැ හිස

61 තුඹගඟ, ආකාශ නැමැති ගඞ්ගාවට; වතුරැලෙස, ජලප්‍ර වාහයක් පරිද්දෙන්; පුන්සඳකිරණ, පූර්ණචන්ද්‍ර රශ්මිය; එන, ආග මනයකරනකල්හි; තොහොත් තුඹගඟ, ආකාශ ගඞ්ගායෙහිවූ; වතුරැලෙස, ජලප්‍රවාහයක් සේසින්; පුන්සඳකිරණ, පූර්ණචන්ද්‍ර රශ්මිය; එන, (ප්‍රසාරිතව) එනකල්හි; තුරැරැස, තාරාසමූහයා; නන්කොඳ, නානාකුන්දයන් හා; කුමුදුසමඟව, කුමුදන් හා සම ගින්; දිලෙන, ජ්වලිතවනකල්හි; මුනිපුදයට, බුද්ධපූජා පිණිස, පසඟතුරැගොස, පඤ්චාඞ්ගිකතූර්යනාදය; දුන්සඳ, ප්‍රදානය කළ කල්හි; (චන්ද්‍ර රශ්මිය පැතිරීම හා තාරකා සමූහයාගේ බැබළීමද සඞ්ඛ්‍යා බුද්ධපූජාවද පවත්නාකාලයයි සේයි) පවුරස, ප්‍රාකාර සමීපයෙහිවූ; මි අඹ තුරු, මධුරාම්‍රවෘක්ෂයක්හුගේ; හිස, ශීර්ෂයෙහි; මන්බැඳ, චිත්තාභිලාෂයකොට; ලගින්, නිවාසග්‍රහණය කරන්.

62 රඳ මුහුද* රත්මිණි කිරණින් වෙසෙස
ලඳ දිනිඳු† රතුපුල්කැරැ රැස් සහස
ලඳ සිරස වැතුවාමෙන් ඉඳුරැ දෙස
ළඳ අරුණු දිසි සඳ තුඹ ගඟින් බැස

62 මුහුද, සමුද්‍රකුක්ෂියෙහිවූ; වෙසෙස, විශෙෂයෙන්; රත්මිණි, රත්නමණි (පද්මරාග) න්ගේ: කිරණින්, නානාතිසකළඹයෙන්; රඳ, රඤ්ජනකොට (නානාතිසකළඹය ආලිප්තකිරීමෙන් රත්නවර්ණ යු ක්තවයයි සේයි) ලඳදිනිඳු, උදයප්‍රාප්තවූ සූර්යයෙමේ; සහසරැස්, සහස්‍ර සංඛ්‍යාත (සර්ය) රශ්මිය; රතුපුල්කැරැ, රක්තෝත්පලයෙසේ සිත් කොට, ලඳසිරස, උදය පර්වත ශීර්ෂයෙහි වැතුවාමෙන්, විස්තීර්ණකළාසේ; එදා, තත් දිනයෙහි; ඉඳුරැදෙස, ඓන්ද්‍රදිශා

* රත්මිණි. † රතුකරසියරැස් සහස ඇතැම්.

යෙහි; අරුණුදිසිසඳ, අරුණාලෝකය දෘශ්‍යමානවූ කල්හි; තුඹ යුෂ්මත්හු; ගසින්, (නිර්මාසස්ථානකොටගත් ආම්‍ර) වෘක්ෂයෙන්; බැස, අවතීර්ණව:—

63 දිනිතිය දිවයුරුට-අදිතිය අයුරු රිවිකුල
ලෙව්වැසිමන් තුටුකර රැඳි සුපිරිසු
මවු බිසවුන් උදෙසා අප නිරිඳු ස
කරවූ තුනුරුවන්-සතු සොඳ රුවන් වෙහෙර හි

මතු සගමොක් සිදුවන ලෙස මිතුරන ට
සිතු සතොසින් සැපමිණ මුනි මැඳුරක ට

සුගත් පසිඳු ගුණවැකි මනිනි තුඩ ගය
මහත් සසර සයුරෙන් නැගුණු නිස ගය
කුසින් තබා කියමින් මුනිඳු ගුණ ගය
පිනත් බඳව වැද පෙති පිළිම සහ ගය

63 දිවයුරුට, දිවාකරයාට; දිනිතිය, ජනෙතෘවූ හෙවත් මාතෘවූ; රිවිකුල, සූර්‍ය්‍යවංශයට හෙවත් සූර්‍ය්‍යවංශයාගේ ප්‍රාදුර්භාවයට; අදිතිය අයුරු. අදිතිනම් සුරමාතෘහු සදෘශවූද; ලෙව්වැසි, ලෝකවාසීන්ගේ; මන්, චිත්තයන්; සුපිරිසුදු, අතිපරිශුද්ධව; තුටුකැර, සන්තුෂ්ටකොට; රැඳි, රඤ්ජිතවූද; මවුබිසවුන්, මාතෘමහෙසිකාවන්; උදෙසා, සඳහා; අප නිරිඳු සඳු, අප්ගේ නරෙන්ද්‍රචන්ද්‍රයා විසින්; තුනුරුවන් සතු, රත්නත්‍රයසන්තක කොට; කරවූ, කාරාපිතවූ; සොඳ සුන්දරවූ; රුවන්වෙහෙරෙහි, රත්නවිහාරයෙහිවූ; මුනිමැඳුරතට, බුද්ධප්‍රතිමාලයට; මිතුර!, (මාගේ) ප්‍රියසහචර!; තට, යුෂ්මත්හට; මතු, අනාගතයෙහි; සගමොක් සිදුවන ලෙස, ස්වර්ගමොක්ෂසම්පත් ප්‍රතිලාභයවන පරිද්දෙන්; සිතු සතොසින්, චිත්තසන්තුෂ්ටියෙන් යුක්තව; සැපමිණ, සම්ප්‍රාප්තව; සුගත්, සර්වඥයන්වහන්සේගේ; පසිඳුගුණ, ප්‍රසිද්ධවූ (නවඅරහාදි ගුණයන්; තුඩගය, තුණ්ඩාග්‍රයෙහි; වැකිමනිනි, ආලිප්තවූ ප්‍රමාණයෙන්; (බුද්ධගුණයන් දිවඟ රැඳුනු ප්‍රමාණයෙන් යයි සේසි) නිසගය, නිසගීයෙන්; මහත්, විශාලවූ; සසරසයුරෙන්, සංසාර නැමැති සාගරයෙන්; නැගුණු, උද්ගතවූ; (භවගත්තාවූ) කුසින්, කෞශිකයෙ; තබා, බැහැලා; අගය, අග්‍රව; මුනිදුගුණගය, සර්වඥයන්වහන්සේගේ ගුණාඞ්ගය; කියමින්, කථනය කොරෙමින්; පෙති පිළිම, ආලෙඛ්‍යරූපයන් සහිත ප්‍රතිමාරූපයන්; වැද, අභිවාදනයකොට; සහගය, ආසක්තිසහිතවූ; පින්, පුණ්‍යඵලයක්; අත් බඳුව, හස්තගතකළ මැනව.

64 බිතු සිතුයම් ඇඳි පෙළෙලෙ'නුදුලන' අතු රූ
අතු රැඳි ගිරවුන් සැටි දැක සොඳු රූ
නතු නොමදන ලොබ බැඳ වැද නොව නිස රූ
සිතු තුටුකැරැ දැක එහි නොයෙක විසිතු රූ

64 සිතුයම් ඇඳි, චිත්‍රකර්මකළාවූ; බිතු, භිත්තියෙහි; පෙළෙන්, පෙළයෙන්; උදුලන, ජ්වලමානවූ; අතුරූ, ආම්‍රවෘක්ෂයන්හි, අතු අත, ශාඛාන්තරයන්හි; රැඳි, රඤ්ජිතවූ; සොඳුරු, සුන්දරවූ; ගිරවුන්, කිරපක්ෂීන්ගේ; සැටි, විශෙෂවිලාසය; දැක, දර්ශනයකොට; නතුනොමදන, තත්ත්වය ජානනයනොකොටම; (ජානනයනොකිරීමෙන්ම) ලොබබැඳ, ලොභබන්ධනයකොට; වැද, ප්‍රවිෂ්ටව; නිසරුනොව, (ලොකයාගේ නිගාමට නොපැමිණ; එහි, තද් විහාරයෙහිවූ; නොයෙක, නානාවිධවූ; විසිතුරු, චිත්‍රකර්මයන්; දැක, දර්ශනයකොට; සිතු තුටුකැරැ, චිත්තසන්තොෂයකොට:-

65 වසවතු දප් බිඳ බුදුවූ ගුණ නදන
අප දිය බප් මුනි ද ගැබ තර නදන
කෙළ මුළුකප් පවතින් ලෙස කල නදන
වැද දගැප් වඳිනාසඳ දිය නදන

65 වසවතු, වශවර්ත්තිනම් දිව්‍යපුත්‍රමාරයාගේ; දප්බිඳ, දර්පභඞ්ගකොට; බුදුවූ, බුද්ධත්වයට පැමිණියාවූ; ගුණනදන, ගුණනිධානවූ; දියබප්, ජගත්පිතෘවූ; අපමුනි, අපගේ ගෞතම සර්වඥයන් වහන්සේගේ; ද, ධාතූන්; ගැබ, ගර්භයෙහි;(අභ්‍යන්තරයෙහි) නදනකර, නිධානගතකොට; මුළුකප්කෙළ, සම්පූර්ණකල්පයාගේ අවසානයෙහි (ද); පවතින ලෙස, ප්‍රවෘත්තවනු පරිද්දෙන්; කළ, කරනලද; නදන, නන්දනීයවූ; දගැප්, ධාතුගර්භය: (චෛත්‍යරාජයා) නදන්. සන්තුෂ්ටවූ; දිය, ලොකයා; වඳිනසඳ, වන්දනයකරන විට; වැද, (තෝද) වැදලා:-

66 නි ස ග පවග දෙන මුනි උපදි නා දිනේ
ස මි ග ඉපිද පිහිටව පැවැති හැම දිනේ
ලොවග පුදන ලද දුම රදුම සබ දිනේ
†ස ව ග සැසන් පිදුවන ලෙසට නම දිනේ

66 නිසඟ, නිසර්ගයෙන් (ම); අපවගදෙන, අපවර්ගසම්පත්ති ප්‍රතිලාභය කරන්නාවූ; මුනි, සර්වඥරාජයා; උපදිනාදිනේ, උත්පන්නදිනයෙහි; සමග, ඒ සර්වඥයන්වහන්සේ සමඟව; ඉපිද, උත්පන්නව; හැමදිනේ, සැමදිනයන්හි; පිහිටවපැවැති ප්‍රතිෂ්ඨාසථා

† සසග බොහෝ.

තයක්ව පැවැත්තාවූද; ලොවග, ලොකනායකවූ සර්වඥරාජයා කෙරෙන්; පුදයලද, (අනිමිසලොචන) පූජාලද්දවූ; දුමරදට, (අශ්වත්ථබොධි) ද්‍රැමරාජයාට; සබදිනේ, යහළුව; සව්, සියලු; අග සැපත්, ශ්‍රෙෂ්ඨවූ සම්පත්තිය; සිදුවන ලෙසට, සිද්ධවන පරිද්දෙන්; නමදිනේ, ප්‍රණාමය කරන්.

**“සමග ඉපිද පිහිටව පැවැති හැමදි සේ”**

බොධිසත්වයන් වහන්සේ සමග හෙවත් එකදම බොධිද්‍රැම රාජයා පහළවිය යනු ආගමයි. මේ බොධිද්‍රැම රාජයා පමණක් නොව යශොදරා දෙවිය, ඡන්නාමාත්‍යයාය, කාළුදායි අමාත්‍ය යාය, කණ්ඨක අශ්වරාජයාය, අජානීය හස්තිරාජයාය, සතරමහා නිධානයය යන මොව්හු එක දවසෙහි උපන්නෝ වෙති.

**“ලොව'ග පුදය ලද දුම රදුට සබදි සේ”**

සමස්තජගද්ව්‍යාපි නිර්මලතර කීර්ත්‍යාලොක ඇති ගෞතම සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ සම්බුද්ධ රාජ්‍යශ්‍රියට පැමිණ තමන් වහන්සේට මහොපකාරීත්වයෙන් පිහිටවූ බොධිරාජයාට අනිමිෂ ලොචනයෙන්ම හෙවත් ඇසිපිය නොහෙලීමෙන්ම එනතැන සිටගෙන සතියක් මුළුල්ලෙහි නෙත්‍රපූජාකළබව මෙයින් ප්‍රකා ශිතයහ.

67 එවෙහෙර *තුළ රදන-මනහර මහරු සඟගණ
මෙතින් සොඳුරු පිරිසුදු †අගමහෙහි සො ද
නිති න් තිලෝගුරු හට පිළිවෙතින් පු ද
හරදල නෙතගවන්-හිමි** තද නොදිනා බබල න
අ මා කර විනය සිඳුනය රුවන්ග ල
තමා ණැන තරිඳු කිරණින් උදම් ක ල
නොමද වි ශ න් ගඟ රළ වැලසේ පුබු දු
නි බ ද දි මු න් සිව් පිරිසුදු සිල් පුරු දු
පැහැද ම හ න් මුණි බණ රද සුමෙහි පසි ඳු
නැ ම ද සුනෙත් මහදෙව් පිරුවන් නොපි ඳු

67 එවෙහෙර තුළ, එම රත්නමහා විහාරාභ්‍යන්තරයෙහි; රදන, රඤ්ජමාන වන්නාවූ; මනහර, (දුටුවන්) සිත් පැහැර ගන් නාවූ; මහරු, (ගුණවිශිෂ්ටත්වයෙන් මහාර්ඝවූ; සඟගණ, සඞ්ඝ සමූ හයා; පිරිසුද, පරිශුද්ධවූ; සොඳුරු, සුන්දරවූ; මෙතින්, මෛත්‍රිය කරණකොටගෙන; අගමහෙහි, ශ්‍රෙෂ්ඨ ප්‍රතිපත්ති සඞ්ඛ්‍යාත මාර්ගී

*තුර. †හියමගෙහි. **හිමි-හැම.

යෙහි; යොදා, යොජිතකරවා; තිනින්, අනවරතයෙන්; තිලෝ ගුරුහට ත්‍රෛලොක්‍යාචාය්‍යීයන් වහන්සේට; පිළිවෙතින්, ප්‍රති පත්තියෙන්; පුදා, පූජාකොට; හර, ඓශ්වරයාගේ; දලඟනනග වන්, ලලාටාක්ෂි වන්ති සදෘශවූ; හිමි, උත්තුඞ්ගවූ; තද තෙදිනි, සන්බන්ධ තෙජස් කරණකොටගෙන; බබලන, භ්‍රාජමානවූද; අම්බ කර, අම්බතාකාරවූ; නය, ක්‍රමලක්ෂණවූ; රුවන්ගල, රත්න සමූ හය ඇති; විනයසිඳු, විනයලක්ෂණ සමුද්‍රය; නමා, නමන්වහන් සේගේ; නැණ, ප්‍රඥාලක්ෂණවූ; නරිඳුකිරණින්, චන්ද්‍රකාන්තිය කරණකොටගෙන; උදම්නල, උද්දාමකළාවූද; වියත්ගඟ, ආකාශ ගඞ්ගායෙහි; පුබුදු, කාන්තිමත්වූ; රළවැළසේ, තරඞ්ගාවලී සෙ සින්; නිබඳ, නිරන්තරයෙන්; දිමුත්, දීප්තිමත්වූ; සිව්පිරිසුදුසිල්, චතුපාරිශුද්ධිශීල සංරක්ෂණයෙහි; පුරුදු, පරිචිතවූද; පැහැද, චිත්තප්‍රසාදයකොට; මහත්, උත්තරතරවූ; මුනිබණ, සම්බුද්ධධර්ම යාගේ; දෙසුමෙහි, දෙශනා කිරීමෙහිලා; පසිදු, ප්‍රසිද්ධවූ; සුනෙත් මහදෙව්පිරුවන් තෙරිඳු, සුනෙත්‍රා මහෙසියගේ නාමයෙන්කරවූ පිරුවන් නායක යතීන්‍ද්‍රයාණන් වහන්සේ; නැමද, අභිවාදනය කොට:–

68 ස වන් පුදට* සැපමිණි බැලුව කොමල ගේ
නු වන් කැලුම් වැද තුඩ මලින වෙයි න ගේ
එ වන් කිලුටු වනතෙක් නොසිට උත්ල ගේ
ප වන් මගට වැද යාගන්න මනර ඟේ

68 සවන්, සජීඥයන්වහන්සේට; පුදට, පූජා පිණිස; සැප මිණි, සම්පාපතවූ; කොමලගේ, මොලොකැටි දෙහ ඇති කාන්තා වන් හෙවත් සුකොමල ශරීර ඇති කා[illegible]වන්; බැලුව, නිරීක්ෂ ණය කළහොත්; නුවන් කැලුම්, නෙත්‍රකාන්තිය; වැද, සට්ටිතව; නගේ, යුෂ්මත්හගේ; තුඩ, වඤ්චුව; මලිනවෙයි, මලානික වන් නේය හෙවත් කිලුටුවන්නේය; එවන්, තත් ප්‍රකාරවූ; කිලුටුවන තෙක්, කාලිමටභාවයක් වනතුරු; උත්ලගේ, ඒ සත්‍රින්ගේ සමීප යෙහි; නොසිට, සවිසිය නොකොට; පවන්මගට වැද, ආකාශ මාර්ගට ප්‍රවිෂ්ටව; මනරගේ, චිත්තාභිලාෂ පරිද්දෙන්; යාගන්න, යාත්‍රාගමණයකර.

69 සි ත් ඒ ඩි ගෙන් හුදකළ සාමගිම් ගෙයෙහ නා
ල ත් අ ඩි ගෙන් ගනුමුව ඉඳ මනමකි නා
ම ත් වැ ඩි ගෙන් ලිය ගි කිගන නැගා කැ නා
අ ත් නි ඩි ගෙන් ගව ළඳලිය දක ගෙසා බ නා

---

*සපැමිණි.

69 තමහිමි, තමන්ගේ ස්වාමිවරුන් විසින්; සිත් එඩියෙන් චිත්තගර්ජියෙන්; යුදකරු, සඞ්ග්‍රාම කොට්න්; යෙහෙන, සුවසේ; ලත්අඩියෙන්, ලබනලද පදවිය හෙතුකොටගෙන හෙවත් රජු වෙතින් ලත් තනතුරු නිමිත්තකොට; සතුටුව, තුෂ්ටිප්‍රාප්තව; මත මතින, චිත්තමදයෙන් යුක්තව; ඉඳ, උපවේශයකොට; මත් වැඩියෙන්, අධිකමාත්‍රා නැඟීමෙන් හෙවත් ඝොෂාන්විතව; නැත නැත, තන්හි තන්හි; ලියගී, ලයාන්විත ගීතිකාවන්; කියන, ප්‍රකාශ කරන්නාවූ; සොබන, සොභනවූ; ළඳලිය, තරුණාඞ්ගනාවන්; දුක, දර්ශනයකොට; අත්තිඩියෙන්, අත්තිඩිය නම්වූ ග්‍රාමයෙන්; **යව, යාත්‍රාකරව.**

**70 පල පල පොරඹ‘ණ යන-ගව මී රළ ගිගිළි යෙන්**
**ගව පල් කෙළිනා සොළිඟයන්-යව ඉවූ මොරවූ එළි යෙන්**

70 පළ පළ, තන්හි තන්හි හෙවත් ස්ථානයක් ස්ථානයක්හි; පොරඹ‘ණ යන, පොරඅැණ යන්නාවූ; ගව මී රළ, ගොමහිෂ සමූහයන්ගේ; ගිගිළියෙන්, ගර්ජනයෙන්ද; කෙළිනා, ක්‍රීඩනය කරන්නාවූ; ගවපල්, ගොපාලයන්ගෙන්ද යුක්තවූ; මොරටු එළියෙන්, මොරටු එළිය නම් ස්ථානයෙන්; කෙලියෙන්, එකඑල්ලේ; ඉ ..., යහළුව; යව, ප්‍රයාණයකර.

**71 ස බ ඳ! මඳක් නැත ගියමග දකුණුප සේ**
**වි හි ද තිබෙන වලුබර පොල් උයන් රු සේ**
**නොමඳ තරඟ පහරට බියව නොක ම සේ**
**මු හු ද කැළුම් රැස්වූ වැන්න වෙරළ සේ** ×

71 සබඳ!, මිත්‍රයාණෙනි!; මඳක්තැන්, මඳක් දුරට; ගිය, ප්‍රයාණයකළ කල්හි; මග, මාර්ගයාගේ; දකුණුපසේ, දක්ෂිණපාර්ශ්වයෙහි; විහිද තිබෙන, විස්තීර්ණව තිබෙන්නාවූ; වලුබර, ඵලභරිතවූ; පොල්, නාලිකෙර වෘක්ෂයන්ගෙන් යුක්තවූ; උයන්රුසේ උද්‍යාන පඞ්ක්තිය (කෙසේද?;) නොමඳ, අමන්දවූ; තරඟ පහරට, තරඞ්ග ප්‍රහාරයට; බියව, භීතව; නොකමසේ, එකහෙළා; මුහුද කැළුම්, සමුද්‍ර කාන්තිය, වෙරළසේ, වෙලාන්තයෙහි; රැස්වූවැන්න, රාශිභූතවූමෙනි.

ඵලභරිත නාලිකෙර වෘක්ෂයන්ගෙන් යුක්ත උද්‍යාන පඞ්ක්තිය කෙසේදැයි යතහොත් චණ්ඩමාරුතයෙන් කම්පිත තරඞ්ගයන් දෙන ප්‍රහාරය නොඉවසා සමුද්‍රයෙහි නීලවර්ණ භයපත්ව අවුත් වෙරළ අසල රැස්ව සිටින්නාක්මෙන් වේ.

72 නි ල ඹ රේ වැජඹෙන ගනකුළු ලෙස ව
මු ද තෙ රේ යන එන නැව් *පෙනෙනා ත ව
පැ ර ත රේ †පියදුක් නොසිතා ගතා ව
පා ත දු රේ නොපිටත්'තරව යව එපි ට ව

72 නිලඹරේ, නීලාකාශයෙහි; වැජඹෙන, විජෘම්භමාණවූ; ගනකුළුලෙසව, මේඝකූට සෙයින්; මුදතෙරේ, සමුද්‍රතීරාසන්නයෙහි; යන එන, යාම්ඊම් කරන්නාවූ; නැව්, නෞකාවන්; තව, සූක්ෂමත්හව; පෙනෙන, දෘශ්‍යමානවනතේහි; ගතව, ශරීරය පිළිබඳවූ; දුක්, දුඃඛයන්; නොසිතා, චින්තනය නොකොට; (ශරීරයට දුක් පැමිණෙත්යයි මෙනෙහි නොකොට යනු භාවයි.) පිය, පියාපත්; තරේපැර, තරයේ ගසා; පාතදරේ නොපිටත්, පාතදුරා තීර්සථානයෙන්; එතරව, උත්තරිතව; එපිට, දූරස්ථානයට; යව, ප්‍රයාණය කර.

73 ක න ලා උපුල් මල් ගවසා කෙස්වැ පිය
බි ද ලා ¶පොකුරු කුරු කර මුතුහර සැ පිය
බැ ද ලා ගවන් වෙත ගවපලු ලිය සි පිය
††නොබලා මිතුර! යාගත් මග පොතු පිය

73 කන, කර්ණයන්හි; උපුල්, උත්පලයන්; ලා, බහාගෙන; කෙස්වැටිය, කේශකලාපයෙහි; මල්, පුෂ්පයන්; ගවසා, ප්‍රවිෂ්ට කොට; පොකුරුකුරු, පුෂ්කරාඞකුරයන්; බිඳ, භග්නකොට; මුතු හර සැටිය, මුක්තාහාර විලාසයෙන්; කර, ග්‍රීවායෙහි; ලා, පිළඳින කොට ගෙන; ගවන්, ගවයන්; බැඳලා, බන්ධනයකොට; වෙත, (උන්ගේ) සමීපයෙහි; සිටිය, ස්ථිතය තලාවූ; ගව පලුලිය, ගොපාල ස්ත්‍රීන්, නොබලා, අවලෝකනය නොකොට; මිතුර!, මිත්‍රය!; පොතුපිටිය, පොතුපිටිය නම් ග්‍රාමයෙහිවූ; මග, මාර්ගයෙහි; යාගත්, යාත්‍රාග්‍රහණය කරත්.

74 දු ල් පවු කලල් තලාය දී ත ලාය
පු ල් රතු උපුල් මලාය සවන ලාය
ග ල් කුළු මුදුන් වලාය සිඹිත ලාය
ඇ ල් වෙවිලියන් බලාය යන්ප ලාය

74 දුල්, කාන්තිමත්වූ; පවුකලල්තලාය, පවුවූ ලලාටස්ථලයෙහි; තලාදී, තිලකාලම්බයකොට; පුල්. විකසිතවූ; රතු උපුල්මලාය, රක්තෝත්පල පුෂ්පයන්; සවන, කර්ණයන්හි; ලාය,

*පෙනෙය-ඇතැම්. †පිය-ඇම. ¶පොකුරුකරලා. ††නොබලා.

ප්‍රක්ෂේපකොට; ගල්කුළු, පර්වතකූටයන් පිළිබඳවූ; මුදුන්වලාය, මස්තකයන්හි; සිටි, ස්ථිතියකළාවූ; කලාය, තෘණකලාපව; ඇල් ගෙවිලියන්, ශාලිගොපිකාඞ්ගනාවන්; බලාය, නිරීක්ෂණයකොට; තෝ, යුෂ්මත්තෙම; පලාය, ප්‍රයාණයකර.

75 වෙනේ මියුරු පල රස විඳ මග දෙපි ට
සෙනේ වඩා වැද සිය නෑසිය වෙත ට
මෙනේ ගිමන් දුක් දුරුකර ගිය තොප ට
පෙනේ සොඳුරු පලතුරු මෙගොඩ කළුතො ට

75 මග දෙපිට. මගෝභය පාර්ශ්වගතවූ; වෙනේ, වනයෙහි; (සඤ්ජාතවූ) මියුරුපල, මධුරවූ ඵලයන්හි; රස, රසය; විඳ. විඳිනයකොට හෙවත් අනුභවකොට; සියනෑසිය වෙතට, ශතසඞ්ඛ්‍යාතවූ ඥාතිසාලෝහිතයන් සමීපයට; සෙනේවඩා, ස්නේහවර්ධනය කොට; වැද, ප්‍රවිෂ්ටව; ගිමන්, ග්‍රීෂ්මය සහිතවූ;මෙනේදුක්, මනොදුඃඛය; දුරුකර, දූරීභූතකොට; ගිය, ප්‍රයාණයකළාවූ; තොපට, යුෂ්මත්හට; පලතුරු, ඵලහරිතවෘක්ෂයන් කාරණකොට ගෙන; සොඳුරු සුන්දරවූ; මෙගොඩ කළුතොට, මෙගොඩ කළුතොට නම් ප්‍රදේශය; පෙනේ, දෘශ්‍යමානවේ.

76 උඳු මුං තල කලන් මාරුතු * තණ විව ග
කිතුල් තල් තැඹිලි අඹ රඹ උගු සම ග
ඇමකල් සැදි † නොයෙක් කෙත්වත් දුක එම ග
මදතැන් නොසිත් තො ගොසින් මිතුර මනර ග

76 උඳු, රාජමාෂය; මුං, මුද්ගය; තල, තලය; කලන්, කුලත්ථය; මාරුතු, නීවාරය හෙවත්මෙනේරිය; තණ, කඞ්ගු යන; විවග, නානාවිධවගීයන්ද; කිතුල්, හින්තාලය; තල්, තාලය; තැඹිලි, සන්නීරය; අඹ, ආම්‍රය; රඹ, රම්භාය; (කෙසෙල්ය) උගුස මග, ඉක්ෂු යන මොවුන් සහිතව; ඇමකල්, සැමකල්හි; සැදි, සජ්ජිතවූ; නොයෙක් කෙත්වත්, අනෙකවිධ ක්ෂෙත්‍රයන් සහිත වාස්තුප්‍රදෙශයන්; එමග, තද්වනමාගීයෙහි; දුක, අවලොකනය කොට; මනරඟ, චිත්තානන්ද කරවූ; මිතුර,! මිත්‍රය!; තෝ, යුෂ්මත් තෙම; තොසින්, සන්තුෂ්ටියෙන්; මදතැන්, අදූරස්ථානයට; ගොසින්, ප්‍රයාණයකොට.

77 ලංකාකොමලග සමනලගිරි හිඹින් සු තා
හල මනරග මලිගිය මල් දමින් ගොතා
වරලසරග පෙණවැල ** හැලිසිංගන් ඉ තා
දිලිකළුගඟ ලඟ වැද හැර ගිමන් ග තා

* මාතුරු. † තිමල්. ** රැලි.

77 ලකා, ශ්‍රී ලංකාලක්ෂණවූ; කොමළඟ, කොමලාංගියම්සින්; මනරඟ, මනඃකාන්තවූ; මලියියමල්දමන්, මාලතී පුෂ්පදාමයන්; පුතා, පුත්‍රකකොට; ගොතා, ග්‍රථිත කොට; සමනලගිරි, සුමන කූට ලක්ෂණවූ; හිසින්, ශිර්ෂස්ථානයකෙරෙන්; හෙළ, හරණලද්දාවූ; වරලසරඟ, ධම්මිල්ලාකාරයෙන්; හැළි, ධවල වර්ණයෙන් යුක්තවූ; පෙනවැළපියෙන්, ඵේනාවලී ශත සඞ්ඛ්‍යායෙන්; ඉතාදිලි, අතිශ සින් දීප්තිමත්වූ; කළුගඟ, එනම් නදියගේ; ලඟ, සමීපස්ථානයට; වැද, ප්‍රවිෂ්ටව; ගතා, දෙහගෙලෙහිවූ ගිමන්, ග්‍රීෂ්මය; හැර, පහ කොට.

ධවල වර්ණයෙන්යුක්තවූ මාලතී පුෂ්පදාමයන් බහා ගොතන ලද කෘෂ්ණ වර්ණ කෙශකලාපය තෙම ධවල වර්ණවත්වූ ඵේනමාලායෙන් බබළන නිලවර්ණ කාලනදියට උපමිතයි සලකනු

78 ගිමන නිවන සිසිලස තරඟ රොන්වැ — ද
බමන බමර රැව් සහ මල් සුවඳ හැ — ද
හමන සිනිඳු මඳනල පහස විඳ වි — ද
නමන *නඳන විසිතුරු තුරු සිරෙකා ඉ — ද

7 ගිමන නිවන, ග්‍රීෂ්මාපහරණය කරන්නාවූ; සිසිලස, සීත ලවූ; තරඟ, තරඞ්ගයන්ගේ; රොන්, රේණූන්; (ගෙවත් සූක්ෂ්ම ජලපරමාණූව;) වැද, ස්පර්ශකොටගෙන; බමන, (පුෂ්ප මකරන්ද පානය පිණිස) භ්‍රමණයකරන්නාවූ; බමර, භෘඞ්ගයන්ගේ; රැව් සහ, ධවනිය සමගින්; මල්සුවඳ, පුෂ්ප සුගන්ධය; හැද, ආකර්ෂණ යකොට; හමන, වහනය වන්නාවූ; සිනිඳු මඳනල පහස, ස්නිග්ධ මන්ද මාරුතස්පර්ශය; විඳවිද විඳිනයකරමින්; නමන නඳන, පුෂ්මන්හුගේ මනොනන්දනය කරන්නාවූ; විසිතුරු, (පුෂ්පඵල පත්‍රාදියෙන් විචිත්‍ර); තුරුසිරෙකා, වෘක්ෂයන්හුගේ මස්තකයෙහි; ඉද, වාඩිගෙන.

79 සුරඟන දිය කෙළනා සුරු සුර — ඹා
ඝනුංග සිරි සොඳ රැසරැස් පසු — ඹා
කමරඟ දුමු සහ ගිනි** ගෙන [illegible] — ඹා
සලඟ දිය කෙළනා ලිය [illegible] — ඹා

79 සුරඟන, [illegible]; දියකෙළනා, ජල ක්‍රීඩනය කරන්නාවූ; සුරඹාසුරු, සුරාම්බිකාවන් පරිද්දෙන්; සොඳ රැසි රෙන්, සුන්දර රූප [illegible] විලාසය [illegible] කරණකොටගෙන; [illegible], අනා

* මෙලසින ** දුමු [illegible] සහ කද. ඇතැම්.

ඕහයාගේ; සිරි, ශ්‍රී විලාසය; පසබා, පශ්චාත්භාගයෙහිලා; තම රහදුටු, තමන්ගේ ආකාරය දර්ශනයකළාවූ; සත, සත්ත්වයන්ගේ; සිතනෙත, චිත්තය හා නෙත්‍රයන්; කලඹා, ආලෝලනයකොට; ගඟ, ගඞ්ගායෙහි; සසොබා, ශෝභාසහිතවූ; දියකෙළනා, ජලක්‍රීඩනය කරන්නාවූ; ලිය, කාන්තාවන්; බල, නිරීක්ෂණ කර.

80 සිව ගඟ ඉවුරෙහි සොඳ නොනෑ ලීසා
මනරඟ මලවල මුතවර ලීසා
කොමලඟ පැනයන රඟ උදු ලීසා
බිසොවග ලෙල දද සිරි කිය ලීසා

80 සොඳ, සුන්දරවූ; ගඟ ඉවුරෙහි. ගඞ්ගාතීරයෙහි; නොනෑ ලීනා, නිශ්චලව; සිට, සිටිනියකොට; මනරඟ, මනොඥවූ; මලවල පුෂ්පාකුලවූ; මුතවරලීයා, මුදුහළ ධම්මිල්ල ඇතිවූ; පැනයන, පැනලා යන්නාවූ; කොමලඟ, කොමලාඞ්ගීන්ගේ; රඟ, ආකාරය තෙම; (කෙසේද) උදුලීයා, උජ්ජ්වලිතවූ; බිසොවග, අනඞ්ගයාගේ; ලෙල, ලෝලිතවූ; දද, ධවජයාගේ; සිරි, ශ්‍රී විලාසය; කියලීයා, ප්‍රකාශ කෙළේය.

81 කෙළනා ලිය පියයුරු බිත ගැසෙමිනි
විදෙනා රළ රොන් වැද වැද වෙසෙසිනි
සොබනා සොම් වුවනත † නද විලසිනි
රදනා අම කිරණින් පිරි සඳ වැනි

81 කෙළනා, ක්‍රීඩනයකරන්නාවූ; ලිය, කාන්තාවන්ගේ; පියයුරුබිත, පයොධර ලක්ෂණ භිත්තියෙහි; ගැසෙමිනී, ඝට්ටිතවෙමින්; විදෙනා, විස්තීර්ණවන්නාවූ; රළ, තරඞ්ගයන්ගේ; රොන්, රේණූන්; වැද වැද, ඝට්ටනයවීමෙන්; හෙවත් හැපීම කරණකොටගෙන; වෙසෙසිනි, විශෙෂයෙන්; සොබනා, ශෝභනවූ; සොම්, සෞම්‍යවූ; වුවනත, වක්ත්‍රයෝ (කෙසේද?) නදවිලසිනි, සන්තුෂ්ටිකාරණවිලාසයෙන්; අමකිරණින්, අමෘත කාන්තියෙන්; රදනා රඤ්ජමානවූ; පිරිසඳවැනි, පූර්ණ චන්ද්‍රයාවැන්නෝය.

"වුවනත" යනු බහුවචනයෙහිවූ එකවචනයයි සැලකියයුතු. ජලක්‍රීඩායෙහි නියුක්ත ස්ත්‍රීන්ගේ පයොධරයන්හි වදිමින් විහිදියන තරඞ්ගයන්ගේ රේණු වැදීමෙන් විශෙෂයෙන් බබළන වක්ත්‍රයෝ අමෘත රශ්මිය වැදීමෙන් ජ්වලිතවන පූර්ණචන්ද්‍රයා වැනි වෙති යනු භාවයි.

---

† වුවතින්.

77 ලක, ශ්‍රීලඞ්කාලක්‍ෂණවූ; කොමලඟ, කොමලාඞ්ගියම්සින්; මනරඟ, මනඃකාන්තවූ; මලියමල්දමින්, මාලතී පුෂ්පදාමයන්; පුනා, පුනකකොට; ගොතා, ග්‍රථිත කොට; සමනලගිරි, සුමන කූට ලක්‍ෂණවූ; හිසින්, ශිරස්ථානයකෙරෙන්; හෙළ, හරණලද්දාවූ; වරලසරහ, ධම්මිල්ලාකාරයෙන්; හැළි, ධවල වර්‍ණයෙන් යුක්තවූ; පෙනවැලපිඹෙන්, ඵේනාවලි ශත සඞ්ඛ්‍යායෙන්; ඉතාදිලි, අතිශයින් දීප්තිමත්වූ; කළුගඟ, එනම් නදියගේ; ළඟ, සමීපස්ථානයට; වැද, ප්‍රවිෂ්ටව; ගතා, දෙහළෙහිවූ ගිමන්, ග්‍රීෂ්මය; හැර, පහ කොට.

ධවල වර්‍ණයෙන්යුක්තවූ මාලතී පුෂ්පදාමයන් බහා ගොතන ලද කෘෂ්ණ වර්‍ණ කෙශකලාපය තෙම ධවල වර්‍ණවත්වූ ඵේනමාලායෙන් බබළන නිලවන් කාලනදියට උපමිතයි සලකනු

78 ගිමන නිවන සිසිලස තරඟ රොන්වැ ද
බමන බඹර රැව් සහ මල් සුවඳ හැ ද
හමන සිනිඳු මඳනල පහස විඳ වි ද
නමන *නඳන විසිතුරු තුරු සිරෙන ඉ ද

78 ගිමන නිවන, ග්‍රීෂ්මාපහරණය කරන්නාවූ; සිසිලස, සීතලවූ; තරඟ, තරඞ්ගයන්ගේ; රොන්, රේණූන්; (ගෙවත් සූක්‍ෂම ජලපරමාණූව;) වැද, ස්පර්ශකොටගෙන; බමන, (පුෂ්ප මකරන්ද පානය පිණිස) භ්‍රමණයකරන්නාවූ; බඹර, භෘඞ්ගයන්ගේ; රැව් සහ, ධ්වනිය සමඟින්; මල්සුවඳ, පුෂ්ප සුගන්ධය; හැද, ආකර්‍ෂණයකොට; හමන, වහනය වන්නාවූ; සිනිඳු මඳනල පහස, ස්නිග්ධ මන්ද මාරුතස්පර්ශය; විඳවිද, වින්දනයකරමින්; නමන නඳන, සුන්මත්හුගේ මනොනන්දනය කරන්නාවූ; විසිතුරු, (පුෂ්පඵල පත්‍රාදියෙන් විචිත්‍ර); තුරුසිරෙන, වෘක්‍ෂයන්හුගේ මස්තකයෙහි; ඉඳ, වාඩිගෙන.

79 සුරඟන දිය කෙළනා සුරු සුර ඹා
තුනුවන සිරි සොඳ රැසෙරෙන් පසු ඹා
කාමරඟ දුටු සහ සින** එකස පාල ඹා
ඔලඟන දිය කෙළනා ලිය සඟසා ඹා

79 සුරඟන, තපොනාගඞ්ගනායෙයි; දියකෙළනා, ජල ක්‍රීඩාව කරන්නාවූ; සුරඹාසුරු, සරාම්බිකාවන් පරිද්දෙන්; සොඳ රැසිරෙන්, සුන්දර රූප ශ්‍රීලාභය කාරණකොටගෙන; තුනුවන, අන

* ළෙසින ** දුටු සා සහ නද. ඇතැම්.

ඞගයාගේ; සිරි, ශ්‍රී විලාසය; පසබා, පශ්චාත්භාගයෙහිලා; තම රහඳුවූ, තමන්ගේ ආකාරය දර්ශනයකළාවූ; සත, සත්ත්වයන්ගේ; සිතනෙත, චිත්තය හා නෙත්‍රයන්; කලඹා, ආලොලනයකොට; ගඟ, ගඞ්ගායෙහි; සසොබා, ශොභාසහිතව; දියකෙළනා, ජලක්‍රීඩනය කරන්නාවූ; ලිය, කාන්තාවන්; බලා, නිරීක්ෂණ කර.

80 සි ව ග ඟ  ඉවුරති සොඳ නොනැ  ලී සා
 ම න ර ඟ  මලවල මුතවර  ලී සා
 කොමළඟ  පැනයන රඟ උදු  ලී සා
 විසොවග  ලෙළ දද සිරි කිය  ලී සා

80 සොඳ, සුන්දරවූ; ගඟඉවුරෙහි. ගඞ්ගාතීරයෙහි; නොනැලීසා, නිශ්චලව; සිව, සපිනියකෝට; මනරඟ, මනොඥවූ; මලවල පුෂ්පාකුලවූ; මුතවරලීයා, මුදුහළ ධම්මිල්ල ඇතිවූ; පැනයන, පැනලා යන්නාවූ; කොමළඟ, කොමලාඞ්ගීන්ගේ; රඟ, ආකාරය තෙම; (කෙසේද) උදුලීයා, උජ්ජ්වලිතවූ; විසොවග, අනඞ්ගයාගේ; ලෙළ, ලොලිතවූ; දද, ධවජයාගේ; සිරි, ශ්‍රී විලාසය; කියලීයා, ප්‍රකාශ කෙළේය.

81 කෙළ නා  ලිය පියයුරු බිත ගැසෙමි  නී
 වි දෙ නා  රළ රොන් වැද වැද වෙසෙසි  නී
 සොබ නා  සොම් වුවනත † නද විලසි  නී
 ර ද නා  අම කිරණින් පිරි සඳ වැ  නී

81 කෙළනා, ක්‍රීඩනයකරන්නාවූ; ලිය, කාන්තාවන්ගේ; පියයුරුබිත, පයොධර ලක්ෂණ භිත්තියෙහි; ගැසෙමිනී, ඝට්ටිතවෙමින්; විදෙනා, විස්තීර්ණවන්නාවූ; රළ, තරඞ්ගයන්ගේ; රොන්, රේණූන්; වැද වැද, ඝට්ටනයපීමෙන්; හෙවත් හැපීම කරණකොටගෙන; වෙසෙසිනි, විශෙෂයෙන්; සොබනා, ශොභනවූ; සොම්, සෞම්‍යවූ; වුවනත, වක්ත්‍රයෝ (කෙසේද?) නදවිලසිනි, සන්තුෂ්ටිකාරණවිලාසයෙන්; අමකිරණින්, අමෘත කාන්තියෙන්; රඳනා රඤ්ජමානවූ; පිරිසඳවැනි, පූර්ණ චන්ද්‍රයාවැන්නෝය.

"වුවනත" යනු බහ්වර්ථයෙහිවූ එකවචනයයි සැලකියයුතු. ජලක්‍රීඩායෙහි නියුක්ත ස්ත්‍රීන්ගේ පයොධරයන්හි වදිමින් විහිදී යන තරඞ්ගයන්ගේ රේණූ වැදීමෙන් විශෙෂයෙන් බබලන වක්ත්‍රයෝ අමෘත රශ්මිය වැදීමෙන් ජ්වලිතවන පූර්ණචන්ද්‍රයා වැනි වෙති යනු භාවයි.

† වුවනින්.

92 කියමින් වෙන වෙන වාසි පැබ ල
ඉදිමින් දියතුළ නොපෙනී බෝක ල
පෙනෙමින් තැග තැන විදුලිය සේ දු ල
ගසමින් කෙළ කෙළ යෙති දිය කෝකි ල

82 බෝකල, සොයෝ කාන්තාවෝ; වෙන වෙන, පෘථක් පෘථක්වූ හෙවත් වෙනස්වෙනස්වූ; වාසි, වනසිබස්; කියමින්, කථනය කෙරෙමින්; බලපෑ, සාමීප්‍යය දක්වමින්; දියතුළ, ජලාභ්‍යන්තරයෙහි; නොපෙනී ඉදිමින්, අදෘශ්‍යව රඳමින්; දුලවිදුලියසේ ජ්වලමාන විද්‍යුල්ලතා සෙයින්; තැනතැන, තන්හිතන්හි; (පළින් පළ පෙනෙමින්, දෘශ්‍යමානවෙමින්; (මතුවෙමින්) දියකෝකිල ගසමින්, දියකෝකිලනම් ජලක්‍රීඩා පවත්වමින් හෙවත් කරමින්; කෙළකෙළ, ක්‍රීඩාකොටකොට; යෙති, යන්නාහ.

93 විලසින් දිය කෙළ කෙළ යෙන නොමැ ලී
වෙසෙසින් නැගි රළ රොන්ගඟ ඉපි ලී
පහසින් තම එක සරියසි එක ලී
සතොසින් ලොමු දැහැගත් සිරි කිය ලී

83 විලසින්, විලාසිනීන් හෙවත් කාන්තාවන්; නොමැලී, ආලස්‍ය යුක්තනොවී; දියකෙළකෙළ, ජලක්‍රීඩාකොටකොට; යෙත, ප්‍රයාණයනාරණනල්හී; වෙසෙසින්, විශෙෂයෙන්; නැගි, උද්ගතවූ; රළරොන්, තරඞ්ගරේණුන් ඇස්තාවූ; (එහෙයින්ම) ඉපිලී, උත්ප්ලාවිතවූ හෙවත් ඔදවැඩියාවූ; ගඟ, ගඞ්ගානැමැති අඞ්ගනා තොමෝ; පහසින්, සපර්ශයෙන්; තමඑකසරියසි, තමන් හා එක්වැනියයි; එකලී, ඒකාලපයෙහි; සතොසින්, සන්තොෂයෙන්; ලොමුදැහැගත්සිරි, රොමොද්ගමශ්‍රිය; කියලී, ප්‍රකාශකළා.

උද්ගත ජලරේණු ඇති ගඞ්ගා නැමැති අඞ්ගනා තොමෝ සපර්ශයෙන් තමන් හා එක්වැනියයි හඟිමෙන් රොමොද්ගම ශ්‍රිය ප්‍රකාශකළායයි කීමෙන් මිනිසුන් අඞ්ගනාවන්ගේ ගඞ්ගාව හා සපර්ශයෙන් රොමොද්ගමනයද වෙයි මෙමස් නදියෙහි ජල රේණු උද්ගත වීමෙන් නවුන්ගේද සපර්ශයෙන් රොමොද්ගමනය වූව නැයි ඥපිතයි.

84 *නදනා  දන නෙත් පැහැලඹු ලා  සි ව
අද නා  මෙන් තම තම වෙත දෙතෙ  ර ව
පිහිනා  යන එන අඟනන් දිය  සි ව
බඳි නා  වැනි රන්හේ තොප යතු  ර ව

84 නදනා, මනොඥවූ; නෙත්පැහ, නෙත්‍රප්‍රභා නැමැති; ලඹු, රජ්ජුන්; ලාසිට, බහාගෙන; දෙතෙරට, උභයතිර මස්තකයෙහි; තම තම වෙත, තම තමන් සමීපයට; අදනා මෙන්, ආකර්ෂණය කරන්නාක්මෙන්; දියපිට, ජල මස්තකයෙහි හෙවත් දිය මතුපිට; පිහිනා, පීනමින්; යනඑන, ගමනා ගමනය කරන්නවූ; අඟනන්, අඞ්ගනාවන්; තොප යතුරට, යුෂ්මත් හුගේ යාත්‍රාවට හෙවත් ගමනට; රන්හේ, ස්වර්ණසේතුවක්; බඳිනා වැනි, බන්ධනය කරන්නාක් වැන්න.

මනොනඥනීයවූ නෙත්‍රයන්ගේ ආලොක නැමැති රැහැන් බහාලමින් ගඟදෙපැත්තෙහි (සිටින්නවුන්) තමන් සමීපයට ඇදගන්නාක් මෙන් ජලය මතුපිට පීනමින් යන එන අඞ්ගනාවන් තොපගේ ගමන් මාර්ගයට ඒදණ්ඩක් හෙවත් පාලමක් වැනිය.

85 කොම  ල'ඟනක් වුවනත උඩුකුරු කො  ව
ත  ම  මුහුලන් බැඳ පිහිනනු දිය පි  ව
හැ  ම  සිය පත් හැකිලෙනු සොමි නරිඳු  ව
මෙ  ම  රඟ යසි පානා වැනි දිනිඳු  ව

85 කොමළඅඟනක්, කොමලාඞ්ගනාවක්; වුවනත, වක්ත්‍රය උඩුකුරුකොට, ඌර්ධ්වමුඛකොට; තම අත්, ස්වකීය හස්තයන්; මුහුලබැඳ, ධම්මිල්ලයෙහි බන්ධනයකොට හෙවත් දෙඅත් කොණ්ඩයෙහි තබාගෙන; දියපිට, ජලමස්තකයෙහි; පිහිනනු, පීනීම; (කෙසේද?) සොමි, සෞම්‍යවූ; නරිඳුට, චන්ද්‍රයාට; හැම සියපත්, සකල ශතපත්‍රයන්ගේ; හැකි ලෙනු, සඞ්කුචිතවීම; මෙම රඟයසි, මේ ආකාරයයි; දිනිඳුට, දිනෙන්ද්‍රයාට (සූර්ය්‍යයාට;) පානාවැනි, ප්‍රකාශ කරන්නාක් මෙනි.

එක් කාන්තාවක් උඩුකුරුව දෙඅත් අකුලා (ධම්මිල්ලමත් තෙහි) තබාගෙන දියපිට පීනීම කෙසේදයත්? චන්ද්‍රයා නිසා ශතපත්‍රයන්ගේ ඇකිලීම මේ ආකාරයෙන් වන්නේ යයි සූර්ය්‍ය යාට පෙන්වන්නාක්මෙනි. මෙසේ කීමෙන් එහිම ජල ක්‍රීඩනයෙහි නියුක්ත ඇයගේ වල්ලභයා "ඇය" අන්‍යපුරුෂ ස්පර්ශයකට රුචිවීයයි ශඞ්කිතවූ බැව් දත් ඒ කාන්තාව ස්වීය

* පළමු මුද්‍රිත පොතේ මේ කව නොමැතියි.

ස්වාමි පුරුෂයා නිශ්ශඞ්කිත කරනුපිණිස යථෝක්තාකාර දූත් වීමෙන් ස්වාමිහටමමුත් අන්‍යය කුට ස්පර්ශය නොදෙනු බැව් ධ්වනිවශයෙන්ශු පිතයි.

86 අ සි රි  දිසි දියදහරින් අඹ  රා
ස සි රි  හුණු ඉඳු සැව් සිය පත  රා
වි සි රි  †ගිය ගඟ ලතු කොකු මග  රා
අ සි රි  සිතුවම් දක්වී පත  රා

86 ලතු, (ස්ත්‍රීන්ගේ කායාලිප්ත) ලාක්ෂාරස සහිතවූ; කොකුමගරා, කුඞ්කුමඞගරාගය; දියදහරින්, (ස්ත්‍රීන් විසින් ක්‍රීඩා පිණිස ඔවුන්නොවුන්ට ගසනලද) ජලධාරාවන් කරණකොට ගෙන; අඹරා, ආකාශකුක්ෂියෙහි; පතරා, විසිනිණිවූ; ඉඳුසැව්සිය, ඉන්ද්‍ර චාපශතයක් සෙයින්; අසිරි, ආශ්චර්‍ය්‍යක්ව; දිසි, දෘශ්‍යමානවිය; සසිරි, ශොභාසම්පන්නාව; හුණු, (ආකාශකුක්ෂියෙහි) පතිතව; ගඟ, (එම) නදියෙහි; විසිරිගිය, විසිනිණීතවයට පැමිණියේ; අසිරී, ආශ්චර්‍ය්‍යවූ; පතරා, පැතිරීමට ගියාවූ; සිතුවම්, චිත්‍රකර්මය; දක්වී, ප්‍රකාශ කෙළේය.

ස්ත්‍රීන්ගේ කායාලිප්තලාක්ෂාරසය හා කුඞ්කුමාඞගරාගය ජලධාරාව සමග අහස් කුස්හි දේදුනු විලාසයෙන් බැබළිය. ගඞ්ගායෙහි පතිතවූ එයම සිතුයම්කළ වස්ත්‍රයක්සේ දෘශ්‍යමාන විය යනු භාවයයි.

87 අ ව ර  ඇදුරු මෙහෙසුරු රිවිදළ නෙති  න
නො හැර  දිනත දිනමින් දදහු වෙසෙ සි  න
පැ ති ර  නැඟුණු නල සිළු ගිනි රොන් ලෙසි  න
එ න ර  පෙනේ සඳවෙල තුරමඳ මදි  න

87 අවර ඇදුරු, අපරපර්වත ලක්ෂණවූ; මෙහෙසුරු, මහදෙවියා; (ඊශ්වරයා) රිවි, සූර්‍ය්‍ය ලක්ෂණවූ; දළනෙතින, ලලාටාක්ෂිය කරණකොටගෙන; දින, දිවස ලක්ෂණවූ; මින්දදහු, මින ධ්වජයා හෙවත් අනඞ්ගයා; නොහැර, පහනොකොට (ශේෂ නොකොට;) දිනත, ජයග්‍රහණය කරනකල්හි හෙවත් භස්ම කරනකල්හි; වෙසෙසින, විශේෂයෙන්; පැතිර, විසිනිණීව; නැඟුණු, උද්ගතවූ; නලසිළු, වහ්නිශිඛා හා; ගිනිරොන් ලෙසින, විස්ඵුලිඞග පරිද්දෙන්; එනර, තත්කාලයෙහි; සඳවෙල, සන්ධ්‍යා වලාහක සහිතවූ; තුරු, තාරාසමූහයා; මදමඳින, මඳින් මඳ; පෙනේ; දෘශ්‍යමානවේ.

* කැවරී-සමහර.

මහෙශ්වරතෙම අනඞගයා හස්මකෙළේය යනු පූරාගත ප්‍රවෘත්තියයි. එක්කලෙක මහෙශ්වරයා ධ්‍යානයෙහි සිත් එකග කිරීමට යොමුව සිටින අතර එය බාධා කරනු පිණිස අනඞග යාද පාශ්වයෙන්හි සැඟවීසිට උපක්‍රම කෙළේය. මහෙශ්වර තෙමේද චිත්තෛකාග්‍රතාවට කවරබාධාවක් දූයි සොයන්නේ අනඞගයාගේ උපද්‍රවයක් බැව් දැන ලලාටාක්ෂියෙන් ගිනිනික්ම වීම කොට අනඞගයා දැවීය. එතැන්පටන් අනඞගයා දෙහ රහිතවිය.

"තෙනෙත්හු විසින් කම්දැම්"

තෙනෙත්හු විසින්, ඊශ්වරයා විසින්; කම්, අනඟතෙම; දම්, දවන ලදි.–සිදත්සඟරාව.

88 වි දු සිනිඳු සුදුරැස් දිගුපිය පත  ර
න දු සුපුන් හිමකර පිවිතුරු තිස  ර
ස දු සිතඹ සියපත් නුබ තඹර කා  ර
උ දු දෙසින් වැද එන රඟ බල මිතු  ර!

88 සිනිඳු, ස්නිග්ධවූ (සුඛස්පර්ශය ඇත්තාවූ;) සුදුරැස්, ශ්වෙතරශ්මි ලක්ෂණවූ; දිගු, දීර්ඝවූ; පියපතර, පක්ෂපත්‍රයන්; විදු, විසනිණි කොට; නදු, ආනන්දකරවූ; සුපුන්හිමකර, සුපූර්ණ චන්ද්‍රලක්ෂණවූ; පිවිතුරු, පවිත්‍රවූ; (ධවලවර්ණවත්වූ;) තිසර, හංසයා; සිතඹ, ශ්වෙතවලාහක ලක්ෂණවූ; සියපත්, ශතපත්‍ර (පඞක්ති) යෙන්; සදු, සජ්ජිතවූ; නුබ, නභොලක්ෂණවූ; තඹර කර, පද්මාකරයට; උදුදෙසෙන්, පූර්විදිශාභාගයෙන්; වැද, ප්‍රවිෂ්ටව; එනරඟ, ආගමනයකරන ආකාරය, මිතුර!, මිත්‍රය!; බල, නිරීක්ෂණය කර.

89 වි ය ත උදුල කිරණිව රළ පැහැ පහ  ස
දි ශ ත විසුල සුදු ගඟුලැලි සිරි විල  ස
දි ය ත පතල පිරිසිදු සඳරැස් වෙසෙ  ස
තනෙ.ත පුරා දක දැහැ ගතෙහි සරතැ  ස

89 වියත, නභොගතියෙහි; උදුල,, ප්‍රොජ්ජ්වලිතවූ; කිර ණව, ක්ෂීරාර්ණවයාගේ; රළපැහැ, තරඞගප්‍රභාව පිළිබඳවූ; පහස, ස්පර්ශය ලද්දාවූ හෙවත් තරඞගප්‍රභාව හා සදෘශවූ; දිගත, දිශා, න්තයන්හි; විසුල, විසනිණිව ගියාවූ; සුදු ගඟුලැලි, ශුභ්‍රගඞගා නිර්ඣරයක්හුගේ; සිරිවිලස, ශොභාවිලාස ඇත්තාවූ; දියත පතල, ජගත්ත්‍රිව්‍යාපතවූද; පිරිසුදු, පරිශුද්ධවූ; සඳරැස්, චන්ද්‍ර මරීචිය; වෙසෙස, විශෙෂයෙන්; තනෙතපුරා, තාගේ නෙත්‍රයන් සම්පූර්ණකොට; දක, දර්ශනයකොට; ගතෙහි, දෙහයෙහි; සර තැස, ශ්‍රාන්තභාවය; දැහැ, වර්ජිතකොට:–

92 සිඳුරුව *උදයගිරි ගජදළ කුඹුතල ම
වලබව අඳුරු රස පිරි නුබ සමුදුර ම
සහලව රත'ඹරයා ලෙසි ඉඳුරු දිග'ඹ ම
සොඳුරුව අරුණු රැස් පැතිරෙයි පෙර'ඹර ම

92 උදයගිරි, උදයපර්වත ලක්‍ෂණවූ; ගජ, හස්තිරාජයාගේ; දළ, දළවූ; කුඹුතලට, කුම්භස්ථලයෙහි; සිඳුරුව, සින්දූරරේණු වක්වූද හෙවත සිඟිපිටි රජස්වැනිවූද; අඳුරු, අන්ධකාර ලක්‍ෂණවූ; රස, ජලයෙන්; පිරි, පරිපූර්ණවූ; නුබ, නභෝලක්‍ෂණවූ; සමුදුරට, සමුද්‍රයට; වලබව, වඩබාග්නියක්වූද; ඉඳුරුදික්, ඉන්ද්‍රදිශා ලක්‍ෂණවූ; අඹට, අම්බිකාවට; එකලෙහි, තත්කාලයෙහි හෙවත් රාත්‍රිය පහවයන වේලෙහි; සහල, වල්ලභයා විසින්; එව, (ආච්ඡාදනය පිණිස) ප්‍රේරිතවූ; රත්අඹර, රක්තවස්ත්‍රයක් වද; අරුණුරුස්, අරුණ ලොකයතෙම; සොඳුරුව, ශෝභාන්විතව; පැතිර, ව්‍යාප්තව; පෙර අඹරට, පූර්වදිශාකාශයට; එයි, ආගමනය කරයි.

"සිඳුරුව උදයගිරි ගජදළ කුඹුතල ම"

උදයපර්වත ලක්‍ෂණ හස්තිරාජයාගේ කුම්භස්ථලයෙහි සින්දූර චූර්ණයක්බඳුවූයේයයි අරුණාලෝකය උපමිතකෙළේය. හස්තිරාජයාගේ කුම්භස්ථලයෙහි ආලේපන සින්දූර රේණුවට අරුණාලෝකය උපමාකිරීම ශිෂ්ටසම්මතවිය. හස්තිරාජයා සියලු සත්ත්වයන් අතුරෙන් උච්චතර හෙයින් ඔහුගේ කුම්භස්ථලයෙහි ආලේපනවන සින්දූර රේණුව නිරාකාශයෙන් දෘශ්‍යමානවේ. එහෙයින් නිරාකාශයෙන පැනෙන අරුණාලෝකයට එය උපමාවේ. ගජකුම්භයෙහි සින්දූර චූර්ණාලේපය කවිසමයාගතයි.

**1 "සින්දූරස්පෘහයා ස්පෘශන්ති කරිණාං කුම්භස්ථමාධොරණාඃ"**

**2 "සින්දූර ප්‍රකරඃ ශිරඃ පරිසරෙ පාර්ශ්වාන්තිකෙ කිඞ්කිණී"**

**3 "දිඞ්මාතඞ්ගොත්තමාඞ්ගෙෂ්ව භිනව නිහිතස්සාන්ද්‍ර සින්දූරරේණුඃ"**

1 අධොරණාඃ, ඇතරුවෝ; කරිණාම්, ඇතුන්ගේ; කුම්භස්ථම්, කුම්භස්ථලයෙහි ගල්වනලද්ද, සින්දූරස්පෘහයා, සින්දූර යන ආසාවෙන්; ස්පෘශන්ති, ස්පර්ශකෙරෙත්.

2 ශිරඃපරිසරෙ, කුම්භස්ථලයෙහි; සින්දූරප්‍රකරඃ, සින්දූර රාශියද; පාර්ශ්වාන්තිකෙ, දෙලවරෙහි; කිඞ්කිණී, ඝණ්ටාවක්ද.

3 දිඞ්මාතඞ්ගෙ, දශානැමැති හස්තීන්ගේ; උත්තමාඞ්ගෙෂු කුම්භස්ථලයෙහි; අභිනවනිහිතඃ, අලුතගල්වනලද; සාන්ද්‍ර, ඝනවූ; සින්දූර රේණුඃ, සින්දූර චූර්ණයද යනාදී ත්‍රිවික්‍රම කවි රාජ මයූරකවි ආදීන්ගේ උක්තිසාධකයි.

*විපරිව මුද්‍රිත.

93 දරුණු උලැඟි කෝපනලවන් සත් සත න
කුළුණු සිහිල් මෙත්ගුණ පහවන ලෙසි න
අරුණු කිරණ රැස් පැතිරී පෙරදිගි න
පිරුණු තරිඳු රැස් තරුවියකෙසි ගුව න

93 සත්, සත්ත්වයන්ගේ; සතන, සන්තානයට; (චිත්තයට) වන්, ප්‍රවිෂ්ටවූ; උලැඟි උල්ලඞ්ඝිතවූ; (උසස්වබැබළියාවූ) දරුණු කෝපනල, දරුණුවූ ක්‍රෝධාග්නිය කරණකොටගෙන; කුළුණු, කරුණාසහිතවූ; සිහිල්, සීතලවූ; මෙත්ගුණ, මෛත්‍රී ගුණයන්; පහවනලෙසින, ඉවත්ව යන්නාක් මෙන්; අරුණු කිරණ, බාලසූර්යයාගේ;. රැස්, රශ්මිය; පෙරදිගින, පූර්වදිශා යෙන්; පැතිරී, ව්‍යාප්තවීමෙන්; ගුවන, ආකාශයෙහි; පිරුණු, පරිපූර්ණවූ; තරිඳුරැස්, චන්ද්‍රරශ්මිය හා; තරු, තාරාසමූහයා; වියකෙසි, මැකියෙසි.

94 පියුමාකර මඳ මඳ පුබුදින තඹ ර
අසුරුකර හෙන බිඟු දල් දිසි එව ර
සිලිලාකර වෙත ගම්බිම් දක නොහැ ර
තොදයාකර සෙද සිත සතොසින් මිතු ර

94 පියුමාකර, තඩාගයන්හි; මඳ මඳ පුබුදින, මඳින්මඳ ප්‍රබුද්ධවන්නාවූ; තඹර, තාමරසයන්; අසුරුකර, ආශ්‍රයකොට; හෙන, පතිතවන්නාවූ; බිඟුදල්, භෘඞ්ගජාලාවන්; දිසි, දෘශ්‍යමානවූ; එවර, තත්කාලයෙහි; සිලිලාකරවෙත, සමුද්‍රාසන්න යෙහිවූ; ගම්බිම්, ග්‍රාමයන් හා භූමිප්‍රදෙශයන්; දක, දර්ශනය කොට; මිතුර, මිත්‍රය; තොද, යුෂ්මත් තෙමේද; සිතසතොසින්, චිත්තසන්තොෂයෙන් යුක්තව; සෙද, වහා; යාකර; යාත්‍රාකරව.

95 පතඟ කිරණ දුරුකළ තුරු සෙවනැ ල්ල
තරඟ රඟන රඟබිම් රඟ සුදු වැ ල්ල
සිතඟ ලෙසට පියතෙපුලැති ලිය ගො ල්ල
බලඟ! මිතුර පෙරමඟ සැදි කල මු ල්ල

95 පතඟකිරණ, පතඞ්ගරශ්මිය හෙවත් සූර්ය රශ්මිය; දුරුකළ, දූරීභූතකළාවූ; තුරුසෙවනැල්ල, තරුච්ඡායායෙන්ද; තරඟ, සමුද්‍රතරඞ්ගයන්; රඟන, නෘත්‍යකරන්නාවූ; රඟබිම් රඟ, තරඞ්ග භූමිසදෘශවූ හෙවත් නෘත්‍යභූමියක් වැනිවූ; සුදු වැල්ල, ශ්වේතවාලුකාතලයෙන්ද; පියතෙපුලැති, ප්‍රියාලාප ඇත්තාවූ; ලියගොල්ල, කාන්තාසමූහයෙන්ද; සැදි, සජ්ජිතවූ; කලමුල්ල, කලමුල්ලනම් ග්‍රාමය; මිතුර, මිත්‍රය; සිතඟලෙසට, චිත්තාභිලාෂ පරිද්දෙන්; බලඟ!, නිරීක්ෂණය කරන්.

96 පසියාගල වෙහෙර—මුනිරු බලා වෙසෙසින්
වසියා කරන් මනරම්—†පලරම් හිසින් සතොසින්

96 පසියාගල, පසියාගලනම් ග්‍රාමවරයෙහිවූ; වෙහෙර, විහාරයෙහි; (භ්‍රාජමානවූ) මුනිරු, බුද්ධ ප්‍රතිමා වහන්සේ; වෙසෙසින්, විශෙෂයෙන්; බලා, අවලොකනයකොට; මනරම්, චිත්තාභිරාමවූ, පලරම්, (නාලිකෙර) ඵලාරාමයන්ගේ; හිසින්, ශීර්ෂයෙන්; සතොසින්, සන්තොෂයෙන් යුක්තව; වසී, ඒකාන්තයෙන්; යා කරන්, යාත්‍රා කරන්.

97 සි ත් ස න හ න ර ත් ලවනත බිඹු ප ලය
වෙ ත් ව න ස ත ම ත් වන මියුරු තෙප ලය
අ ත් ව න සකිනෙත් යුග නගෙ ලත් ප ලය
ම ත් ගොන කෙළි යුත් ලිය සැටි දැක ප ලය

97 සිත්, (දක්නායකල සත්ත්වයන්ගේ) චිත්තය; සනහන, සන්තර්පණය කරන්නාවූ; බිඹුපලය, බිම්බාඵලසදෘශවූ; රත්ලවනත, රක්තාධර ඇත්තාවූද; වෙත්වන, සමීපස්ථවන්නාවූ; සත, සත්ත්වයන්; මත්වන, උම්මත්තයන් වන්නාවූ; මියුරු තෙපලය, මධුර වචන ඇත්තාවූ; සකි, යහළුව; තගෙ, යුෂ්මත් හුගේ; නෙත් යුගලත් පලය, නෙත්‍රයුග්ම ප්‍රතිලාභ ඵලය; අත් වන, හස්තප්‍රාප්ත වන්නාවූ; මත්ගොන, එනම් ග්‍රාමයෙහි; කෙළියුත්, ක්‍රීඩාසක්තවූ; ලිය, කාන්තාවන්ගේ; සැටි, ආකාරය; දැක, දර්ශනයකොට; පලය, ගමනයකර

98 රන් ප න් සවන් යොන් ලිය රඳනා නිම ල
සන් ර න් රුවන් සල්පිල් සොබනා ගෙව ල
බන් න න් දෙදෙන් බබළන සිඳුනා අස ල
බන් ස න් තොසින් තොගොසින් වදු *බේරුව ල

98 රන්පත්, සෞවර්ණ පත්‍රයන් ඇති; සවන්, ශ්‍රවණයන් ගෙන් යුක්තවූ; යොන්ලිය, යවන ස්ත්‍රීන්; රඳනා, රඤ්ජමාන වන්නාවූද; නිමල, නිර්මලවූ; රන්රුවන්, සුවර්ණ මාණික්‍යයන් ගෙන්; සොබනා, ශොභනවූ; ගෙවල, ගෘහයන්හි; බන්, බඳනා ලද; නන් දෙදෙන්, නානාධ්වජයන්ගෙන්; බබළන, භ්‍රාජ මානවන්නාවූ; සිඳුනා, ගඞ්ගානායකයාහට (සමුද්‍රයා යන අර්ථයි;) අසල, ආසන්නවූ; බේරුවල, (බෙරුනම් පත්වර්ගීයකැලෑ වමෙන් පිහිටීම යන අර්ථයෙන්) බේරුවල නම්වූ ග්‍රාමයට; මන්සන්තොසින්, චිත්ත සන්තොෂයෙන් යුක්තව; ගොසින්, ගමනයකොට; තො, යුෂ්මත්තෙම; වදු, ප්‍රවිෂ්ටවෙව.

†පලරස්. *බේරුහල2

මෙහි "සිඳුනා" යනු සමුද්‍රයට නමි. සිඳුන් හටනා සිඳු නාසි විග්‍රහයසි. සිඳු යනු ගඞ්ගාවාචක "සින්ධු" යන සංස්කෘත හෝ මාගධ වචනයෙන් තද්භව වියසි සලකනු.

පූරාණ නාමාවලියෙහි.

හෝ, සිඳු, වසා, නී, ගඟ. (ගඟ නම් වේය.)

99 මත් ව න අඹින් කංසා කා රළු පර ළු
අත් ව න කුසුම් රත්මල් කනලා ලකු ළු
ගත් ව න මුගුරු ලෙළවා ඇද ඇද රවු ළු
සිත් මෙන බමන බඹුරන් රඟ බල යහ ළු

99 රළුපරළු, අතිරෞද්‍රලෙස; මත්වන, චිත්තවිකෘතිය කරන්නාවූ; අඹින්, අග්‍රවේණිය; කංසා, විජයාය යන මෙතෙක්දෑ; කා, භක්ෂණය කොට; අත්වන කුසුම්, ධුස්තුර පුෂ්පයන් හා; රත්මල්, එනම් පුෂ්පයන්; කනලා, කණීයෙහිබහා; ලකුළු, අලඞ්කෘතවූ; ගත්, ග්‍රහණය කරන ලද; වනමුගුරු, වන මුද්ගරයන් හෙවත් ලීකැබලි; ලෙළවා, ලොලිතකරවා; රවුළු, සම්ශ්‍රැන්; ඇදඇද, ආකර්ෂණය කොට කොට; සිත්මෙන, චිත්තාභිලාෂ පරිද්දෙන්; බමන, භ්‍රමණයකරන්නාවූ; බඹුරන්, බර්බරයන්ගේ හෙවත් ධූර්තයන්ගේ; (චණ්ඩන්ගේ) රඟ, ආකාරය; යහළු, මිත්‍රය; බල, අවලොකනයකර.

මෙහි බඹුරු ශබ්දය වනාහි බර්බර යන සංස්කෘත වචනයෙන් භින්නාවීයසි සැලකිය'යුතු. "බර්බරඃ පාමරෙකෙශචක්‍රලෙ" යනු අභිධානයි.

100 නොබැඳ විදෙන වරලස් මල් ප ටි න් පටි න්
නොහැඳ තරව ගිළිහෙන සළු ප ටි න් පටි න්
පැ හැ ද තවෙන දිවඑන ලිය ව ටි න් පිටි න්
ස බ ඳ! නොසිට යාගන් බෙම්* තොටින් තුටින්

100 නොබැඳ, බන්ධනය නොකිරීමෙන්; විදෙන, විසනිණිවන්නාවූ; මල්පටින් පටින්, පුෂ්පදාමයන්ගෙන් හා පට්ටයන්ගෙන් යුක්තවූ; වරලස, ධම්මිල්ලය ඇතිවූ; තරවනොහැඳ, ස්ථිරව ආච්ඡාදනය නොකිරීමෙන්, ගිළිහෙන, පතිතවන්නාවූ; සළු පටින් පටින්, සාටකපට්ටයන්ගෙන් යුක්තවූ; තවෙත, නාකෙරෙහි; පැහැද; ප්‍රසන්නව; වටින් පිටින්, හාත්පසින්; දිවඑන, ධාවනය කොට එන්නාවූ; ලිය, කාන්තාවන් ඇත්තාවූ; බෙම්තොටින්, ගිමනිඵ ප්‍රදෙශයෙන්; සබඳ!, මිත්‍රය!; තුටින්, සන්තුෂ්ටියෙන් යුක්තව; නොසිට, ස්ථිතියනොකොට; යාගන්, යාත්‍රාග්‍රහණය කරන්.

* බෙන්තොටින් සමඟර.

101 විදි නා සේ මතු සගමොක් සැප නොම ද
වන වා සේ වෙහෙරට ගොස් වැද සබ ද!
දු මු වා සේ *දිවමන් මුනිඳුන් පැහැ ද
සිට බෝ සේ බුහුමන් †වඩමින් නැම ද

101 සබද!, මිත්‍රය!; මතු, අනාගත කාලයෙහි; නොමද, අමන්‍දවූ; සගමොක්සැප, ස්වර්‍ගාපවර්‍ග සම්පත්තීන්; විදිනාසේ, විඳිනයකරන පරිද්දෙන්; ගොස්, ප්‍රයාණයකොට; වනවාසේ වෙහෙරට, වනවාස විහාරයට; වැද, ප්‍රවිෂ්ටව; දිවමන් මුනිඳුන්, ජීවමාන සම්බුද්ධයන් වහන්සේ; දුටුවාසේ, දර්‍ශනයකලාසේ; පැහැද, චිත්තප්‍රසාදය කොට; සිට, ස්ථිතියකොට; බෝසේ, නානා ප්‍රකාරයෙන්; බුහුමන් වඩවමින්, සම්මාන වර්‍ධනය කෙරෙමින්,; නැමද, ප්‍රණාමයකොට:–

102 දි ව ස ර ක ය රුසිරෙන් පා දන ස ක ය
සැදි අ ල ක ය ඇඳ නළලතෙහි තිල ක ය
සිවි නි සැ කය ළඳ කොමල'ඟනන් දැ ක ය
ප ර ත ර ක ය වැද යව මඟ නොවැළ ක ය

102 රුසිරෙන්, රූපසෞන්‍දර්‍ය්‍ය විලාසයෙන්, දිවසර, සුරාඞ්ගනාවන්ගේ; කය, දෙහ (ශ්‍රීවිලාසය;) දන, ජනයන්ගේ; සකය, නෙත්‍රයන්ට; පා, ප්‍රකාශකොට; අලකයසැදි, අලකාවලියෙන් සජ්ජිතවූ; නළලතෙහි, ලලාටතලයෙහි; තිලකය ඇද, තිලක රෙඛාකොට; නිසැකය, නිඃසඞ්කිතව; සිටි, ස්ථිතවූ; ළඳ, තරුණවූ; කොමළඅඟනන්, කොමලාඞ්ගනාවන්; දැකය, දර්‍ශනයකොට; පරතරකය, නද්‍යාසන්නවූ එනම් ප්‍රදෙශයට; වැද, ප්‍රවිෂ්ටව; නොවැළකය, නොවරදවා; මඟ, මාර්‍ගයෙහි; යව, ප්‍රයාණයකර.

103 එ ළි කො ට අවට රිවිබට සිඳු මැදුර ත ට
එ ක වි ට ලොවට එළිබට ගන'ඳර කඳ ට
රොස කොට සුදට අඹරට සඳ එන කල ට
වැලි නො ට ගමට ලැගුමට ගොස් මඟ නොසි ට

103 අවට, හාත්පස්හි; එළිකොට, ආලොක විකාශයකොට; රිවි, සූර්‍ය්‍යයා; සිඳු, සමුද්‍රලක්‍ෂණවූ; මැදුරතට, මන්‍දිරාභ්‍යන්තරයට; බට, අවතීර්‍ණවූකල්හි; එකවිට, එක්‍ෂණයෙහි; ලොවට, ලොකයට; එළි බට, අවතීර්‍ණවූ, ගනඅඳර කඳට, ඝනාන්‍ධ

*දිවකුරු-මුද්‍රිත. †වඩවමින්වැද.

කාර ඝනබයට; රොස කොට, රොෂොත්පාදනය කොට; සඳ, නිසාකාරයා; යුදට, සටන් පිණිස; අඹරට, ආකාශයට; එන කලට, ආගමනය කරන කල්හි; මග, මාගියෙහි; නොසිට, නොරඳා; ලැගුමට, නිවාසග්‍රහණය සඳහා; වැලිතොටගමට, වාලුකාතීර්ථ නම් ග්‍රාමඹරයට; ගොස්, ප්‍රයාණය කොට:–

104 නිල් පැහැ බර ‌ කොල අතු *පතර විසිතු රේ
දිගු තර සර ‌ කඳු මහ විහිදි †මනහ රේ
රැඳි පි ස කර ‌ බිඟු දද සෙනග නොවින රේ
තුරු කඳතුර‡ සැනපෙව අම්බලම සො රේ

104 නිල්පැහැ, නීලවර්ණයෙන් යුක්තවූ; කොළ, පත්‍රයන් ගෙන්; බර, භරිතවූ; අතුපතර, ශාඛාවිටපයන්ගෙන්; විසිතුරේ, විචිත්‍රවූ; දිගුතර, අතිශයින් දීඝිවූ; සර, ශක්ති සම්පන්නවූ; විහිදි, විස්තීර්ණවූ; මහකඳු, මහත්වූ ශාඛාවන්ගෙන්; මනහරේ, (දුටුවන්) සිත් පැහැරගන්නාවූ; නොවිනරේ, අප්‍රමාණවූ; බිඟු, භෘඞ්ගයන් හා; දද සෙනග, පක්ෂිසෙනාවන් විසින්; පියකර, අභිලාෂකොට; රැඳි, රඤ්ජිතවූ; අම්බලමකෙරේ, විශ්‍රාමශාලා සන්නායෙහිවූ; තුරු, වෘක්ෂයක්හුගේ; කඳතුර, ස්කන්ධාන්තර යෙක්හි; සැනපෙව, සන්තර්පණය කරව.

සබඳ! තොප එහි නිවාසග්‍රහණය කොට උන්කල්හි එහි විශ්‍රාම ශාලොපගත නෛක ජනසමූහයාගේ මෙබඳු** අන්‍යො න්‍ය වර්ණනාලාප විශෙෂයකුදු පවත්නේය. එද ††නාකර්ණයට ස්වර්ණලඞකාර කර.

මිත්‍රය! තොප ඒ විශ්‍රාමශාලයෙහි නවාතැන්ගෙන සිටිකාල යෙහි විශ්‍රාමශාලාවට පැමිණි නොයෙක් ජනසමූහයාගේ මෙබ දුවූ ඔවුනොවුන් විසින් කථාකරන වචන විශෙෂයක්ද ඇති වන්නේය. හෙද තොපගේ කර්ණාවතංසයක් කරගනුව.

105 සැපමිණ දෙසතු රෙන් 106 අවා මග අවර ණ
සරත සව මග ය තුරෙන් සිඳුකරන සැප අපම ණ
සැදිනන් පල තුරෙන් ඉගෙන කෙනා එළි බ ණ
තුමුව සැතපු ණුදනන්අතු කියති සමහරු බුදුන්ගේගු

105 දෙසතුරෙන්, නානාදෙශවලින්; සැපමිණ, සම්ප්‍රාප්තව; මගයතුරෙන්, මාගියෙහි ගමන්කිරීම හෙතුකොටගෙන; සරත

*මැදුරු.—†විදි. ‡කඳඹුර ඇතුළු.
**අන්‍යොන්‍යවර්ණනා ††නාකර්ණයෙහි.

සව් ශ්‍රාන්තභාවයට පැමිණ; සැදි, සජ්ජිතවූ; නන්පලතුරෙන්, නානාඵලවර්ගයන්ගෙන්; තුටුව, සන්තුෂ්ටියට පැමිණ; සැත පුණූ, සන්තර්පිතවූ; දනන් අතුරෙන්, ජනයන් අතුරෙහි; (වූ)

106 අවාමග, අපායමාර්ගය; අවරණ, ආවරණයකරන් නාවූද; අපමණ, ප්‍රමාණ රහිතවූ; සැප, (ලෞකික ලොකොත්තර) සම්පත්තීන්;සිදුකරන, සිද්ධකරදෙන්නාවූද; බුදුන්ගේ ගුණ, සර්වඥයන්වහන්සේගේ ගුණයන්; එළිබණ ඉගෙනගෙන, සිංහල භාෂොද්ග්‍රහණය කොට; සමහරු, ඇතැම්කෙනෙක්; කියති, ප්‍රකාශ කෙරෙත්.

107 නොයෙක් මිසදිටු ගත්
නොයෙක් කව්නළු රසදත්
පෙරතම තමනු'ගත්
රමසිතා කතා නෙපලත්

108 සමහරූ උදුරා
උනුනට වෙමින් වාරා
බසින් බස සාරා
කියති සිත් නාමපදතෝ

107 නොයෙක් මිසදිටු, නානාවිධ මිථ්‍යාදෘෂ්ටිය; ගත්, ග්‍රහණය කළාවූද; නොයෙක්, නානාවිධවූ; කව්නළුරස, කාව්‍ය නාටක රසය; දත්, දත්තාවූද; (සමහරු, ඇතැම් අය;) පෙර, පූර්වයෙහි; තමතමන් උගත්, තමතමන් විසින් උද්ග්‍රහණය කරන ලද්දාවූ; රමසිතාකතා, රාම කුමරු හා සීතාදෙවිය සම්බන්ධ කථාවන්; නෙපලත්, ප්‍රකාශකරත්.

108 සමහරු, අන්‍යජනයෝ; උදාරා, උද්දාමවූවෝ; උනුනට, අන්‍යොන්‍යයන්ට; වරාවෙමින්, විරුද්ධවෙමින්; බසින්බස, වචනයෙන් වචනය; සාරා, ස්ථිරකොට; සිත්නාමපද, චිත්‍ර නාමපද හෙවත් නාමපදයන් සම්බන්ධ චිත්‍ර ප්‍රශ්නයන් (තේර විලි); තෝරා, විසර්ජනයකොට; කියති, කථනය කෙරෙත්.

109 වෙන වෙනම පෑසි
කියමින් උනුන් වාසි
සමහරූ සිනාසි
කියති සිව්පද දෙපදරාසි

110 රූපුන් මන් සින්දූ
දිය දද දිගත රැන්දූ
රඳු නමිනි බැන්දූ
කියති සමහර අශෙෂ්සින්

109 වෙන වෙනම, වෙන් වෙන්වම; පෑසි, සාමග්‍රතායුක්තව; (කොටස් කොටස්ව බෙදීයන අර්ථයි) උනුන්, අන්‍යොන්‍යයන්; වාසි කියමින්, වහසි බෙණෙමින්; සමහරු, අන්‍යජනයෝ; සිනාසි, හාස්‍යජනනයකොට; සිව්පද, චතුස්පද්‍යයන් හා; දෙපදරාසි, ද්විපද සමූහයන්; කියති, කථනය කෙරෙත්.

110 රුපුන්මන්, ශත්‍රුරාජයන්ගේ ගව්ය; සිත්දු, ප්‍රවර්තිත කළාවූද; දිගත, දිසාවන්හි; දියදද, විජය ධවජයන්; රුන්දු, රඤ්ජිතකළාවූද; රදු, රාජයාගේ; නමිනි, නාමගසිකොට; බැන්දු, ග්‍රන්ථිතවූ; සින්දු, සංගිතපද්‍යයන්; සමහර අයෙක්, ඇතැම් ජනයෝ; කියති, කථනය කෙරෙති.

**111 නරනිඳුනට සොඳු රු**
**ළඳ යස සොලෝ විසිතු රු**
**දූන පද රුත් මියු රු**
**කියාවන පොත්**
**කෙරෙති සමහ රු**

**112 සමහරු උන් බ සින්**
**පිබිද ඉඳගෙන සතොසින්**
**පවසති සැඩ ගො සින්**
**නිරිඳු විරුදවලි* නෙ**
**ලෙ සින්**

111 සොඳුරු, සුන්දරවූ; නරනිඳුනට; පෘථිවිපාලයන් පිණිස බඳ, බඳනාලද; යස, කීර්තිඇති; විසිතුරු, විචිත්‍රවූ; සොලෝ, ශ්ලෝකයන්ගේ; මියුරු පදරුත්, මධුර පදාර්ථයන්; දූන, ජානනය කොට; කියා, කථනයකොට; සමහරු, ඇතැම් ජනයෝ; වනපොත් කෙරෙති, අධ්‍යයනය කෙරෙති!; (පාඩම් කියති.)

112 සමහරු, අන්‍යජනයෝ; උන්බසින්, ඔවුන්ගේ අධ්‍යයන ඝොෂයෙන්; පිබිද, අපගත නිද්‍රාඇතිව, (නින්දෙන් නැගිට) සතොසින්, සන්තුෂ්ටියෙන් යෙදී; ඉඳගෙන, නිසීදනය කොට; නිරිඳු, නරෙන්ද්‍රයන්ගේ; විරුදාවලී, විරුදුනාම සමූහය; නෙලසින්, නොයෙක් ආකාරයෙන්; සැඩගොසින්, චණ්ඩඝොෂයෙන්; පවසති, ප්‍රකාශ කෙරෙති.

**113 පෙර ලක්දිව නොම ද**
**රජකළ රජුන්ගේ සො ද**
**ගුණෙනි බඳ සිව් ප ද**
**කියති සමහර**
**මහල්ලෝ ඉ ද**

**114 පඬිනිරිඳු නැණ ස ක්**
**පෑ මුළු දෙරණ අණ ස ක්**
**දිනුවකි මිරිඳු ස ක්**
**අයෙක් පවසති ඔහුගෙ**
**වෙනසසක්**

113 පෙර, පූර්වයෙහි; ලක්දිව, ලඞ්කාවීපයෙහි; රජකළ, රාජ්‍යයකළාවූ; නොමද, අමන්දවූ; රජුන්ගේ, නරපතීන්ගේ; සොඳ, සුන්දරවූ; ගුණෙනිබඳ, ගුණකදම්බයෙන් ග්‍රන්ථිතවූ; සිව් පද, චතුෂ්පද්‍යයන්; ඉද, නිසීදනය කොට; සමහර මහල්ලෝ, ඇතැම් වෘද්ධජනයෝ; කියති, කථනය කෙරෙති.

114 නැණසක්, ප්‍රඥාචක්ෂුෂ ඇත්තාවූ; පඬිනිරිඳු, (දඹදිව) පාණ්ඩු රාජයා; මුළුදෙරණ, සමස්ත පෘථිවිතලයෙහි; අණසක්,

*සතොසින්.

ආශුවන්‍රය; පා, ප්‍රකාශකොට; විරිදුසක්, ශත්‍රුනරෙන්ද්‍ර සමූහයන්; දිනුවයි, ජයග්‍රණය කෙළේයයි; අයෙක්, ඇතැම් ජනයෝ; ඔහුගෙ, ඒ පාණ්ඩුරාජයාගේ; වෙසසක්, විශෙෂවික්‍රමයක්; පවසත්, ප්‍රකාශ කෙරෙත්.

**115 සොළි පඩිලා ර — ට**
**ගුජ්ජර* තුළුඹ මහර — ට**
**තෙලිඟු වගුරට සි — ට**
**පැමිණි දන තමතමන්ගේ**

**116 ජයගෙන රුපුර — දුන්**
**තුටුකර සියල් දිළි — දුන්**
**විඳ සව්සිරි න — දුන්**
**වණතරජ කරන රඟනිරිඳු**

115 සොළී, සොළීරටය; පඩි, පඩිරටය; ලාරට, ලාටදෙශය; ගුජ්ජර, ගුර්ජරදෙශය; තුළුක, තුළුකජනපදය; මහරට, මහාරාෂ්ට්‍රය; තෙලිඟු, ආන්ද්‍රරටය; වගුරට, වංගදෙශය යන මෙ තන්හි; සිට, සිටිතව; පැමිණි, සම්ප්‍රාප්තවූ; දන, ජනයන්; තම තමන්ගේ රට, ස්වියස්වියරාෂ්ට්‍රයන්හි:–

116 රුපුරදුන්, ශත්‍රුරාජයන්; ජයගෙන, ජයග්‍රහණය කොට; සියල් දිළිඳුන්, සකල දරිද්‍රජනයන්; තුටුකර, සන්තුෂ්ට වූවන් කොට; නඳුන්, ආනන්දකරවූ; සව්සිරි, සකලෛශ්වර්‍ය්‍යය; විඳ, වින්දනය කොට; නිරිඳුන්, නරෙන්ද්‍රයන්; රජකරන රඟ, රාජ්‍යයකරන ආකාරය; වණත, වර්ණනා කරන කල්හි:–

**117 අප නිරිඳු යස — සා**
**නොකියා ඔවුන් හ — සා**
**පවසන බස් අ — සා**
**පවර නුවණැති දනෝ**
**වෙසෙ — සා**

**118 දිනමිණිකුලග ප — ත්**
**නිරිඳෝම වෙත් යහප — ත්**
**එයිනප රජු පව — ත්**
**මෙසේ අසවයි කියා පවසත්**

117 අප නිරිඳු, අස්මත් පරාක්‍රමබාහු නරෙන්ද්‍රයාගේ; යසසා, යශොවර්ණනාවක්; නොකියා, ප්‍රකාශනොකොට; ඔවුන්, ඒ ඒ ජනයන් විසින්; සහසා, ලාහෙලා හෙවත් දෘඪොත්සාහයෙන්; පවසන, ප්‍රකාශකරනු ලබන්නාවූ; බස්, (රජුන්ගේ යශොවර්ණනා සඞ්ඛ්‍යාත) කථාවන්; අසා; ශ්‍රවණයකොට; වෙසෙසා, විශෙෂයෙන්; පවරනුවණැති, ශ්‍රෙෂ්ඨබුද්ධිසම්පන්නාවූ; දනෝ, ජනයෝ:–

118 දිනමිණිකුල, සූර්‍ය්‍යවංශයට; අගපත්, අග්‍රප්‍රාප්තවූ; නිරිඳෝම, නරෙන්ද්‍රයෝම; යහපත්වෙත්, (සොළි පාඩි ආදි රාජයන්ට වඩා) ශ්‍රෙෂ්ඨවන්නෝය; එයින්, ඒ හෙතුකොට ගෙන; අපරජු, අස්මතුන්ගේ රාජයා පිළිබඳවූ; පවත්, ප්‍රවෘත්තීන්; අසවයි, ශ්‍රවණය කරව්යයි; මෙසේ, මේ වක්ෂ්‍යමාණාකාරයෙන්; පවසත්, ප්‍රකාශ කෙරෙති.

* තුඵර.

119 තෙදින් රිවි බි ම් බා
නිරිඳු සඳු පැර කු ම් බා
රුපුසිඳු ක ල ම් බා
කෙලෙස විරුසිරි
සඳ ඔලොම් බා

120 මෙරද සිරි සරණය
නිරිඳුන් මුදුන් බරණය
සිරිසඳට වරණය
වේය මුළුලොවට
එක සරණය

119• තෙදින්, තෙජස්හෙතුකොටගෙන; රිවිබිම්බා, සූය්‍ය්‍යී බිම්බායමානවූද; පැරකුම්බා නිරිඳුසඳු, පරාක්‍රමබාහු නම් නරෙන්‍ද්‍රතෙම; රුපුසිඳු, ශත්‍රැලක්‍ෂණ සමුද්‍රය; කලම්බා, මථනයකොට; විරු, වීරගුණලක්‍ෂණවූ; සිරිසඳ, ශ්‍රීකාන්තාව; ඔලොම්බාකෙලෙය, අවලම්බනය කෙලේය.

120 මෙරද, මේ රාජයාගේ; සිරිසරණය, ශ්‍රීමත්පාදයුගලය තෙම; නිරිඳුන්, (අන්‍ය) නරෙන්‍ද්‍රයන්ගේ; මුදුන්, මස්තකයෙහිම; බරණය, ආභරණයකි; (එසේම) සිරිසඳට, ශ්‍රීදෙවියට; වරණය, ආරක්‍ෂා ස්ථානයෙකි, (ඒ මතුද?) මුළුලොවට, සමස්ත ලොකයට; එකසරණය, අසහාය ප්‍රතිෂ්ඨා ස්ථානයක්ද වේය.

121 බලකොටු ගිරිදුදු ළු
බලසෙන් සමග තෙද ර ළු
බුන් තැන තැන අඹු ළු
නැබුළු විකුමැති
නොයෙක් රජමු ළු.

122 යුද දප පසි න්දූ
ඔවුන් බිද ලුහු බ න්දූ
යස දස'ත අ න්දූ
කෙලෙය මුළු දඹ
දිවට නි න්දූ

121 ගිරිදුදුළු, ගිරිදුගියන්හි; බලකොටු, ශක්තිමත් සෙනාවින්‍යාසයන්; රළුතෙද, දෘඪතෙජස් ඇත්තාවූ; බලසෙන් සමග, භටසෙනා සමගින්; නැබුළු විකුමැති, මහත් වික්‍රමාන්විතවූ; නොයෙක් රජ මුළු, අනෙක ශත්‍රැරාජ සමූහයා; බුන්, භග්න කොට; තැන තැන, තන්හි තන්හි; අඹුළු, ආවෘතතව:-

122 ඔවුන්; ඒ ශත්‍රැරාජයන්ගේ; යුදදප, යුද්ධයෙහිවූ ගර්වය; පසින්දූ, ප්‍රච්ඡින්නකොට; බිද, හෙදය හෝ කොට; ලුහුබන්දූ, පසුපස්සේ එලවා; යස, යශඃකදම්බය; දසඅත, දශදිශාවන්හි; අන්දූ; ආලෙඛ්‍යයකොට; මුළුදඹදිවට, සමස්ත ජම්බුද්වීපයට; නින්දූ කෙලෙය, නිග්‍රාකෙලේය.

123 දසමක් ගිරිදුදු ළු
ජයගෙන විකුම් තෙද ර ළු
හල දල රුපු අඹු ළු
**දුරුමරසෙන් අයුරුබලමුළු

124 අඛිල මෙර මත වැ ද
වෙරළ ගිලිසිඳු දිය ක ද
රොසකැරැ ඝොසඝනාමද
ඇවිත්වන්සඳ යුදට එකබ

**දරුණු. †සිරි-සමහර.

123 දසටස්, අපමාදශප්‍රමාණවූ; ගිරිදුදුළු, ගිරිදුගියන්; රළු, දැඩිතරවූ; විකුම්, වික්‍රමයෙන් හා; තෙද, තෙජසින්;. ජය ගෙන, ජයග්‍රහණයකොට; දළ, දැඩිවූ; රුපු, ශත්‍රූන්; අඹුළු, ආවෘතකොට; හළ, පන්නාහැරියාවූද; මරසෙන් අසුරු, මාර සෙනාවගේ ආකාරය; දරූ, ධාරණය කළාවූද; බලමුළු, භට සමූහයා:–

124 රොස, කොපයෙන්; නොමද ඝොසකැර, අමන්‍දඝොෂය පවත්වා; ඇවිත්, ආගමනයකොට; යුදටවන්සද, සඞ්ග්‍රාම යට ප්‍රාප්තකල්හි; මෙරමත, මෙරුමස්තකයෙහි; වැද, ඝට්ටිතව; අබල, ආවෘතතාව; වෙරළ, වෙලානතයෙහි; ගිලී, ගලා ගියාවූ; සිඳු, සමුද්‍රයාගේ; දියකද, ජලස්කන්ධය හා; එකබද, එක්වැනිවේ.

125 මෙනර පව රාසා
හළනැව්* බඩු පු රාසා
අතර උදු රාසා
ගතිසි රාසන් **මළවරාසා

126 දඹ දිව සොළී ර ට
ආ දිව රාම පටුන ට
මහ සෙනග යුද ය ට
යවාමහනැව්පිපින්එකවිට

125 මෙනරපවරය, මේ (අපගේ) ප්‍රවරනරෙන්‍ද්‍රතෙම; බඩු පුරයා, භාණ්ඩයෙන් පූරවා; හළ, (ලක්දිවින් වෙළඳුන් විසින් වෙළඳාම පිණිස දඹදිවට) යවනලද; නැව්, නෞකාවන්; අතර අන්තරමාගියෙහි; රායන්මළවරයා, එනම් යාත්‍රානිවෙහිදී; උදුරයා, බලාත්කාරයෙන්; ගතිසි, (රාජවීරරාම මළවරායර නම් රාජයා විසින්) ග්‍රහණය කෙළේයසි; (අසා)

126 දඹදිව, ජම්බුවීපයෙහි; සොළීරට, චොලරාෂ්ට්‍රයෙහිවූ; ආදිවරාමපටුනට, අදිවිරම්පට්ටන නම් ස්ථානයට හෙවත් අදිවීර රාම පට්ටනමට; මහසෙනග, මහා සේනාව; මහ නැව්පිපින්, මහත්වූ නෞකාපඞ්ක්තියෙන්; එකවිට, එකවරම; යුදයට, සඞ්ග්‍රාමය පිණිස; යවා; ප්‍රේරණය කොට:–

127 †නිබද යුද බඳ සො ඩ
දෙමළ බළසෙන්†† මන්මැ ඩ
දඹදිව්තල නිහ ඩ
කොළෙසිරිලක්දිවට දියවැ ඩ

128 තෙවිකුම් විකුම් ඇ ති
අපහිමි දිනිඳු කුල ප ති
පෙර නිරිඳුන් අයි ති
නුවූදසමක් වන්නිජයගති

127 නිබද, නිත්‍යයෙන්; යුද; යුද්ධකිරීමෙහිලා; බඳසොඩ, බද්ධාභිලාෂ ඇති; දෙමළ බළසෙන්, ද්‍රවිඩභටසේනාවගේ; මන්වැඩ, දප්මර්දනයකොට; දඹදිව්තල, ජම්බුවීපතලය; නිහඩ, නිශ්ශබ්දයද; සිරි ලක්දිවට, ශ්‍රීලඞ්කාවීපයට, දියවැඩ, ජයාභිවෘද්ධියක්ද; කෙළේ, කෙළේය.

* සෙන්පුරයා ** රායන්වලවරායා † නිබදබඳ †† බලමැඩ

128 තෙවිකුම්, ත්‍රිවික්‍රමයාට බඳුවූ හෙවත් ශ්‍රී විෂ්ණු දිව්‍ය රාජයාට සදෘශවූ; විකුම් ඇති, වික්‍රමය ඇත්තාවූ; දිනිඳුකුලපති, සූර්‍ය්‍ය වංශයට නායකවූ; අපහිමි, අපගේ ස්වාමිතෙම; පෙර, පූර්‍වයෙහි; නිරිඳුන්, නරෙන්ද්‍රයන්ට; අසිහිනුවූ, අයත්තනොවූ; දසටක්වන්නි, අෂ්ටාදශවන්නි ප්‍රදෙශයෙන්; ජයගති, දිනා ගත්තේය:

**129**
**සිය ගණනක් මෙ සේ**
**රුදුරණ දිනා වෙසෙ සේ**
**දක්වී යස රැ සේ**
**මහලු පැරකුම් නිරිඳු විල සේ**

**130**
**පිවිස මුළුලෝ කු ස**
**යුගකෙළ සයුරු ගොස ලෙ**
**මැඩි රුපු රජ යස ස**
**කොතන නොපතළෙද මොහු ජය ගොස**

129 මෙසේ, මේ උක්තප්‍රකාරයෙන්; සියගණනක්, ශතසඛ්‍යාතවූ; රුදුරණ, රෞද්‍රසඞ්ග්‍රාමයන්; වෙසෙසේ, විශෙෂයෙන්; දිනා, ජයග්‍රහණයකොට; මහලු පැරකුම් නිරිඳු විලසේ, මහලු පරාක්‍රමබාහු නරෙන්ද්‍රයා සෙයින්; යසරැසේ, කීර්ත්තිකදම්බය; දක්වී, ප්‍රකාශ කෙළේය.

130 රුපුරජ, ශත්‍රුරාජයන්ගේ; යසස, යශොමාලාව; මැඩී, මර්දනය කළාවූ; මොහු, මේ නරෙන්ද්‍රයාගේ; ජයගොස, ජය ඝොෂය; යුගකෙළ, යුගාන්තයෙහි; සයුරුගොස ලෙස, සමුද්‍ර ඝොෂය පරිද්දෙන්; මුළුලෝකුස, සමස්තලොක කුහරයට; පිවිස, ප්‍රවිෂ්ටව; කොතන, කිනම් ස්ථානයෙක්හි; නොපතළෙද, ව්‍යාප්තනොවීද? (සියලු තැනම පැතුරුණේයයි සේයි.)

**131**
**දිසි දස දිස ගො සින්**
**මොහුගෙ අණසක වෙසෙසින්**
**සැණ මල්දම් ලෙ සින්**
**කවර රද නොදැරිද සිරසින්**

**132**
**තම තෙද අණට උ ඳු**
**හිම්සාර සතර දල නි ඳු**
**පිම්බු සැඩ විරු ඳු**
**පයිඳු සන්තඩ නිරිඳුගේ රු ඳු**

131 දසදිස, දශදිශාවන්හි; ගොසින්, ගමනයකොට; වෙසෙසින්, විශෙෂයෙන්; දිසි, දෘශ්‍යමානවූ; (ප්‍රත්‍යක්ෂවූ) මොහුගෙ, මේ නරෙන්ද්‍රයාගේ; අණසක, ආඥාචක්‍රය; සැණමල් දම් ලෙසින්, ක්ෂණ මාලාදාම විලාසයෙන් හෙවත් ක්ෂණ ක්‍රීඩාවෙහි පිලන්ධිත මාලාදාමයක් සෙයින්; කවර රද, කිනම් රාජයෙක් තෙම; සිරසින්, මස්තකයෙන්, නොදැරීද, ධාරණය නොකෙළේද? (සියල්ලෝම දැරූහ යනු භාවයි.)

132 (මෙනිරිඳු, මේ නරෙන්ද්‍රතෙම;) උඳු, සෘජුව හෙවත් නොවැළැක්විය හැකිව හෙන්නාවූ; තමතෙද අණට, තමාගේ

තේජස් හා ආඥාබලයට; සතරදලනිඳු, චතුස්සාගරය; හිමිකර, යිමාකොට; පසිඳු, ප්‍රසිද්ධවූ; රුඳු, රෞද්‍රවූ; කන්නඩිනිරිඳුගේ; කණ්ණාටරාජයාගේ; සැඩ, චණ්ඩවූ; විරිඳු, වෛරිභාවයද; පිම්බූ, පිඹ හලේය.

"හිමිකර සතර දලනි ඳු"

ඒ මහාමෙරුපර්වතය සතරමහදිග සතර පැහැයෙක සතර අනුදිග සතර පැහයෙකැයි අට පැහැයෙක් ඇත්තේය. එයින් පූර්වදිග පලිඟුවන් සුදුපැහැය, දකුණුදිග ඉඳුනිල්මිණි වන් පැහැය, පශ්චිමදිග පබළුවන් රත්පැහැය, උතුරුදිග ඝන රන්වන් පැහැය, ඊසානදිග සුදු රන්වන් මිශ්‍රවූ පැහැය, අග්නි දිශාව සුදුනිල් මිශ්‍රවූ පැහැය, නිරිත රත්නිල් මිශ්‍රවූ පැහැය, වායුදිග රත්රන් මිශ්‍ර පැහැය මෙසින් සතරමහදිග සතර අනු දිග පර්වත සමුද්‍රාදිය ස්වකිය වර්ණ කරමින් සක්වළගල පැහැ ර සිටිනේය. එසේ හෙයින් පූර්වදිශාවෙහි සමුද්‍රය කිරිමුහුද නම් විය. දක්ෂිණදිශාවෙහි සමුද්‍රය නිල්මුහුද නම් විය. පශ්චිම දිශාවෙහි සමුද්‍රය පබළු මුහුද නම් විය. උත්තර දිශායෙහි සමු ද්‍රය ස්වර්ණසාගර නම් විය. සද්ධර්මරත්නාකරය.

**133**

**මුළු දඹදිව අව ට**
**බැලුවත් දෙරණ විකුම ට**
**මෙ අප නරනිඳු හ ට**
**ඇද්ද සරිවන රජෙක්මෙකල**

**134**

**බෙලෙන් බල දෙවි යු ත**
**අප නරනිඳුට සිරිම ත**
**නොවි නිති අවන ත**
**කවරනිරිඳෙක් ඉඳිද මෙදියත**

133 මුළු දඹදිව, සමස්තජම්බුවීපයෙහි; අවට, හාත්පස; දෙරණ, ධරණීයෙහි; බැලුවත්, නිරීක්ෂණයකළත්; විකුමට, වික්‍රම මහිමයෙන්; මෙ අප නරනිඳුහට, මේ අපගේ රාජයාට; සරි වන රජෙක්, සදෘශ වන රාජයෙක්තෙම; මෙකලට, මේ කාලයෙහි; ඇද්ද, විද්‍යමානද? (නැත්තේමැයි.)

"ඇද්ද සරි වන රජෙක් මෙකල ට"

උවම්, වත්, පිළිරු, නුරු, අනුරු, සුඳුස්, හරණ, ගින්, මෙන්, අසුරු, වැනි, පලග, එකබඳු, දූසි, සුද, සේ, වන්, සම, එව්, පිළි වක්, සුරුකු, ශුරු, සහලු, වැලහලු යන මේ ශබ්ද පඤ්චවිංසතිය සරි වන හෙවත් සදෘශ්‍යයට නම්. රුවන්මල සහ පියුම්මල.

134 බෙලෙන්, බලයහෙතුකොටගෙන; බලදෙවියුත, බල භද්‍රයා හා සදෘශවූ; සිරිමත, ශ්‍රී සම්පන්නවූ; අප නරනිඳුට, අස්මතුන්ගේ රාජයාහට; නිති, නිත්‍යයෙන්; අවනතනොවූ, විනයාවනතනොවූ; (යටත්නොවූ) කවර නිරිඳෙක්, කිනම් රාජයෙක් තෙම; මෙදියත, මේ ධරණීතලයෙහි; ඉඳිද,? විද්‍යමානද? (නැත්තේමයයි සේයි.)

**135**

**සිටි මුළු ලොව දි ලි**
**මොහු අණ මිසක් නොමැ ලි**
**කවරකු අණ බ ලි**
**විද පර රජ ගජන් හැකි ලි**

**136**

**වසන හැම දුදු ලේ**
**රුදු රුපු රදුන් දප ලේ**
**උවිදුද පසු කෙ ලේ**
**කුමන විකුමෙක්ද මොහු නොකෙළේ**

135 මුළුලොව, සමස්තලොකයෙහි; දිලිසිටි, ජ්වලිතව ප්‍රවෘත්තවූ; මොහු, මේ රාජයාගේ; නොමැලි, මලානනුවූ; අණ මිසක්, ආඥාචක්‍රයමුත්; කවරකු, (අන්) කිනම් රාජයකුගේ; බලී, බලවත්වූ; අණ, ආඥාවක්; පර රජ, ශත්‍රැරාජලක්‍ෂණවූ; ගජන්, හස්තීන්; හැකිලී විද, බන්ධනය වූයේද?

136 හැමදුදුලේ, සියලු වනදුර්ග ගිරිදුර්ගාදියෙහි; වසන, වාසය කරන්නාවූ; රුදු, රෞද්‍රවූ; රුපුරදුන්, ශත්‍රැරාජයන්ගේ; දපලේ, දර්පච්ඡේදය කෙළේය; (එසේම) උවිදුද; උපෙන්‍ද්‍රයාද පවා; (විෂ්ණු දිව්‍යරාජයා පවා) පසුකෙළේ, (වික්‍රමයෙන්) පශ්චාද්භාගයෙහි කෙළේය; (එහෙයින්) මොහු, මේ රාජයා විසින්; නොකෙළේ, නොකරන ලද්දේ; කුමන විකුමෙක්ද? කිනම් වික්‍රමයෙක්දෝ :–

**137**

**ජය ගෙන මුළු දෙර ණ**
**පෙන්වා තමන් තෙද අ ණ**
**ලක එක හිර වර ණ**
**කෙළේ අපහිමි විකුම්අපමණ**

**138**

**සැම නිරිඳුන් හ ට**
**අවනත නොවූ පෙර සි ට**
**ආරිය සක්විති ට**
**නොමඳබලසෙන්යවා යුදයට***

137 මුළු දෙරණ, සමස්තධරණීතලය; ජයගෙන, දිනාගෙන; තමන්, ස්වීයවූ; තෙද අණ; තෙජස් හා ආඥාචක්‍රය; පෙන්වා, ප්‍රකාශකර; ලක, ශ්‍රී ලඞ්කාතලය; එකහිරවරණ, එකච්ඡත්‍රයක් ඇත්තකු; කෙළේ, කළේය; අප හිමි, අපගේ ස්වාමි රාජයාගේ; විකුම්, වික්‍රමය; අපමණ, අප්‍රමාණය.

138 සැම නිරිඳුන්හට, සමස්ත රාජයන්ට; පෙර සිට, පූර්වයෙහි පටන්; අවනතනොවූ, යටත් පැවතුම් නැත්තාවූ; ආරිය සක්විතිට; ආර්‍ය්‍යචක්‍රවර්තිරාජයා හා; යුදයට, සටන් පිණිස; නොමඳ බලසෙන්, අමන්දවූ භටසේනාවන්; යවා, ප්‍රේරණය කරවා :–

**139**

**කළ යුදෙහි සෙ ද වා**
**එනිරිඳුන් ලුහු බ ඳ වා**
**ඔහුගෙ ඔද සි ඳ වා**
***ඔසිල් නැ බැ මලුන් බ ඳ වා**

**140**

**මැති සෙනග සල සා**
**යාපාපටුන සක සා**
**ගෙන අදහස ලෙ සා**
**තිබිය පස්වා දහස් යස සා**

* මේ ලකුණ දරණ කවි දෙක මුද්‍රිත පොතේ නොපෙනේ.

139 සෙදවා, ශීඝ්‍රව; කලියුගෙ දගී, කලාවූ යුධයෙහි; එනිරිදුන්, ඒ නරෙන්‍ද්‍රයා; ලූහුබැඳවා, පලවාහැර; ඔහුගෙ, එම රජයාගේ; ඔද සිදවා, තෙජස් භග්න කොට; මයිල්, මාතුලයන්ද; නෑ, ඥාතීන්ද; බෑ, භාගිනෙයයන්ද; මලුන්, භ්‍රාතෘන්ද; බඳවා, ජීවග්‍රාහයෙන් ගත්තේය.

140 මැතිසෙනඟ, මන්ත්‍රිසේනාව; සලසා, සජ්ජිතකොට ගෙන; යාපාපටුන, යාපාපට්ටන නම් රාජධානිය; සකසා, මනාකොට; අදහස ලෙසා, අධ්‍යාශය පරිද්දෙන්; ගෙන, හස්තගත කොට ගෙන; පස්වාදහස්, පඤ්චගුණිත සහස්‍රවර්ෂකාලයක් මුළුද; යසසා, කීර්තිය; තිබිය, පැවැත් විය.

| 141 | | 142 | |
|---|---|---|---|
| දශ දහසක් යො | දුන් | තම කුලයට මතු | ත් |
| දඹදිව දිනූ විරි | දුන් | වන ලෙසට ලක එකස | ත් |
| දම්සෝ නර නි | ඳුන් | පෙන්වා රජ සිරි | ත් |
| මිසක් කවරෙක් සරිද මෙර දු | | විය මනු නිරිඳුමෙන් මැදහ | ත් |

141 දසදහසක්, දශසහස්‍ර ප්‍රමාණවූ; යොදුන්, යොජනයන් ඇත්තාවූ; දඹදිව, ජම්බුද්වීපයෙහි; විරිදුන්, වෛරීරාජයන්; දිනූ, පැරදවූ; දම්සෝ නරනිඳුන් මිසක්, ධර්මාශොක රජයාමුත්; මෙරදුන්, මේ රජයාට; කවරෙක්, අනික් කවර රජයෙක් තෙම; සරිද, සදෘශ වන්නේද? (නොවේමැයි.)

142 තම, තමන්ගේ; කුලයට, රාජවංශයට; ලක, ලඞ්කාව; මතුත්, අනාගතයෙහිදු; එකසත් වන ලෙසට, එකච්ඡත්‍ර වන පරිද්දෙන්; රජසිරිත්, රාජචාරිත්‍රයන්; පෙන්වා, දක්වා හෙවත් ලියවා තබා; මනුනිරිඳුමෙන්, මනුරාජයා සෙයින්; මැදහත්විය මධ්‍යස්ථ වූයේය.

| 143 | | 144 | |
|---|---|---|---|
| තමන් සිළුමිණ | ඤේ | වැඳ ඔහු පද කම | ල |
| සිලිලෙන් සරණ කර | ඤේ | ලැබ සව් ඉසුරු මනක | ල |
| රජු ඉති දූන සො | ඤේ | සොළී පාණ්ඩි කු | ල |
| සිටිති සිරිලක සියල් නිරි ඤේ | | නොයෙක්නිරිඤේසිටිතිහැමක | ල |

143 සිරිලක, ශ්‍රී ලඞ්කාතලයෙහිවූ; සියල් නිරිඳෝ, සමස්ත මහීපාලයෝ; තමන්, තම (තම) න්ගේ; සිළුමිණ, චූඩාමණියෙහිවූ; ඤෝසිලිලෙන්, රශ්මිලක්ෂණ ජලයෙන්; රජු, (අප) නරෙන්‍ද්‍රයාගේ; සරණ, පාදතලය; ඤෝකර, ධෞවනයකොට; ඉති, (රජයාගේ) අධ්‍යාශය; සොඳෝ, මනාසේ; දූන, ජානනය කොට; සිටිති, ප්‍රවෘත්ත වෙති.

144 ඔහු, ඒ නරෙශ්‍රෂ්ඨයාගේ; පදකමල, පාදලක්‍ෂණපද්මය; වැද, අභිවාදනයකොට; මනකල, චිත්තානුකූලවූ; සව් ඉසුරු, සකලෛශ්වර්‍ය්‍යය; ලැබ, ප්‍රතිලබ්ධකොට; සොළීපාඩි කුල, චොලවංශ පාණ්ඩුවංශවයෙහිවූ; නොයෙක් නිරිඳෝ, අනෙක නරෙන්‍ද්‍රයෝ; හැමකල, සැම කල්හි; සිටිති, වාසය කරති.

| 145 | | 146 | |
|---|---|---|---|
| මුනි බණ අසා නි | ති | විරිදුන් හැර දුර | ම |
| අප හිමි* තිවුණු නුවණැ | ති | වැද රද නිති අසර | ම |
| සසමය දැන පැවැ | ති | දැන අවි සිප් සර | ම |
| මිළිඳු රදු සේ විය දනුමැ | ති | සියල් සාව්නළු ඇසි නොහැර | |

145 තිවුණු නුවණැති, තීක්‍ෂණ ඥනාන්විතවූ; අප හිමි; අපගේ (මේ) පරාක්‍රමබාහු නරෙන්‍ද්‍රතෙම; නිති, නිරන්තරයෙන්; මුනිබණ, බුද්ධධර්‍මය; අසා, ශ්‍රවණයකොට; සසමය දැන, ස්වසමය ජානනයකොට; පැවති, ප්‍රවෘත්තවූ; මිළිඳුරදු සේ, මිලින්‍ද රජයා පරිද්දෙන්; දනුමැතිවිය, ප්‍රඥාන්විතවි.

“අප හිමි තිවුණු නුවණැ ති”

අප හිමි, අපගේ (මේ) පරාක්‍රමබාහු රජයා නැමැති ස්වාමි තෙම; තිවුණු, තීක්‍ෂණවූ; නුවණැති, ඥනාන්විතය.

සංස්කෘත භාෂාගත “ත්‍රිගුණ” ශබ්දයෙන් සිද්ධවූ “තිහුණු” ශබ්දය වනාහි තුන්පංගුවක් හෙවත් තුන්ගුණයක්ය යන අර්‍ථය ශාබ්දිකයෝ හඟවත්. ඇතැම් ආචාර්‍ය්‍යවරු මෙය තීක්‍ෂණ අර්‍ථයෙහි යොදත්. ගේ ශාස්ත්‍රයට අතිශයින්ම ප්‍රහාර දානයක් බැව් පෙනේ. පාළිහත්වනගල්ල විහාරවංසයෙහි “සඞ්ඝබොධි කුමාරොපි කතාධිකාරත්තා තික්ඛ පඤ්ඤත්තාච” සඞ්ඝබොධිකුමාරො අපි, සඞ්ඝබොධිකුමාර තෙමේත්; කතාධිකාරත්තා, කරනලද අධිකාර ඇති බැවින්ද හෙවත් කරනලද පින් ඇති හෙයින්ද; තික්ඛ පඤ්ඤත්තාච, තීක්‍ෂණ ප්‍රඥව ඇති හෙයින්ද; යනාදිය ජෙකප්‍රයොගයන්ට අනුව යොදා තිබෙන බැව් පෙනේ. පෞරාණික ශාබ්දිකයෝ ව්‍යාකරණානුකූලව සුපරීක්‍ෂාවෙන් ග්‍රන්ථයන්හි අරොපිත කළාහුය. අධුනා සමයෙහි බෙහෙවින් කිසිම වගවිභාගයක් නැතුව ලියන කියන ඇත්තන්ගේ සඞ්ඛ්‍යාව සුළුපටු නොවේ.

සංස්කෘත භාෂායෙහිවූකලී “තීක්‍ෂණ” කියාද පාළියෙහි “තික්ඛණ” කියාද සිංහලට “තිවුණු” කියාද ව්‍යවහාරර්‍ම ශිෂ්ට සම්මතවිය. අපවෙත තිබෙන පැරණි කාව්‍යශෙඛරගත පුස්කොළ පොතක මෙසේ දක්නට ලැබේ. එනම්:-

* මේ ලකුණ දරණ කවිය මුද්‍රිත පොතේ නොපෙනේ.

නබන ලද සිඑ ඇ — නි
එකුමරු තිවුණු නුවණැ — ති
එකලට රට පැවැ — ති
කිසා සෝඩිසෙ අකුරු දනග — ති

යනුවෙන් පෙනෙන්ට තිබෙන නමුත් සියළුම මුද්‍රිත පොත්වැල තිවුණු නුවණැති කියා අශොභන ලෙස යොදා තිබීම ඛෙදයට කරුණකි.

146 විරිඳුන්, ශත්‍රුනරෙන්‍ද්‍රයන්; දුරමහැර, දූරීභූතකොටම; රදනිති, රාජනීති ලක්‍ෂණවූ; අසරම්, මාගීයටම; වැද, ප්‍රවිෂ්ටව; අවිසිප්සරම, ආශුඛශිල්පාභ්‍යාසයන්; දැන, ජානනය කොට, සියල් කව්නළු, සකලකාව්‍යනාටකයන්; නොහැරම, නිරව ශෙෂකොටම; ඇසි, ශ්‍රවණය කෙළේ.

147

මනුනිති දස ර — ද
*දහමින් ලොවට අග ර — ද
අප නිරිඳුට පැහැ — ද
පඩුරු නේවන කෙනෙක් කාවුරු — ද

148

පසිඳු රිවි — වංසා
†සැපමිණි මෙරද — හංසා
මුළු ලොවට — හිංසා
නොකොට කරනුය නිතිප — සංසා

147 මනුනීති, මනුප්‍රොක්ත නීතිය සහිත; දසරදදහමින්, දශරාජධර්මයෙන්; ලොවට, ලොකයට; අගරද, අග්‍රරාජවූ; අප නිරිඳුට, අපගේ නරෙන්‍ද්‍රයාහට; පැහැද, ප්‍රසන්නව; පඬුරු, (තුෂ්ටි) ප්‍රාභෘතයන්; නේවන කෙනෙක්, ප්‍රෙරණය නොකරන අය; කවුරුද?, කවරහුද?.

148 පසිඳු, ප්‍රසිද්ධවූ; රිවිවංසා, සූය්‍යවංශයට; සැපමිණි, සම්ප්‍රාප්තවූ; මෙරද හංසා, මේ රාජ ශ්‍රෙෂ්ඨතෙම; මුළුලොවට, සමස්තලොකයට; හිංසා නොකොට, පීඩා නොකර; නිති, නිත්‍යයෙන්; පසංසා කරනුය, ප්‍රශංසාකෙරේ හෙවත් ප්‍රසාදය දක්වයි.

149

මෙ අප නර පව — රා
මනුනය සිතින් සපු — රා
නොහැර සිවු සඟ — රා
ලොවට නිරතුරු කෙරෙයි සඟ — රා

150

මෙ අප නරනි — න්දේ
රජ දහම ‡නිති රැ — න්දේ
කොස් සිඳු කිමි — න්දේ
නොයෙක් බමුණන්ට නිති ද — න්දේ

149 අප, අස්මතුන්ගේ; මෙනර පවරා, මේ නරශ්‍රෙෂ්ඨ තෙම; මනුනය, මනුප්‍රොක්ත රාජනීතිය; සිතින්, චිත්තයෙන්; සපුරා, සම්පූර්ණකොට; (සිත්හී මනුනීතිය ආදරයෙන් දරා යන අදහසි) සිවුසඟරා, චතුඃ සඞ්ග්‍රහවිධිය; නොහැර, පහනොකොට; නිරතුරු, අනවරතයෙන්; ලොවට, ලොකසත්වයාට; සඟරා කෙරෙයි, සඞ්ග්‍රහකරයි.

* දහැමින්. † සපැමිණි මුද්‍රිත. ‡ සිත රැන්දේ මුද්‍රිත.

150 නිති, නිරතුරුව; රජදහම, රාජධර්මයෙහි; රැන්දේ, රක්‍ෂිතවූ; (රාජධර්මයෙහි යෙදුනාවූ යන අර්ථයි) මෙ අප නරනින්දේ, මේ අපගේ නරේන්‍ද්‍රතෙම; තොස්සිඳු, සන්තුෂ්ටි ලක්‍ෂණ සමුද්‍රයෙහි; කිමින්දේ, නිමග්නවූයේ; නොයෙක් බමුණනට, නානා බ්‍රාහ්මණයන්ට; නිති, නිත්‍යයෙන්; දන්දේ, දානයන් දෙන්නේය.

151 ගත් මෙන් නවන දන්
කෙරෙමින් කලි අතුරු දන්
†කැරැ සත සිත න දන්
දේය අවුරුදු පතා මහ දන්

152 මේ අප නරපව ර
සිරිලක රදන හැමව ර
මහසඟගණ නොහැ ර
දේය අවුරුදු පතා පිරිකර

151 නවනදන්, නවමහානිධානයන්; ගත්මෙන්, ග්‍රහණය කළාක්මෙන්; කලි, දුඃඛයන්; අතුරුදන් කෙරෙමින්, අන්තර්ධානකොට; සත, සත්ත්වයන්ගේ; සිත, චිත්තයන්; නදන්කැර, ප්‍රසන්නකොට; අවුරුදුපතා, වර්ෂයක්පාසා; මහදන්දේය, මහාදානයන් දෙන්නේය.

152 මේ අප, මේ අස්මතුන්ගේ; පවර, ශ්‍රේෂ්ඨවූ; නරවර, නරෝත්තමතෙම; සිරිලක, ශ්‍රී ලඞ්කාවෙහි; රදන, වාසයකරන්නාවූ; හැම, සකල; මහසඟගණ, මහාසඞ්ඝ සමූහයාට; නොහැර, අඛණ්ඩව; අවුරුදුපතා, සංවත්සරයක් පාසා; පිරිකර දේය, පරිෂ්කාර දානය කරයි.

153 දිවමන් මුනි ර ඳු
ඳුටුමෙන්ම සිත පහ ඳු
පුදපඬුරෙන් ස ඳු
පුදයි බුහුමන් සිතින්දළ ඳු

154 රුපුවියවුල් පැහැ ර
සදහම් සිතින් නොමහැර
කරවා මහ වෙහෙ ර
⁋කෙරෙයි එහි නිබඳ
පුද පෙළහ ර

153 දිවමන්, ධරමාණවූ; (ජීවමානවූ) මුනිරඳු, සම්බුද්ධරාජයා; දුටුමෙන්ම, දර්‍ශනය කළාක්මෙන්ම; සිත, චිත්තය; පහඳු, ප්‍රසන්නකොට; පුදපඬුරෙන්, පූජාප්‍රාභෘතයෙන්; සඳු, සරසා; දළඳු, දන්ත ධාතුන්වහන්සේට; බුහුමන් සිතින්, බහුමාන චිත්තයෙන්; පුදයි, පූජාකරයි.

154 රුපුවියවුල්, ශත්‍රුපීඩාවන්; පැහැර, දූරීභූතකොට; සදහම්, සද්ධර්මය; සිතින්, චිත්තයෙන්; නොමහැර, පහනොකටම; මහවෙහෙර, මහාවිහාරයන්; කරවා, කාරාපණය කොට; එහි, තද්විහාරවරයෙහි; නිබඳ, නිරන්තරයෙන්; පුදපෙළහර, පූජා ප්‍රාතිහාර්‍ය්‍ය; කෙරෙයි, කරන්නේය.

155 කුලුණෙන් දුක්ප තුන්
තිවුණු නුවණින් වියතුන්
විකුමෙන් බලව තුන්
නිබඳ දෙන මහදනින්
නිව තුන්

156 මෙතින් නරපති ඍන්
නිතිනනතුරෙන් මැතියන්
වැඩුමෙන් කුලැති ඍන්
නෙකඩ ‡බැතිපුනි
සිතිනි ඍති ඍන්

†කරතම සිත නදන්.

⁋කරයි. ‡බැතිපෙම්.

155 කුලුණෙන්, කාරුණ්‍යව හෙතුකොට ගෙන; දුක්පතුන්, දුඃඛිතජනයන්ද; නිපුණු ගුණවණින්, තීක්ෂණබුද්ධියෙන්; විය තුන්, ව්‍යක්තයන්ද; (පණ්ඩිතයන්ද) විකුමෙන්, වික්‍රමාතිශයෙන්; බලවතුන්, ප්‍රශස්තබල ඇත්තවුන්ද; නිබඳ, නිරතුරුව; දෙන, ප්‍රදානය කරන්නාවූ; මහදනින්, මහත්වූ දානයෙන්; නිවතුන්, හීන ජනයන්ද:––

156 මෙතින්, මෛත්‍රියෙන්; නරපතියන්, නරශ්‍රෙෂ්ඨයන්ද; නිතිතනතුරෙන්, නිත්‍යස්ථානාන්තර (දාන) යෙන්; මැතියන්, මන්ත්‍රීන්ද; වැඩුමෙන්, වර්ධනයෙන් හෙවත් වෘද්ධිය හෙතුමාගී කථනයෙන්; කුලැතියන්, ප්‍රශස්ත කුලවතුන්ද; නොකඩ, අඛණ්ඩවූ; බැතිසුනු සිතිනි, භක්තියුක්ත චිත්තයෙන්; යතියන්, යතීශ්වරයන්ද:–––

157 තෙපුලෙන් සුබැ සියන්
ඉසුරෙන් සියකුල සියන්
විලසින් විල සියන්
*මෙලෙසින් ගතිය
ලෝවැ සියන්

158 රැක සිරිලක ළක ළ
සව්සත සතැන් තුටුක ළ
අප නරනිඳු **උදු ළ
ලොවට බට පින්
පිඬෙක නිකස ළ

157 තෙපුලෙන්, සුභාෂිතවාක් ප්‍රකාශයෙන්; සුබැසියන්, සුභාෂිතවාක් ඇත්තවුන්ද; ඉසුරෙන්, ඓශ්වර්‍ය්‍යයෙන්; සියකුල, ස්වීයවංශයෙහිවූ; සියන්, බන්ධූන්ද; විලසින්, (දෙහශ්‍රී) විලාසයෙන්; විලසියන්, ස්ත්‍රීන්දුයි; මෙලෙසින්, මේ ආකාරයෙන්; ලෝවැසියන්, ලොකවාසීන්ගේ; සිත්, චිත්තයන්; ගතිය, ගත්තේය.

158 ළකල, මනොඥවූ හෙවත් හෘදයට කාන්තවූ; සිරිලක, ශ්‍රී ලඞ්කාව; රැක, සංරක්ෂණයකොට; සව්සත, සකල සත්ත්වයන්ගේ; සතැන් (චිත්ත) සන්තානයන්; තුටුකළ, සන්තුෂ්ට කළාවූ; උදුළ, උජ්ජ්වලිතවූ; අප නරනිඳු, අපගේ නරෙන්ද්‍රතෙම; ලොවට, ලොකයාට; බට, ප්‍රාදුර්භූතවූ; නිකසළ, නිර්මලවූ; පින්පිඬෙක, පුණ්‍යපිණ්ඩයෙකි.

159 අම්බලමේ නොම ඳ
දන රැස් උනුන් මන් බැ ඳ
මෙලෙසින් කියන සො ඳ
තෙපුල් තා අස අසා උන් ස ඳ

159 අම්බලමේ, (එම) විශ්‍රාමශාලායෙහි; නොමඳ, අමන්දවූ; දනරැස්, ජනසමූහයා; උනුන්, ඔවුනොවුන්; මන්බැඳ, අභිමාන උපදවා; මෙලෙසින්, මේ උක්තප්‍රකාරයෙන්; කියන, කථනය කරන්නාවූ, සොඳ, සුන්දරවූ; තෙපුල්, කථාවන්; තා, ශුකමිත්‍රය; අස අසා, ශ්‍රවණය කෙරෙමින්; උන්සඳ, නිසීදනය කළකල්හි:–

*මෙලෙස ගත්තේය. **පුවළ.

160 ස ර ණ වි රැව්කොමරේය තුරුසි රේය
පැ හැ ද බමරසිරේය පුල්ස රේය
†තු ඟු තු ල් ගණඳරේය කැරැදු රේය
අරුණුරැස් පැ ති රේය පෙරඹ රේය

160 සරණවි, චරණායුධ සමූහයා හෙවත් කුක්කුට සමූහයා; තුරුසිරේය, (රාත්‍රී වාසය පිණිස උන්නාවූ) වෘක්ෂාග්‍රයන්හි; රැව් කොමරේය, හඬලන්නේය; (ඒ අනුව) බමර, ෂට්පාදී සමූහයා; පැහැද, ප්‍රසන්නත්වයට පැමිණ; පුල්සරේය, ප්‍රඵුල්ලපද්මාකරයෙහි; හැසිරේය, (මකරන්දග්‍රහණය පිණිස) භ්‍රමණය කරන්නේය; (ඉක්බිත්තෙන්) තුඟු, උස්වූ; තුල්, මහත්වූ; ගණඳරේය, ඝනාන්ධකාර පුඤ්ජය; දුරේය කැරැ, දූරීකරණයකොට හෙවත් දූරීභූතකොටලා; අරුණුරැස්, අරුණ ලෝකයංතම; පෙරඹරේය, පූර්වාම්බරෝදරයෙහි; පැතිරේය, ව්‍යාප්ත වන්නේය.

කුකුලන්ගේ රාවයද–භෘඞ්ගයන්ගේ සඤ්චාරයද–සූර්‍යාලෝක ව්‍යාප්තියද යන කරුණු තුන එකවර සිද්ධවන අයුරු බලාගතයුතුය යනු භාවයි.

**කුක්කුටශ්චරණායුධඃ – යනු අමරකෝෂයි.**

සරණ අවිවූයේ මොහුටනුයි–"සරණවි" කියා සිද්ධයි කුක්කුටයාදී–කුක්කුට පක්ෂියා ස්වීය පාදයෙන්ම පොළොව හාරා ගොදුරුකෑම හා යම් යම් අයවලුන්ට පහරදීමද එයින්ම කරයි. එහෙයින්ම "සරණවි" කියා ව්‍යවහෘත වෙයි.

161 ස ඳ රැ ස් වතුරැ ලොව පිරෙමින් බසින ස ඳ
තු රු හි ස් අතුරැ රැඳි පෙණ පෙළ ලෙස විහි ද
එ ද ව ස් උදය වන කුසුමන් දූක + නොම ඳ
සි ත තොස් ඩිඩා මඳතැන් තො ගොසින් සබ ඳ!

161 සඳරැස්, චන්ද්‍රකාන්ති ලක්ෂණවූ; වතුරු, ජලෞඝය හෙවත් සැඩ දියපාර; ලොව, ලෝකකුහරයෙහි; පිරෙමින්, පූර්ණවෙමින් හෙවත් ගලායමින්; බසිනසඳ, බැසයන කල්හි; තුරුහිස් අතුරු, වෘක්ෂශිඛාන්තරයෙහි; රැඳි, රඤ්ජිතවූ; (රැඳිසිටියාවූ) පෙණපෙළ ලෙස, ඵේනාවලිව්‍යාජයෙන්; විහිද, විකසිතවූ හෙවත් පිපියාවූ;

† විහිද

නොමද, බොහෝවූ; වනකුසුමන්, අරණ්‍යපුෂ්පයන්; එදවස් උදය, තද්දින ප්‍රාතඃකාලයෙහි; දුක, නිරීක්ෂණයකොට; සබඳ!, යහළුව!; තො, සුෂමන්තෙම; සිතතොස්වඩා චිත්තප්‍රසාද වර්ධනය කොට; මදතැන් ගොසින්, අදූර ස්ථානයට ගමනාගමනය කොට හෙවත් මදක් දුරට පැමිණ :–

චන්ද්‍රකාන්ති නැමැති සැඬවතුර පහර ලොකකුහරාභ්‍යන්තරයෙහි පිරෙමින් සිට බැසයන කල්හි එම වෘක්ෂයන්ගේ අතු අග පෙණ සමූහයා රැඳුම සිරිතකි. එබඳු පෙණමාලාවකට සමවූ චන්ද්‍රරශ්මියෙන් ප්‍රබුඩ පුෂ්පයන් බලවයි කී සේවේ.

162 සමඟ† පබළකුරු දිලි පෙන වැළ ලක ළ
තරඟ විසුල සොඳ නිල් ‡ පැහැය පළක ළ
සුළඟ ලෙළෙන දළු මල් තුරු වැල වත ළ
බලග! උදුල පෙරමඟ වනගළ නැබ ළ

162 පබළකුරු සමඟ, ප්‍රවාලාඞ්කුරයන් හා සමගින්; දිලි, ජ්වලිතවූ; පෙනවැළ, ඵෙනමාලායෙන්; ලකළ, මනොඥවූ හෙවත් ශොභාන්විතවූ; විසුල, විහිදීගිය හෙවත් විසතිණීව ගියාවූ; තරඟ, තරඞ්ගාවලින්ගේ; සොඳ, සුන්දරවූ; නිල්පැහැය නීලවර්ණය; පළකළ, ප්‍රකාශකාළාවූද; සුළඟ (මන්ද) මාරුතයෙන්; ලෙළෙන, චලිතවන්නාවූ; දළු, පල්ලවයන් හා; මල්, පුෂ්ප සමූහයෙන් යුක්තවූ; තුරුවැළ, වෘක්ෂසමූහයෙන්; වතළ, ව්‍යාප්තවූද; පෙරමඟ, පටිපථයෙහි; උදුළ, උජ්ජ්වලිතවූ; නැබළ, විශාලවූද; (මහත්වූ) වනගළ, වනපඞ්ක්තිය; බලග!; නිරීක්ෂණය කරන්!.

ප්‍රවාලාඞ්කුරයන් හා සමඟ බබළන පෙනවැළින් යුක්ත තරඞ්ග පඞ්ක්තිය පිළිබඳවූ යහපත් නීලවර්ණය ප්‍රකාශ කරන්නාවූද සුළඟින් කම්පිතවන පල්ලව සහිත පුෂ්පයන් ඇති විශාල වනලැහැප් බලවයි සේයි. රක්තවර්ණප්‍රවාල පඞ්ක්තිය හා එක්වූ ඵෙනමාලාව ඇති තරඞ්ගයන්ගේ නීලවර්ණය තෙම මෘදු හෝ රතුදළු පෙළ හා සුදු මල් ඇති වන පෙදෙසට උපමිතය. ප්‍රවාල රක්තවර්ණ පල්ලවයන්ටද පෙනවැළ සුදු මල්වලටද තරඞ්ගයෝ නිල් කොළාදියෙන් යුත් වනයටද උපමිත යයි සලකනු.

† පබලකැල. ‡ නිල්සුදුහැම.

163 සිකිපිල් † සන්කොළේස ගිරිකු ළේ ස
රොන් සක් සකා'ඹළේස තුරුබෙ ළේ ස
බි ගු දුල් ව'මු දුළේස ගජ ර ළේ ස
ර ජ සි රි අත් කොළේස වනගෙ ළේ ස

163 ගිරිකුළේය, පර්වතකූටයෙහි; සිකිපිල්, මයුරසමූහයා; සන් කෙළේය, නාදපැවැත්වීය; තුරුබෙළේය, වෘක්ෂයන් නැමැති භටසමූහතෙම; රොන්, (පුෂ්ප) රේණුනැමැති; සක්සක, ආයුධ පඞ්කතිය; අඹළේය, ආවෘතක කෙළේය; ගජරළේය, හස්ති සමූහය තෙම; බිගුදුල්, භෘඞ්ගාවලි නැමැති; වම්, සන්නාහ යෙන්; උදුළේය, උජ්ජ්වලිතවිය; (මෙසෙයින්) වනගෙළේය, (ඒ) වනඝටයතෙම; රජසිරි, රාජ්‍යශ්‍රිය හෙවත් නගරයක ශොභාවිලාසය; අත්කෙළේය, ආයතන කෙළේය.

රාජ්‍යය තෙම තූර්‍ය්‍යනාදයද — අවිගෙන සැරසුණු යොධසමූහ යාද — සන්නාහසන්නාබවූ හස්තිසමූහයාද යනාමෙයින් යුක්තවිය යුතුයි. එම වනප්‍රදෙශයද මයුරයන්ගේ නාදයෙන්ද — රේණු සමූහයෙන්ද — වෘක්ෂ පඞ්කතියෙන්ද — භෘඞ්ග සමූහයෙන්ද යුක්තය. තූර්‍ය්‍යනාදය මයුර නාදයටද අවිගෙන දිලිහෙන භට සමූහයා රේණු විසුරුවන වෘක්ෂ සමූහයටද හස්තිසමූහයාගේ සන්නාහ භෘඞ්ගසමූහයටද වනශ්‍රිය රාජ්‍යශ්‍රියටද උපමිත විය.

"රජසිරි අත්කොළේස වනගෙළේස"

වර්ෂාඍතුයෙහි මයුරයන්ට සන්තුෂ්ටිඇතිවී කෙකාරව දෙමින් නැටීම ස්වභාව ධර්මයකි. මේ ඍතුයෙහි භෘඞ්ගසමූහයාද පුෂ්පයන් කෙරෙහි ගැලී රොන්ගැනීමෙහි යෙදී සිටිත්. වන රාජයා තන්හි තන්හි භෘඞ්ගජාලාවන්ගෙන් විසතිණිවිය. වන ඝටාව රජකුගේ සිරි උසුලන්නිමැයි. ශ්‍රීමත් මහාකවි කාලිදාස පණ්ඩිතොත්තමයා විසින් මේ කියනලදි. ඍතුසංහාරයෙහි:-

"සශීකරමෙභාධරමත්තකුඤ්ජර
ස්තඩිත්පතාකො 'ශනිශබ්ද මර්දලඃ
සමාගතො රාජවදුඞතද්‍යුතිර්
ඝනාගමඃ කාමිජනප්‍රියඃ ප්‍රියෙ"

යනු කියනලදී. මෙහි මෙඝකාලය රාජයෙකු වශයෙන් රූපනය කරතිබේ. පොද සහිත වැහිවළා නැමැති මතුතුන් ඇති විදුලි නැමැති කොඩි ඇති මෙඝගර්ජනා නැමැති මදීල

† සත්ලෙළේය. සමහර.

ඇති උසස් ශොභා ඇති ප්‍රියවූ මෙස කාලය රජෙකුමෙන් සොඳුර පැමිණියේය යනු අදහසයි.

164 දිලිහෙන ගඟුලැ ලී ය ඇඳහැ ලී ය
ගිලිමල් රෙ ණුවු ලී ය සුදුවැ ලී ය
මද මත් *හසකැ ලී ය† වනවි ලී ය
දැ ක ය ව මන කා ලි ය වන ව‡ ලී ය

164 ඇඳහැලීය, හාත්පස පතිතවෙමින්; දිලිහෙන, ඡවිමත්වන්නාවූ ගඟුලැලිය, ගඞ්ගානිර්ඣරයන්ද; ගිලි, ගලිතව; මල්රෙණ්, පුෂ්පරේණූන්ගෙන්; අවුලිය, ගහනවූ; සුදුවැලීය, සේවතවාඑකාතලයන්ද; මදමත්, මදයෙන්මත්වූ; හසකැලීය, හංසසමූහයා ඇත්තාවූ; වනවිලිය, වනතඩාගයන්ද; දැක, අවලොකනය කොට; මනකලිය වන, මනඃකාන්ත වන්නාවූ; වලිය, (එම) අරණ්‍යයෙහි; යව, ප්‍රයාණය කරන්.

165 අතු අති නැද ගසාය තුරුරැ සා ය
කෙළන පන්දු ලෙසාය සහ තො සා ය
පැන පැන * වන හිසාය මග අ සා ය
යන වඳුරන් නිසාය නොව ල සා ය

165 තුරුරැසාය, වෘක්ෂසමූහය විසින්; අතු, (ස්වීය) ශාඛාලක්ෂණවූ; අතින්, හස්තයෙන්; ඇද, (අභිමුඛයට) ආකර්ෂණය කොට; ගසාය, පහරදෙමින්;සහ තොසාය, ප්‍රීතිමත්ව;කෙළන, ක්‍රීඩනය කරනු ලබන්නාවූ; පන්දුලෙසාය, කන්දුක විලාසයෙන්; මග අසාය, මාර්ගාසන්නයෙහිවූ; වනහිසාය, වනමස්තකයෙහි;පැන පැනයන, පනිමින් යන්නාවූ; වඳුරන්නිසාය;වානරයන් කරණකොටගෙන; නොවලසාය, අලසයුක්ත නොවී:-

වෘක්ෂසමූහයා විසින් සාඛා නැමැති හස්තයෙන් ඉදිරියට ඇදගෙන නැවත විසිකෙරෙමින් ප්‍රීතිමත්ව කෙළන පන්දු සෙයින් මග අසබඩවන මස්තකයෙහි පැන පැන යන වඳුරන් දැක අලස නොවෙවයි කිමෙන් යථොක්තාකාර වානර සමූහයාගේ ක්‍රීඩාව දැක ගමන් නොනවත්වව – යනු භාවයි.

වෘක්ෂයන්හි සිටි වානරයන් ආසන්න වෘක්ෂයෙහි අත්තට පැන නැවතත් පෙරසිටි වෘක්ෂයටම පැන පැන ක්‍රීඩා කිරීම වනාහි දෙදෙනෙකුන් විසින් හස්තයන්ට පන්දුගෙන ගසමින් ක්‍රීඩා කරන්නාක් මැනියයි හැඟවුනු.

---

*හංසකුලීය. †වනරලීය. ‡වනමලීය. *පැනගෙන.

166 අඹ දළු පල ර ඹා සිඳ නොත බා යා
ගෙන තමපිය අ ඹා තුඩ'ග ත බා යා
සිඹ සිඹ රති ලොබා දෙපිය ග බා යා
උන් පර පුටු සු බා සකි! නර ඹා යා

166 අඹදළු, අඹු පල්ලවද; රඹාපල, රම්භා ඵලයන්ද; නොතබායා, ශෙෂනොකොට; සිඳ, කඩා; ගෙන, ග්‍රහණය කොට; තම, තමන්ගේ; පියඅඹා, ප්‍රියාම්බිකාවන්ගේ; තුඩඅගා තුණ්ඩාග්‍රයන්හි; තබායා, තබමින්; රතිලොබා; රති ක්‍රීඩා ලෞල්‍යයෙන්, දෙපියගබායා; පක්‍ෂපත්‍ර ගර්‍භයෙහි; සිඹසිඹ, චුම්භණය කෙරෙමින්; උන්, උන්නාවූ; පරපුටු, කොකිල පක්‍ෂි සමූහයා; සුබාසකි!, ශොභනවූ මිත්‍රය!; නරඹා, නිරීක්‍ෂණය කොට; යා, ප්‍රයාණය කරන්.

"පරපුටු" යනු "පරපුට්ඨ" යන මාගධ ශබ්දයෙන් හෝ "පරපුෂ්ට" යන සංස්කෘත ශබ්දයෙන් හෝ තද්භව විය. පරා විසින් පුටුයේ " පරපුටු" කියා සමාස විග්‍රහයි. අන්‍යයා විසින් පොෂ්‍යය කරනු ලබන්නේ යන අර්ථයි. කොවුල්දෙනුව බිත්තර දමා ගියවිට අන්‍යයකු විසින් රකිනු හෙයින් "පරපුටු" යනු ව්‍යවහෘතයි.

එයින් කීහු ශාඞ්ගධර සෘෂිහු.–

**තත්කිංසමරසිනභුකතං–යත්පික! රෙ! කාකමඤ්ජරෙ පුෂ්ටිම් සහකාර කුසුම කාලෙ–හඨෙනකුරුෂෙ'ධුනා රාවම්" යි.**

රෙ!, පික!; කොල!, කොවුල!; යත්, යම්හෙයකින්; පුෂ්ටිම්, පුෂ්ටියෙහි; කාකමඤ්ජරෙ, කපුඩාගේ කූඩුවෙහිද; භුක්තම්, අනුභව කරන ලද්ද; න සමරසි, සිහි නොකරන්නෙහි; කිම්?, කිම?; සහ කාර කුසුමකාලෙ, මී අඹමල් පිපෙන කාලයෙහි; අධුනා, දැන්; හඨෙන, බලාත්කාරයෙන්; රාවම්, නාදය; කුරුෂෙ, කරන්නෙහිය.

167 ඉඳු නිල් කොළ තුරු රැඳි මියු රු යා
විලිකුන් අ ඹ..ඉ රු තුඩගිනි රු යා
එන රස උ ර උ රු ලොබ නොහැ රු යා
†න ර ඹ නඳන ගි රු පෙළ ඉඳු රු යා

167 ඉඳුනිල් කොළතුරු, ඉන්ද්‍රනීල පත්‍රාන්තරයෙහි; රැඳි, රඤ්ජිතවූ; මියුරුයා, මධුරවූ; විලිකුන්, පැසුණාවූ; අඹ, ආම්‍රඵල

---

† මුද්‍රිත පොතේ මේ කව නොමැත්තේය.

යන්; රුයා, රක්තවර්ණවත්වූ; තුඩගිනි, තුණ්ඩාග්‍රයෙන්; ඉරු, පලාගෙන; එන, වැහෙන්නාවූ; රස, ආම්‍රරසය; උර උරා, පානය කෙරෙමින්; ලොබ නොහැරයා, ලෞල්‍යවර්ධනයකොට; නදන, සන්තුෂ්ට වන්නාවූ; ගිරුපෙළ, කීරපක්ෂි සමූහයා; ඉඳුරුය, සෑජුම; නරඹ, නිරීක්ෂණය කරන්.

168 එ න රි වි බි ඹු දු ලා ගිරඟ බ ලා යා
ගිරි නිල් මල්තු ලා පිල් සස ලා යා
දිගුකර නිල් ගෙ ලා දිගු හඬ ලා යා
රඟන මොණර බ ලා සිට තොප ලා යා

168 ගිරඟ, උදයපර්වත මස්තකයෙන්; එන, උද්ගත වන්නාවූ; දුලා, (කාන්තිස්කන්ධයෙන්) උජ්ජ්වලවන්නාවූ; රිවි බිඹු, සූර්‍ය්‍යබිම්බය; බලායා, අවලොකනය කොට; ගිරිනිල්මල් තුලා, ගිනිතිල්ල පුෂ්ප හා සදෘශවූ; පිල්, පිච්ඡයන්; සසලායා, චලනයකොට; නිල්ගෙලා, නීලවර්ණ ග්‍රීවාවන්; දිගුකර, දික් කොට; (ගෙල ඔසවා යන අර්ථයි) දිගු, දීර්ඝකොට; හඬලායා, නාදපවත්වා; රඟන; නෘත්‍යය කරන්නාවූ; මොණර, මයූර යන්; බලා සිට, නිරීක්ෂණය කොටලා; තො, ශ්‍රීමත් තෙම; පලායා, පලායව.

මෙහි බලා සිට යන්නෙහි "සිට" යන්නෙන් අමුතු අර්ථයක් නොහැගේ. මුදුගණී—කියා ලන්නේ—"පැසිගිය" යනාදීය මෙනි "බලා—මුදු—කියා—පැසි" යන පූර්වපදයන්ගේ අර්ථයම පරපදයෙනුත් වාච්‍යයයි දතයුතුයි.

169 දුනුකේපෙති ගො තා වරළ ඉ තා යා
පිපි මල් රොන් ග තා තවර ග තා යා
විසො වග සුද ප තා එවන පෙ තා යා
එ න ව න සරක තා නොකර සා තා යා

169 ඉතායා, ප්‍රියතරවූ; වරළ, ධම්මිල්ලයන්; දුනුකේපෙති, රාජ කේතකිපුෂ්ප පත්‍රයෙන්; ගොතා, ග්‍රථිත කොට; පිපි, පුෂ්පිතවූ; මල්රොන්, පුෂ්පරේණූන්; ගතා, දෙහයෙහි; තවර ගතාය, තවරා ආලිප්තකොට ගත්තාවූ; විසොවගසුද, අනඞ්ග යුද්ධය හෙවත් රතික්‍රීඩාව; පතා, ප්‍රාර්ථනාකෙරෙමින්; එවන පෙතායා එන, තද්වන පඞ්ක්තියෙහි ආගමනය කරන්නාවූ; වනසරකතා, වන්‍යාඞ්ගනාවන් හාසමඟ; කතායා නොකර, අල්ලාප සල්ලාප නොදෙඩා :—

මෙහි "තවර" යන්නෙන් ඡන්දෝහෙතුවෙන්වූ මාත්‍රා හානියි. "තවරා" යනු ප්‍රකෘතියි.

170 ව න සර දක තම සිතබිය සල සා
ග න ගන ගැබ ලෙළදෙන විදු විල සා
ව න ගැබ ඔබිමොබ පැන යන නොල සා
තැ න තැන මුවරළ දක සව සතො සා

170 වනසර, වනචර පුරුෂයන් හෙවත් ව්‍යාධ මනුෂ්‍යයන්; දක, දර්ශනයකොට, තම සිත, තමාගේ සිත්හි; බියසලසා, භය උපදවා; ගන, සාන්ද්‍රවූ; ගනගැබ, මෙඝගර්භයෙහි; ලෙළදෙන, බබළන්නාවූ; විදුවිලාස, විද්‍යුද්විලාසයෙන්; වනගැබ, වන ගර්භයෙහි; ඔබිමොබ, ඒ මේ තැන; නොලසා, ආලස්‍යයුක්ත නොවී; පැනයන, පනිමින් යන්නාවූ; මුවරළ, මෘග සමූහයා; තැන තැන, තන්හි තන්හි; දක, අවලොකනයකොට; සතොසා, සන්තුෂ්ටියෙන් යුක්තව; සව; ප්‍රයාණය කරන්.

සාන්ද්‍රවූ මෙඝයෙහි ලෙළදෙන විදුලිය විලාසයෙන් වන ගර්භයෙහි ඒ මේ තැන පැන යන මෘග සමූහයා යයි කීමෙන් නීලවර්ණ ආකාශයෙහි බබළන විදුලිය විලාසයතෙම නිල වර්ණ වනයෙහි බබළන මෘගයන්ට උපමිතයයි දතයුතුයි. නීලාකාශය නීලවනයටද රක්ත වර්ණ විදුලිය රක්තවර්ණ මෘග යන්ටද සමසේ ගළපා අර්ථ දත යුත්තේය.

මෙහි "වනසර" යනු "වනචර" යන පාළි හෝ සංස්කෘත ශබ්දයෙන් භින්නයි. වෙනෙහි සරන්නුයේ වනසරයි සමාස වාක්‍යයි වැද්දාට නම්.

වැදි, සබර, පුලිඳු, වනසර, මලදරු, ලැව්, සැරටි, මිලිඳු, මල් පස් යන මේ ශබ්ද නවය වැද්දන්ට ව්‍යවහෘතයයි දතයුතු රුවන් මල සහ පිඹුම් මල.

171 වන වි ල් වැද බොල් සෙවෙලග නව රා
ගන ව ල් සැල ඇරගෙන අඟිනු† දු රා
දිගු උ ල් සිඟු සොමුසරැ සරැ අඹ රා
පිළි ම ල් වන මිගිවුන් දකු නුදු රා

† "අතින්" හැම. බාහුයෙන් යි සන්ස.

171 වනවිල්, වන තඩාගයන්ට; වැද, ප්‍රවිෂ්ටව; බොල්, බහලවූ; (ඝනවූ) සෙවෙල්, ශෛවාලයන්; ඇඟතවරා, ශරීර යෙහි අලිප්ත කොටගෙන; ගත, ඝනවූ; වල්කැල, අරණ්‍යක කුඩාලතා පැලැටි ආදිය; අගින්; ශෘඞ්ගයෙන්; උදුරා, උද්ධරණය කොට; ඇරගෙන, (ශෘඞ්ගයෙන්) ග්‍රහණයකොට; දිගු, දික්වූ; උල්, ශූලාකාරවූ; (උල්ව සිටිනාවූ) සිඟු, ශෘඞ්ගයන්; අඹරා, ආවෘත්තකොට; යොමුකරැ කරැ, (උනුනුන්ට) අභිමුඛකොට කොට; පිළිමල්; විරුද්ධවන්නාවූ; වනාමිහිඳුන්, අරණ්‍ය මහිෂ යන්; නුදුරා. සමීප ස්ථානයෙහි; දකු, නිරීක්ෂණය කරත්.

මෙහි "බොල්" යනු "බහල" යන මාගධ ශබ්දයෙන් සිද්ධයි. "භූස" යන්නෙන් සිද්ධවූ බොල් ශබ්දයෙක්ද ඇත එහි තේරුම හිස්වූ යනුයි.

"ගනකඩ මහ බොල් පොලොව" යනු සිද්ධාන්ත පාඨයි.

172 වි ල් තෙරවල් බිඳ† ගත මඩ තව රා
ලො ල් කර හෙළ නෙළුඹල කමිනුදු • රා
බො ල් කෙළ පෙණපිඩු‡ දෙසොලින් වගු රා
ව ල් වැද එන ඌරන් බල ඉඳු රා

172 විල්තෙරවල්, තඩාගතීරයන්; බිඳ, භග්නකොට ලා; ගත, ශරීරයෙහි; මඩ, කර්දමයන්; තවරා, තවරාගෙන; හෙළ නෙළුඹල, ධවලවූ ශිළාකන්දයන් හෙවත් හෙළ නෙළුම් අල; උදුරා, උද්ධරණය කොට; ලොල්කර කමින්, ලෞල්‍යයෙන් භක්ෂණය කෙරෙමින්; බොල්, ඝනවූ; කෙළ පෙණපිඩු, බෙල එන පිණ්ඩයන්; දෙකොලින්, කපොල තලයෙන්; වගුරා, වගුරුවා, වල්වැද, අරණ්‍යයට ප්‍රවිෂ්ටව; ඉඳුරාඑන, ඍජුව එන්නාවූ; ඌරන්, ශූකර සමූහයන්; බල, නිරීක්ෂණය කරත්.

173 වැ ද සෙද උනුනට පසු නොබසමි නේ
බි ඳ බි ඳ මි අඹකැන් ගෙන අති නේ
ඇ ද ඇ ද තුරුවැල ගලපන ලෙසි නේ
රො ද බැ ඳ එන පිලවුන් දකු තොසි නේ

† හෙව. ‡ දෙකොලින්.

173 උතුනට, ඔවුනොවුන්ට; පසුනොබසිමිනේ, පසුබට නොවෙමින්; සෙද, ශීඝ්‍රව; වැද, (අභිමුඛයට) ප්‍රවිෂ්ටව; වීඅඹ කැත්, සහකාරමලඅරින්; බිඳ බිඳ, භග්නකොට කොට; අගනේ, හස්තයෙන්; ගෙන, ග්‍රහණයකොට; තුරු, වෘක්ෂයන්; ඇද ඇද, ආකෘෂ්ටකොට කොට; වැළ, ලතායෙන්; ගලපන ලෙසිනේ, ඝටනය කරන්නාක්මෙන්; (ගළපන්නාක්මෙන්) වෘක්ෂයන් වැල්වලින් ඇදන්නාක්මෙනැයි සේයි) රොද බැඳ එන, රාජි ආකාරයෙන් බඳිනව එන්නාවූ ගෙවත් රේඛාවක්සේ එක්ව පැමිණෙන්නාවූ; රිළවුන, සාඛාමෘගයන්; තොසිනේ, සන්තෝෂයෙන් යුක්තව; දකු, දර්ශනය කරන්.

"ඇ ද ඇද තුරුවැල ගලපන ලෙසි නේ
රො ද බැඳ එන රිළවුන් දකු තොසි නේ

වෘක්ෂයන් ආකර්ෂණය කෙරෙමින් ලතායෙන් ඇදන්නාක් මෙන් පේළිගැසී එන්නාවූ සාඛාමෘගයන් සන්තෝසින් බලවයි කීමෙන් පේළිගැසී වැළක ආකාරයෙන් පැමිණෙන රිළවුන් වෘක්ෂයන් ඇද ඇද ගස්මුදුනෙන් යාම කෙසේදැයි කිවහොත් වැළක් අරගෙන මස්තකය බැඳ බැඳ ඇදන්නවුන් වැනි වෙතියි හැඟවූහ. එහෙයින්ම පේළිගැසී එන රිළවුන් වැළකට උපමිතය හයි දතයුතු.

174 නිති වැළඳගෙන තුරු හිමියෙ නි
එන බඹරුන් දූහැ පළු සුරති නි
සිවි පිපිළිය දූසා කුලඟන මෙ නි
සකි! ලසනොව යව තොස වඩමි නි

174 තුරුහිමියෙනි, වෘක්ෂයන් නැමැති වල්ලභයන්; නිති, නිරන්තරයෙන්; වැළඳගෙන, ආලිඞ්ගනයකොට ගෙන; එන, (පුෂ්පමකරන්ද පානයකිරීම පිණිස) ආගමනය කරන්නාවූ; බඹරුන්, භෘඞ්ගයන්; පළු, පල්ලව නැමැති; සුරතිනි, දක්ෂිණ හස්තයෙන්; දූහැ, පහකොට; කුලඟනමෙනි, කුලාඞ්ගනාවන් පරිද්දෙන්; සිවි, (සජීතව) සිටිනවූ; පිපිළිය, ප්‍රඵුල්ල ලතාවන්; දූසා, අවලෝකනයකොට; සකි, යහළුව!; ලසනොව, අලස යුක්ත නොවී; තොස, සන්තුෂ්ට චිත්තය; වඩමිනි, වර්ධනය කෙරෙමින්; යව, ප්‍රයාණය කරන්.

175 ලොබසොම දූන් ගිරමුන් තුඩු ප බා
අ සු සො ම නොහැරම ඇතුළත ක බා
පි ම න ම පෑ සුරූ බිඹු* පල සු බා
ත නෙ න ම පෙනෙනුය මහවන ශෑ බා

* බිඹුවැල.

175 මිහිමවනගැබා, මහා වනගර්භය විසින්; ගිරවුන්, කීර පක්ෂීන්ගේ; තුඩු, චක්ෂුන්හි; දුන්, ජනිතවූ හෙවත් හටගත් තාවූ; පබා, රක්තවර්ණකාන්තිය කෙරෙහි; ලොබකොට, ආශා වර්ධනය කොට; නොහැරම, වර්ජිතනොකරම; අසුකොට; බඩ කොටගෙන; ඇතුළත තබා, අන්තරයෙහි (ම) ස්ථාපිතකොට ගෙන; පිටතට, බාහිරස්ථානයට; පැහුරු, ප්‍රකාශකළාක්වැනිවූ; සුබා, ශෝභනවූ; බිඹුපල, බිම්බඵල සමූහය; තනෙතට, තාගේ නයනවක්‍ෂට; පෙනෙනුය, දෘශ්‍යමාන වන්නේය.

කීරපක්ෂීන්ගේ චක්ෂුගත රක්තවර්ණයට සමවර්ණ ඇති හෙයින් අත්හැරිය නොහැකිව ඇතුළෙහිම තබාගෙන වනය විසින් පිටට පෙන්වන්නාක් වැනිවූ ලක්ෂණ යුක්ත බිඹඵල දැක්වියනු භාවයි.

බිඹඵලයෝ ගිරවුන්ගේ චක්ෂුවට බඳු පැහැය ඇත්තෝය. අරණ්‍යයද ඊට ලොභයෙන් වනයතුළම තබා වැළෙන් බැඳ ගෙන පිටට යානොදී දර්ශනමාත්‍රයම කරවයි කීනු එලිතාවයි.

176 නි ක ස ළ වැලිතල පිටුවල වෙ නේ
පි ළ'ඹ ල සිකිකැන් ලෙස වෙන වෙ නේ
රෝන්දෙල බිඟුමුළු රැඳි තැන තැ නේ
පැ හැ දු ල කසමල් තුරුවැල පෙ නේ

176 වෙනේ, අරණ්‍යයෙහි; නිකසළ, නිර්මලවූ; වැලිතල පිටුවල, වාළුකාතල මස්තකයෙහි; පිල්අඹල, කලාපවිදහා ගත්තාවූ; වෙන වෙනේ, පෘථක් පෘථක්වූ; සිකිකැන්ලෙස, මයුර සමූහයාගේ විලාස යුක්තවූද; රෝනදෙළ, රේණුයෙහි අභිලාෂයෙන්; රැඳි, රඤ්ජිතවූ; බිඟුමුළු, භෘංගශ්‍රේණීන්ගේ; පැහැ, ප්‍රභායෙන්; දුළ, ජ්වලිතවූ; කසමල්තුරුවැළ, වැලිකසා පුෂ්පවෘක්ෂ පඞ්ක්තිය; තැන තැනේ, තන්හි තන්හි; පෙනේ, දෘශ්‍යමාන වේ.

පිල් විදහාගෙන සමූහව වෙන වෙනම සිටින මයූර සමූහයාගේ ආකාරයෙන් යුක්තවූ රේණුයෙහි ආශායෙන් භෘංග සමූහයා වසා සිටින පුෂ්ප යුක්තවූද වැලිකසාවෘක්ෂයන් පිරිසුදු වාළුකා තලයෙහි බලව යනු භාවයි.

මයූරයන්ගේ පිල්හි නීලවර්ණය සහිත ස්වර්ණවර්ණ ඇස් ඇත්තාහ. පුෂ්පරේණුයෙහි අභිලාෂයෙන් කෘෂ්ණවර්ණ භෘංග සමූහයා විසින් ගැවසීගත් ස්වර්ණවර්ණවූ වැලිකසා පුෂ්පයෝද යථෝක්තාකාර මයූරපිඤ්ඡාවන්ට සදෘශකළහයි දතයුතු.

177 දි සි නි ම ල් වන දෙව්ක ලා
මි ණි මෙ වු ල් ලෙස මනක ලා
රැ ඳි මි දෙ ල් මල්කැන් බ ලා
යව කොඩොල් මිණි සිරි'සු ලා

177 වනදෙව්කලා, වන දිව්‍යාඞ්ගනාවන්ගේ; නිමල්, නිර්මලවූ; (පැහැපත්වූ) මනකලා මනඃකල්‍යවූ; මිණිමෙවුල් ලෙස; මාණික්‍යමය මෙඛලාදාම විලාසයෙන්; දිසි, දෘශ්‍යමානවූ; කොඩොල් මිණිසිරි, මාණික්‍යමය කුණ්ඩලාභරණශ්‍රිය; උසුලා, උද්වහනයකොට; රැඳි, රඤ්ජිතවූද; මිදෙල් මල් කැන්, නිවුල පුෂ්පස්තබකයන්; බලා, අවලොකනයකොට; යව, ප්‍රයාණය කරන්.

178 ව න දෙවඟන සරණ ත ලා
තැන තැන වැකිලෙස උගු ලා
ව න තුරු හිස රැඳි ළඳ ලා
ම න තොස කර බල එක ලා

178 වන, වනයෙහි; සරණ, සඤ්චාරය කරන්නාවූ; දෙවඟන, දිව්‍යාඞ්ගනාවන්ගේ; තලා, (පාද) තලයන්; උගුලා, ඉගිලී; තැන තැන, තන්හි තන්හි; වැකිලෙස, අලිප්තවූපාසේ නොහොත් වනදෙවඟන, අරණ්‍ය දිව්‍යාඞ්ගනාවන්ගේ; සරණත, චරණතලයෙහිවූ; ලා, ලාක්ෂාරසය; තැන තැන, තන්හි තන්හි; උගුලා වැකිලෙස, ඉගිලීගොස් ඇලුනාසේ; වනතුරු හිස, වන වෘක්ෂමස්තකයෙහි; රැඳි, රඤ්ජිතවූ; ළඳලා, (බාල රක්ත) පල්ලවයන්; එකලා, ඒ කාලයෙහි; මනතොසකර, මනොනන්දනය කොට; බල, නිරීක්ෂණයකර.

අරණ්‍ය ශ්‍රීසාරය බැලීමෙහි අභිලාෂයෙන් එහි වැස සඤ්චාරය කරන්නාවූ දිව්‍යාඞ්ගනාවන්ගේ පාදතලයෙහි ආලිප්ත ලාක්ෂාරසය නොහොත් පාදතලය (දුඃඛස්පර්ශීහෙයින්) තැලී ඉගිලී ගොස් රුක්මුදුන්හි රැඳුනාසේ දිලෙන රක්තවර්ණවූ බාලපල්ලවයන් බැලියයුතුය යනු භාවයි. මෙයින් මේ වනය දෙව්ලොව නන්දනවනයටද අධිකතරසේ රම්‍යතර යයි සූචිතයි.

179 ගු ව න පැතිරි රිවිරැසි නේ
එ ව න බියෙන් සැඟවෙමි නේ
සැලෙන අඳුරු කැටිලෙසි නේ
එ ලෙ න වවුළුකැලන් පෙ නේ

170 ගුවන, නභස්තලයෙහි; පැතිරි, විස්තෘතවූ; රිවිරැසිනේ, සූර්‍ය්‍යරශ්මියට; බියෙන්, භීතිය හෙතුකොටගෙණ; එවන, තද්වන

ප්‍රදේශයෙහි; සැඟවෙමින්, නිලීනවෙමින්; සැලෙන, චලිතවන්නාවූ; අඳුරුකැටි ලෙසින්, අන්ධකාර පිණ්ඩයන් සෙයින්; එලෙන, එල්බෙන්නාවූ; වවුලුකැලන්, වවුලුසමූහයා; පෙනේ, දෘශ්‍යමානවේ.

අරණ්‍යයෙහි වෘක්ෂශාඛාවන්හි කෘෂ්ණවර්ණ වවුලු සමූහයා එල්ල් සටිනු පෙනේ. ඔවුහු සූර්යරශ්මියට බියෙන් අරණ්‍යයෙහි සැඟවී සිටිනා අන්ධකාර පිණ්ඩයන් මෙනැයි උත්ප්‍රේක්ෂා කළහ.

“වවුලුකැලන් මෙහි පෙනේ” මෙහි පෙනේ යන ආඛ්‍යාත පදයට කර්තෘභූතවූයේ “වවුලුකැලන්” යනුයි. ප්‍රථමාවිභක්තියෙන් යෙදිය යුතුව කර්මවිභක්තියෙන් යෙදුයේ නමුදු ප්‍රථමාවිභක්තියටම අර්ථ කියයුතු වන හෙයින් විභක්ති විපර්යාසයයි දතයුතු.

කුමන ගුරුඳුසි කියයි “මුනිඳුන” යන්නෙහි “මුනිඳුන” යන්නද “කතිවෙන මියන” තන්හි “මියන” යන්නද කියන් නාක් මෙනි.

180 එ ව න රජුගෙ තද තෙද මු ළු
බ ම න විලස් පෑ සුලකු ළු
ස ර ණ වෙසෙසැ වලිකුළුමු ළු
ත ම න ලෙසට බලග! යහ ළු!

180 එවන, ඒ වන නැමැති; රජුගෙ, නරේන්ද්‍රයාගේ; තද තෙද, ඝනබද්ධතේජස් සමූහ; මුළු, එක්වූයේය; (කැටිවූයේ) බමන විලස්, භ්‍රමණයකරන ආකාරය; පෑ, ප්‍රකාශකළාවූද; වෙසෙස්, විශේෂයෙන්; සුලකුළු මනාව අලංකෘතවූ; සරණ, සඤ්චාරය කරන්නාවූ; වලිකුළුමුළු, වන කුක්කුට සමූහයා; යහළු!, මිත්‍රය!; තමනලෙසට, ශ්‍රීමත්හුගේ අභිප්‍රාය පරිද්දෙන්; බලග!, නිරීක්ෂණය කරන්.

එම අරණ්‍යයෙහි රක්තවර්ණ වන කුක්කුට සමූහයා භ්‍රමණය කරන බැව් පෙනේ. ඔව්හු අරණ්‍ය රාජයාගේ දැඩිතර තෙජස් සමූහය කැටි කැටිව සිටියනවුන් වැනි වෙතියි උත්ප්‍රේක්ෂාකළහ.

181 නොමඳ රැසින් රැඳුනු අව ට
ඝ ර ඳ කුසුම් දූස තුරුය ට
වි ල ඳ *වෙනැයි සිත සැකය ට
ස බ ඳ! ශොසින් නොවන් නිව ට

181 තුරුයට, වෘක්ෂයන්ගේ අධොභාගයෙහි; අවට, හාත්පස්හි; (පතිතව) රැසින්, කාන්තියෙන්; රැඳුනු, රඤ්ජිතවූ හෙවත්

* වෙදූයි.

චිත්තප්‍රසාදය කරන්නාවූ; නොමද, බෝහෝවූ; කරදකුසුම්; කරණ්ඩපුෂ්පයන්; දක, දර්ශනයකොට; විලඳමෙතැයි, ලාජාවන් නාහයි; සිත, චිත්තයෙහි; සැකකොට, ශඞ්කාජනකකොට; සබඳ!, යහළුව!; ගොසින්, ප්‍රයාණයකොට; නිවට නොවන් ලජ්ජා යුක්ත නොමෙව.

182 වි සි ර ගෙන ගඟුලැලි වැ දේ
ත ව ර ගෙන මල් මුවර දේ
බ ම ර රැව් ඇද මඳ ම දේ
පැ තිර එන මඳනල වි දේ

182 ගඟුලැලි, ගඞ්ගානිර්ඣරන්හි; වැදේ, ඝට්ටිතව; විසිර ගෙන, විසිණිව; මල්මුවරදේ, පුෂ්පමකරන්දයන්; තවරගෙන, ආලේපකොටගෙන; බමරරැව්, භෘඞ්ගයන්ගේ රාවය; මඳමදේ, මඳින්මඳ; ඇද, ආකර්ෂණයකොට; පැතිරඑන, ව්‍යාප්තව එන්නාවූ; මඳනල, මන්දමාරුතය; විදේ, විඳිනය කොට :–

183 ගි ම න දුර එලවන නි සා
ස ල න මිණි තල්වැට ලෙ සා
ය නෙ න යුග පියපත් ග සා
ද කි න සිය සියොතුන් රැ සා

183 ගිමන, ග්‍රීෂ්මය; දුර, දූරස්ථානයට; එලවන නිසා, අප හරණය කරන පිණිස; සලන, චලනයකරනු ලබන්නාවූ; මිණිතල් වැටලෙසා, මණිමය තාලවෘන්තයන් බඳුවූ; පියපත් යුග, පක්ෂපත්‍රවය; ගසා, ප්‍රහරණයකොට; යනෙන, යාම් ඊම කරන්නාවූ; සිය, ශතසඞ්ඛ්‍යාතවූ; සියොතුන්රැසා, පක්ෂි සමූහයන්; දකින, නිරීක්ෂණය කරන්.

184 ස ර ද නුබ තුරුවැල ලෙ සේ
නොමඳ පිපි කොඳමල් *දි සේ
ස බ ඳ! ඉඳ ලියමඬුකු සේ
පැහැ ද විඳ වනපල ර සේ

184 සරදනුබ, ශරදාකාශයෙහිවූ; තුරුවැලලෙසේ, තාරකාවලි විලාසයෙන්; පිපි, සුපුෂ්පිතවූ, නොමද, අමන්දවූ; කොඳ මල්, කුන්ද කුසුමයන්; දිසේ, දෘශ්‍යමානවූ; ලියමඬුකුසෙ, ලතාමණ්ඩපාභ්‍යන්තරයෙහි; සබඳ!, (මාගේ) මිත්‍රය!; ඉඳ, ප්‍රවේශය කොට; පැහැද, ප්‍රසාදයට පැමිණ; වනපලරසේ, අරණ්‍ය ඵලයන්ගේ රසය; විඳ, විඳිනයකොට :–

* රැසේ.

සරද නුබතුරුවැල ලෙ සේ
නොමඳ පිපි කොඳ මල් දි සේ

සරත්කාලයෙහි අහසේ බබළන තාරකා සමූහයා මනා ලෙස පිපියාවූ කුඳ කුසුමයන් සෙයින් අතිශයින් බවලවණී වත්ව දෘශ්‍යමානවේ. ශ්‍රීමත් මහාකවි කාලිදාස පඬිතුමන් විසින් මේ කියනලදී. ඍතුසංහාරයෙහි :—

වෙශ්මනිකාවිද්‍රජතශඞ්ඛමෘණා ලගෞරෛ
ස්තෘයකානාමුබිහි්සූනයා ශනශඃ ප්‍රයාතෛඃ
සංලක්‍ෂ්‍යතෙ පවනවෙග චලෛඃ සයොමෛද
රාජෙව චාමරවරෛරුපවිජ්‍යමානඃ

ශරත්කාලයෙහි වළාකුල් සමූහයාද රිදීද හක්ද නෙළුම් නූයද මෙන් ශ්වේතවණිය උසුලයි. ජලය නොමැති හෙතු වෙන් වළාකුල් සැහැල්ලුවී සියක්කඩව ලෙස සුළංවෙගයෙන් සැලි සැලි යන්නාක්මෙන් පෙනේ. මෙසේ බැබළෙමින් යන් නාවූ සුදුවලා කරණකොටගෙන අහසතලයෙහි ඇතැම් ස්ථානයක් ශ්වේත චාමරවලින් පවන්සලනුලබන රජයකු මෙන් පෙනෙයි සේයි.

කාශෛර්මහී ශිශිර දීධිතිනා රජන්‍යො
හංසෛර්ජලානි සරිතාං කුමුදෛඃ සරාංසි
සප්තච්ඡදෛඃ කුසුමභාරනතෛර්වනාන්තාඃ
ශුක්ලී කෘතාන්‍යුපවනානි ච මාලතීභිඃ

වැලූක්මලින් පෘථිවීතලයද සදපහනින් රාත්‍රියද හංසයන් ගෙන් නදීජලයද කුමුදු මලින් විල්ද රුක්අත්තන මලින් කලෑද දෑසමන් මලින් වනද සුදුවිය. ශරත්ඍතුවට ඇතිවන මේ පුෂ්පජාති සියල්ලම ශ්වේතවණී බවත් සැලකිය යුතුයි. කොඳමල් හෙවත් කුමුදුමල්ද ශරත්ඍතුවට හටගන්නා ශ්වේත වණී පුෂ්ප වගීයන් බැව් කවිතෙමේ හඟවී.

185 කොවුල් කුල්පිරි*නෙක ලෙ සේ
සු පු ල් මල් සැදි තුරු කි සේ
ක ම ල් විල් වෙත මුව ය සේ
වි ස ල් වල් දූත ඝොස් නො සේ

185 සුපුල්, සුපිපුලෙවූ; මල්, පුෂ්පයන්ගෙන්; සැදි, සපිරි නාවූ; තුරුහිසේ, වෘක්‍ෂමස්තකයෙහි; කොවුල්, කොකිලයන්ගේ,

* නෙකමසේ.

සුල්, නාදය කරණකොටගෙන; නොකලෙසේ, නොයෙක් ආකාරයෙන්; පිරි, පැතිරෙන ලද්දාවූද; කමල්විල් වෙත, පද්ම තඩාග සමීපයෙහිවූ; මුවරැසේ, මෘග සමූහයාගෙන්ද; සැදි, සජ්ජිතවූද; විසල් වල්, මහත්වූ අරණ්‍යය; දුක, අවලෝකනය කොටගෙන; තොසේ, සන්තොෂයෙන්; ගොස්, ප්‍රයාණය කොට :–

186 ඇ වි වූ ව ලා   දිඟගෙන සිඳුමැදට බැ   සා
වෙ ර ළ ව ලා   සිටි යනු බැරිව නුබ කු   සා
නොමඳ ව ලා   කුළුලෙසදිසි හැම දව   සා
මූ හු දු බ ලා   තුරුපෙළ වැද ඉඳ සතො   සා

186 සිඳුමැදට, සමුද්‍රමධ්‍යයට; බැසා අවතීර්ණව; දියගෙන, ජලග්‍රහණය කොට; ඇවිටූවලා, අධිකභාර යුක්තවූයේ; නුබ කුසායනුබැරිව, ආකාශ කුක්ෂියට යාගතනොහී; වෙරළවලා සිටි, සමුද්‍රවෙලාන්තයට; නොමඳ; අමන්දවූ; වලාකුළුලෙස, මෙඝකූටවිලාසයෙන්; හැමදවසා, සැම දවස්හි; දිසි, දෘශ්‍යමානවූ;තුරුපෙළ, වෘක්ෂපඞ්ක්තියට; වැද, ප්‍රවිෂ්ටව; මූහුදු බලා ඉඳ, සමුද්‍රය නිරීක්ෂණයකොට සතිනව :–

මූහුදු වෙරළ අසබඩ හාත්පස සැදීසිටි වෘක්ෂපඞ්ක්තිය කෙසේදැයි කිවහොත් මූහුදුදිය ගැනීම පිණිස අධූත් බැස්සාවූ මෙඝකූටයන් වතුරගත්ත ලහි බරවීමෙන් යාගතනොහී මූහුදු වෙරළට ගොඩගසන ලදුව සිටින්නාක්මෙනැයි උත්ප්‍රෙක්ෂා කළහයි දතයුතු.

187 සියොතුන්පා   පහරින් හැසිරෙන දෙතෙ   ර
නිති කම්පා   වනතුරු මල්රෙණ් *වැති   ර
නද ගිම් පා   සරලැබ එන දිය දහ   ර
ම හ ද ම් පා   මෝදර දුසා යව මිතු   ර

187 දෙතෙර, උභයතීරයෙහි; හැසිරෙන, සඤ්චාරය කරන්නාවූ; සියොතුන්, පක්ෂිසමූහයාගේ; පාපහරින්, පාද ප්‍රහාරය කරණකොටගෙන; නිති, නිරන්තරයෙන්; කම්පාවන, කම්පිත වන්නාවූ; තුරු, වෘක්ෂයන්ගේ; මල්රෙණ්, පුෂ්ප රේණූන්; වැතිරඑන, පතිතව එන්නාවූ; (මල්රෙණ් හා මිශ්‍රව එන්නාවූයයි සේයි) දියදහර, ජලධාරාව; ලැබ, ලබ්ධව; නද ගිම්පාකර, සන්බ්ධ ග්‍රීෂ්ම පහරණයකොට; (ජලස්නානය කොට; විඩා සනසා යනු භාවයි) මහදම්පා මෝදර, එනම්වූ ස්ථානය; දුක, අවලොකනයකොට; මිතුර!, මිත්‍රය!; යව, ප්‍රයාණය කරන්.

* පැතිර.

සරද නුබනුරුවැල ලෙ සේ
නොමඳ පිපි සොඳ මල් දි සේ

සරත්කාලයෙහි අහසේ බබළන තාරකා සමූහයා මනා ලෙස පිපියාවූ කුඳ කුසුමයන් සෙයින් අතිශයින් ධවලවර්ණ වත්ව දෘශ්‍යමානවේ. ශ්‍රීමත් මහාකවි කාලිදාස පඬිතුමන් විසින් මේ කියනලදී. ඍතුසංහාරයෙහි :-

ව්‍යොම ක්වචිද්‍රජතශංඛමෘණාලගෞරෛ
ස්ත්‍යක්තාම්බුභිර්ලඝුතයා ශතශඃ ප්‍රයාතෛඃ
සංලක්ෂ්‍යතෙ පවනවෙගචලෛඃ පයොදෛ
රාජෙව චාමරවරෛරුපවීජ්‍යමානඃ

ශරත්කාලයෙහි වලාකුල් සමූහයාද රිදීද හක්ද නෙළුම් නූයද මෙන් ශ්වේතවර්ණය උසුලයි. ජලය නොමැති හෙතුවෙන් වලාකුල් සැහැල්ළුවී සියක්කඩව ලෙස සුළංවෙගයෙන් සැලි සැලි යන්නාක්මෙන් පෙනේ. මෙසේ බැබළෙමින් යන්නාවූ සුදුවලා කරණකොටගෙන අකාශතලයෙහි ඇතැම් ස්ථානයක් ශ්වේත චාමරවලින් පවන්සලනුලබන රජයකු මෙන් පෙනෙයි සේයි.

කාශෛර්මහී ශිශිර දීධිතිනා රජන්‍යො
හංසෛර්ජලානි සරිතාං කුමුදෛඃ සරාංසි
සප්තච්ඡදෛඃ කුසුමභාර ා නෛර්වනාන්තාඃ
ශුක්ලී කෘතාන්‍යුපවනානි ච මාලතීභිඃ

වැලුක්මලින් පෘථිවීතලයද සඳපහනින් රාත්‍රියද හංසයන්ගෙන් නදීජලයද කුමුදු මලින් විල්ද රුක්අත්තන මලින් කලෑද දෑසමන් මලින් වනද සුදුවිය. ශරත්ඍතුවට ඇතිවන මේ පුෂ්පජාති සියල්ලම ශ්වේතවර්ණ බවත් සැලකිය යුතුයි. කොඳමල් හෙවත් කුමුදුමල්ද ශරත්ඍතුවට හටගන්නා ශ්වේත වර්ණ පුෂ්ප වර්ගයන් බැව් කවිතෙමේ හැඟවී.

185 කොවුල් කුල්සිරි*නොසා ලෙ සේ
පු පු ල් මල් සැදි තුරු හි සේ
ක ම ල් විල් වෙසා මුව රැ සේ
වි ස ල් වල් දුසා ඝොස් කො සේ

185 පුපුල්, ප්‍රඵුල්ලවූ; මල්, පුෂ්පයන්ගෙන්; සැදි, සජ්ජනවූ; තුරුහිසේ, වෘක්ෂමස්තකයෙහි; කොවුල්, කොකිලයන්ගේ,

* නොසමසේ.

කුල්, නාදය කරණකොටගෙන; නෙකලෙසේ, නොයෙක් ආකාරයෙන්; පිරි, පැතිරෙන ලද්දාවූද; කමල්විල් වෙත, පද්ම තඩාග සමීපයෙහිවූ; මුවරැසේ, මෘග සමූහයාගෙන්ද; සැදි, සජ්ජිතවූද; විසල් වල්, මහත්වූ අරණ්‍යය; දුක, අවලෝකනය කොටගෙන; තොසේ, සන්තොෂයෙන්; ගොස්, ප්‍රයාණය කොට :–

186 ඇ වි වු ව ලා දියගෙන සිඳු මැදට බැ සා
වෙ ර ළ ව ලා සිටි යනු බැරිව නුබ කු සා
නොමඳ ව ලා කුළුලෙසදිසි හැම දව සා
මු හු දු බ ලා තුරුපෙල වැද ඉඳ සතො සා

186 සිඳුමැදට, සමුද්‍රමධ්‍යයට; බැසා අවතීර්ණව; දියගෙන, ජලග්‍රහණය කොට; ඇවිටුවලා, අධිකභාර යුක්තවූයේ; නුබ කුසායනුබැරිව, ආකාශ කුක්ෂියට යාගතනොහී; වෙරළවලා සිටි, සමුද්‍රවෙලාන්තයට; නොමඳ; අමන්දවූ; වලාකුළුලෙස, මෙඝකූටවිලාසයෙන්; හැමදවසා, සැම දවස්හි; දිසි, දෘශ්‍ය මානවූ; තුරුපෙළ, වෘක්ෂපඞ්ක්තියට; වැද, ප්‍රවිෂ්ටව; මුහුදු බලා ඉඳ, සමුද්‍රය නිරීක්ෂණයකොට සිටිතව :–

මුහුදු වෙරළ අසබඩ හාත්පස සැදිසිටි වෘක්ෂපඞ්ක්තිය කෙසේදැයි කිවහොත් මුහුදුදිය ගැනීම පිණිස අදූත් බැස්සාවූ මෙඝකූටයන් වතුරගත්බ ලහි බරවීමෙන් යාගතනොහී මුහුදු වෙරළට ගොඩගසන ලදුව සිටින්නාක්මෙනැයි උත්ප්‍රෙක්ෂා කළහයි දතයුතු.

187 සියොතුන්පා පහරින් හැසිරෙන දෙතෙ ර
නිති කම්පා වනතුරු මල්රෙණ් *වැති ර
කදගිම්පා සරලැබ එන දිය දක ර
මහදම්පා මෝදර දක යව මිතු ර

187 දෙතෙර, උභයතීරයෙහි; හැසිරෙන, සඤ්චාරය කරන්නාවූ; සියොතුන්, පක්ෂිසමූහයාගේ; පාපහරින්, පාද ප්‍රහාරය කරණකොටගෙන; නිති, නිරන්තරයෙන්; කම්පාවන, කම්පිත වන්නාවූ; තුරු, වෘක්ෂයන්ගේ; මල්රෙණ්, පුෂ්ප රේණූන්; වැතිරඑන, පතිතව එන්නාවූ; (මල්රොන් හා මිශ්‍රව එන්නාවූයයි සේසි) දියදහර, ජලධාරාව; ලැබ, ලබ්ධව; තද ගිම්පාකාර, ඝනබද්ධ ග්‍රීෂ්මා පහරණයකොට; (ජලස්නානය කොට; විඩා සනසා යනු භාවයි) මහදම්පා මෝදර, එනම්වූ ස්ථානය; දක, අවලෝකනයකොට; මිතුර!, මිත්‍රය!; යව, ප්‍රයාණය කරත්.

* පැතිර.

188 විහිගුම් වෙරළ වැද – වැදදෙන සිඳුගොසා යෙන්
සලසිත්වබා නොගොසින් – තොගොසින් සෙදක සා යෙන්

188 විහිගුම්, උසස්වූ ඝෝෂයෙන්ග්‍රහණයකළාවූ; සිඳ, සමුද්‍රය විසින්; වෙරළ, වෙලාන්තයට; වැද වැද, හැපි හැපී; දෙන, දානය කරනු ලබන්නාවූ; ගොසායෙන්, ඝෝෂය කරණකොට ගෙන; සලසිත්ව, චඤ්චල සිත්ඇතිව; බානොගොසින්, භීති ප්‍රාප්තනොවී; තො, ඔබ තෙම; කසායෙන්, කහවනම්වූ ග්‍රාමයෙන්; සෙද, ශීඝ්‍රව; ගොසින්, ප්‍රයාණයකොට :–

189 විදි විහිගුම් සමුදුර වෙරළන හ මු ව
සුරපුර බිම් බටමෙන්*තුටුවන †ළ මු ව
සැදි පලරම් විසිතුරු ගෙවුයන් සො මු ව
දකුමන රම් සව්සිරි පිරි තොටග මු ව

189 විහිගුම්, උසස් ඝෝෂයෙන් යුක්තවූ; සමුදුර, සමුද්‍රයා ගේ; වෙරළන, වෙලාන්තයට; හමුව, සම්මුඛභූතව; විදි, විස්තීර්ණ වූද; (සමුද්‍රසන්නායෙහි විශාලව පිහිටියා වූ යයි සේයි) සුරපුර, දිව්‍යපුරය; බිම්, භූමියට; බටමෙන්, අවතීර්ණවූවාසේ; උමුව, ඉදිරියෙහි; තුටුවන, තුෂ්ටිජනනය කරන්නාවූ; සැදි, සජ්ජිතවූ හෙවත් සඤ්ජාතවූ; රම්පල, රම්‍යඵලයන්ගෙන්; විසිතුරු, විචිත්‍රවූ; සොමුව, සෞම්‍යවූ; ගෙවුයන්, ගෘහෝද්‍යානයන්ගෙන්; මනරම්, සිත්කලුවූද; සව්සිරිපිරි, සමස්ත සම්පත්තියෙන් පරිපූර්ණවූද; තොටගමුව, තීර්ථග්‍රාමය; දකු, නිරීක්ෂණය කරන්.

190 උ දු ළ තරලම්ණ වෙන් ඇරගැනැසි ත මා
දූ ව ළ නතිඳුහට පමුණන ලෙසින් බ මා
ත ර ළ නැබල රළගොස පහළකර ද මා
වෙර ළ වසල සිඳුරඟ බලග! නොක්සො මා

190 තමා, තමන්ගේ හෙවත් තමාගේ කුක්ෂියෙහි රක්ෂිතවූ; උදුළ, උජ්ජ්වලිතවූ; තරලම්ණ, මුක්තාහාර මධ්‍යගත ශ්‍රේෂ්ඨමාණික්‍යය; (කෞස්තුභ පාෂාණයයි සේයි) වෙන්, ශ්‍රී විෂ්ණු දිව්‍යරාජ තෙම; ඇරගැනැසි, ආභරණයකොට ගත්තේයි; දූවළ, ශ්‍රේෂ්ඨතරවූ; නතිඳුහට, නාථදෙවන්‍ද්‍රයාට; පමුණන ලෙසින්, පැමිණීල්කරන ආකාරයෙන්; බමා, භ්‍රමණයකොට හෙවත් එමින් යමින්; තරළ, චඤ්චලවූ; නැබළ, මහත්වූ; රළ, තරඞ්ගයන්ගේ; ගොස පහළකර දමා, ඝෝෂය ප්‍රකාශකොටලා.

---

* තුටුවෝත †ලමුව.

මෙරළ, වෙළානතයෙහි; වතළ, වැතිරගත්තාවූ; (වැදමැඩූනාවූ යයි සේසි) සිඳූ, සමුද්‍රරාජයාගේ; රඟ, ආකාරය; නෙත්සොමා, ඇස්දල්වා; බලග, නිරීක්ෂණය කරත්.

“උ දූ ළ  තරලමිණ වෙත් ඇරගැතැයි ත  මා
පූ ව ළ  නතිඳුහට පමුණත ලෙසින් බ  මා

කුක්ෂිගත මුක්තාහාරයයි කීමෙන් සමුද්‍රාන්තරවර්තිවූ රුවන් හා මුක්තාවෝ සමුද්‍රරාජයාගේ වස්තු බැව් දීපිතයි. එම වස්තූන් අතුරෙහිවූ ශ්‍රේෂ්ඨතර මාණික්‍යය නම් කෞස්තුභ මාණික්‍යයයි දතයුතු. එම මාණික්‍යයද ශ්‍රී විෂ්ණු දිව්‍යරාජයා හැරගත්තේයයි මෙහි දක්විය. පෙර සුරාසුර සමූහයෝ ජරාභයින් ත්‍රස්තවූවෝ අමෘතය ලැබ නිරොගිවනු සඳහා වාසුකී නාගරාජයා රජ්ජුවක් (රැහැණක්) කොට එයින් බඳනාලද මහමෙරගෙන කිරි මුහුද කැළඹූවෝය. එවිට ඒ කිරිමුහුදින් ශ්‍රී කාන්තාය, චන්ද්‍රයාය, ශඞ්ඛය, ඛඞ්ගය, කාලකූට විෂය, පාරිජාත වෘක්ෂය, ඓරාවත හස්තිරාජයාය, සුරභිධේනුවය, ධන්වන්තරි සෘෂියාය, කෞස්තුභපාෂාණය යනාදි මඞ්ගලවස්තු තෙළෙසක් පැන නැංගාහුය. ඊශ්වරතෙම චන්ද්‍රයා හා කාලකූටවිෂය ගත්තේය. ශක්‍රතෙම ඓරාවත හස්තිරාජයා ගත්තේය. විෂ්ණුතෙම ශ්‍රීකාන්තාවද, ශඞ්ඛයද, ඛඞ්ගයද, කෞස්තුභපාෂාණයද ගත්තේය. මේ ආදි වශයෙන් ඒ ඒ දෙවිවරුන් විසින් ඒ ඒ මඞ්ගල වස්තුගන්නාලදහ යනු පුරාණෝක්තියි.

සමුද්‍රරාජතෙම තමාගේ කුසතුළ පැවැති යථොක්ත කෞස්තුභමාණික්‍යය විෂ්ණු දිව්‍යරාජයා හැරගත්තේයයි අමනාපවී ඒ බව නාථදෙවියාටපැමිණිලිකරනු පිණිස චඤ්චලවූ මහත්වූ තරඞ්ගාවලින් ඝොෂයකොට නැවත යමින් ආයිත් අවුත් වෙරළානතයෙහි වැද වැටී සිටින්නාක් මැනියයි කීසේ වේ. තොටගමු විහාරවරයෙහි නාථදෙවයා එකල්හි වැඩසිටි බවද කාව්‍යශෙඛරයෙහිදු ආගතයි.

“සිරි පැ හිරු තරි  දූ
තෙද යස දියත පසි  දූ
මතුවන බුදු ර  දූ
සැරද තොටගමු වෙහෙර නති  දූ” යනුයි.

යට දැක්වූ කවෙහි තරලමිණි යන්නෙහි “තරල” යනු තත් සම ශබ්දයකැයි දතයුතු. සංස්කෘතභාෂාගත හෙයිනි.

**191 සු නි ල්  නෙරළුවන පිළපතර වොරද  නා**
**ල ක ල්  වෙහෙර පැහැසර ගුරුළිඳුග පි  නා**
**වි ස ල්  සයුරතින් ගත් නාරදකු ම*  නා**
**නි ම ල්  පුලිනතල පෙක්මහම බසිමි†  නා**

* විතා සමහර  † බැසනනා.

188 විහිගුම් වෙරළ වැද – වැද දෙන සිඳුගොසා යෙන්
සලසිත්වබා නොගොසින් – තොගොසින් සෙද ක සා යෙන්

188 විහිගුම්, උසස්වූ ඝොෂග්‍රහණයකළාවූ; සිඳු, සමුද්‍රය විසින්; වෙරළ, වෙලාන්තයට; වැද වැද, හැපි හැපී; දෙන, දානය කරනු ලබන්නාවූ; ගොසායෙන්, ඝොසය කරණකොට ගෙන; සලසිත්ව, චඤ්චල සිත්ඇතිව; බානොගොසින්, භීති ප්‍රාප්තනොවී; තො, භවත්තෙම; කසායෙන්, කහවනම්වූ ග්‍රාමයෙන්; සෙද, ශීඝ්‍රව; ගොසින්, ප්‍රායාණයකොට :–

189 විදි විහිගුම් සමුදුර වෙරළත හ මුව
සුරපුර බිම් බටමෙන්*තුටුවන †උ මුව
සැදි පලරම් විසිතුරු ගෙවුයන් සෝ මුව
දකුමන රම් සව්සිරි පිරි තොටග මුව

189 විහිගුම්, උසස් ඝොෂයෙන් යුක්තවූ; සමුදුර, සමුද්‍රයා ගේ; වෙරළත, වෙලාන්තයට; හමුව, සම්මුඛගතව; විදි, විස්තීර්ණවූද; (සමුද්‍රසන්නායෙහි විශාලව පිහිටියා වූ යයි සේයි) සුරපුර, දිව්‍යපුරය; බිම්, භූමියට; බටමෙන්, අවතීර්ණවූවාසේ; උමුව, ඉදිරියෙහි; තුටුවන, තුෂ්ටිජනනය කරන්නාවූ; සැදි, සජ්ජිතවූ හෙවත් සඤ්ජාතවූ; රම්පල, රම්‍යඵලයන්ගෙන්; විසිතුරු, විචිත්‍රවූ; සොමුව, සෞම්‍යවූ; ගෙවුයන්, ගෘහොද්‍යානයන්ගෙන්; මනරම්, සිත්කලුවූද; සව්සිරිපිරි, සමස්ත සම්පත්තියෙන් පරිපූර්ණවූද; තොටගමුව, තීර්ථග්‍රාමය; දකු, නිරීක්ෂණය කරන්.

190 උ දු ල තරලමිණ වෙන් ඇරගැතැයි ක මා
පු ව ල නතිඳුහට පමුණන ලෙසින් බ මා
ත ර ල නැබල රළඝොස පහළකර ද මා
වෙර ල චපල සිඳුරග බලග! නෙක්සො මා

190 තම, තමන්ගේ හෙවත් තමාගේ කුක්ෂියෙහි රක්ෂිතවූ; උදුළ, උජ්ජ්වලිතවූ; තරලමිණ, මුක්තාහාර මධ්‍යගත ශ්‍රෙෂ්ඨමාණික්‍යය; (කෞස්තුභ පාෂාණයයි සේයි) වෙන්, ශ්‍රී විෂ්ණු දිව්‍යරාජ තෙම; ඇරගැතැයි, ආභරණයකොට ගත්තේයි; පුවළ, ශ්‍රෙෂ්ඨතරවූ; නතිඳුහට, නාථදෙවෙන්ද්‍රයාට; පමුණන ලෙසින්, පැමිණිල්කරන ආකාරයෙන්; බමා, භ්‍රමණයකොට හෙවත් එමින් යමින්; තරළ, චඤ්චලවූ; නැබළ, මහත්වූ; රළ, තරඞ්ගයන්ගේ; ගොස පහළකර දමා, ඝොෂය ප්‍රකාශකොටලා.

---

* තුටුවොත †ලමුව.

වෙරළ, වෙළානතයෙහි; වතළ, වැතිරගත්තාවූ; (වැදවැටුනාවූ යයි සේයි) සිඳු, සමුද්‍රරාජයාගේ; රඟ, ආකාරය; නෙත්සොමා, ඇස්දල්වා; බලග, නිරීක්ෂණය කරන්.

“උ දු ළ  තරලම්ණි වෙත් ඇරගැනැයි ත  මා
පු ව ළ  නතිඳුහට පමුණන ලෙසින් බ  මා

කුක්ෂිගත මුක්තාහාරයයි කීමෙන් සමුද්‍රාන්තරවර්තිවූ රුවන් හා මුක්තාවෝ සමුද්‍රරාජයාගේ වස්තු බැව් දීපිතයි. එම වස්තූන් අතුරෙහිවූ ශ්‍රෙෂ්ඨතර මාණික්‍යය නම් කෞස්තුභ මාණික්‍යයයි දතයුතු. එම මාණික්‍යයද ශ්‍රී විෂ්ණු දිව්‍යරාජයා හැරගත්තේයයි මෙහි දක්විය. පෙර සුරාසුර සමූහයෝ ජරාභයින් ත්‍රස්තවූවෝ අමෘතය ලැබ නිරොගිවනු සඳහා වසුකී නාගරාජයා රජ්ජුවක් (රැහැණක්) කොට එයින් බඳනාලද මහමෙරගෙන කිරි මුහුද කැළඹූවෝය. එවිට ඒ කිරිමුහුදින් ශ්‍රී කාන්තාය, චන්ද්‍රයාය, ශඞ්ඛය, ඛඞ්ගය, කාලකූට විෂය, පාරිජාත වෘක්ෂය, ඓරාවත හස්තිරාජයාය, සුරභිධෙනුවය, ධන්වන්තරිඍෂියාය, කෞස්තුභපාෂාණය යනාදි මඞ්ගලවස්තු තෙළෙසක් පැන නැංගාහුය. ඊශ්වරතෙම චන්ද්‍රයා හා කාල කූටවිෂය ගත්තේය. ශක්‍රතෙම ඓරාවත හස්තිරාජයා ගත්තේය. විෂ්ණුතෙම ශ්‍රීකාන්තාවද, ශඞ්ඛයද, ඛඞ්ගයද, කෞස්තුභපාෂාණයද ගත්තේය. මේ ආදී වශයෙන් ඒ ඒ දෙවිවරුන් විසින් ඒ ඒ මඞ්ගල වස්තුගන්නාලදහ යනු පුරාණෝක්තියි.

සමුද්‍රරාජතෙම තමාගේ කුසතුළ පැවැති යථොක්ත කෞස්තුභමාණික්‍යය විෂ්ණු දිව්‍යරාජයා හැරගත්තේයයි අමනාපවී ඒ බව නාථදෙවියාටපැමිණිලිකරනු පිණිස චඤ්චලවූ මහත්වූ තරඞ්ගාවලින් ඝොෂයකොට නැවත යමින් ආයිත් අවුත් වෙරළානතයෙහි වැද වැටි සිටින්නාක් වැනියයි කීසේ වේ. තොටගමු විහාරවරයෙහි නාථදෙවයා එකල්හි වැඩසිටි බවද කාව්‍යශෙඛරයෙහිදු ආගතයි.

“සිරි පැ හිරු නරි  දු
තෙද යස දියත පසි  දු
මතුවන බුදු ර  දු
සැරද තොටගමු වෙහෙර නති  දු” යනුයි.

යට දක්වූ කවෙහි තරලම්ණි යන්නෙහි “තරල” යනු තත් සම ශබ්දයකැයි දතයුතු. සංස්කෘතභාෂාගත හෙයිනි.

191 සු නි ල්  නෙරඑවන පිළපහර වොරද  නා
ල කා ල්  වෙහෙර පැහැසර ගුරුළිඳුග සි  නා
වි ස ල්  සයුරතින් ගත් නාරදනු ම*  නා
නි ම ල්  පුළිනතල පෙන්මහට බසිවි†  නා

* විනා සමහර   † බැසගනා.

191 සුනිල්, අතිනිලවණියෙන්; නෙරඑවන, නාලිකෙරවන නැමැති; පියපතර, පක්ෂපත්‍රවයෙන්; වොරදනා, විරාජමානවූ; ලකල්, මනොඥවූ හෙවත් අලංකාර කරනලද; වෙහෙර, විහාර නැමැති; පැහැසර, ප්‍රභාසාරවූ; ගුරුළිඳුහු, ගරුඩරාජයා; පිනා, සන්තුෂ්ටව; විසල්, විශාලවූ; සයුරතින්, සාගරාන්තර යෙන්; ගත්, ග්‍රහණයකළාවූ; නාරදකුවනා, නාගරාජයකු වැනි වූද; නිමල්, නිර්මලවූද; පුලිනතල, වැලිතලා ඇත්තාවූද; පෙත්මගට, පටි පථයට; බස්මිනා, අවතිණිවෙමින් :–

විහාරොහය මාර්ගපාර්ශ්වයෙහි සජ්ජිතවූ නාලිකෙර වෘක්ෂ පඞ්ක්තිවය නැමැති පියාපත් දෙකින් බබලන්නාවූ විහාර (ගෘහ) නැමැති ගුරුළිඳුහු විසින් සාගරයෙන් ගත් (ශ්වේතවණී) නාගරාජයකු බඳුවූ වැලිතලා ඇති පෙරමග බැස යනු අප්සී. මෙහි නාලිකෙරවනය ගුරුළාගේ පක්ෂවෘයටද විශාල ගෘහ යුක්තවිහාරය ගුරුළාගේ ශරීරයටද ශ්වේත වාලුකාතලය නාග රාජයාටද උපමිතයයි දතයුතු.

19! වෙහෙර තුලට සෙද නොගොසින් පළමුකො ට
පවර සුරිඳු නඳුනයනෙව දිසි අව ට
නිතොර සුසැදි මල්පලරම් වනපෙත ට
මිතුර! පිවිස නරඹව සිත් සතුටුකො ට

192 පළමුකොට, ප්‍රථමයෙන්; වෙහෙරතුලට, විහාරාභ්‍ය න්තරයට; සෙද, ශීඝ්‍රව; නොගොසින්, ප්‍රයාණයනොකොට; පවර, ශ්‍රෙෂ්ඨවූ; සුරිඳු, සුරෙන්ද්‍රයාගේ; නඳුනුයනෙව්, නන්ද නොද්‍යානය සෙයින්; අවට, හාත්පස්හි; දිසි, දෘශ්‍යමානවූ; නිතොර, අතර නැතිව; සුසැදි, මනාකොට සජ්ජිතවූ; මල්පල, පුෂ්ප ඵලයෙන්; රම්, රම්‍යවූ; වනපෙතට, වනපඞ්ක්තියට; පිවිස, ප්‍රවිෂ්ටව; මිතුර!, මිත්‍රය!; සිත් සතුටුකොට, චිත්තප්‍රසාදයකොට; නරඹව, (එහිවූ ශොභනාලංකාර විශෙෂය මතු දක්වන ලෙසින්) නිරීක්ෂණය කරන්.

193 වෙන වෙන රගට බැඳි තෝතැනි දියකෙළ ස
සන එන සිංහොත් කැල රැව පිළිරැව කළ ස
දන මන සතුටුවන රස පලවැල දුළ ස
තැන තැන අවට බබලන නන්තුරු පෙළ ස

193 වෙන වෙන රගට, වෙන් වෙන් ආකාරයෙන්; බැඳි, බඳනාලද්දාවූ; තෝතැනි, ආල්වාලයන්හි හෙවත් වෘක්ෂයන් ගේ වර්ධනයට ඒ ඒ තැන එක් එක් ආකාරයෙන් තනනලද දියපාත්තිත්හි; දියකෙළිය, ජලක්‍රීඩනයකොට; රැව්පිළිරැව් කළස, රාව ප්‍රතිරාවයකොට; යන එන, යාම් ඊම් කරන්නාවූ සිංහොත්කැලැ, පක්ෂිසමූහයාඇති; දන, ජනයන්ගේ; මන සතුටු වනු චිත්තසන්තුෂ්ටිය වන්නාවූ; රස, මධුරවූ; පලවැල, නානා ඵලාඵලයන්ගෙන්; දුළස, ජ්වලිතවූ; තැන තැන, තන්හි තන්හි; අවට, (ආරාමය) හාත්පස්හි; බබලන, භ්‍රාජමාන වන්නාවූ; නන්තුරුපෙළස්, නානා වෘක්ෂසමූහයකි.

194 ර ළි න් ර ළ බිඟුන් කෙළිවතළ* දිමු තුය
කෙළි න් කෙළ පොකුණු† දුළතඹර තුමු තුය
පෙ ළි න් පෙළ සුරත් නිල්මල් මිණ්මු තුය
ප ළි න් ප ළ‡ විගිඳි සුවඳැති මල්ව තුය

124 රළින්රළ, සමූහයෙන් සමූහය; වතළ, වනපතාවූ; බිඟුන්, භෘඞ්ගයන්ගේ; කෙළි, ක්‍රීඩනයෙන්; දිමුතු, දීප්තිමත්වූද, තඹර, තාමරස පුෂ්පයෙන්; තුමුතුය, යුක්තවූ; දුළ, ජ්වලිතවූද, කෙලින් කෙළ, කොණස්ථානයන්හි; පොකුණු, පුෂ්කරිණීහුය; පෙළින් පෙළ, පඞ්ක්තියෙන් පඞ්ක්තිය; මිණ්මුතුය, ප්‍රබුඩවූ; සුරත්, අති රක්තවණිවූද; නිල්, නීලවණිවූද; මල්, පුෂ්පයන් ගෙන්;- විගිඳි, විසතිණිවූ, සුවඳැති, සුගන්ධ ඇත්තාවූ; පළින් පළ, තන්හි තන්හි; මල්වතුය, පුෂ්පාරාමයෝය.

195 නොයෙක සුවඳ මුවරද ගෙන පිපි තුරුය
පසෙක සුපුල් සල් කොළඹින් විසි තුරුය
පසෙක සහස කර*කිරණින් නොවි තුරුය
දෙසෙක සුපිපි සපු නා කිණිහිරි තුරුය

195 සුවඳ මුවරද, සුගන්ධ මකරන්දයන්; ගෙන, ග්‍රහණය කොට; පිපි, පුෂ්පිතවූ; නොයෙකතුරුය, නානාවිධ වෘක්ෂයෝය; සුපුල්, සුප්‍රපුල්ලවූ; සල්, සාලවෘක්ෂයන් සහිතවූ; කොළඹින්, කදම්බවෘක්ෂයන්ගෙන්; පසෙක, එක් පාර්ශ්වයෙක්හි; විසිතුරුය, අලඞ්කාරය (ශොභනය); සහසකරකිරණින්, සහස්‍රරශ්මිහුගේ කාන්තියෙන්; පසෙක, එක්පාර්ශවයෙක්හි; නොවතුරුය, අතර නැත්තේය; දෙසෙක, එක් දිශාවෙක්හි; සුපිපි, මොනවට පිපියාවූ; සපු, චම්පකය; නා, නාගය; කිණි හිරි, කණිකාරයනා; තුරුළු, වෘක්ෂයෝය.

196 පලොල් සිහින් ගෙදිය එරහැ දිය
දෙසමන් සව ගෙදිය පුල් ගෙ දිය
නිලුපුල් අඹ ගෙදිය සිහිනි දිය
†සුවද දසත ගෙදිය තුරුනො දිය

196 පලොල්, පාටලීය; සිහින්ගෙඳිය, එනම් වෘක්ෂය; එර, හැඳිය; රාජවෘක්ෂය; දෙසමන්, ජාතිසුමන දෙවගිය;සව්ගෙඳිය; සව්ගෙන්දය; පුල්ගෙඳිය; පුෂ්පගන්ධය; නිල්උපුල්, නීලොත්පලය; අඹගෙඳිය, ආම්‍රගන්ධය; සිහිනිඳිය, ස්නිග්ධගන්ධය යන මේ; තුරු; වෘක්ෂයන්ගේ; නොඳිය, ක්‍ෂය නොවන්නාවූද; දසත, දසදිශාවන්හි; ගෙදිය, විස්තෘතවන්නාවූ; සුවද, සුගන්ධයයි.

* වැතිර. † මලතඹර. ‡ සුවද විහිදෙන.
‖ කිරණෙව-නැට. † මුද්‍රිත පොතේ මේ කවි නොමැතිසි.

197 මල්රොන් තුරු සිරේය නිරතු රේය
පවන් වැදි සිරේය මඑතු රේය
බිඟු ලොබකර තරේය නොවින රේය
දම් පිළි රැව් යුරේය නාද කෙ රේය

197 තුරුසිරේය, වෘක්ෂමස්තකයෙහිවූ; මල්, පුෂ්ප සමූහ සාගේ; රොන්, රේණුකදම්බයතෙම; පවන්වැදී, මාරුතස්පර්ශය ලැබ; මඑතුරේය, (විහාර) අඞ්ගණාන්තරයෙහි; නිරතුරේය, අතර නැතිව; සිරේය, විසිරිණීවන්නේය; (එහි) නොවින රේය, අප්‍රමාණවූ; බිඟු, භෘඞ්ගශ්‍රේණීහු; තරේය, දැඩිසේ; ලොබ කර, ලෝභකොට; දම්පිළිරැව් යුරේය, ධර්මයට දෙන ප්‍රතිරාවයක් පරිද්දෙන්; නදකෙරේය, නාදකරයි.

198 නොමඳ බමරකැල† රැඳි මල් රෙහෙණුප ට
පැහැද නිතොර ඇරගෙන සියඅතු අත ට
පබඳ කොවුල් රැව් තෙපුලින් මිහිරි කො ට
තුරුද දහම් පවසන වැනි වෙහෙර ව ට

198 නොමඳ බමරකැල, අමන්දවූ භෘඞ්ගශ්‍රේණීන් විසින්; රැඳි, රක්ෂිතවූ; මල්රෙහෙණු, පුෂ්පපරාග ලක්ෂණවූ; පට, උත්තර ශාටකය; සිය, ස්වකීය; අතු, ශාඛාලක්ෂණවූ; අතට, හස්තයෙන්; ඇරගෙන, ග්‍රහණයකොට හෙවත් පොරෝවාගෙන; නිතොර, තොරනැතිව; පැහැද, ප්‍රසන්නව; පබඳ, එකාබද්ධවූ; කොවුල්රැව්, කොකිලරාව ලක්ෂණවූ; තෙපුලින්, වචනයෙන්; වෙහෙර වට, විහාර හාත්පසෙහිවූ; තුරුද, වෘක්ෂයෝද; මිහිරි කොට, මධුර කොට; දහම් පවසන වැනි, ශ්‍රී සද්ධර්මය ප්‍රකාශ කෙරෙත්යයි හඟිමි.

භෘඞ්ගශ්‍රේණීන් ගැවසෙන පුෂ්පයන්ගේ රේණුනැමැති උත්තරශාටකය ස්වකීය ශාඛා නැමැති හස්තයෙන් පොරවාගෙන කොවුල්රාව නැමැති මිහිරි වචනයෙන් වෘක්ෂයෝ ධර්මය ප්‍රකාශකරන්නාවූන් වැන්නෝය යනු භාවයි. වෘක්ෂයන්හි රක්ත වර්ණ රේණු කදම්බයන් වෘක්ෂ ශාඛා පත්‍ර මත්තෙහි පතිතවී මෙන් ශාඛාවෝ සිවුරු පෙරවියවූන් වැන්නෝය. එම වෘක්ෂයන්හි හැසිරෙන කොකිල පක්ෂි සමූහයන්ගේ නාදය ධර්ම ප්‍රකාශකිරීම මෙන් වේ. එහෙයින් එම වෘක්ෂයෝ ශාසනයෙහි පැහැද සිවුරුපොරවා සැදැහැයෙන් බණ කියන භික්ෂූහු වැනී වෙතිසි උත්ප්‍රේක්ෂාකළහයි දතයුතු. ශාඛා මතුයෙහි ආකීර්ණව තිබෙන රක්තවර්ණ රේණුස්කන්ධයතෙම රක්තවර්ණ චීවරයන්ටද කොකිල නාදයතෙම ධර්මදෙසන නාදයටද වෘක්ෂයෝ භික්ෂූන්ටද යථාපර්‍ය පාටියෙන් උපමිතයහයි දතයුතු.

† කුරු සමහර

199 ම හ රු මහසඟන එවෙහෙරතුර රඳ න
සි වු රු පැහැ*දිවුණුකැරැ නිරතුරු දර න
සොඳු රු පිපි නිමල් මල්කැන්†කැල සැදූ න
රු සි රු ඇසලතුරු බබලසී නොයෙක තැ න

199 එවෙහෙරතුර, තද්විහාරාභ්‍යන්තරයෙහි; රඳන, රඤ්ජමානවන්නාවූ; මහරු, (ගුණයෙන්) මහත්වූ; මහසඟන, මහාසඞ්ඝයා විසින්; දරන, ධාරණයකරනු ලබන්නාවූ; (පොරොවනු ලබන්නාවූ, සිවුරු, චීවරයන්ගේ; පැහැ, ප්‍රභාව; නිරතුරු, අනවරතයෙන්; දිවුණුකැරැ, වෘද්ධිකොට; සොඳුර, සිත්කලුවූ; පිපි, සුපිෂ්පිතවූ; නිමල්, නිර්මලවූ; මල්කැන්කැල, පුෂ්පස්තබක සමූහයෙන්; සැදුන, සජ්ජවූ; රුසිරු, රුචිරවූ; ඇසලතුරු, ආරග්වධ වෘක්ෂපඞ්ක්තිය; නොයෙකතැන, අනෙක ස්ථානයන්හි; බබලසී, භ්‍රාජමානවේ.

එම විහාරාභ්‍යන්තරයෙහි වසන පූජ්‍යතර සඞ්ඝයා විසින් පොරවනලද චීවරයන්ගේ ප්‍රභාව විගුණකොට පිපියාවූ යහපත් මල්කැන් සමූහයාගෙන් හෙවත් මල්පොකුරු සමූහයෙන් ඇසළ වෘක්ෂයෝ බබලන්නාහ යනු භාවයි. ඇසළමල්කැන්ද සිවුරු පාටින් යුක්තයයි දක්වනලදහ.

200 තු රු යටි යෙන් හුණු පැටිලෙහෙනුන් රැගෙ න
සි තු අ පි යෙන් ‡පිඹ ඇඟ පිරිමැද සෙමෙ න
මල් ගොටුවෙන් පැන් පොවමින් අතිනති න
සි ටි පැටි න න් හෙරණුන්ගෙන් වෙසී සොබ න

200 තුරුයටියෙන්, වෘක්ෂයෂ්ටියෙන්; හුණු, පතිතවූ; පැටි ලෙහෙනුන්, කලන්දක පොතකයන්; රැගෙන, ග්‍රහණයකොට ගෙන; සිතුඅපියෙන්, චිත්තාභිලාෂ පරිද්දෙන්; පිඹ, පිඹිම කොට; ඇඟ, දෙහය; සෙමෙන, සන්සුන්ව; පිරිමැද, පරිමාර්ජනය කොට; අතිනඅති, හස්තයෙන් හස්තයටගෙන; මල්ගොටුවෙන්, පුෂ්පචඞ්ගොටකයෙන් හෙවත් මල්තෙලනගොටුවකින්; පැන් පොවමින්, ජලයපානය කරවමින්; සිට, සජිතවූ; පැටි, බාලවූ; නන්හෙරණුන්ගෙන්, බොහෝ සාමණේරවරුන්ගෙන්; සොබනවෙසී, ශෝභමාන වේ.

201 තු රු ය ට සුපිපි නිල් කටරොළු මල් කැ ලය
¶සැටිකොට විදු දිගු නිල් ඇස් පිල් කැ ලය
නද කො ට රඟන **ගෙමොනරකැල මනා ලය
මු තු ප ට සදිසි පිරිසුදු සුදුවැලි ත ලය

201 තුරුයට, වෘක්ෂයන්ගේ අධොභාගයෙහි; සුපිපි, සුපුෂ්පිතවූ; නිල්, නීලවර්ණවූ; කටරොළුමල්කැලය, ගිරිකර්ණිකා පුෂ්පයන්ගේ; සැටි, ආකාරය; කොට, ප්‍රකාශකර; (ගිරිකර්ණික පුෂ්පලතාකාරයෙනැයි සේයි) දිගු, දීඝවූ; නිල්, නීලවර්ණවූ;

*දිසුණු. †යාදි සඳහ ‡සිඹ ¶සැටි-සැට
**මොනරයන ඇමිකලය

ඇස් පිල්කැලය, අඤ්පිච්ඡා සමූහයා; විදැ, විදහාගෙන; නද කොට; නාද පවත්වා; රඟන, නෘත්‍යකරන්නාවූ; ගෙමොනර කැල, ඝෘන මයූර සමූහයාගෙන්; මනකලය, මනඃ කාන්ත වූද; මුතුපටසදිස්, මුක්තාපට්ටාකාරයෙන්; පිරිසුදු, පරිසුඬවූද; සුදු වැලිතලය, ශ්වේත වාලුකාතල වෙත්.

වෘක්ෂයන්ගේ යටෙහි පිපීගිය නිල් කටරොළු මල්කැලයක් හුගේ ආකාරයෙන් නිලවණිවූ දිඝ මයූරපිච්ඡාවන් විදහාගෙන නෘත්‍යකරන මයූරයන්ගෙන් ශොභමානවූයයි කීමෙන් කට රොළු වැල් සමූහයක නිල්මල් පිපි සිටීම මයූරයන්ගේ නිල්වන් ඇස් ඇති පිල්සමූහය විදහාගැනීම වැනියයි උපමිතකළහ. නිල් කටරොළු වැල්මෙන් මයූරයන්ගේ නිලවණී විදහාගත් පිල්වැටියද කටරොළු මල්සේ මයූරපිච්ඡාවන්ගේ ඇස්පෙළද වන්නාහයි දතයුතු.

**202 පලරස බි තුරින් – තුර එහි කුසුම් රෙදෙසින්**
**තැවිරී සැරී සැනහී – වෙහෙරට ගොසින් සතොසින්**

202 එහි, තද්විහාරභූමියෙහිවූ; තුරින්තුර, වෘක්ෂයෙන් වෘක්ෂයෙහි; පලරස, ඵලොද්භව රසය; බි, පානයකොට ලා; කුසුම්රෙදෙසින්, (ඒ වෘක්ෂයන්හිමවූ; පුෂ්පරේණුයෙන්; තැවිරි, ආලිප්ත කොටගෙන; සැරි, එයින්ම) අලඞ්කෘතව; සැනහී, ශාන්තව; සතොසින්, සන්තොෂයෙන්; වෙහෙරට, විහාරයට; ගොසින්, ප්‍රයාණයකොට :–

203 බඳ ද ද ලැ ල් පැහැරඳ පැතිර දස අ තේ
නඳ සඳ කැ ල් මෙන් දිලි කෙලෙස කුළු පු තේ
කොඳ සඳ කල් සුණුසම් උදුල පලබි තේ
ඉඳ මඳ කල් වහසල් කැරැලි මුදුන තේ

203 බඳ, බඳනාලද්දාවූ; දදලැල්, ධ්වජලතිකාවන්ගේ; පැහැරඳ, ප්‍රභාරාජීන්; දසඅතේ, දසදිගුන්හී; පැතිර, ව්‍යාප්තව; නඳ, ආනන්දකරවූ; සඳකැල්මෙන්, චන්ද්‍රකාන්තිය කාරණකොට ගෙන; දිලි ජ්වලිතවූ; කෙලෙස කුළුපුතේ, කෛලාසකූටය වැනිවූද; කොඳ, කුන්ද හා; සඳ, චන්ද්‍රයාසේ; කල්; සිත්කලුව; (කුන්ද හා චන්ද්‍රයා බඳුවූද යනු භාවයි) සුණුසම්, සුණුකර්මයෙන්; උදුල, උජ්ජ්වලිතවූ; පලබිතේ, ස්ඵටිකමාණික්‍යමය භිත්ති ඇත්තාවූද; වහසල්, ප්‍රාසාදයාගේ; කැරැලිමුදුනතේ, ශෘඞ්ගාග්‍රයෙහි; මඳ කල්; මදවේලාවක්; ඉඳ, ඉඳලා .–

204 ප හ ල සිතබ හිම හිමසෙල් මහිම හැ ර
ව න ල අහස්ගඟ රළවැල පැහැ පැහැ ම
අ ඹ ල කිරණ පෙණ*පෙළ දිසිසර බැහැ ර
උ දු ල පොහොය මළු සිරිසර බල වෙහෙ ර

204 සිතබ, ශ්වේතාභ්‍රය; හිම, තුෂාරය; හිමසෙල්, හිමාලය පර්වතය යන මොවුන්ගේ; පහල, (කවිසමයෙහි) ප්‍රකටවූ;

* පේණ පේළ ලේස සෝම වැ.ර.

මඟිම. මඟිමය හෙවත් ශ්‍රී විලාසය; හැර, බැහැරකොටද; අහස් ගඟ, ආකාශගඞ්ගාව; පිළිබඳවූ; වතළ; විස්තෘත; රළවැළ. තරඞ්ගාවලියෙහිවූ; පැහැ, ප්‍රභාවට; පැහැර, ප්‍රහාරදානය කොටද; (ප්‍රභාව පරදවා යනු භාවයි) කිරණ, ක්ෂීරසාගරයෙහි; අඹල, අව්‍යාප්තව; දිසි, දෘශ්‍යමානවූ; පෙණපෙළ, ඵේනාවලිය; බැහැරකර, බාහ්‍යකොටද; (ඵේනාවලිවිලාසයද දුරුකොටයයි සේයි) වෙහෙර, විහාරයෙහි; උඳුලි, උජ්ජ්වලිතවූ; පොහොය මළුසිරිසර, පෞෂධාගාර මාලක ශ්‍රීසාරය; බල, නිරීක්ෂණය කරව.

205 නිතොර රදන සඳරැස්ලෙස මුනි පුද ට
වි සි ර බැබළී මළු පැහැසර සතර පි ට
පැ හි ර අඹර සාඳුගෙන සිටිමෙන් අව ට
මි තු ර උඳුල මහවුර දුටුවෙයි සතු ට

205 සතරපිට, විහාරයාගේ සතරපැත්තෙහි; විසිර, විස්තීර්ණව; බැබළි, භ්‍රාජිතවූ;මළු, මාලකය පිළිබඳවූ; පැහැසර, ප්‍රභාසාරය; අඹර, නභොකුක්ෂියෙහි; පැතිර, ව්‍යාප්තව; අවට, හාත්පස්හි; කඳුගෙන, කඳුනැසී; (ගොඩගැසිනැසිසේයි) සඳරැස් ලෙස, චන්ද්‍රමරීචිසෙයින්; නිතොර, තොරනැතුව; රදන, රඤ්ජමානව; මුනිපුදට, බුඩපූජා පිණිස; සිටිමෙන්, සිටියාසේ; උඳුළ උද්දීප්තවූ; මහවුර, මහප්‍රාකාරය; දුටු, දක්නායකළහොත්; සතුටවෙයි, සන්තුෂ්ටිය වන්නේය.

විහාරයෙහි සතර පැත්තේ ව්‍යාප්තව භ්‍රාජමානවූ මාලක ප්‍රභාව අහසට නැගී අවට කඳුගැසී ශ්වේතවර්ණයෙන් නිරතුරුව බබළමින් බුඩපූජාව පිණිස සිටියාක්මෙන් බබළන මහාප්‍රාකාරය බලා තුටුවෙව යනු භාවයි.

206 ගු ව න් කුස පැතිරි රන්කැරැළි මිණිරැ සේ
ප ව න් වැද ලෙලෙන දදමිණි කිකිණි ගො සේ
ලෙවන් සතුටුකළ හිමගිරිකුළෙකා ලෙ සේ
ස ව න් මැඳුර බල දිලිහෙන උතුරුදෙ සේ

206 ගුවන්කුස, නභොකුක්ෂියෙහි; පැතිර, ව්‍යාප්තවූ; රන් කැරැළි, සෞවර්ණ ශෘඞ්ගයන්ගේ; මිණිරැසේ, මාණික්‍යකාන්ති ඇත්තාවූද; පවන්වැද, මාරුතස්පර්ශය ලැබ; ලෙලෙන, ලලිතවන්නාවූ; දද, ධ්වජයන්ගේ; මිණිකිකිණි ගොසේ, මාණික්‍යකිඞ්කිණිඝොෂය ඇත්තාවූද; ලෙවන්, ලොකවාසීන්; සතුටුකළ, තුෂ්ටිප්‍රාප්තකළාවූද; හිමගිරිකුළෙකාලෙසේ, හිමාලය පර්වතයසේ; උතුරුදෙසේ, උත්තරදිශායෙහි;දිලිහෙන, ජ්වලිතවන්නාවූද; සවන්මැඳුර, සම්බුඩ ප්‍රතිමාලය;බල, නිරීක්ෂනායකරන්.

207 න ර ණ + සතොබ සාළසඳ නොවල සේ යා
කි ර ණ + පිඩුව දිසි අමරස ලෙ සේ යා
දෙ ර ණ පසිඳු එවෙහෙර වම්දෙ සේ යා*
කි ර ණ විහිදි දහගැබ බල නො සේ යා

* පසේයා

207 නරණ, නාරායණයා හෙවත් ශ්‍රී විෂ්ණු දිව්‍යරාජයා; කිරණ, ක්ෂීරාර්ණවය; නොවලසේයා, අනලස්ව; සකොබකළ සද, ක්ෂොභයකළකල්හි; (කැළඹූකල්හි) පඩුව, පිණ්ඩභූතව; දිස්, දෘශ්‍යමානවූ; අමරසලෙසේයා, අමෘතරසය හා සමවූද; දෙරණිපසිඳු, ජගද්විඛ්‍යාතවූ; එවෙහෙර, තද්විහාරයෙහි; වම්දෙසේයා, වාමදිශාභාගයෙහි; කිරණවිහිදි, රශ්මි විහිදුවන්නාවූද; දහගැබ, චෛත්‍ය රාජයන්වහන්සේ; තොසේයා, සනෙතාෂයෙන්; බල, නිරීක්ෂණය කර.

නාරායණයා ක්ෂීරාර්ණව කැළඹූකල්හි පිඩුව එයින් නැගුණාවූ අමෘතය සදෘශවූ එම විහාරයෙහි වම්පස දුලන ධාතුගර්භය බලව යනු භාවයි.

පෙර විෂ්ණුදිව්‍යරාජයා ශ්‍රී කානතාව සෙවීමෙහි ලෞල්‍යයෙන් කිරිමුහුද සෙවිය යනු පුරාණ කථායි. එසේ කළඹනකල්හි මුහුදතුළ පැවැති ශ්වෙතවර්ණ අමෘතය පිඩුවී (එකම ගුළියක්වී) මුහුදින් නැංගේලු. මේ චෛත්‍යරාජයා එම අමෘතපිණ්ඩය වැනි කොටද මාලකය කිරිමුහුදවැනි කොටද දක්වූහයි දතයුතු.

208 විදු කිඳු  වැළඳි මුදුනත රැඳි කලඹකු  එ
උදු රැදු  කෙලෙස ගිරිකුළු පැහැසර† රුකු  එ
මුදු උ දු  ලත‡මනකල් සාබර ලකු  එ
සුදු රැදු  කඳිනුදුළ දුම්දුන් බල සහ  එ

208 විදුකිඳු, විද්‍යුත්රාජින් විසින්, වැළඳි, වැළඳගන්නාලද්දාවූ; කලබකුළු, කාලභ්‍රකූටයන්; රැඳි; රඤ්ජිතවූ; මුදුනත මස්තක ඇත්තාවූ; උදු, ඍජුවූ; රුදු, මහත්වූ; කෙලෙසගිරිකුළු, කෛලාසපර්වතකූටය පිළිබඳවූ; පැහැසර, ප්‍රභාසාරය; රුකුළු, (ප්‍රකාශ) කළාවූ; මුදු, මෘදුභාවයෙන් හෙවත් සෞම්‍යගුණයෙන්; උදුලන, උජ්ජ්වලිතවන්නාවූ; මනකල්, මනඃකල්‍යවූ; සාබර, ශාඛාභාරයෙන්; ලකුළු, අලඞ්කෘතවූද; සුදු රැදු, ශ්වෙතවර්ණයෙන් රඤ්ජිතවූ; කඳින්, ස්කන්ධයෙන්; උදුළු, උජ්ජ්වලවූද; දුම්දුන්, බොධිද්‍රුමරාජයා; සහළු, මිත්‍රය; බල, අවලොකනයකර.

විදුලිකොඳමල්ත් බබලන මෙඝයක් විසින් වැළඳගත් මස්තකය ඇතිවූ කෛලාශකූටශ්‍රීය වැනිවූද සෞම්‍යගුණයෙන් දුලනසිත්කලු ශාඛාභාරයෙන් සවලඞ්කෘතවූද ශ්වෙතවර්ණ කඳක් ඇති බොධිද්‍රුමරාජයා බලව යනු භාවයි.

රක්තවර්ණ විදුලි කොඳිඇති මෙඝය විසින් මුදුනෙහි වැළඳගන්නාලද කෛලාශකූටය රක්තවර්ණ දළු හා නීලවර්ණ පත්‍ර පඞ්ක්තියෙන් යුත් මුදුන ඇති ශ්වෙතවර්ණ බොධිද්‍රුමරාජයාට උපමිතකළහයි දතයුතු.

† පැහැසිරි-හැම  ‡ දලුනිල්-හැම

209 ප ත ඟ   කිරණ දුරුකළ දද ගළ   පා ය
ස ර ඟ   කවුළු බිම්බිතු පළ දුළ   පා ය
නි ස ඟ   බැබළි සුර පහ සිරිවෙළ   පා ය
බ ල ග!   උතුරුදිග විජයබ මහ   පා ය

209 දද, ධ්වජයන්; ගළපාය, ඝටනයකොට හෙවත් බන්ධනය කොට; පතඟ කිරණ, සූර්‍ය්‍යරශ්මිය; දුරුකළ, දුරීභූතකළාවූද; සරඟ, (මාණික්‍යයන්ගේ) මනාකාන්ති ඇතිවූ; කවුළු, කවාටය; බිම්, භූමිය; බිතු, භිත්තිය; පළ, ඡදන යන මොවුන්ගේ; දුළ, ප්‍රොජ්ජ්වලිතවූ; පාය, රශ්මිය කරණකොටගෙන; සුර පහ සිරි, ශක්‍රයාගේ ප්‍රාසාදයට; වෙළපාය, විඩම්බනයකොට; (නිගාකොට) නිසගබැබළි, නිසර්ගයෙන් බැබළුනාවූද; උතුරුදිග, උත්තර දිශා භාගයෙහිද; විජයබ මහපාය, විජයබාහු මහාප්‍රාසාදය; බලග!, නිරීක්ෂණය කරන්.

තවද ඒ විශුද්ධ ප්‍රසිද්ධ සමෘද්ධ විහාරයාගේ මේද එක් අසාධාරණ කාරණයකි:-යලිත් පිරිසුදුවූද ප්‍රසිද්ධවූද සම්පත්තියෙන් පරිපූර්ණවූද එම විහාරයෙහි මේත් ශ්‍රෙෂ්ඨතර කරුණක් වන්නේය.

210 එ ත ර ම්*   වෙහෙර තුළ තැන තැන සැපමි   ණි ය
සි ති ය ම   බණවසුන් විදහා අපම   ණි ය
සිත සොම්   නසින් සිහිකැරු කැරු බුදුගු   ණි ය
අ බි ද ම්   පෙළ අරුත් විමසන සඟග   ණි ය

210 එතරම්, තත්ප්‍රකාරවූ; වෙහෙරතුළ, විහාරාභ්‍යන්තරයෙහි; තැන තැන, තන්හි තන්හි; සැපමිණිය, සම්ප්‍රාප්තව හෙවත් රාශිභූතව; සිතියම්, චිත්‍රකර්ම කරන ලද; බණවසුන්, ධර්මපුස්තක වෙළුන වස්ත්‍රයන්; විදහා, මුක්තකොටගෙන; අපමණිය, ප්‍රමාණ රහිතවූ; බුදුගුණිය, බුද්ධගුණයන්; සිත සොම්නසින්, චිත්ත සන්තොෂයෙන්; සිහි කැරු කැරු, සමරණය කොටකොට; අබිදම් පෙළ, අභිධර්මපාල්‍යාගතවූ; අරුත්, අර්ථයන්; විමසන, විමංශනය කරන්නාවූ; මහසඟගණිය, මහා සඞ්ඝ සමූහයෙක.

211 උ තු රු   ගුණෙන්   සැපමිණි පිළිවෙත්   ම ග ය
ප තු රු   ව මි න්   සතවෙන මෙන් මහ   ශ ග ය
අ තු රු   ද හ න්   කෙරෙමින් සිව අව   ම ග ය
සු තු රු   ද හ ම්   පවසන සමහර   ස ග ය

*මතරම්-සමහර.

211 උතුරුගුණෙන්, ශ්‍රෙෂ්ඨතර ගුණය කරණකොටගෙන; පිළිවෙත් මඟය, ප්‍රතිපත්ති මාර්ගයට; සැපමිණ, සම්ප්‍රාප්තව; සත වෙත, සත්වයන් කෙරෙහි; මෙත්මහ ගඟය, මෛත්‍රීසඞ්ඛ්‍යාත මහා ගඞ්ගා ජලප්‍රවාහය; පතුරුවමින්, ප්‍රකාශකොට හරිමින්; සිව්අවමඟය, චතුර්විධ අපාය මාර්ගයන්; අතුරුදහන් කෙරෙමින්; අන්තර්ධාන කෙරෙමින්; සුතුරුදහම් පවසන, සූත්‍රපිටක ධර්මය හදාරන්නාවූ; සමහර සඟය, ඇතැම් සඞ්ඝයාය.

212 ස ම හ ර සුපිළිපන් සඟගණ වෙන වෙ න ය
පු ව ත ර අරුත් ටීකාගෙන වෙන වෙ න ය
පැ ණ ස ර ඇදුරු උවදෙස් බස් දැනගෙ න ය
නොම හැ ර ගැඹුරු තැන් විමසති විනය න ය

212 සුපිළිපන්, සුප්‍රතිපන්නවූ; සමහර, (එයින්) අන්‍යවූ; සඟගණ, සංඝ සමූහයා; වෙන වෙනය, වෙන් වෙන්ව; පුවතර අරුත්, ඉතා ප්‍රසිද්ධාර්ථ ඇත්තාවූ හෙවත් ගම්භීරාර්ථ යුක්තවූ; වෙන වෙනය ටීකාගෙන, පෘථක් පෘථක් ටීකාපොත් හැරගෙන; පැණ සර, ප්‍රඥාසාරවූ; ඇදුරු, ආචාර්යවරුන්ගේ; උවදෙස්බස්, උපදේශ වචනයන්; දැනගෙනය, පරිඥානයකර; විනයනය, විනය ක්‍රම පිළිබඳවූ; ගැඹුරුතැන්, ගම්භීර ස්ථානයන්; නොමහැර, ප්‍රතික්ෂෙප නොකොට; විමසති, පරීක්ෂණය කෙරෙත්.

213 ගැඹුරු නොයෙක තැන් පිළිවිස සිත් ලෙසි න
වෙහෙර ප සෙ ක ඉඳ සොඳ පොත්පත් රැගෙ න
නො හැ ර සල ක මින් සත්සඳ'රුත් † යෙදෙ න
හෙ ර ණ රැසෙ ක වියරණ වතපොත් කර න

213 සොඳ, සුන්දරවූ; පොත්පත්, පුස්තක හා පත්‍රිකාවන්; රැගෙන, ග්‍රහණයකොට; වෙහෙර, විහාරයාගේ; පසෙක, පාර්ශ්වයෙක්හි; ඉඳ, උපවේශයකොට; ගැඹුරු, ගම්භීරවූ; නොයෙක තැන්, නානා ස්ථානයන්; සිත්ලෙසින, චිත්තාභිලාෂ පරිද්දෙන්; පිළිවිස, ප්‍රතිපෘච්ඡනයකොට; යෙදෙන, යුක්ත වන්නාවූ; (ඒ ඒ තන්හි ගැලපී තිබෙන්නාවූ;) සත්, සංඥද; සඳ, සන්ධි; අරුත්, අර්ථයන්ද; නොහැර, පහනොකොට; සලකමින්, කල්පනාකෙරෙමින්; වියරණ වතපොත්කරන, ව්‍යාකරණ ශාස්ත්‍ර හදාරන්නාවූ; (පාඩම්කරන්නාවූ) හෙරණ රැසෙක, සාමණේර සමූහයෙක.

---

†යෙහෙණ

214 තිවු ණු* තැණින් කෙරෙමින් සැක නිවා රණ
පමු ණු වමින් එකිනෙක සමය කා රණ
දපු ණු සිතින් ඉඳ කරළ වෙහෙර පු රණ
බමු ණු රළෙසක වේද'රුත් කරන ද රණ

214 තිවුණු, තීක්ෂණවූ; නැණින්, ඥානමහිමයෙන්; සැක, ශඞ්කිතස්ථානයන්; නිවාරණකෙරෙමින්, දුරුකෙරෙමින්; එකිනෙක සමයකාරණ, එකින් එක ශාස්ත්‍ර යුක්තීන්; පමුණුවමින්, ප්‍රාප්තකෙරෙමින්; (ශඞ්කාවන් දුරුකොට ශාස්ත්‍ර යුක්ති පෙන්නා යනු භාවයි.) දපුණු සිතින්, ශාන්ත චිත්තයෙන් යුක්තව; වෙහෙර පුරණකරළ, විහාරයෙහි ගැවසීගෙන; ඉඳ, නිෂණ්ණව; වේදඅරුත්, වේදාර්ථයන්; දරණකරන, ධාරණය කරන්නාවූ; බමුණුරළෙසක, බ්‍රාහ්මණ සමූහයෙක.

215 පබා† තුරු ලෙසින් බොල්ලන් ගෙන නොම ද
තබා පෙළින් පෙල ඇද නිල් ††පලස මැ ද
බබා සෙද තැනින් තැන ගහ ගණින් බැ ද
පබා කර සිදත් සමහරු ගණිති ඉ ද

215 තුරුලෙසින්, තාරකාවන්ගේමෙන්; පබා, කාන්ති යුක්තවූ; නොමද, බොහෝවූ; බොල්ලන්, වරාටිකාවන්; ගෙන, ග්‍රහණයකොට; නිල්පලසමැද, නීලවර්ණ කම්බල මධ්‍යයෙහි; පෙළින් පෙළ, පඞ්ක්තියෙන් පඞ්ක්තිය; තබා, ස්ථාපිතකොට; ඇද, (ඔබි නොබ) ආකර්ෂණයකොට; ගහගණින්බැද, ග්‍රහසමූහයා පිළිබඳව; තැනින් තැන, තන්හි තන්හි; සෙද, වහවහා; බබා, භාගකොට කොට; සමහරු, (එයින්) අන්‍යයෝ; පබාකර සිදත්, සූර්‍ය්‍යසිද්ධාන්තය; ගණිති, ගණින්නාහ.

216 මුනි වි රු දෙසූ සදහම්මෙන් ඇම දව ස
උව දු රු දුරළර රකිනුව සත්වග වෙසෙ ස
පෙරළ දුරු ඉසිවරන් පැවසූ නොයෙක ලෙ ස
වෙද වරු වෙද සතර පිරුවති එහි සතො ස

216 මුනිවිරු, සර්වඥවීරයා විසින්; දෙසූ, දෙශනාකරනලද; සදහම්මෙන්, ශ්‍රී සද්ධර්ම පරිද්දෙන්; ඇමදවස, සෑම දවස්හි; උවදුරුදුරළර, උපද්‍රව දුරීභූතකොට; සත්වග, සත්ත්වසමූහයා; වෙසෙස, විශෙෂයෙන්; රකිනුව, රක්ෂාකරනු සඳහා; පෙරළදුරු ඉසිවරන්, පූර්වාචාර්‍ය්‍යවූ ඍෂිවරයන් විසින්; නොයෙක්ලෙස, අනේකප්‍රකාර යෙන්; පැවසූ, ප්‍රකාශකරණලද්දාවූ; වෙදසතර, වෛද්‍යශාස්ත්‍රය; වෙදවරු, වෛද්‍යවරයෝ; එහි, ඒ විහාරයෙහි; සතොස, සන්තුෂ්ටියෙන් යෙදී; පිරුවති, හදරන්නාහ.

---

*තියුණු. †සබා. ††පළඟ.

217 මනහර පොත් රැගෙන පරසිඳු පෙරපට න
එහි පද'අරු ත් කියනලෙස නොහැර දැනගෙ න
සු ර ගු රුව ත් උතුරු දෙම්හසි වනපොති න
සමහරු *වු ත් සතර පිරුවති නොයෙක තැ න

217 පෙරපටන, පූර්වයෙහි පටන්; පරසිද්ද, ප්‍රසිද්ධවූ; මනහර, මනොහරවූ; පොත්, (වෘත්තරත්නාකර වෘත්තොදයාදි) පුස්තක යන්; රැගෙන, ග්‍රහණයකොට; එහි, තද්ග්‍රන්ථයන්හිවූ; පදඅරුත්, පදාර්ථයන්; නොහැර, පහනොකොට; කියනලෙස, කථනයකරන පරිද්දෙන්; දැනගෙන, ජානනයකොට ලා; සුරගුරුවත්, සුරාචාර්යයාට උවත්; වනපොතින, හදරණ පුස්තකයෙන්; උතුරුදෙම් හසි, උත්තර දෙන්නෙමුයි; සමහරු, (එයින්) අන්‍යයෝ; වුත් සතර, ඡන්දඃ ශාස්ත්‍රයයි කථිතවූ වෘත්ත ශාස්ත්‍රය; නොයෙකතැන්, නානා ස්ථානයන්හි; (ඉඳගෙන) පිරුවති, හදුරන්නාහ.

218 සි රි ව ත් සොඳුරු එවෙහෙර තැන තැන ලකු ළු
ඉ ඳ සි ත් ලෙසට පෙර කිවියර සිරි රුකු ළු
දැ න ග ත් සඳ ලකර වියරණ වියත් මු ළු
ප ව ස ත් සකුමගද එළු දෙමළ කිවි න ළු

218 සිරිවත්, (ජනසමූහයා එලවන පූජාදියෙන්) ශොභා සම්පන්නවූ; සොඳුරු, (දර්ශනීයත්වයෙන්) මනඃකල්‍යවූ; ලකුළු, (ප්‍රාසාද තොරණ මාලකාදියෙන්) අලඞ්කෘතවූ; එවෙහෙර, තද් විහාරයෙහි; තැන තැන, පලින්පල; සිත්ලෙසට; චිත්තානුකූල ලෙසින්; ඉඳ, තිෂ්ඨණව; පෙර, පූර්වියවූ; කිවියර, (කුමාරදාස කාලිදාසාදි) කවිවරයන්ගේ; සිරි, ශොභාවිලාශය; රුකුළු, ප්‍රකාශ කොට; සඳ, ඡන්දොලක්ෂණද; ලකර, අලඞ්කාරද; වියරණ, ව්‍යාක රණද; දැනගත්, අවබොධකළාවූ; වියත් මුළු, ව්‍යක්ත ජනසමූ හයෝ; සකු, සංස්කෘත භාෂාය; මගද, මගධ භාෂාය; එළු, සිංහල භාෂාය; දෙමළ, දමිල භාෂා යන මෙයින් කරන ලද්දාවූ; කිවි නළු, කාව්‍ය නාටකයන්; පවසත්, ප්‍රකාශකරත්.

219 පෙර තොප නුදුටුවූ නොඇසූ මෙබඳු සිරිස ර
නෙත සිත සතු මු කැරැ දැක පවර එවෙහෙ ර
සු ද ස ම සි වි මු දන කොලහල තැවති ව ර
වැ ඳ තො ද ඉ මු මිතුර! වැඳ මුනි මැඳුර තු ර

219 පෙර, (මින්) පූර්වයෙහි; තොප, යුෂ්මත්හු විසින්; නුදුටුවූ, දර්ශනය නොකරනලද්දාවූ; නොඇසූ, ශ්‍රවණය නොකරනලද්දා වූද; මෙබඳු, මේ උක්තප්‍රකාරවූ; එවෙහෙර, තද් විහාරවරයෙ

†වත්සතර සමහර.

හිවූ; පවරසිරිසර, ප්‍රවරවූ ශ්‍රීසාරය; දැක, දර්ශනයකොට; නෙතසිත, චිත්තනෙත්‍රයන්; සතුටුකැරූ, සන්තුෂ්ටකර; පුදයට, පූජාපිණිස; පිවිටුදන, ප්‍රවිෂ්ටවූ ජනසමූහයන්ගේ; කොලහල, පූජාකලබලය; නැවතිවර, නිවෘත්තවූ කල්හි; ඉටුමිතුර!, ප්‍රිය මිත්‍රය!; තොද, පුණමත් තෙමේද; මුනිමැඳුරුතුර, බුද්ධප්‍රතිමාලයාභ්‍යන්තරයට; -වැද, ප්‍රවිෂ්ටව; වැද, ප්‍රණාමයකොට:-

220 ලකරද ඉසුරු ලද-දද කැලණිතිස් මහරද
සව රද වරද නතුලෙස නොදැන පිරිසි දේ
නිවරද වරද යතිඳුට වරද කලස දේ
†කිපියෙන් සුරන් සිත්-සිඳුඑන වෙරල මැඩගෙන
නිසා මෙලක සෙත එම මුහුද පැහැම වූ
දිසා පිළිම රුව දැක සක්දෙවිඳු මැ වූ
රුදුව සෙනඟ ගෙන ආ වසවතු යුද ට
මුදු ව බිණු තෙපලෙන් ජයගෙන ලොව ට
බුදු ව නොයෙක් සෙත්කල අප මුනිසඳු ට
වඳු ව අදර බැතිපෙම්සිත් *දිවුණුකො ට

220 ලකරද ඉසුරු, ලඞ්කාරාජ්‍යශ්‍රිය; ලද, ලද්දාවූ; දද, මුග්ධවූ; කැලණිතිස් මහරද, කල්‍යාණිතිස්ස නම්වූ මහාරාජයා; වරද, යුවරාජයාගේ; සවරද, සාවද්‍යය; නතුලෙස, නත්වූ පරිද්දෙන්; පිරිසිදේ නොදැන, පරිච්ඡින්නව ජානනය නොකොට; නිවරද, නිරවද්‍යවූ; වරද, ශ්‍රෙෂ්ඨ නිර්වාණ දෙන්නාවූ; යතිඳුට, (රහත්) යතීන්ද්‍රයන්වහන්සේට; වරදකලසඳ, දඬුයම් පැමිණවූ කල්හි හෙවත් උණු තෙල්සැලෙහි දම්මවා මැරවූකල්හි; සුරන්, (ලඞ්කාසංරක්ෂණාසක්ත) දෙවියන්ගේ; සිත්, චිත්තය; කිපියෙන්, කුපිතවූ හෙයින්; සිඳු, සමුද්‍රය; වෙරලමැඩගෙන, වෙලාන්තය ඉක්මවා; එන, එනකල්හි; (ගලාඑන කාලයයි සේයි) මෙලක, මේ ශ්‍රී ලඞ්කාවීපයට; සෙත නිසා, ශාන්තිකරනු සඳහා; සක්දෙවිඳු, ශක්‍රදෙවේන්ද්‍රයා විසින්; එම මුහුදු පැහැමවූ, ඒ සමුද්‍රයාගේම වර්ණයෙන් යුක්තකරන ලදුව; මැවූ, නිර්මාපිතවූ; දිසාපිළිමරුව, එනම් ප්‍රතිමාරූපය; දැක, අවලොකනයකොට; රුදුව, (කෝපයෙන්) රෞද්‍රව; සෙනඟගෙන, සේනාවන් ග්‍රහණයකොට; යුදට ආ, යුද්ධය පිණිස පැමිණියාවූ; වසවතු, වසවර්තිමාරයා; මුදුවබිණු තෙපලෙන්, මෘදුකොට ප්‍රකාශිත වචනයෙන්; ජයගෙන, ජයග්‍රහණය කොට; බුදුව, බුද්ධත්වයට පැමිණ; ලොවට නොයෙක් සෙත්කල, ලොකයාට නානාවිධ ශාන්තිකලාවූ; අප මුනිසඳුට, අපගේ සර්වඥරාජයාට; අදරබැති පෙම්සිත්, ආදර භක්ති ප්‍රේම චිත්තය; දිවුණුකොට, වෘද්ධිකොට; වඳුව, ප්‍රණාමයකරන්.

---

†කිරියෙන් සමහර. *දිසුණුකොට.

ලක්දිව කල්‍යාණතිස්ස රජහු රාජ්‍යයකරන කල්හි යුවරජ තෙම රාජදේවිය හා පිළිබඳ සිත් ඇතිව විසීය. එපවත් එරජ දත් කල්හි බියපත්වූ ඒ යුවරජතෙම පලා ගොසින් බැහැර වසනුයේ ඒ මෙහෙසිය සිහිකොට පුරුෂයකුට සිවුරු හඳවා රහස් ලියුමක් දී දේවියවෙත යැවීය. එකල්හි රජගෙයි දිනපතා වළඳන රහතන් වහන්සේ නමක් දිනපතාම වඩනේය. රජමාළිගයට වඩනා එම රහත් තෙරුන් හා සමග රජගෙට වැද වළඳා අනනයෙහි රජුද රහත් තෙරුන්වහන්සේ සමග පළමුව ගියකල්හි ඒ සොර පැවිද්දා එම රහස් ලේඛනය දේවියට පෙණෙන ලෙස බිම දැමීමේය. එවිට ලේඛනයද ශබ්දනගා බිම වැටුණේය. රජද එම ශබ්දයෙන් ආපසු හැරී බලා ලියුම දැක රැගෙන යලිදු බලා රහත් තෙරුන් කෙරෙහි කිපියෙන් එම තෙරුන් හා සොර පැවිද්දාද මරවා මුහුදට දැම්මවීය. ඒට කිපියාවූ දේවියෝද මුහුද ගොඩට ගලා යවා ජනයන් සහිත සියලු වස්තූන් දියෙන් යටකලෝය. එවිට බියපත් එම රජතෙමේ තමාගේ ශුඬ ගුණ වෘතත ඇති කුමරිය රන්තලියක බහා මෙහි කුමාරිකාවෙකැයි සැළිය මතුයෙහි අකුරු ලියා මුහුදට දැම්මෙව්වේය. එවිට ශක්‍රතෙමේ ලඬකාවට සෙත්කරනු පිණිස එම සමුද්‍රවණීවූ මාණික්‍යයකින් පිළිමයක් මවා පැකල්හි මුහුද ගැලීයාම නැවතුනේය. එම තලියෙහි බහා මුහුදේ යැවූ කුමාරිකා තොම මාගම් පුරයට දෙවියන්ගේ ආරක්ෂායෙන් ගොස් මාගම්පුරවරයෙහි කිරින්දනම් ගමෙහිවූ වෙරළට පාවිය. කාවන්තිස්ස රජතෙම එපවත් දැන ගෙන්වා බලා ප්‍රාසාදයට පැමිණ අභිෂෙක කොට අග්‍රමෙහෙසිකාවක් කොට පාවා ගත්තේය.

221 ම හ ත සසර සයුරෙහි කුමුඹුව සර ත
අ න ත සත නිවන්පුර ගෙනයන සිති ත
ස ත ත සොඳුරු බුදුකුරු ගුණදම් පූර ත
දි ය ත පසිඳු නතිඳුණ් දැක ගොස් සොබ ත

221 මහත, මහත්වූ; සසර සයුරෙහි, සංසාර සාගරයෙහි; කුමූටුව; නිමග්නව; සරත, සඤ්චාරය කරන්නාවූ; අනනසත, අනන්ත සත්වයන්; නිවන්පුර ගෙනයන සිතින, නිර්වාණපුරයට පමුණුවන අදහසින්; සතත, අනවරතයෙන්; සොඳුරු බුදුකුරු ගුණදම්, සුන්දරවූ බුද්ධාඞකුර ගුණධර්මය; පුරත, පූරණය කරන්නාවූ; දියත පසිඳු, ජගද්ව්‍යාපි කීර්ති ඇත්තාවූ; සොබත, සොභනවූ; නතිඳුන්, නාථදේවයා; දැක, අවලොකනයකොට; ගොස්, ප්‍රයාණය කොට–

222 ජ ව ර රුසිරු මහසැ සමග බෝනු රැ
නො හැ ර නැමද බැතිපෙම් සිතිනි විසිනු රැ
වෙ හෙ ර පුද පසගතුරු රැව තොදෙනනු රැ
මි තු ර! තොසින් වැද සැදි පහතුරු සොඳු රැ.

222 පවර, ප්‍රවරවූ; රුසිරු, සිත්කලුවූ; මහසෑ සමඟ, මහා චෛත්‍ය රාජයා සමගින්; බෝතුරු, බොධිද්‍රැමරාජයා; නොහැර, අත්නොහැර; විසිතුරු, විචිත්‍රවූ; බැතිපෙම්සිතිනි, භක්තිප්‍රෙම යුක්ත චිත්තයෙන්; නැමද.. ප්‍රණාමයකොට; වෙහෙර, විහාර යෙහි; පුදපසඟතුරුරැව්, පූජා පඤ්චාඞ්ගිකතූර්‍ය්‍ය රාවය; නොදෙ නතුරු, දුනය නොකරනතාක්; සොඳුරු සුන්දරාකාරයෙන්; සැදි, සජ්ජිතවූ; පහතුරු, (විජයබාහු) ප්‍රාසාදයාගේ අනන්තරයට; මිතුර! මිත්‍රය!; තොසින්, සන්තොෂයෙන්; වැද, ප්‍රවිෂ්ටව:-

223 †කඳවුරු කුල පහන්-දලනිඳු ලකල මුදලිඳු
පිවිතුරු උතුරු මුලමහ තෙරිඳුට සොඳු රු
මුනුබුරු මහරු ගුණසරු පිළිවෙත් ගැඹු රු
කිවිකැල මුදුන් මල්-කළ තම තෙපුල් හැමකල
මනරම් මුනිසසුණ් වැඩපිණිස නිකැස ල
පැරකුම් රජ විසින් සුත පෙමිනි ඇතිකළ ල
සිරිබර මෙසිරි ලකගන පැලඳි පිරිසු දු
පුවතර මහවෙහෙර වැසි තෙරගණ සිනි දු
මනහර රුවණ්වැල මැද බඳමිණික් බ දු
නමකර පවර විජයබ පිරුවන් තෙර් දු

223 කඳවුරුකුල, සකන්ධාවාරවංශ නැමැති; පහන්, ප්‍රසාද ජනකවූ; දලනිඳු, සමුද්‍රරාජයා; ලකල, මනොඥ කළාවූ; මුදලිඳු, මෙරුපර්‍ව්‍වතාකාරවූද; පිවිතුරු,(ශීලව්‍රතාදියෙන්)පවිත්‍රවූ, සොඳුරු, සුන්දරවූ; උතුරුමූල මහතෙරිඳුට, උත්තරමූල මහාස්ථවිරතුමන්ට; මුනුබුරු, නප්තෘවූද; මහරුගුණ, මහාර්ඝගුණයෙන් හා; ගැඹුරු පිළිවෙත්, ගම්භීර ප්‍රතිපත්තියෙන් හෙවත් ශ්‍රෙෂ්ඨ ව්‍රතසමාචරණ යෙන්; සරු, ශ්‍රෙෂ්ඨස්ථානයෙහි සිටියාවූද; තම, තමන්ගේ; තෙ පුල්, (ශාස්ත්‍රානුගත) වචනයන්; හැමකල, සැමකල්හි, කිවිකැල, කවිසමූහයාගේ; මුදුන්මල්කළ, මූර්ධමාල්‍යයක් කළාවූද; මනරම්, මනොරම්‍යවූ; නිකැසල, නිර්මලවූ; මුනිසසුන් වැඩපිනිස, සම්බුද්ධ ශාසනාභිවෘද්ධිය සඳහා; පැරකුම් රජවිසින්, පරාක්‍රමබාහුනරෙන්ද්‍රයා විසින්; සුතපෙමිනි, පුත්‍රප්‍රෙමයෙන්; ඇතිකළ, සංවර්ධනය කරන ලද්දාවූද; සිරිබර, ශ්‍රීභාරවූ; මෙසිරිලකගන, මේ ශ්‍රී ලඞ්කාඞ්ගනාව විසින්; පැලඳි, පිලන්ධිතවූ; පිරිසුදු, පරිශුද්ධවූ; පුවතර, ප්‍රසිද්ධවූ; මහවෙහෙරවැසි, මහා විහාරවාසිවූ; තෙරගණ, ස්ථවිර සමූහයා නැමැති; සිනිදු, ස්නිග්ධවූ; (සෞම්‍යගුණ යුක්තවූ;) මන හර රුවන්වැල, මනොඥ රත්නාවලියගේ; මැද, මධ්‍යයෙහි; බඳ මිණක්බඳු, සවිත මාණික්‍යයක් වැනිවූද; පවර, ශ්‍රෙෂ්ඨවූද; විජ යබපිරිවන් තෙරිඳු, විජයබාහු පරිවෙණාධිපති ස්ථවිරයන් වහ න්සේ; නමකර, ප්‍රණාමයකරන්.

†කඳවුරුනාගම්කුල.

තවද දශවිධ ප්‍රඥපාටව ප්‍රශස්තතර ත්‍රිපිටක වාගීශ්වර ශ්‍රී සඞ්ඝබොධි විජයබාහු පරිවෙණාධිපති සර්වඥොත්තමයාගේ මේද එක් වර්ණනාභාෂනයෙක. එද තා කර්ණ භූෂණයකර.

යළිත් දශවිධ ප්‍රඥපාටවය කාරණකොටගෙන ප්‍රශස්තතරවූද ත්‍රිපිටක වාගීශ්වරවූද විජයබාහු පරිවෙණාධිපති සර්වඥොත්තම යාගේ මේත් එක් වර්ණනා කථනයෙකි. ඒද තා කන්හි පැළඳ ගත්තාවූ ආභරණය කරත්.

224 ගැ ඹු රු  බිදම්පෙළ කිරි සයුර ඇම වි  ට
සො දුරු  නුවණ මෙර පහරින් සකොබකො  ට
මි යු රු  පද අරුත් අමගෙන දෙන ලොව  ට
කා වු රු  සදිසිවෙද† මෙකලට එයතිඳු  ට

224 ගැඹුරු, ගම්භීරවූ; අබිදම්පෙළ, අභිධර්මපාළි නැමැති; කිරිසයුර, ක්ෂීරාර්ණවය; සොඳුරු, සුන්දරවූ; නුවණ, බුද්ධි නැමැති; මෙර පහරින්, මෙරුමථනයෙන්; ඇමවිට, නිරන්තරයෙන්; සකොබකොට, ක්ෂොභයකර හෙවත් අලලා; මියුරු, මධුරවූ; පද අරුත්, පදාර්ථ නැමැති; අම, අමෘතය; ලොවට, ලොකයාට; ගෙන දෙන, ඇරගෙන දෙන්නාවූ; එයතිඳුට, ඒ යතීන්ද්‍රයාට; කවුරු; කවරෙක්; මෙකලට සදිසිවෙද, මෙකල්හි සදෘශ වන්නේද; (නො වන්නේමැයි.)

225 වි හි ගු ම්  නොයෙක් දිටු සකිලිටු ගිම් පිහි  ට
දෙන තුම්  සග පවග සිරිපල මුළු ලොව  ට
න ර ද ම්  සැරි සුතුරුදම් තුඟු සුරතුර  ට
ම න ර ම්  ඔහු නුවණ දෙරනම විය පිහි  ට

225 විහිගුම්; විස්තීර්ණවූ; නොයෙක්දිටු, නානාවිධ දෘෂ්ටි නැමැති; සකිලිටු, ශංකලිෂ්ටවූ; ගිම්, ග්‍රීෂ්මාපහරණයට; පිහිට; ප්‍රතිෂ්ඨාස්ථානවූද; උතුම්, ශ්‍රෙෂ්ඨවූ; සගපවගසිරි, ස්වර්ගාපවර්ග සම්පත් නැමැති; පල, ඵලජාතියන්; මුළුලොවට, සමස්ත සත්ත්වයා හට; දෙන, ප්‍රදානය කරන්නාවූද; නරදම්සැරි, නරදම්‍යසාරථිවූ සර්වඥයන් වහන්සේගේ; සුතුරුදම්, සූත්‍රධර්ම නැමැති; තුඟු, උත්තුඞ්ගවූ; සූරතුරට, කල්පවෘක්ෂයාගේ රූදීමට; ඔහු, ඒ යතීන්ද්‍රයාගේ; මනරම්, මනොරම්‍යවූ; නුවණදෙරණම, ඥාන නැමැතිධරණියම; පිහිටවිය, ප්‍රතිෂ්ඨාස්ථානයක්විය.

226 *මු නි ව ර  සසුන් ඔහිමබලෙහි කල තඳ  න
ම න හ ර  විනය පද'රුත් මහම්ණි තඳ  න
පෙ රැ දු ර  නු'ව දෙසින් ලැබ නැණ පතලව  න
ගෙන නැර  දෙමින් ‡කරවයි යතිගණ තඳ  න

---

†සදිසිවෙති. ඇතැම්. *මූනිරද. ‡යතිගත කරවයි.

226 මුනිවර සසුන්, සර්වඥරාජයාගේ ශාසනතැමැති; මිහිමඩලෙහි, පෘථිවීමණ්ඩලයෙහි; නදනකළ, නිධානගතකළාවූ; මනහර, මනොඥවූ; විනයපදඅරුත්, විනයපදාර්ථතැමැති; මහමිණි, මහාමාණික්‍යයන්; නදන, නන්දනීයවූ; පෙරදුරන් උවදෙසින්, පූර්වාචාර්‍ය්‍යයන්ගේ උපදෙශාශ්‍රයෙන්; පතළවතනැණ, ව්‍යාප්තවූ ප්‍රඥයෙන්; ලැබ, ලබ්ධව; ගෙනහැර දෙමින්, ග්‍රහණය කොට ප්‍රකාශකෙරෙමින්; යතිගණ, යතිසමූහයා; නදනකරවයි, සන්තුෂ්ට කරවන්නේය.

227 ස ත ර  පහළකළ ඇදුරන්සෙ පො — රණය
නොහැර  සිතසෙ දනගෙන *අටවිය — රණය
ප ව ර  පබඳ බැඳ සඳ සතොස ක — රණය
නිතො ර  පසිඳු කරවිය සියලුදෙ — රණය

227 පොරණය, පුරාණයෙහි; සතරපහළකළ, ශාස්ත්‍රප්‍රකාශ කළාවූ; ඇදුරන්සෙ, ආචාර්‍ය්‍යවරයන් සෙයින්; නොහැර, ශෙෂ නොකොට; අටවියරණය, අෂ්ටවිධ ව්‍යාකරණයන්; සිතසෙ දන ගෙන, සිත්වූපරිද්දෙන් ජානනයකොට; සඳ, චිත්තය; සංතොස කරණය, සන්තුෂ්ටකරන්නාවූ; පවර පබඳබැඳ, ශ්‍රෙෂ්ඨවූ ප්‍රබන්ධ ග්‍රථිතකොට; සියලු දෙරණය, සකලධරණීතලයෙහි; නිතොර පසිඳුකරවිය, අනවරතයෙන් පහළකරවිය.

නොහැර සිතසෙ දනගෙන අටවිය — රණය

අෂ්ටවිධවූ ව්‍යාකරණ ග්‍රන්ථ මෙසේවිය එනම්:—

ඉන්ද්‍රශ්චන්ද්‍රඃ කාශකෘත්ස්නාපිශලිඃ ශාකටායනඃ
පාණින්‍යමරජෛනෙන්ද්‍රා ජයන්ත්‍යෂ්ටාදි ශාබ්දිකාඃ.

ඉන්ද්‍රාචාර්‍ය්‍යය, චන්ද්‍රාචාර්‍ය්‍යය, කාසකෘත්ස්නාචාර්‍ය්‍යය, ආපිශලිආචාර්‍ය්‍යය, ශාකටායනාචාර්‍ය්‍යය, පාණිනිආචාර්‍ය්‍යය, අමරාචාර්‍ය්‍යය, ජෛනෙන්ද්‍රාචාර්‍ය්‍යය යන මොහු මහාවෛයාකරණ කර්තෘවර යෝ වෙත්.

228 ස ස ම ය  සතරසිඳුඅගසිසි කරත — ලය
අ ය ම ය  සපිරි සිරි සුදු ගුණ ඇමස — ලය
මෙ සමය  පසිඳු දියතෙගි එගිම් තෙප — ලය
වි ස ම ය  ඇඳුරු තුරු උදුරන සැඩන — ලය

228 සසමය, ෂඩ්විධ සමයතැමැති; සතරසිඳු, චතුඃසාගර යට; අගසිසි, අගස්ති සෘෂිහුගේ; කරතලය, පාණිතලය බඳුවූද;

*සයවියරණය ඇතැම්.

අසමය, අසදෘශවූ; පිරිසුදුගුණ, පරිශුඬ ගුණය කරණකොටගෙන; ඇමකලය, සැමකල්හි; සපිරි, පරිපූර්ණවූද; මෙසමය, මේ කාල යෙහි; දියතෙහි පසිදු, ලෝකයෙහි ප්‍රසිඬවූ; එහිමිතෙපලය, ඒ ස්වාමිහුගේ වචනයතෙම; විසමය, විෂමවූ; (ප්‍රතිවිරුඬවූ) ඇදුරු, ආචාර්‍ය්‍යයන් නැමැති; තුරු, වෘක්ෂයන්; උදුරණ, උඬරණයකරන් නාවූ; (මූලෝඬරණයකොට හරින්නාවූ) සැඩනලය, චණ්ඩනාල යෙකි.

229 ඡේ පිරි යත් මහකව් දැනගෙන යෙහෙ න
සේ සිරි පත් කොඳ සඳ යස රැස සොබ න
පෑදියකොත් බඳවා දියතෙහි නිති න
ඒ සි රි ව ත් * හිමිසඳු වැජඹෙයි † නඳ න

229 සේ, ඡේකයන්ගේ; මහකවි, මහාකාව්‍යයන්; පිරියත්, අවසන්කොට; යෙහෙන, යහපත් සේ; දැනගෙන, පරිඥානය කොට; සිරිපත්,ශ්‍රීසම්පන්නාවූ; කොඳසඳසේ, කුන්ද හා චන්ද්‍රයා පරිද්දෙන්; සොබන, ශොබනවූ; යසරැස, කීර්ත්තිකදම්බය; දියතෙහි, ලෝකයෙහි; දියකොත්බඳවා, ජයධ්වජයන්බන්දවා; නිතින, නිරන්තරයෙන්; පෑ, ප්‍රකාශකළාවූද; නදන, සන්තුෂ්ටිකරවූ; ඒ සිරිවත් හිමිසඳු, ඒ ප්‍රඥශ්‍රීසම්පන්න ස්වාමීන්ද්‍රතෙම; වැජඹෙයි. විජෘම්භමාණවේ.

230 ප සි දු රුසිරු සරසවිලිය රැඳි නිතො ර
කි වි දු සවන් බිඟුවැල තුටුකල නොහැ ර
පු බු දු සොඳුරු ඔහු මුවනඹරට පව ර
සි නි දු සුවඳ මුවරදමය සඳලක ර

230 පසිදු, ප්‍රසිද්ධවූ; රුසිරු,සිත්කළුවූ; සරසවි ලිය, වාග්වනිතාව විසින්; නිතොර, අනවරතයෙන්; රැඳි, රඤ්ජිතවූද; කිවිදු කවීන්ද්‍රයන්ගේ; සවන්, ශ්‍රවණ නැමැති; බිඟුවැල, භෘඞ්ගාවලිය; නොහැර, පහනොකොට; තුටුකල, සන්තුෂ්ටකළාවූද; පුබුදු, ප්‍රබුද්ධවූද; සොඳුරු, සුන්දරවූද; පවර, ශ්‍රේෂ්ඨවූද; ඔහු මුවනඹරට, ඒ යතීන්ද්‍රයාගේ මුඛතාමරසයට; සඳලකර, ඡන්දලඞ්කාරය; සිනිදු, ස්නිග්ධවූ; (මෘදුවූ) සුවඳ මුවරදමය, සුගන්ධ මකරන්දය වැයි.

231 නි ව ව කසුබු ඉසි සුරගුරුවන් සුබ ද
ලොවට කලණ ඒ යති සඳුගේ නොව ද
සු ම ට වදන් දුල විසිතුරු මහමුහු ද
ද ස ට පොරණ රළපනරින් පිරිනිබ ද

* යතිහිමි. † බබලයි.

231 තිවට, මහාබ්‍රහ්මයා; කසුබුඉසි, කාශ්‍යපඍෂිහුය; සුරගුරු, වෘහස්පති යන මොවුන් හා; වන්, සදෘශවන්නාවූ; සුබද, අතිභද්‍රවූ; ලොවට කලණ, ලොකයාට කල්‍යාණවූ; ඒ යතිසඳුගේ, ඒ යතීන්ද්‍රයාගේ; නොමද, අමන්දවූ; සුවට, අතිශලිෂ්ටවූ; වදන්, වචන නැමැති; දුල, ජ්වලිතවූ; විසිතුරු මහවුහුද, විචිත්‍රවූ මහාසමුද්‍රය තෙම; දසව පොරණ, අෂ්ටාදශ පුරාණ නැමැති; රළපතරින්, තරඞ්ගවිස්තීර්ණත්වයෙන්; තිබද, අතරනැතිව; පිරි, පරිපූර්ණවිය.

මේ කවෙහි සඳහන්වූ අෂ්ටාදශ පුරාණයන්ගේ හා එහි විශෙෂ විභාග සැකෙවින් මෙසේයි. එනම්:—

සර්ගශ්ච ප්‍රතිසර්ගශ්ච වංශො මන්වන්තරාණිච
වංශානු චරිතඤ්චෛව පුරාණං පඤ්ච ලක්ෂණම්.

පුරාණ වනාහි පරිච්ඡේදද, භාගකළාවූ කුඩාපරිච්ඡේදද, පරම්පරාද, මන්වන්තර හෙවත් කාලභෙදද, වංශයන්ගේ පරිපාටියද යන මේ ලක්ෂණ පඤ්චකායක විශෙෂ ප්‍රකාශවේ. පුරාණ නම්ලත් ග්‍රන්ථ ලක්ෂණ යථොක්ත ශ්ලොකයෙන් ප්‍රකාශිතයි. මේ නාමයෙන් ඇත්තාවූ මුල්පොත් දහඅට මෙසේයි.

බ්‍රාහ්මං පද්මං වෛෂ්ණවඤ්ච ශෛවං භාගවතං තථා,
අථාන්‍ය නාරදීයඤ්ච මාර්කණ්ඩෙයඤ්ච සප්තමම්.
ආග්නෙයමෂ්ටමඤ්චෛව භවිෂ්‍යං නවමං තථා,
දශමං බ්‍රහ්ම වෛවර්තං ලෛඞ්ග මෙකාදශංස්මෘතම්
වාරාහං ද්වාදශඤ්චෛව ස්කාන්දඤ්චාත්‍ර ත්‍රයොදශම්,
චාතුර්දශං වාමනඤ්ච කෞර්මංපඤ්ච දශං ස්මෘතම්,
මාත්ස්‍යඤ්ච ගාරුඩඤ්චෛව බ්‍රහ්මාණ්ඩඤ්ච තතඃ පරම්.

1 ශ්ලොක දශදහකින් යුක්තවූ බ්‍රහ්ම පුරාණය. 2. ශ්ලොක 50000 කින් යුත් පද්මපුරාණය 3 ශ්ලොක 23000 කින් යුත් විෂ්ණුපුරාණය. 4. ශ්ලොක 24000 කින් යුක්තවූ ශිවපුරාණය. 5. ශ්ලොක 15000 කින් යුත් භගවත් පුරාණය. 6. ශ්ලොක 25000 කින් යුක්තවූ නාරදපුරාණය. 7. ශ්ලොක 9000 කින් යුත් මාර්කණ්ඩයපුරාණය. 8 ශ්ලොක 16000 කින් යුක්තවූ අග්නිපුරාණය. 9. ශ්ලොක තුදුස් දහස් පන්සියයකින් යුක්තවූ භවිෂ්‍යපුරාණය. 10. ශ්ලොක 16000කින් යුත් බ්‍රහ්මවෛවර්තපුරාණය. 11 ශ්ලොක 11000 කින් යුත් ලිඞ්ගපුරාණය. 12. ශ්ලොක 24000 කින් යුත් වාරාහපුරාණය. 13 ශ්ලොක අසූඑක්දහස් එක්සියයකින් යුක්තවූ ස්කන්දපුරාණය. 14. ශ්ලොක දශදහසකින්යුත් වාමණ පුරාණය. 15. ශ්ලොක 17000 කින් යුත් කූර්මපුරාණය. 16. ශ්ලොක

20000 කින් යුත් මත්ස්‍යපුරාණය. ශ්ලොක 19000 කින් යුත් ගරුඩ පුරාණය. 18. ශ්ලොක 12100 කින් යුත් බ්‍රහ්මාණ්ඩපුරාණය යන මොව්හු අෂ්ටදශ පුරාණනම් වෙත්.

232 අ ව ට  ඉදිත පඬිවරුනටද අබද  නී
ස ත ට  සතුටුවන ලෙද පද'රුන් සෙහෙ  නී
රු වට  කියන පෙර ඇදුරන් ලෙස නිති  නී
*ඔ හු ට  දසට විදුතැන් විය සිය පවෙ  නී

232. අබදනි, අධිජානුකව; අවටඉදිත, හාත්පස තිෂණ්ණවූ; පඬිවරුනටද, පණ්ඩිතවරයන්ගේද; සිතට, චිත්තයට; සතුටුවන ලෙද, සන්තුෂ්ටියවන පරිද්දෙන්; සෙහෙනී, යහපත් ආකාර යෙන්; අරුත්පැ, අර්ථයන් ප්‍රකාශකොට; පෙර ඇදුරන්ලෙස, පූර්වාචාර්‍ය්‍යයන් පරිද්දෙන්; නිතිනී, නිරන්තරයෙන්; රුවට, ශොභාන්විත විලාසයෙන්; කියන, කථනයකරන්නාවූ; ඔහුට, එම විජයබාහුපරිවෙණාධිපති යතින්ද්‍රයාණන් වහන්සේට; දසටවිදු තැන්, අෂ්ටාදශ විද්‍යාස්ථානයෝ; සියපවෙනිතැන්විය, ස්වීයප්‍රවෙණී සමානයයි විය.

" ඔහුට දසට විදුතැන්විය සිය පවෙ  නී"

අෂ්ටාදශවිද්‍යා හෙවත් ශිල්ප මෙසේයි. එනම්:— 1 ඍග්වේදය, 2. යජුර්වේදය, 3. සාමවෙදය, 4. අථර්වවෙදය යන මෙකී සිව්වේදසතරද, 5, ඍග්වේදයට උපවෙදයවූ ආයුර්වේදය, 6. යජුර්වේදයට උපවෙදයවූ ධනුර්වේදය, 7. සාමවෙදයට උපවෙදයවූ ගන්ධර්වවෙදය. 8. අථර්වවෙදයට උපවෙදයවූ ස්ථාපත්‍යය වෙදය, 9. ශික්ෂාය, 10. ඡන්දස්ය, 11 ව්‍යාකරණය, 12. නිරුක්තිය, 13. ජ්‍යොතිශය, 14. කල්පය. 15. පුරාණය, 16. මීමාංසාය, 17. න්‍යායය, 18. ධර්මය යන මොව්හු අෂ්ටාදශවිද්‍යානම් වේ. මෙය ඇතැම් ග්‍රන්ථයන්හි මීට වෙනස් ලෙසද පෙනෙන්ට තිබේ

2:3 නො සි  කරන මිසදිටුවන් බස් අබ  ද
නි සි  නැණැති සිරිපැරකුම් රජුට සො  ද
ර සි  ගැඹුරු නොපුලෙස සැකහැර පසි  ද
දෙ සි  සුවාසූ දහසක් දහම් සා  ද

233. මිසදිටුවන්, මිථ්‍යාදෘෂ්ටි ජනයන්ගේ; අබදබස්, අසම්බන්ධ වචනයන් හෙවත් ප්‍රතිවිරුඬ වචනයන්; නොසිකරන, නොප

* මේහට මුද්‍රිත පොතේ නොමැතියි.

20000 කින් යුත් මත්ස්‍යපුරාණය. ශ්ලෝක 19000 කින් යුත් ගරුඩ පුරාණය. 18. ශ්ලෝක 12100 කින් යුත් බ්‍රහ්මාණ්ඩපුරාණය යන මොව්හු අෂ්ටාදශ පුරාණනම් වෙත්.

232 අ ව ට ඉඳින පඬිවරුනටද අඬදූ නී
සි ත ට සතුටුවන ලෙද පද'රුත් සෙහෙ නී
රු ව ට කියන පෙර ඇදුරන් ලෙස නිති නී
*ඔ හු ට දසට විදුනැන් වියසිය පවෙ නී

232. අඬදූනි, අධිජාතුකව; අවටඉඳින, හාත්පස තිෂ්ණවූ; පඬිවරුනටද, පණ්ඩිතවරයන්ගේද; සිතට, චිත්තයට; සතුටුවන ලෙද, සන්තුෂ්ටියවන පරිද්දෙන්; සෙහෙනී, යහපත් ආකාර යෙන්; අරුත්පෑ, අර්ථයන් ප්‍රකාශකොට; පෙර ඇදුරන්ලෙස, පූර්වාචාර්යයන් පරිද්දෙන්; නිතිනි, නිරන්තරයෙන්; රුවට, ශොභාන්විත විලාසයෙන්; කියන, කථනයකරන්නාවූ; ඔහුට, එම විජයබාහුපරිවෙණාධිපති යතිඥයාණන් වහන්සේට; දසටවිදුනැන්, අෂ්ටාදශ විද්‍යාතෙමේ; සියපවෙනිතැන්විය, සවිශප්‍රවෙශී සමානයයි විය.

" ඔහුට දසට විදුනැන්විය සිය පවෙ නී"

අෂ්ටාදශවිද්‍යා නොහොත් ශිල්ප මෙසේවිය. එනම්:— 1 ඍග්වේදය, 2. යජුර්වේදය, 3. සාමවෙදය, 4. අථර්වවෙදය යන මෙකී සිව්වේදසතරද, 5, ඍග්වේදයට උපවෙදයවූ ආයුර්වේදය, 6. යජුර්වේදයට උපවෙදයවූ ධනුර්වේදය, 7. සාමවෙදයට උපවෙදයවූ ගන්ධර්වවෙදය. 8. අථර්වවෙදයට උපවෙදයවූ ස්ථාපත්‍යය වෙදය, 9. ශික්ෂාය, 10. ඡන්දස්ය, 11 ව්‍යාකරණය, 12. නිරුක්තිය, 13. ජ්‍යොතිශය, 14. කල්පය 15. පුරාණය, 16. මීමාංසාය, 17. න්‍යායය, 18. ධර්මය යන මොව්හු අෂ්ටාදශවිද්‍යානම් වේ. මෙය ඇතැම් ග්‍රන්ථයන්හි මීට වෙනස් ලෙසද පෙනෙන්ට තිබේ

233 නොසි කරන මිසදිටුවන් බස් අබ දී
නි සි නැණැති සිරිපැරකුම් රජුට සො දී
ර සි ගැඹුරු තෙපුලෙන් සැකහැර පසි දී
දෙ සි සුවාසූ දහසක් දහම් සා දී

233. මිසදිටුවන්, මිථ්‍යාදෘෂ්ටි ජනයන්ගේ; අබදබස්, අසම්බන්ධ වචනයන් හෙවත් ප්‍රතිවිරුඬ වචනයන්; නොසිකරන, නොප

* මේතාව මුද්‍රිත පොතේ නොමැතියි.

කන්නාවූ; (හිස්වූවක් කරන්නාවූ) නිසීනැණැති, යොග්‍යතා ප්‍රඥමහිම ඇත්තාවූ; සොඳ, සුන්දරවූ; සිරිපැරකුම් රජුට, ශ්‍රී පරාක්‍රමබාහු රාජයාට; රසී, රසවත්වූ; ගැඹුරුතෙපුලෙන්, ගම්භීර බුද්ධවචනයෙන්; සැකපසිඳහැර, ශඞ්කාවිච්ඡේදයකොටලා; සුවාසූ දහසක් දහම්කඳ, අසූහාරදහසක් ධර්මස්කන්ධයක්; දෙසී, දෙශනා කළසේක.

“දෙසි සුවාසූදහසක් දහම්ක ද”

අසූසාරදහසක් ධර්මස්කන්ධයෝ බුද්ධධර්මයට ඇතුළත් වෙති. ත්‍රිපිටක බුද්ධධර්මයට අයත් ග්‍රන්ථයන්ගේ නම් මෙසේය. එනම්:— පාරාජිකා, පචිත්ති, මහවග, සුළුවග, පරිවාර යන පොත් විනය පිටකයට ඇතුළත්වෙති.

දීඝනිකාය, මජ්ඣිමනිකාය, සංයුත්තනිකාය, අඞ්ගුත්තර නිකාය, ඛුද්දකනිකාය යන පස සූත්‍රපිටකයට ඇතුළත්වෙති.

ධම්මසඞ්ගනි, විභඞ්ග, කථාවත්ථු, පුග්ගලපඤ්ඤත්තිය, ධාතුකථා, යමක, පට්ඨාන යන සප්තප්‍රකරණයෝ අභිධර්මපිටකයට ඇතුළත්වෙති.

ත්‍රිපිටකධර්මයට සාධරණවූ මහාපච්චරියට්ඨකථා, කුරුන්දියට්ඨකථා, මහාට්ඨකථා, යන සිංහල අටුවාතුනක්ද, අන්ධකට්ඨකථා නම් තෙලිඟු අටුවාවක්ද, පෞරාණිකයන් විසින් කරනලදින් එය බොහෝකලක් සිංහල ජාතියට සිතුමිණි රුවනක්මෙන් පැවැති බවත් ප්‍රකාශකරමු. සිංහල භාෂායෙන් පැවැති ඒ මේ විශිෂ්ට අටුවා නෂ්ටප්‍රායබවට පත්වීම ඛෙදයට කරුනකි.

මේ තුන්පිටකයට අයත් පොත් අතුරෙන් විනය පොත් පසට සමන්තපාසාදිකා නම් විනය අටුවාවද දීඝනිකායට සුමඞ්ගලවිලාසිනී අටුවාවද, මජ්ඣිමනිකායට පපඤ්චසූදනී නම් අටුවාවද, සංයුත්තනිකායට සාරත්ථප්පකාසිනීනම් අටුවාවද අඞ්ගුත්තර නිකායට මනොරථපූරණීනම් අටුවාවද බුද්ධඝොෂ ස්වාමිපාදයාණන් වහන්සේ විසින් කරනලදහ. ඛුද්දකනිකායට අයත් සමහර පොත්වලටද බුද්ධඝොෂමාහිමියෝ අටුවා පොත් කළහ. අභිධර්මපිටකයට අට්ඨසාලිනී සම්මොහවිනොදනී පඤ්චප්පකරණ අට්ඨකථා යන අටුවා පොත් එම බුද්ධඝොෂ ස්වාමීන් විසින්ම ලියන ලදහ

231 එ ඟි මි සො ලෙ ස් ගිරිමුදුනෙන් වැහෙන සො ද
ද හ ම් අ හ ස් ගඟ දුල දිය දහර වැ ද
නොමඳ ස නො ස් අම බඳසින් පිපි නිබ ද
බැ බ ළි වෙ සෙ ස් නරනිඳු සඳ කිරි මුහු ද

234 එහිම්, ඒ විජයබාහු පරිවෙණාධිපති ස්වාමීන් නැමැති කෙලෙස්ගිරිමුදුනෙන්, කෛලාශ පර්වත මස්තකයෙන්; වැහෙ... වාහනයවන්නාවූ; සොඳ, සුන්දරවූ; දහම්, සද්ධර්මනැමැති; අහ... ගඟ, ආකාශ ගඞ්ගාවෙහි; දුළ, ජ්වලිතවූ; දියදහර, ජලධාරාව... වැද, ස්පර්ශයකොට, නොමඳ, අමන්දවූ; සතොස්, සන්තොෂනැමැ... අම ඔදසින්, අමෘතෞජසින්; නිබඳ, අතරනැතිව; පිරි, පරිපූර්ණ... නරනිඳුසඳ, නරෙන්ද්‍රචන්ද්‍ර නැමැති; කිරිමුහුද, ක්ෂීරාර්ණවයතෙ... වෙසෙස්, විශෙෂයෙන්; බැබළි[illegible]ාජිතවී.

235 දෙ ස න දහම් දනමන ඝර
සොබ න එයතිසඳුගේ ගුණ
න ද න වදන් නළඟන පෑ
ර ඟ න පවර රඟබිම් සිය

235 දන, ජනයන්ගේ; මනවිකාසයකර, මනඃ ප්‍රබෝ... කොට; දහම්දෙසන, ධර්මදෙශනාකරන්නාවූ; සොබන... ශොභනගුණයන්ට; නිවාසය, වාසස්ථානවූ; එයතිසඳුගේ, ඒ... රාජයාගේ; විසේසය, විශෙෂලීලාවක්; පෑ, ප්‍රකාශකළාවූ (ඒ සින්ම) නඳන, සන්තොෂකරවූ; වදන්, වචන නැමැති; නළ... නාටිකාඞ්ගනාව; විසේසය, විශෙෂවශයෙන්; රඟන, නෘ... කරනු ලබන්නාවූ; රඟබිම්, නෘත්‍යභූමිය නම්; සබාසදවිය, ... ඝාතාදි සඞ්භාෂාවවිය.

236 ප සැ ස් ප ස ස් කැරු වදහල ලෙසම සො
නි දෙ ස් වෙසෙ ස් පිළිවෙත් සිරිත නොවිහි
ස දෙ ස් කෙලෙ ස් සතුරන් ඔද මැඩ නොව
අ පි ස් සතො ස් ගුණයෙන් වැජඹෙයි නිබ

236 සොඳ, සුන්දරවූ; පසැස්, පඤ්චචක්ෂුවූ සර්වඥයන් සේ විසින්; පසැස්කැරු, ප්‍රත්‍යක්ෂකොට; වදහළ ලෙසම, ... පරිදිදෙන්ම; වෙසෙස්, විශෙෂයෙන්; නිදෙස්, නිර්දොෂවූ; වෙත් සිරිත, ප්‍රතිපත්තියෙහි හැසිරීම; නොවිහිද, පහනොවෙ... සදෙස්, වෙෂසහගතවූ; නොමඳ, බොහෝවූ; කෙලෙස් සතු... කෙලශශත්‍රූන්ගේ; ඔද, තෙජස්; මැඩ, මර්දනයකොට; සතොස් ගුණයෙන්, අල්පේච්ඡතා සන්තුෂ්ටතා සඞ්ඛ්‍යාත... යෙන් යුක්තව; නිබඳ, නිරන්තරයෙන්; වැජඹෙයි, විජෘම්... වෙයි.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු